බුදුසමයේ පැනෙන

# මාරයා

කන්දරපංගුවේ ධම්මසිරි හිමි

සිරි පියරතනපිරිවෙණ
වැලියාය
මොණරාගල

බුදුසමයේ පැනෙන

# මාරයා

© කන්දරපංගුවේ ධම්මසිරි හිමි

ISBN 978 - 955 - 633 - 113 - 5

පළමුවැනි මුද්‍රණය බු . ව . 2552 . ක්‍රි .ව 2009

කවරයේ සැලැස්ම කතුවරයා විසිනි

Printed for free distribution by
**The Corporate Body of the Buddha Educational Foundation**
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org
Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**
**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

*" යො ඉමස්මිං ධම්මවිනයෙ*
*අප්පමත්තො විහෙස්සති*
*පහාය ජාති සංසාරං*
*දුක්ඛස්සන්තං කරිස්සති "*

යමෙක් මෙ සස්නෙහි අප්‍රමත්තව වෙසෙත්තේ නම් (හෙතෙමේ) ජාතිය හා සංසාරය දුරුකොට දුක් කෙළවර කරන්නේය.

සංයුත්තනිකාය. I. පි. 282

## නැවත මුද්‍රණය සඳහා පෙරවදන

සිංගප්පූරුවේ ධම්මදූත බෞද්ධ ආයතනයේ අධිපතිත්වය දරන්නා වූ කන්දරපංගුවේ ධම්මසිරි හිමියන් විසින් රචිත 'සංඛ්‍යා ධර්මපද වර්ණනා' ග්‍රන්ථය පස්වැනි වරටත් මුද්‍රණය කිරීම සඳහා තායිවානයේ බෞද්ධ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය වෙත බාරදීම පිළිබඳව අපි ඉමහත් සොම්නසට පත් වන්නෙමු. තායිවානයේ මෙම බෞද්ධ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන ආයතනය මේ වන විටත් විවිධ භාෂාවන්ගෙන් රචිත ලක්‍ෂ ගණනක් බෞද්ධ පොත් පත් මුද්‍රණය කොට ලෝකය පුරා විවිධ රටවල ඇති බෞද්ධ ආයතනවලට හා පුස්තකාලවලට බෙදා දී ඇත.

මම වසර ගණනක් පුරාවට විදේශීය ධර්මදූත සේවාවෙහි යෙදී සිටින කන්දරපංගුවේ ධම්මසිරි හිමියන් විසින් ඉංග්‍රීසි හා සිංහල යන භාෂා දෙකෙන් ම පොත් පත් ලියා මුද්‍රණය කොට බෙදාහැර ඇත. මෙම උත්සාහය ලෝකවාසී, බෞද්ධ ධර්මය හැදෑරීමට උනන්දුවක් දක්වන ගිහි පැවිදි කාගේත් ගෞරවයට පත් වන කරුණ කි. වසර තිහකට ආසන්න කාලයක් තායිවානයේ වාසය කරමින් මෙම බෞද්ධ අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන ආයතනයේ

අනුශාසකත්වය හොබවමින් එයින් සිදුවන ලෝක ශාසනික කටයුතුවලට සහයෝගය ලබාදෙන අතර වර්තමානය වන විට බෞද්ධ ධර්මය ඉගෙනීම සඳහා උනන්දුවක් දක්වන ලෝකයේ සියලු ම බෞද්ධ අබෞද්ධ විද්‍යාර්ථීන්ගේ පහසුව උදෙසා ශ්‍රී ලංකාවේ කැලණිය මානෙල්වත්ත විහාර පරිශ්‍රයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලයක් ඇරඹුවෙමි.

බෞද්ධ ඉතිහාසය දෙස විමර්ශනාත්මකව බැලීමේදී විවිධ වූ බෞද්ධ අධ්‍යාපන ආයතනයන්ගේ ආරම්භය හා ක්‍රියාකාරීත්වය පිලිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට හැකියාවක් ඇති බව අප කාටත් පිළිගත හැකි කරුණ කි. මගේ දැනීමේ හැටියට පළමු ශතවර්ෂය වන විට ශ්‍රී ලංකාවේ අනුරාධපුර අභයගිරි විහාරය ආශ්‍රිත බෞද්ධ අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන ගොස් තිබේ. ඉන් අනතුරුව 5 වන ශත වර්ෂය වන විට අනුරාධපුර පැවති මහා විහාර, හා 12 වැනි ශත වර්ෂය වන විට පොළොන්නරුවේ පැවති ආලාහන පිරිවෙන් ආයතන ද ඉතිහාස ගත වූ බෞද්ධ අධ්‍යාපන ආයතනයෝ වූහ. මීට අමතර ව ඉන්දියාවේද විවිධ කාල වකවානුවල බෞද්ධ අධ්‍යාපන ආයතන බිහි වී තිබේ. අප කවුරුත් දන්නා ඉතිහාසගත තොරතුරුවලට අනුව නාලන්ද,

වලභි, සෝමපුර, ඕදන්තපුර, වික්‍රමශීලා, ජගද්දලා, වැනි බෞද්ධ අධ්‍යාපන ආයතන එදමෙද තුර දෙස් විදෙස් කාගේත් අවධානයට යොමු වූ ආයතනයෝ වූහ. මෙම ඓතිහාසික ශ්‍රේෂ්ඨ බෞද්ධ අධ්‍යාපන ආයතන අතර ඉන්දියාවේ නාලන්ද විශ්වවිද්‍යාලය මා සිත් ගත් ආයතනයක් විය.

නාලන්ද විශ්වවිද්‍යාලය ගැන වැඩිදුර කරුණු කාරණා සෙවූ මට තව දුරටත් දැන ගන්නට ලැබුණේ මේ ආයතන තුළින් එද මෙදතුර බුද්ධ ශාසනය හා ලෝක වාසී බෞද්ධ සමාජය වෙත කර ඇති සේවාව ඇති විශාල බවයි. නාලන්ද විශ්වවිද්‍යාලය වනාහී, මහායාන හා වජ්‍රයාන නම් වූ බෞද්ධ සම්ප්‍රදයන් පිලිබඳ අවබෝධයක් ලබා දුන් ආයතනයක් විය. ඊට අමතර ව ජ්‍යෝතිෂය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් පිලිබඳ ව දැනුම ද එකල සිටි විද්‍යාර්ථීන්ට ලබා දී ඇත. කාලය විසින් ඉතිහාසයේ ගමන්මග නිරන්තරයෙන් වෙනස් කරන නිසාවෙන් වත්මන් බෞද්ධ සමාජයට එවැනි උදර ආයතනවලින් කළ සේවාව අද වන විට අහිමි වී ඇත. ඉන් අනතුරුව මගේ සිතට අලුත් සිහිනයක් ඇතුල් විය. එනම් "වත්මන් බොදුනු ලොවට අහිමි වූ පැරණි නාලන්ද විශ්වවිද්‍යාලයේ ශ්‍රී විභූතිය කෙසේ හෝ මා නැවත ආරම්භ කර

ලබාදිය යුතු ය" යන්නයි.

මගේ එම සිහිනය මල්ඵල ගන්වමින් අද වනවිට කැලණිය බොල්ලෑගල මානෙල්වත්ත විහාර භූමියේ එම විශ්වවිද්‍යාලය ඉදි කරමින් පවතී. ගොඩනැගිලි සංකීර්ණය මේ වන විටත් ඉදිවෙමින් පැවතිය ද විශ්වවිද්‍යාලයට සිසුන් බඳවා ගැනීම හා ඉගැන්වීමේ කටයුතු දැනටමත් අරඹා ඇත. මෙහි අධ්‍යාපන කටයුතු ප්‍රධාන අංශ පහක් ඔස්සේ ව්‍යාප්ත කිරීමට කටයුතු යොදා ඇත. එනම් බෞද්ධ දර්ශන පීඨය, ආදි බෞද්ධ මූලාශ්‍ර අධ්‍යයන පීඨය, ව්‍යවහාරික බෞද්ධ අධ්‍යයන පීඨය, බෞද්ධායුර්වේද අධ්‍යයන පීඨය හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යනුවෙනි. තවද මෙම විශ්වවිද්‍යාලයේ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ දැනට ලොව පුරා පැතිර පවතින ථේරවාද, මහායාන, හා වජ්‍රයාන යන බෞද්ධ සම්ප්‍රදයන් තුනම පිළිබඳ ඉගැන්වීම් කටයුතු හා පර්යේෂණ කටයුතු කිරීමට අවස්ථාව උදා කර දී තිබීමයි. ඒ තුළින් අනාගත ලොවට ධර්මය ප්‍රචාරය කිරීමට සුදුසු දැනුමෙන් හා කාර්යක්ෂමතාවයෙන් පිරිපුන් පිරිසක් බිහි කිරීමද මගේ තවත් එක් බලාපොරොත්තුවක් වේ.

අවසාන වශයෙන් කන්දරපංගුවේ ධම්මසිරි හිමියන් විසින් රචිත 'සංඛ්‍යා ධර්මපද වර්ණනා' නම් ග්‍රන්ථය පරිශීලනය කරන සියලු ම පාඨකයන්ට මතක් කර සිටින්නේ, විධිමත් බෞද්ධ අධ්‍යාපනයක් සමඟ එය ප්‍රායෝගිකව අත්විඳීම කෙරෙහි යමෙක් උනන්දුවක් දක්වන්නේ නම් ඒ අය සඳහා අපේ මෙම නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය පිළිබඳව හඳුන්වා දෙන ලෙසයි. එසේම මේ ග්‍රන්ථය රචනා කර කිහිපවතාවක්ම මුද්‍රණය කර බෙදාහැර බෞද්ධ පාඨකයන්ගේ දහම් දැනුම වැඩි කරලීමට මහත් සේ වෙහෙසක් දරන කන්දරපංගුවේ ධම්මසිරි හිමියන් වහන්සේට නිදුක් නිරෝගී බව ප්‍රාර්ථනා කරමි.

තෙරුවන් සරණයි.

තායිවානයේ තායිපේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ
ප්‍රධාන අනුශාසක හා තායිවානයේ ප්‍රධාන සංඝ නායක,
**පූජ්‍ය ආචාර්ය බෝදගම චන්දිම නාහිමි,**
නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ විශ්වවිද්‍යාලය,
බොල්ලෑගල, කැලණිය.

# සංඥාපනය

මා විසින් නොබෝදා පළ කරණ ලද 'සංඛ්‍යා ධර්මපද වර්ණනා' යන ග්‍රන්ථය සම්පාදනය කිරීමෙදී මාරයා පිළිබඳව ද කරුණු අධ්‍යයනයට අවස්ථාව ලැබුණි. එම කරුණු එක්කොට මේ පොත සම්පාදනය කෙළෙමි.

මාර ශබ්දය සංකීර්ණ අදහස් ඇති පදයකි. බෞද්ධයන් අතර බෙහෙවින් ප්‍රචලිත වචනයකි. පස්මරුන් යන්න ද එසේය. බුදුසමයෙහිදී බොහෝවිට මාරයා ගැන සඳහන්වන්නේ පුද්ගලයාගේ විමුක්තිමාර්ගයට අවහිර කරණ පාපධර්ම හඳුන්වාදීමේ උපායමාර්ගයක් වශයෙනි. මාරයා පිළිබඳව බෞද්ධසාහිත්‍යයේ දැක්වෙන කරුණු උපුටා දක්වමින් මේපොත ලිවීමට මා අදහස් කෙළේ ද මාරයා මගින් ඉදිරිපත්වන පව්ටුගති ලක්ෂණ සමාජය ඉදිරියෙහි තබා එම කරුණු මාර්ගයෙන් පාපධර්මයන් නැතිකර යහපත් චරිතයක් ඇතිකරගැනීමට ඉවහල්වේය යන අදහසිනි. එසේ වුවද බුදුසමයේ පැනෙන මාරයා පිළිබඳ ලිවීම ඉතාම දුෂ්කර කාර්යක්විය. ලිවීම අතරමඟ නතරකර නිතර කල්පනාබරව සිටි අතර බෞද්ධ විශ්වකෝෂයේ නියෝජ්‍ය කර්තෘ (විශ්‍රාමලත්) සනත් නානායක්කාර, මහාචාර්ය කපිල අභයවංස, යන වියතුන් ගෙන් ලැබුණ උපදෙස් මෙය සම්පාදනයට පහසු විය. එම වියතුනට ද මගේ කෘතඥතාව හිමි වෙයි.

මෙම කෘතියෙහි බුදුසමයේ පැනෙන මාරයා - පස්මරුන් සහ ඒ හා බැඳුණු කරුණු ඇතුළත්වෙයි. එහෙයින් මෙය මාරසංකල්පය පිළිබඳව අධ්‍යයනයට ගවේෂණයට උපකාරී වේ යයි සිතමි. පෙළ සහ අටුවා අනුව විස්තර සඳහන් වෙයි.

මෙය සම්පාදනයේදී ග්‍රන්ථ රාශියක් ආශ්‍රයෙන් කරුණු රැස් කර ගතිමි. විශේෂයෙන් බුද්ධජයන්ති ග්‍රන්ථමාලා සහ හේවාවිතාරණ අට්ඨකථා මෙහිලා ඉවහල් කරගත්තාලදි. ඒ හැර පහත සඳහන් ග්‍රන්ථ විශේෂය. එම ග්‍රන්ථ සංස්කාරකවරයන් කෘතඥතා පූර්වකව සිහිපත් කරමි. එසේම Pali Text Society (PTS) පළ කළ පොත් ද අනුගමනය කෙළෙමි. එම සංස්කාරකයනට ද ස්තුතිවන්ත වෙමි. සිංහල විශුද්ධිමාර්ගය පණ්ඩිත මාතර ශ්‍රී

ධර්මවංශ ස්ථවිර, ධම්මපදට්ඨකථා අග්ගමහා පණ්ඩිත බුද්ධදත්ත මහාථෙරෙන, සංඛ්‍යා ධර්මපද වර්ණනා කන්දරපංගුවේ ධම්මසිරි හිමි.
*Pāli English Dictionary* by T.W. Rhys Davids and William Stede, *Pāli English Dictionary* by Margaret Cone. *Buddhist Dictionary by* Ven. Nyanatiloka, *The Path of Purification*, by Ven. Bhikkhu Ñānamoli, *Dictionary of Pāli Proper Names* by G. P. Malalasekara. *SANSKRIT ENGLISH DICTIONARY* Sir .M.Monier Willams

තවද මෙහිදී මසුරු නැතිව මිතුරු ලෙස සහාය දුන් වැලියායේ සිරි පියරතන පරිවෙණාධිපති ශාස්ත්‍රපති කන්දැලඩපංගුවේ සුධම්ම නාහිමි, වෙහෙරහේනපූර්වාරාම රජමහවිහාරයේ අධිපති ගෞරවශාස්ත්‍රවේදී කෑගල්ලේ රතනසාර හිමි, සිංගප්පූරුවේ බුඩිස්ට් මිෂන්හි අධිපති කෝන්ගල ධම්මික හිමි, සිංගප්පූරුවේ බුද්ධයාන ආයතනයේ අධිපති ගතේකුඹුරේ සාන්ත හිමි යන හිමිවරු ද ප්‍රශංසනීය වෙති.

පරිගණකයෙන් සැකසීම ද කතුවරයා විසිනි.

බුදුසමයේ පැනෙන මාරයා හා තදීය කරුණු මෙම ග්‍රන්ථයෙහි හැකිතාක් නිරවද්‍යව ඉදිරිපත්කිරීම මගේ උත්සාහය වුව ද මෙහි අඩුලුහුඬුකම් තිබිය හැකිය.

ධම්මසිරි හිමි

# කෙටි යෙදුම්

| | |
|---|---|
| අ. | අංගුත්තරනිකාය |
| අඅ. | අංගුත්තරනිකායට්ඨකථා (මනොරථපූරණී) |
| අභි. | අභිධම්මත්ථ සංගහ |
| අප. | අපදාන |
| අපඅ. | අපදානට්ඨකථා (විසුද්ධජනවිලාසිනී) |
| ඉති. | ඉතිවුත්තක |
| ඉතිඅ. | ඉතිවුත්තකට්ඨකථා (පරමත්ථදීපනී) |
| උ. | උදාන |
| උඅ. | උදානට්ඨකථා (පරමත්ථදීපනී) |
| කව. | කථාවත්ථු |
| ඛුපා. | ඛුද්දකපාඨ |
| ඛුපාඅ. | ඛුද්දකපාඨට්ඨකථා (පරමත්ථජොතිකා) |
| ච. | චරියාපිටක |
| චඅ. | චරියාපිටකට්ඨකථා (පරමත්ථදීපනී) |
| චූනි. | චූල්ල නිද්දෙස |
| චූනිඅ. | චූල්ලනිද්දෙසට්ඨකථා (සද්ධම්මපජ්ජොතිකා) |
| ජා. | ජාතක (ජාතකට්ඨකථා) |
| ථෙර. | ථෙරගාථා |
| ථෙරඅ. | ථෙරගාථාට්ඨකථා (පරමත්ථදීපනී) |
| ථෙරී. | ථෙරීගාථා |
| ථෙරීඅ | ථෙරීගාථාට්ඨකථා (පරමත්ථදීපනී) |
| දීනි. | දීඝනිකාය |
| දීඅ. | දීඝනිකායට්ඨකථා (සුමංගලවිලාසිනී) |
| ධප. | ධම්මපද |
| ධපඅ. | ධම්මපදට්ඨකථා අග්ගමහා පණ්ඩිත බුද්ධදත්ත මහාථෙරෙන |
| ධස. | ධම්මසංගිනී |
| ධසඅ. | ධම්මසංගිනී අට්ඨකථා (අත්ථසාලිනී) |
| නෙත්. | නෙත්තිප්පකරණ |
| නෙත්අ. | නෙත්තිප්පකරණට්ඨකථා |
| පටි. | පටිසම්භිදාමග්ග |
| පටිඅ. | පටිසම්භිදාමග්ගට්ඨකථා (සද්ධම්මප්පකාසිනී) |
| පා. | පාලි |

| | |
|---|---|
| පුප. | පුග්ගලපඤ්ඤත්ති |
| පෙව. | පෙතවත්ථු |
| පෙවඅ. | පෙතවත්ථුඅට්ඨකථා (පරමත්ථදීපනී) |
| බුව. | බුද්ධවංස |
| බුවඅ. | බුද්ධවංසට්ඨකථා (මධුරත්ථවිලාසිනී) |
| මනි. | මජ්ඣිමනිකාය |
| මනිඅ. | මජ්ඣිමනිකායට්ඨකථා (පපඤ්චසූදනී) |
| මිප. | මිලින්දපඤ්හ |
| මහානි. | මහානිද්දෙස |
| මහානිඅ. | මහානිද්දෙසට්ඨකථා (සද්ධම්මප්පජ්ජෝතිකා) |
| මහාව. | මහාවග්ගපාළි |
| සනි. | සංයුත්තනිකාය |
| සනිඅ. | සංයුත්තනිකායට්ඨකථා (සාරත්ථප්පකාසිනී) |
| සධව. | සංඛ්‍යා ධර්මපද වර්ණනා |
| සිවි. | සිංහලවිශුද්ධිමාර්ගය පණ්ඩිත මාතර ශ්‍රී ධර්මවංශ ස්ථවිර |
| සුනි. | සුත්තනිපාත |
| සුනිඅ. | සුත්තනිපාත අට්ඨකථා (පරමත්ථජෝතිකා) |
| විභ. | විභංග |
| විභඅ. | විභංගට්ඨකථා (සම්මොහවිනොදනී) |
| විම. | විමානවත්ථු |
| විමඅ. | විමානවත්ථු අට්ඨකථා (විමලවිලාසිනී) |
| සං. | සංස්කෘත |
| උදා. | උදාහරණ |
| බ. | බලන්න |
| පිසි. | පිට සිට - පිටුව සිට |
| ව.බ. | වචනය යෙදුන තැන බලන්න |
| BD. | Buddhist Dictionary by Nyanatiloka |
| DPPN. | Dictionary of Pàli Proper Names |
| PED. | PALI-ENGLISH DICTIONARY PTS |
| PTS. | The Pàli Text Society |
| SED. | SANSKRIT ENGLISH DICTIONARY Sir .M.Monier Willams |

# පටුන

මාරයා - *මාරො* ..................................................... 1
කාළයා- කළුවා- *කණ්හ*..................................................... 5
අධිපති..................................................... 7
අන්තක- *අන්තකො*..................................................... 9
මුදාතොහරි-මුදාතොහරින්නා- *නමුචි*..................................................... 10
ප්‍රමාදවූවන්ගේ ඥාතියා- *පමත්තබන්ධු*..................................................... 11
ප්‍රජාපති- *පජාපති*..................................................... 11
අන්තයට ගිය- *අන්තගු*..................................................... 12
මෘත්‍යු මාරයා - *මච්චු මාරො*..................................................... 12
මරණය-*මරණං*..................................................... 14

# මහාවග්ගපාළියෙහි

නො මිඳුනේය යි කියයි..................................................... 20
වේරඤ්ජබමුණට කළ දෙය..................................................... 23

# දීඝනිකායෙහි.

අකාල ආරාධනය..................................................... 24
සිතට ඇතුළුවෙයි..................................................... 27
දේවසමාගමයටත් පැමිණියේ ය..................................................... 32

# මජ්ඣිමනිකායෙහි.

මාරග්‍රහණයට පත් නො වන්නා..................................................... 36
මුවවැද්දෙකු ලෙස..................................................... 37
බඹලොවට යයි..................................................... 39
ආබාධයක් ලෙස..................................................... 41
අරමුණු නො ලබයි..................................................... 44

# සංයුත්තනිකායෙහි


ආරූඪ වෙයි ........ 49
තපස්කර්මයෙන් ඉවත්වන්නයයි කියයි ........ 50
ඇතෙකු ලෙස ........ 54
විසිතුරු සටහන් මවයි ........ 55
නාගයෙකු ලෙස ........ 60
කිම නිදයි ද? විමසයි ........ 61
සතුටට හේතුවන කරුණු කියයි ........ 62
ආයුෂ දීර්ඝ ලෙස පෙනෙයි ........ 63
ගල් පෙරලයි ........ 65
සිංහනාද නො කරන්න ........ 65
වැඩ නැද්දැයි? විමසයි ........ 68
අනුශාසනා සුදුසු නො වේ යයි පවසයි ........ 69
ගවයෙකු ලෙස ........ 70
භයානක ශබ්දයක් කෙළේය ........ 74
පිණ්ඩපාත දීම වලකයි ........ 76
ගොවියෙකු ලෙස ........ 77
රජවන ලෙස කියයි ........ 80
මහලුබමුණෙකු ලෙස ........ 82
දෙවරක් පැමිණෙයි ........ 85
දූතයකු ලෙස ........ 88
සත්වසක් ලුහුබැන්දේ ය ........ 95
මාරදූවරු ........ 97
මෙසේ පවසයි -නිවණෙක් නැත ........ 99
ස්ත්‍රියකට නො හැකැ යි කියයි ........ 101
පුරුෂයකු සොයයි ද ? යනුවෙන් අසයි ........ 102
දේවලෝක ගැන කියයි ........ 104
අත්බව කවරකු විසින් කරණලදැයි විමසයි ? ........ 110
සත්ත්වයා කවරෙක් දැයි විමසයි ........ 115
බිළිවැද්දෙකු ලෙස ........ 120
අවකාශ ලබයි ........ 123
රාධ තෙරුන්ගේ මාර ප්‍රශ්නය ........ 124
මරසෙන් මඬින අයුරු ........ 130

ඉදිබුවා කෙරෙන් හිවලා මෙන් ........ 132
ගිජුලිහිණියක මෙන්........ 135

## අංගුත්තරනිකායෙහි

අග්‍රය........ 139
ශූරඅම්බට්ඨ හමුවීමට යයි........ 139

## ඛුද්දකනිකායෙහි

### සුත්තනිපාතයෙහි

කාරුණික වචන........ 140
මාරසේනාව........ 144

### ජාතකට්ඨකථාවෙහි

නික්ම නො යන ලෙස කියයි........ 148
මාරපරාජය........ 149
අඟුරුවළක් මවයි........ 156

## ධම්මපදයෙහි- ධම්මපදට්ඨකථාවෙහි

රාහුලතෙර වෙතට පැමිණියේය........ 157
මාරකායික දෙව්වරු........ 159

## ථෙරගාථා - ථෙරගාථාට්ඨකථාවෙහි

දැරියකගේ අත අල්ලයි........ 161
කෙසේ දිවි රකිම් ද?........ 166
බියසුලුරූප මවයි........ 169

අභිභූ තෙරුන්ගේ ධර්ම දේශනය ........................................ 170

## පස්මරුන් - *පඤ්ච මාරා*

මෘත්‍යුමාරයා-*මච්චුමාරො* ........................................ 172
කෙලෙස්මාරයා- *කිලෙසමාරො* ........................................ 172
ස්කන්ධමාරයා - *ඛන්ධමාරො* ........................................ 176
අභිසංස්කාරමාරයා - *අභිසංඛාරමාරො* ........................................ 176
මාරදේවපුත්‍රයා- *දෙවපුත්ත මාරො* ........................................ 180
මාරසංඛ්‍යාව ........................................ 181
මාරබලය- *මාරබලං* ........................................ 182
මාරධෙය්‍ය ය- *මාරධෙය්‍යං* ........................................ 183
මච්චුධෙය්‍ය ........................................ 184
මාරරජා - *මච්චුරාජා* ........................................ 186
විවරණ කළ පද ........................................ 188

කෙලසුන් නසන සැනසෙන යන මඟ පෑදූ
නිතකින් සියලු සත වෙත හිත සෙත සෑදූ
මුනිඳුන් කෙලෙස් සිඳ බිඳ සිය සිත සේදූ
කියමින් වඳිමි බුදුගුණ බැතියෙන් සාදූ

නුවණින් දතත් දැන
නෙක් දම් දෙසූ සැනසෙන
මුනිඳුන් නැමඳ ගෙන
කියමි තොරතුරු මාරයා ගැන

## මාරයා - *මාරො*

'මාර, (*මාරො*) ශබ්දය බෞද්ධයන් අතර බෙහෙවින් ව්‍යවහාර වන වචනයකි. සංකීර්ණ අදහස් දෙන පදයකි. පදගතාර්ථ වශයෙන් නම් මරණය, මරන්නා, නැතිකරන්නා, කරදර කරන්නා, යන තේරුම් දෙයි. පෙළෙහි හා අටුවාවල - පාලි සාහිත්‍යයේ විවිධ අර්ථ දෙමින් යෙදී ඇත. පොදුවේ ගත්විට මරණය යන තේරුම දෙයි.
සිංහලභාෂාවේ කථා ව්‍යවහාරයේදී මාර ශබ්දය විවිධ අර්ථවල යෙදී තිබේ.

"ඊයේ වැහපු වැස්ස නන් මාරයි. මන් ගමනක් යන්ට සූදානන්වෙලා බලාගෙන හිටියා හිටියා වැස්ස නවතියි කියල නැවතුනේම නෑනේ. ඉතින් කුඩෙත් දිගඇරගෙන පාරට බැස්සා මොන යෑමක්ද වැස්සයි හුලඟයි. කුඩෙත් ඇඹිරිලා ගියා. මාර වැස්සක්නෙ. ඉතින් යන්ට බැරිවුණානෙ " මෙහිදී මාර ශබ්දය මහත්, පුදුම යන අර්ථයන් දෙයි.

" යාලුවෙකුගෙන් මට පොතක් ලැබුණා. මන් පොත් බලන්න හරී කම්මැළියි ඒ වුනත් ඒක ටිකක් බලන්ට හිතුනා. පිටුදෙක තුනක්

බැලුව. ඉතින් තවත් බැලුවාම නතරකරන්න හිතුනෙම නෑ. හරිම හොඳයි. ඒක මාර පොතක් හරි හොඳයි. තරමක් ලොකුයි. ඉවරවෙන්නම බලල තමයි නැවතුනෙ " මෙතන මාර වචනය ඉතාම උසස් යන අදහස කියයි.

" මට පුතුන් තුන්දෙනෙක් ඉන්නව. වැඩිමහල් දෙන්නානම් හොඳයි. ඉගෙනීමත් නරක නෑ. කරණ වැඩත් කල්පනාවෙන් කරණව. බාලයා බාල පුතා කියන දෙයක් අහනනෙත් නෑ එයා හිතන දේමයි කරන්නෙ. මහ කරදර කාරයෙක් මාරපුතෙක් අනේ මන්දන්නෙ නෑ. වැඩිහිටියෙක් වුනාම වත් හරි යාවි ද කියල" මෙවැනි තැන්වල මාර යන්න අකීකරු යන තේරුමට යෙදී ඇත.

මාරෝ සං. මෘ, පා. මාර, යන ධාතුප්‍රකෘතියෙන් සකස්වුණ ශබ්දයකි. මරණය, මරන්නා, නැතිකරන්නා, කරදරකරන්නා, පච්කාරයා යන තේරුම් දෙයි. මරණය ම පුද්ගලත්වය ආරෝපණය කර, පුද්ගලයෙකු ලෙස දක්වා තිබේ. *පඤ්ච මාරා*, පස්මරුන් යන තැන මච්චු මාර යනු මරණයයි.

*මාරෝ පාපිමාති එත්ථ සත්තෙ අනත්ථෙ නියොජෙන්තො මාරෙතීති මාරෝ.*[1]

පාපී මාරයා යනු මෙහි සත්ත්වයන් අනර්ථයේ යොදමින් මරණ හෙයින් මාරයා නම් වෙයි.

*පාපිමාති තස්සෙව වෙවචනං, සො හි පාපධම්ම සමන්නාගතත්තා පාපිමාති වුච්චති කණ්හො, අන්තකො, නමුචි, පමත්තබන්ධූතිපි තස්සෙව නාමානි.* [2]

පාපිමා යනු ඔහුටම කියන සමාන වචනයකි, පව්වලින්

---

[1] දීනිඅ. I පි. 385
[2] දීනිඅ. I පි. 385, II . පි . 613

සමන්නාගත හෙයින් පාපියා යයි කියනුලැබේ. ඔහුට ම කාළයා-කළුවා, කෙළවර කරන්නා, මුදා නො හරින්නා, පමා වන්නාගේ ඤාතියා යන වෙනත් නම් ඇත.

*මාරො පාපිමාති අත්තනො විසයං අතික්කමිතුං පටිපන්නෙ සත්තෙ මාරෙතීති මාරො*[1]

පාපී මාරයා යනු තමාගේ විෂය ඉක්මවීමට පිළිපන්න සත්ත්වයන් මරණහෙයින් මාරයා නම්වෙයි.

*පාපෙ නියොජෙති සයං වා පාපෙ නියුත්තොති පාපිමා. අඤ්ඤාතිපිස්ස, කණ්හො, අධිපති, වසවත්ති, අන්තකො, නමුචි, පමත්තබන්ධූති ආදීනි බහූනි නාමානි.*[2]

තමා පාපයන්හි යෙදී ඇති හෙයින් හෝ අන්‍යයන් පාපයන්හි යොදවන හෙයින් පාපියා නම් වෙයි. තව ද මොහුට, කාළයා-කළුවා, ප්‍රධානයා, වසවර්තියා, කෙළවරකරන්නා, මුදානොහරින්නා, පමා වන්නාගේ ඤාතියා යනාදී බොහෝ නම් ඇත.

*යො සො මාරොති එවමාදීසු මහාජනං අනත්ථෙ නියොජෙත්වා මාරෙතීති මාරො* [3]

යම් ඒ මාරයා යනු මේ ආදී තැන්හි මහජනයා අනර්ථයේ යොදවා මරණ හෙයින් මාරයා නම් වෙයි.

*මහාජනං පාසෙ නියොජෙත්වා මාරෙතීති මාරො*[4]

මහජනයා පාශයේ යොදා මරණ හෙයින් මාරයා නම් වෙයි.

---

[1] සනිඅ. I පි. 133
[2] සනිඅ. I පි. 133
[3] මහානිඅ. පි. 325,328
[4] චූලනිඅ. පි. 26

*පාපිමාති ලාමක පුග්ගලො, පාපසමාචාරෝ වා* [1]
පාපිමා- පාපියා යනු ලාමකපුද්ගලයා, පව්කාරයා.

*පාපිමා- පාප + මන්තු = පාපිමන්තු.* යන ශබ්දයේ ප්‍රථමා විභක්තියේ ඒකවචනය *පාපිමා.* තද්ධිත පදයකි. සසඳාබලන්න. සතිමා, ඉද්ධිමා, *පාපිමා.* පාපී, පව්වු, පාපියා, ලාමකපුද්ගලයා, පව් කරන්නා, පව් ඇත්තා, තමන් ද අනර්ථ කරමින් අනුන් ද අනර්ථයේ යොදවයි යන තේරුම් දෙයි.

පාලි සංඥා නාම ශබ්දකෝෂයේ, මාරයා සාමාන්‍යයෙන් විමසා බලනවිට මරණය පුද්ගලත්වයෙන් දක්වයි. පාපියා, වරදට පොළඹවන්නා යනුවෙන් සඳහන්වෙයි.[2]

පාලි ඉංග්‍රිසි ශබ්දකෝෂය මෙසේ කියයි. මාරයා මෘ යන්නෙන් සම්භව වූවකි. පසුකාලීන වෛදික, මාර මරන්නා, විනාශකරන්නා, මරණය ගෙනඒම, මහත්උපද්‍රවය. සාමාන්‍යයෙන් මරණය පුද්ගලයකුගේ නමක් ලෙස පුද්ගලත්වයක් ආරෝපණය කර දක්වයි. ඇතැම්විට මාර යන පදය නිර්වාණයට විරුද්ධ ලෙස මුලු ලෝකප්‍රවෘත්තියට හෙවත් පුනර්භවය ඇතිකරණ ලෝකයට සම්බන්ධ කර ඇත.[3]

බෞද්ධශබ්දකෝෂයේ මෙසේ සඳහන් වෙයි. මාර (පදගතාර්ථ වශයෙන් 'මරන්නා'), බුදුසමයට අනුව කරදරකරන්නා. බොහෝවිට පාපියා (*පාපිමා මාරෝ*) නොහොත් නමුචි (වචනාර්ථයෙන් 'මුදානොහරින්නා' නිදසුනක් නිදහස්කිරීමට,

---

[1] සුතිඅ. පි. 30

[2] Māra - Generally regarded as the personification of Death, the Evil One, the Tempter . DPPN 611

[3] Māra (fr, **mr** later Vedic, māra killing, destroying, briging death, pestilence, cp Lat. mors death, morbus illness. Lth. māras death.pestilence) death; usually personified as Np. Death,the Evil One, , the Tempter. (the Buddhist Devil or Principle of destruction). Sometimes the term māra is applied to the whole of the worldy existance, or the realm of rebirth, as opposed to Nibbana. PED PTS 530

නිදහස්වීමට විරුද්ධවන්නා) ඔහු (පාලි)ග්‍රන්ථවල දෙයාකාරයටම සඳහන්වෙයි. (එනම්) සජීවී පුද්ගලයෙක් ලෙස ද නිදසුනක්, දෙවියෙකු මෙන් ද මරණයම පුද්ගලත්වයෙන් ද දක්වා ඇත.[1]

## කාළයා- කළුවා- *කණ්හ*

*කණ්හාති මාරං ආලපති. සො හි කණ්හකම්මත්තා කණ්හාභිජාතිතාය ච කණ්හොති වුච්චති*[2]

කාළයා-කළුවා යනු මාරයාට කියන නමකි ඔහු වනාහි කාළකර්ම කරණ හෙයින් ද කළුව ජනිත හෙයින් ද කාළයා-කළුවා යයි කියනුලැබේ.

*කණ්හකම්මත්තා කණ්හො කාමාවචර ඉස්සරත්තා*[3]
කෘෂ්ණකර්ම ඇතිහෙයින්, කමාවචරඉසුරු හෙයින් කළුවාය.

*අකුසලධම්මෙ නියුත්තත්තා කණ්හො*[4]
අකුසල්හි නියුක්ත හෙයින් කළුවා නම්.

කණ්හො යනු මාරයාට කියන තවත් නමකි. පදගතාර්ථ වශයෙන් කෘෂ්ණයා, කාළයා, කළුවා යනුවෙන් තේරුම් දෙයි. කළු (කණ්හ) යන්න අප්‍රිය, නරක, නපුරු, හොඳනැති යන අර්ථයන්හි යෙදෙයි. විරුද්ධ පදය සුදු යනුය එය ප්‍රිය, යහපත්, හොඳ, යන තේරුම් දීම සඳහා ව්‍යවහාරවෙයි.
පව් කරණහෙයින්, නො මනාදෙය කරණහෙයින්,

---

[1] Māra (lit. : ' the killer' ), is the Buddhist "Tempter" –figure. He is often called " Māra the Evil One (*Pāpimā Māro* ) or Namuci (lit. : 'the non- liberator', i.e.the opponent of liberation). He appears in the texts both as a real person ( i.e.as a deity) and as personification of evil...
BD 97

[2] ථෙරඅ. පි.61, . මහානිඅ. පි..328

[3] මහානිඅ. පි..328

[4] චූනිඅ. පි 26

අකුසල්කරණනිසා මාරයාට කාළයා, කළුවා,යි කියයි.

පාලි සාහිත්‍යයේ කණ්හ-කළු යන්න බොහෝ තැනක අකුශල සඳහා යෙදී තිබේ.

*කණ්හන්ති කාලං(කාළං) දසඅකුසලකම්මපථ කම්මං*[1]
කණ්හ යනු කළුය, දශඅකුශල කර්මපථ කර්මයෝය.

මේ අනුව එම පදයෙන් දස අකුසල් ගැනෙයි. එනම්; කයින් කෙරෙණ සතුන් මැරීම, නොදුන් දෙය ගැනීම, කාමයේ වරදවා හැසිරීම. වචනයෙන් කෙරෙණ බොරු කීම, කේලම් කීම, පරුෂ වචන කීම, හිස්වචන කීම. මනසින් සිදුවෙන දැඩිලෝභය, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය.

*කණ්හන්ති අකුසලධම්මං*[2]

කාළ යනු අකුශල ධරමයෝ ය.

*කණ්හං ධම්මං විප්පහාය ...*

කළු ධර්ම හැර...

*තත්ථ කණ්හ ධම්මන්ති කායදුච්චරිතාදිභෙදං අකුසල ධම්මං ජහිත්වා* [3]

එහි කාළ ධර්මයනු කාය දුශ්චරිතාදි අකුශල ධර්ම හැරදමා යනුයි

කණ්හ යන්න සංඥා නාමයක් ලෙස ද යෙදී තිබේ.

---

[1] දීනිඅ. II . පි. 749
[2] සනිඅ. III පි . 118
[3] ධපඅ. පි 364.

*'කණ්හො ච බුද්ධො'*[1]

## අධිපති.

*ඡසු දෙවලොකෙසු අධිපතිත්තා අධිපති*[2]

සදෙව් ලොවට ප්‍රධානියා නිසා අධිපති නම් වෙයි
මාරයාට අධිපති නම ද සඳහන්වෙයි. ඔහු දිව්‍යලෝක හයට ප්‍රධානියා වන හෙයින් ඒ නම යොදා තිබේ.

( දිව්‍ය ලෝක

දිව්‍යමය සැප සම්පත් ඇති ලෝක මෙහිලා අදහස් කරයි. ස්වර්ග ලෝක සුගති යනුවෙන් ව්‍යවහාරයේ යෙදෙයි. එම ලෝක හයකි. (*ඡ සග්ගලොකා*) දෙවියන් වෙසෙන ලෝක දිව්‍ය ලෝක නම් වෙයි. එම දෙවිවරු සාමාන්‍ය මිනිසුනට නොපෙනෙති.

චාතුම්මහාරාජික ය, තවුතිසා/තාවතිංස ය, යාම ය, තුසිත ය, නිර්මාණරති ය, පරනිර්මිත වසවර්ති ය යි.

එහි පළමුවැන්න චාතුම්මහා රාජික සග්ගලෝකයයි. මේ සංඥා නාමය මෙයට ලැබුණේ සතරවරන් දෙවිවරුන් එහි වෙසෙන හෙයිනි. ඔවුහු සිවු දිශාවන් ආරක්ෂා කරති.

දෙවැන්න තවුතිසා / තාවතිංස දේවලෝකයයි. මඝ මානවකයා තවත් 32කු සමග සමාජසේවා කිරීම නිසා ලැබූ පින් බලෙන් ඔවුහු තිස්තුන්දෙනෙක් මෙහි උපන්හ. ඒ නිසා තාවතිංස නම් විය. මෙය අසුරයන්ගේ වාසස්ථානයකි. මඝ තෙමේ සක්දෙව් වී මෙහි උපන්නේය. හෙතෙම අසුරයන් පලවා හැරියේය. අසුරයෝ අසුර ලොව උපන්නෝය. මහාමායා දේවිය මිය ගොස් මාතෘ දිව්‍ය රාජයා නමින් මෙහි උපන්නාය. තථාගතයන් වහන්සේ තවුතිසාවට වැඩම කොට මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දෙසූහ.

---

[1] මනි. .III පි. 210
[2] චූනිඅ. පි. 26

ඊලඟට සඳහන් වන්නේ යාමය නම් දේවලෝකයයි. පරමත්ථජෝතිකාවට අනුව දිව්‍ය සුවය විඳින හෙයින් යාමයයි කියනු ලැබේ. *(තත්ථ දිබ්බ සුඛං යාතාපයාතා සම්පත්තාතීති යාමා)*

තුටු පහටු සිතින් වෙසෙන දෙවියන් වෙසෙන දෙව්ලොව තුසිත දිව්‍යලෝකයයි. තුසිත මෙය සුන්දර දෙව් ලොවකි. බෝසත්වරු බුදුවීමට පෙර මෙහි උපදිති. ගෝතම බුදුන් තුසිත දෙව්ලොව සිටියේ සේතකේතු නමිනි. මෛත්‍රී බුදුහු ද නාථදෙව නමින් දැනට එහි වෙසෙති. බෝසත්වරුන්ගේ දෙමාපියෝද තුසිතයේ උපත ලබති.

පස්වැනි තැනට එන්නේ නිර්මාණරති දෙව්ලොවය. තමා විසින්ම නිර්මාණය වීමෙහි ඇලුණ දෙවිවරු මෙහි වෙසෙති. වර්ණය, ස්වරූපය, කැමැති පරිදි ඔවුනට වෙනස් කර ගත හැකිය.

හය වැනි දේවලෝකය නම් පරනිර්මිත වසවර්තියයි. අන්‍යයන් නිර්මාණය කිරීමෙහි ඇලුණ අය වෙති. මෙය කාම ලෝකයන්ගේ උසස් ම තැනය. )

මෙම දිව්‍යලෝක හයට අධිපතිත්වය දරන හෙයින් මාරයාට අධිපති යන නමව්‍යවහාර වෙයි[1]

*කාමාවචරිස්සරත්තා අධිපති*[2]

කම්සැපට නායක හෙයින් අධිපති නම වෙයි. පඤ්ච ඉන්ද්‍රියන් පිනවීම කරන්නන්ට අධිපතිත්වය දරයි.

---

[1] DPPN. වෙ. සග්ගලොකා

[2] මහානිද. පි ..328

## අන්තක- *අන්තකො*

මාරයාට කියන තවත් නමකි අන්තක. පදගතාර්ථ වශයෙන් අන්තය, කෙළවර කරන්නා, අවසානය කරන්නා. අන්තක ශබ්දයේ ප්‍රථමා ඒකවචනය අන්තකො යනුයි.

*පුප්ඵානි හෙව පචිනන්තං- ඛ්‍යාසත්ත මනසං නරං*
*අතිත්තං යෙව කාමෙසු - අන්තකො කුරුතෙ වසන් 'ති*

මාරයා පඤ්චකාම සම්පත් නමැති මල්ම සොයන එහිම ඇලුණු සිත ඇති පඤ්ච කාම සම්පත්තියේ සෑහීමට පත් නො වුණ මිනිසා වසඟයට ගනී.

මෙම ගාථාව විස්තර කරණ ධම්මපදට්ඨ කථාව මෙසේ කියයි.

*අන්තකො කුරුතෙ වසන්ති , මරණසංඛාතං අන්තකො කන්දන්තං පරිදෙවන්තං ගහෙත්වා ගච්ඡන්තො අත්තනො වසං පාපෙතී 'ති අත්ථො.*[1]

කෙළවරකරන්නා වසඟයට ගනී. යනු මරණය නම් වූ කෙළවරකරන්නා අඬන්නන් වැළපෙන්නන් ගෙන යමින් තමා යටතට ගනියි යනුයි.

මෙහි කෙළවරකරන්නා (අන්තකො) යන්න මාරයා යන අර්ථයට යොදා තිබේ.

---

[1] ධපඅ. පි .224.

## මුදා නො හරි-මුදා නො හරින්නා- නමුචි

නමුචි යනු මාරයාට ව්‍යවහාර වන තවත් නමකි. පදගතාර්ථ වශයෙන්, මුදා නොහරි, මුදා නො හරින්නා යනුයි.

න- යනු නො, නොවේ, නැත. මුඤ්චති යනු මුදයි, නිදහස් කරයි. නමුඤ්චති - මුදා නොහරි.

සං. මුච් පා. මුච යන ධාතුප්‍රකෘතියෙන් සෑදුන වචනයකි.

*නමුචීති මාරං ආලපති* [1]

මුදානොහරින්නා යයි මාරයට කියයි.

*නමුචීති මාරො, සො හි අත්තනො විසයා නික්ඛමිතුකාමෙ දෙව මනුස්සෙ නමුඤ්චති, අන්තරායං නෙසං කරොති තස්මා නමුචීති වුච්චති.* [2]

නො මුදන්නා යනු මාරයාය, ඔහු වනාහි තමන්ගේ විෂයෙන් මිදෙන්නට කැමති දෙවි මිනිසුන් නො මුදයි, ඔවුන්ට බාධා කරයි, එහෙයින් (නමුචි) නො මුදන්නා යයි කියයි.

*මුඤ්චිතුං අප්පදානට්ඨෙන නමුචි* [3]

මුදාහැරීම නො දෙන හෙයින් නොමුදාහරින්නාය

*පාප ජනං න මුඤ්චතීති නමුචි* [4]
පව් කරණ ජනයා නො මුදාහරිණ හෙයින් එනම් වෙයි. '

---

[1] සනිඅ. I පි. 101
[2] සුනිඅ. II. පි. 328
[3] මහානිඅ. පි. 328
[4] චූනිඅ. පි. 26

## ප්‍රමාදවූවන්ගේ ඤාතියා- පමත්තබන්ධු

*පමත්තබන්ධූති මාරං ආලපති, සො හි යෙ කෙචි ලොකෙ පමත්තා තෙසං බන්ධු.* [1]

පමත්තබන්ධු යනු මාරයට නමකි, ඔහු වනාහි ලෝකයේ යම් කෙනෙක් (කුසල් කිරීමට) ප්‍රමාද වේ නම් ඔවුන්ගේ ඤාතියා ය. '

*අනත්ථෙන පමත්තෙ සත්තෙ බන්ධතීති පමත්තබන්ධූ* [2]

අනර්ථයෙන් පමා වූ වන් බැඳතබන නිසා එනම් වෙයි.
*පමත්තස්ස බන්ධූ = පමත්තබන්ධූ*, ප්‍රමත්තයාගේ ඤාතියා = ප්‍රමත්තඤාති.

## ප්‍රජාපති- පජාපති

ප්‍රජාපති යනු මාරයාට කියන තවත් නමකි. මජ්ඣිමනිකායේ මූලපරියාය සූත්‍රය විස්තර කරණ අටුවාවේ ප්‍රජාපති යනු මාරයා ය. යි, සඳහන් වෙයි.

*පජාපතින්ති එත්ථ පන මාරො පජාපතීති වෙදිතබ්බො* [3]
මෙහි ප්‍රජාපති යනු මාරයා ය.

*පජානං පති= පජාපති*

ප්‍රජාවට ස්වාමියා වන හෙයින් ප්‍රජාපති නම්.

---

[1] සනිඅ. 1 . පි .146
[2] උඅ. පි. 245
[3] මනිඅ. 1 . පි ..31

## අන්තයට ගිය- *අන්තගූ*

අන්තගූ , පදගතාර්ථ වශයෙන් කෙළවරට ගිය යනුයි. මාරයාට ම වහරන තවත් නමකි අන්තගූ. පව් කිරීමෙහි අන්තයට ම ගිය පුද්ගලයා.
*අකුසලධම්මානං අන්තං ගතත්තා අන්තගූ*[1]

## මෘත්‍යු මාරයා - *මච්චු මාරො.*

පස් මරුන්-පඤ්ච මාර යන තැන මච්චු මාරො යන්නෙන් අදහස් කරන්නේ මියයෑම, මරණයයි. ඒ ඒ සත්ත්ව වර්ගවලින් සත්ත්වයන් චුතවීම, මියයෑම, අභාවය, නැතිවීම මරණය නමි.

මච්චු (සෑදී තිබෙන්නේ වෛදික මෘත්‍යු , යන්නෙන්ය. ධාතුප්‍රකෘතිය මෘ; යනුයි. අර්ථයෙන් වෙනස්කමක් ඇත. වේද සංස්කෘතයේ මරණය පමණි) මාරදෙවියෝ, බුදුසමයේ මාර හෝ යමට සමානය....[2]

මෘත්‍යු, සංස්කෘත ඉංග්‍රි ශබ්දකෝෂයේ, පුල්ලිඟු ශබ්දයකි. (කලාතුරකින් ස්ත්‍රීලිඟු ශබ්දයක් ලෙස ඇත) මරණය, මියයෑම විවිධ ක්‍රමයෙන් සිදුවන මරණ දක්වා ඇත. රෝග වලින් හෝ අනතුරුවලින් සිදුවන මරණ 100ක් සහ මහලුවීමෙන් සිදුවන එක් ස්වාභාවික මරණයක් වශයෙනි) පුද්ගලාරෝපිත මරණය මාරදෙවියෝ[3]
*මෘත්‍යුබීජ* මියයනබීජ, උණ, වේවැල්. (ඵල-බීජ දැරීමෙන් පසු

---

1 චූලනිද. පි .26
2 **Maccu** (in form = Vedic mrtyu, fr, **mr** ; in meaning differentiaed , the Ved. – Sk. meaning "death" only) the God of Death , the Buddhist Māra , or sometimes equialent to Yma...PED. 513 PTS
3 **Mrityu**, m. (very rarely f.) death, dying, RV. &c. &c.; (death of different kinds are enumereted , 100 from disease or accident and one natural from old age ; ifc. ='d° caused by or through' ) ; Death personified , the god of d° SED 827.

මැරෙණ හෙයිනි)[1]
*මාතුපූසූති,* කක්කුටට්ටී (ප්‍රසූතියෙන් මැරෙණ හෙයිනි) [2] (එම කෘතියේම)

*අප්පමාදො අමතපදං*
*පමාදො මච්චුනො පදං*
*අප්පමත්තා නමීයන්ති*
*යෙ පමත්තා යථා මතා*[3]

අප්‍රමාදය නිවනට මාර්ගයයි. ප්‍රමාදය මරණයට මාර්ගයයි. අප්‍රමාදවූවෝ මිය නො යත්. ප්‍රමාදවූ වෝ මැරුණා හා සමානය.

*මච්චුනො ති මරණස්ස, පදන්ති උපායො මග්ගො. පමත්තො හි ජාතිං නාතිවත්තති . ජාතො ජීයති චෙව මීයති චා'ති පමාදො මච්චුනො පදං නාම හොති, මරණං උපෙති.*[4] ,

මච්චුනො යනු මරණයටය, *පදන්ති* උපාය, මාර්ගය. ප්‍රමාද වූ කෙනා වනාහි ඉපදීම නො ඉක්මවූයේය. උපන්න තැනත්තා දිරා යෑම මෙන්ම මිය යෑම ද වෙයි එහෙයින් ප්‍රමාදය මරණයට මාර්ගය වෙයි. මරණයට පත්වෙයි.

*තං පුත්තපසුසම්මත්තං*
*බ්‍යාසත්ත මනසං නරං*
*සුත්තං ගාමං මහොඝොව*
*මච්චු ආදාය ගච්ඡති* [5]

මහා ජලස්කන්ධකින් නිඳිගත් ගමක් ගසා ගෙනයන්නාක් මෙන්

---

[1] - ***bīja***, m. ' dying after production of seeds', the bamboo – cane, ib.
[2] - ***sūti***., f. 'dying in parturition' a female crab, ib.
[3] ධපඅ. පි 142.
[4] ධපඅ. පි .143
[5] ධපඅ. පි. 688

දූදරුවන් ආදිය කෙරහි ආශක්ත මිනිසා මරුවා විසින් ගෙනයනු ලැබේ. මෙහි මච්චු යනු මරණයයි.

"දෑතෙහි වාරු නැත දෙපය ද විය එලෙස
පිනකුත් කිසිත් නොකෙළෙමි පරලොව පිණිස
මරුවා බලයි මා වෙත ඇර ඇර දෙ ඇස
දැන් වත් යන්ට ඕනෑ පන්සල පෙදෙස

මෙහි 'මරුවා, යන්නෙන් අදහස් වන්නේ මරණයයි. එය පුද්ගලත්වයෙන් සප්‍රාණිකලෙස ප්‍රථමා විභක්ති ඒක වචනයෙන් දක්වා තිබේ.

මරුවැල, එම වැලේ පැටලුනේ නම් මැරෙයි, මරණය සිදුවන හෙයින් මරුවැල නම් වෙයි.

## මරණය (මරණං )

*කතමඤ්චාවුසො මරණං: යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාලකිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො, ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදො ඉදං වුච්චතාවුසො මරණං*[1]

ඇවැත්නි, මරණ කවරෙ යත් : ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ සත්ත්වනිකායෙන් යම් චුතියෙක් චවනාකාරයෙක් බිඳීමෙක් අතුරු දහනෙක් මෘත්‍යු සංඛ්‍යාත මරණයෙක් කාලක්‍රියායෙක් ස්කන්ධයන්ගේ බිඳීමෙක් ශරීරයාගේ නික්ෂේපයෙක් ජීවිතින්ද්‍රියයාගේ උපච්ඡේදයෙක් වේ ද. ඇවැත්නි, මේ 'මරණ' යයි කියනුලැබේ.
*මච්චුමරණන්'ති මච්චු මරණං න ඛණික මරණං*[2]

---

[1] මජ්. III පි .514
[2] දීනිඅ. II පි. 577.

(මෙහි) මච්චුමරණං යනු මරණයයි ක්ෂණික මරණය නො වේ.

*ආයු උස්මා ච විඤ්ඤාණං*
*යදා කායං ජහන්තිමං*
*අපවිද්ධො තදා සෙති*
*පරභත්තං අචෙතනං* [1]

ආයුෂත් (ජීවිතේන්ද්‍රියත්) උණුසුමත් (කර්මජතේධාතුවත්) විඤ්ඤාණයත් යම්කලෙක මේ කය හැරදමාද, එකල්හි බැහරකරණ ලද්දේ (කෘමිගණාදි) මෙරමාහට බත්ව අචේතනව හොවි .

(මරණය, එහි ස්භාවය අනුව ප්‍රභේද කීපයකට බෙදේ. එනම්:-ජීවිතින්ද්‍රිය උපච්ඡේද මරණය, සමුච්ඡේද මරණය, ක්ෂණික මරණය, සම්මුති මරණය, කාල මරණය, අකාල මරණය, කර්මක්ෂය මරණය, ආයුක්ෂය මරණය, උපච්ඡේද මරණය සහ උභයක්ෂය මරණය යනුයි.

ජීවිතින්ද්‍රිය උපච්ඡේද මරණය; එක් භවයකට ඇතුලත් ජීවිතින්ද්‍රිය නැතිවීම, සිඳී යෑම ජීවිතින්ද්‍රිය උපච්ඡේද මරණය නමි.

සමුච්ඡේද මරණය; එනම් රහතන්වහන්සේගේ සියලු සංස්කාරික දුකින් මිදීම නම් වූ මරණයයි.

ක්ෂණික මරණය; මෙයින් කියවෙන්නේ සංස්කාරයන්ගේ වහා සිදුවන ක්ෂණ භංගයයි.

සම්මුති මරණය; ගසමැරුණේය ආදි ක්‍රමයෙන් පවත්නා ලෝක සම්මත මරණය සම්මුති මරණයයි.
කාල මරණය; මෙය ආයුෂය ද පින ද අවසන් වීමෙන් සිදුවෙයි.

---

[1] සනි. .III . පි. 246

අකාල මරණය; උපච්ඡේද කර්මයෙන් - අතුරු බාධකයකින් වන මරණය මෙයින් අදහස්වෙයි.

කර්මක්ෂය මරණය; කළ පින් (යහපත්කර්මය) නිමවීමෙන් සිදුවන්නේ කර්මක්ෂය මරණයයි.
ආයුක්ෂය මරණය; ආයුෂ අවසන්වීමෙන් මෙම මරණයට පත්වෙයි.

උපචඡේද මරණය; කර්මයත් ආයුෂයත් ශේෂව තිබියදී මියයෑම මෙයින් අදහස් කරයි.

උභයක්ෂය මරණය; කර්මයත් ආයුෂයත් එකවර අවසන් වීමෙන් මේ මරණය සිදුවෙයි.[1]

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩවසද්දී කොසොල් රජ තෙමේ උන්වහන්සේ වෙතට පැමිණ, තමාගේ ප්‍රිය, මනාප, දයාබර මිත්තණිය මිය ගිය බවත් හස්තිරත්න අශ්වරත්න ආදිය දීමෙන් හෝ ගම්වර දීමෙන් හෝ මරණයෙන් බේරා ගතහැකි වූ යේ නම් එසේ කළහැකිව තිබුණ බවත් එහෙත් මරණයෙන් බේරා ගත නො හැකි වූ බවත් පැව සීය.
ඒ අවස්ථාවේ තථාගතයෝ මෙසේ වදාළහ.

*සබ්බෙ සත්තා මහාරාජ, මරණධම්මා මරණපරියොසානා මරණං අනතීතා'ති.*

මහරජ, සියලු සත්ත්වයෝ මරණය ස්වභාවය කොට ඇත්තාහ. මරණය කෙළවර කොට ඇත්තාහ. මරණය නො ඉක්ම වූ වෝ ය[2].
තථාගතයන්වහන්සේ මෙම මරණය නැතිකිරීමට, අමතපදය-

[1] සිවි . පි. 343
[2] සන්. I පි. 178

නොමැරෙණ තැන සොයාගැනීමට ක්‍රියා කළහ. දහම් දෙසූහ. සත්ත්වයන් මරණයෙන් නිදහස් නම් උපතක් නැත්නම් දුක්විඳීමක් ද නැත. බුදුහු මෙම පරමාර්ථය බුදුවීමට පෙරම ඇතිකරගත්හ.

සංයුත්තනිකායේ ගොතම සූත්‍රයට අනුව ගෞතමයන්වහන්සේ බෝධිසත්ත්ව කාලයේ ම ජාති, ජරා, ව්‍යාධි, මරණ නැතිකරණ මාර්ගය සෙවූහ. බුදුවීමෙන් පසු පටිච්චසමුප්පාද න්‍යාය දෙසූහ. එම යථාර්ථය තේරුම් ගැනීමෙන් පසු මරණය නැතිකළ හැකිය.

10 *පුබ්බෙව මෙ භික්ඛවෙ, සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි. "කිච්චං වතායං ලොකො ආපන්නො ජායති ච. ජීයති ච, මීයති ච, චවති ච, උප්පජ්ජති ච. අථ ච පනිමස්ස දුක්ඛස්ස නිස්සරණං නප්පජානාති ජරාමරණස්ස කුදස්සු (කුදාස්සු) නාම ඉමස්ස දුක්ඛස්ස නිස්සරණං පඤ්ඤායිස්සති ජරාමරණස්සා"ති.*[1]

10 මහනෙනි, බුදුවීමට පෙර ම බුදුනො වූ බෝසත් වූ මට මේ සිත පහළ විය: ඒකාන්තයෙන් මේ ලෝකයා දුකට පැමිණියේය. උපදියි. දිරයි. මියෙයි. (මියයයි ). ච්‍යුතවෙයි. නැවතඋපදී. එහෙත් දිරීම මැරීම පිළිබඳ දුකින් නික්ම යෑමෙක් නො දනී. කවර කලෙක නම් ජරාමරණ සංඛ්‍යාත මේ දුකින් නික්ම යෑමෙක් පෙණේද යනුවෙනි.

අරියපරියේසන සූත්‍රයේ ආර්යන්ගේ සහ අනාර්යන්ගේ සෙවීම් සඳහන්වෙයි. එහි ද දේසිත පරිදි බුදුරජාණන්වහන්සේ මරණය නැතිකිරීම සඳහා අනුගමනය කළයුතු පිළිවෙත සොයාගත්හ, ඉන්පසු අමත තැනට යන ලෙස දහම් දෙසූහ.

16 ... *යන්නූනාහං අත්තනා ජාතිධම්මො සමානො ජාතිධම්මෙ ආදීනවං විදිත්වා අජාතං අනුත්තරං යොගක්ඛෙමං*

---

[1] සනි. II. පි. 16

*නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා ජරාධම්මො සමානො ජරාධම්මෙ ආදීනවං විදිත්වා අජරං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා බ්‍යාධිධම්මො සමානො බ්‍යාධිධම්මෙ ආදීනවං විදිත්වා අමතං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා මරණ ධම්මො සමානො මරණධම්මෙ ආදීනවං විදිත්වා අබ්‍යාධිං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා සොකධම්මො සමානො සොකධම්මෙ ආදීනවං විදිත්වා අසොකං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍යං, අත්තනා සංකිලෙසධම්මො සමානො සංකිලෙධම්මෙ ආදීනවං විදිත්වා අසංකිලිට්ඨං අනුත්තරං යොගක්ඛෙමං නිබ්බානං පරියෙසෙය්‍ය න්ති.*

17 *සො ඛො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොව සමානො සුසුකාළකෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා, අකාමකානං මාතාපිතුන්නං අස්සුමුඛානං රුදන්තානං, කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිං, සො එවං පබ්බජිතො සමානො කිංකුසලගවෙසී අනුත්තරං සන්තිවරපදං පරියෙසමානො...*[1]

16 ....මම ජාතිධර්ම වූයෙම් ජාතිධර්මයෙහි ආදීනව දැන ජාතියක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනව. ජරාධර්ම වූයෙම් ජරාධර්මයෙහි ආදීනව දැන ජරාවක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනව. තෙමේ ව්‍යාධිධර්ම වූයෙම් ව්‍යාධි ධර්මයෙහි ආදීනව දැන ව්‍යාධියක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනව. තෙමේ මරණධර්ම වූයෙම් මරණධර්මයෙහි ආදීනව දැන මරණයක් නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනව. තෙමේ ශෝකධර්ම වූයෙම් ශෝකධර්මයෙහි ආදීනව දැන ශෝකයක්

[1] මනි. I පි. 400

නැති නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනව. තෙමේ සංක්ලෙශධර්ම වූයෙම් සංක්ලෙශධර්මයෙහි ආදීනව දැන සංක්ලිෂ්ට නො වූ නිරුත්තර වූ යෝගක්ෂේම වූ නිවන සොයන්නේ නම් මැනවයි කියායි.

17 මහණෙනි, ඒ මම පසුකාලයෙහි ළදරු වූයෙම් ම ඉතා කළුකෙස් ඇත්තේම පළමුවන වයස වූ සොඳුරුයොවුනෙන් යුක්තවූයේම, නො කැමති වූ කඳුළු පිරුණු මුහුණු ඇති මවුපියන් හඬද්දී කෙස්රවුළු බා කහවත් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණියෙමි. ඒ මම මෙසේ පැවිදි වූයෙම් 'කුසලය කුමක්දැ'යි සොයන සුලුවූයෙම් නිරුත්තර වූ උතුම් වූ ශාන්තිපදය සොයමින් ...

මේ කරුණු අනුව පැහැදිළිවන්නේ උන්වහන්සේ අමත පදය, නිවන සොයා ගත්බවයි. නො මැරෙණ තැනට පැමිණියහ. මරණය නැතිකළහ. මේ නිසා ඒ මරණය ම පුද්ගලත්ව ආරෝපණයෙන් දකවා ඇත. (මච්චමාරො).

# මහාවග්ගපාළියෙහි

## නොමිඳුනේ යයි කියයි

පාලිසාහිත්‍යයට අනුව පවිටු මාරයා පිළිබඳව මුලින් ම තොරතුරු සඳහන් වන්නේ විනය පිටකයේ මහාවග්ගපාළියේ ය.

රහතුන් හැට එක් නමක් ඇති වීමෙන් පසු තථාගතයෝ තමන් දේව මානුෂික සියලු බැඳීම් වලින් මිදුණ බවත් භික්ෂූන්සැම ද මිදුණු බවත් බොහෝ දෙනාගේ යහපත පිණිස දහම් දෙසීමට සිවු දිසාවන්ට යනලෙසත් තමන් ද උරුවේලාවේ සේනානි ගමට යනබවත් පැවසූහ. එකල්හි පවිටු මාර තෙමේ බුදුන් වෙතට පැමිණ මෙසේ කීය.

(මාරයා) *බද්ධො'සි සබ්බ පාසෙහි*
*යෙ දිබ්බා යෙ ච මානුසා*
*මහා බන්ධන බද්ධො'සි*
*න මෙ සමණ මොක්ඛසී'ති.*

දෙවියන් පිළිබඳවූ ද මිනිසුන් පිළිබඳවූ ද යම්කෙලෙස් මළපුඩු ඇද් ද, ඒ සියලු කෙලෙස් මළපුඩුවලින් බඳනාලද්දේ වෙහි ය. ඒ මහත් කෙලෙස් බැඳුමෙන් බැඳුනේ වෙහි ය. ශ්‍රමණය, මාගේ විෂයෙන් නො මිදෙන්නෙහිය.

මාරයාට පිළිතුරුවශයෙන් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

(භගවත්හු) *මුත්තො'හං සබ්බ පාසෙහි*
*යෙ දිබ්බා යෙ ච මානුසා*
*මහා බන්ධන මුත්තොම්'හි*
*නිහතො ත්වමසි අන්තකා'ති*

මම දෙවියන් පිළිබඳවූ ද මිනිසුන් පිළිබඳවූ ද යම්කෙලෙස් මළපුඩු කෙනෙක් වෙද්ද, ඒ සියලු පාශයන්ගෙන් මිදුණේ වෙමි.

ඒ මහත් කෙලෙස් බැඳුමෙන් මිදුණෙමි වෙමි. මාරය, තෝ නැසුනේ වෙහි ය.

නැවතත් මාරයා මෙසේ පැවසී ය.

(මාරයා) *අන්තලික්ඛ චරො පාසො*
*ය්වායං චරති මානසො*
*තෙන තං බාධයිස්සාමි*
*න මෙ සමණ මොක්ඛසී"ති*

අහස හැසිරෙණ අන්තලික්ඛ චර නම් වූ සිතෙහි හටගත්තා වූ යම් මේ රාගපාශයක් වේ ද එයින් තා බඳින්නෙමි. ශ්‍රමණය, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය.

මාරයාට පිළිතුරුවශයෙන් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

(භගවත්හු) *රූපා සද්දා රසා ගන්ධා*
*ඵොට්ඨබ්බා ච මනො රමා*
*එත්ථ මෙ විගතො ඡන්දො*
*නිහතො ත්වමසි අන්තකා'ති*

සිත්කලු වූ රූපයෝ ද ශබ්දයෝ ද රසයෝ ද ගන්ධයෝ ද ස්පර්ශයෝ ද යන මේ පස්කම් කෙරහි පැවති මාගේ ආලය වෙසසින් පහ ව ගියේය. මාරය තෝ නැසුනේ වෙහිය.[1]
ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නො සතුටු ව නො පෙනී ගියේ ය.
මෙයට සමාන සිද්ධියක් එම කෘතියෙහිම සඳහන්වෙයි. වස් විසූ භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් අමතා තමන් විසින්

[1] මහාව. පි. 42

උපායවශයෙන් මෙනෙහි කිරීමෙන් ද උපායෙන් මනා සේ ප්‍රදහන වීර්ය කිරීමෙන් ද අනුත්තර වූ අර්හත්ඵල විමුක්තිය ලබාගත් බවත් නිරුත්තර වූ අර්හත්ඵල විමුක්තිය ප්‍රත්‍යක්ෂ කළ බවත් භික්ෂූන්ට ද එසේ කරන ලෙසත් දෙසූහ. ඉක්බිති පවිටු මාර තෙමේ බුදුන් වෙතට පැමිණ මෙසේ පැවසීය.

(මාරයා) *බද්ධො'සි මාර පාසෙහි*
*යෙ දිබ්බා යෙ ච මානුසා*
*මහා බන්ධන බද්ධො'සි*
*න මෙ සමණ මොක්ඛසී'ති.*

දෙවියන් පිළිබඳවූ ද මිනිසුන් පිළිබඳවූ ද යම් මාරපාශ කෙනෙක් වෙත් නම්, ඒ සියලු මාරපාශවලින් බැඳුනේ වෙහි ය. මාරබන්ධනවලින් බඳනා ලද්දෙහිය. ශ්‍රමණය, මාගේ විෂයයෙන් නො මිදෙන්නෙහි ය.

මාරයාට පිළිතුරුවශයෙන් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

(භගවත්හු) *මුත්තො'හං මාර පාසෙහි*
*යෙ දිබ්බා යෙ ච මානුසා*
*මාර බන්ධන මුත්තොම්'හි*
*නිහතො ත්වමසි අන්තකා'ති*

මම දෙවියන් පිළිබඳවූ ද මිනිසුන් පිළිබඳවූ ද යම් මාරපාශ කෙනෙක් වෙද්ද, ඒ සියලු මාරපාශයන්ගෙන් මිදුනේ වෙමි. මාරබැඳුම්වලින් මිදුණෙම් වෙමි. මාරය, තෝ නැසුනේ වෙහි ය. ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නො සතුටු ව නො පෙණී ගියේ ය.[1]

[1] එම කෘතියේම පි. 46

## වේරඤ්ජබමුණට කළ දෙය

*වෙරඤ්ජෙන බ්‍රාහ්මණෙන නිමන්තිතො පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං වස්සං උපගඤ්ඡි. වෙරඤ්ජො බ්‍රාහ්මණො මාරාවට්ටනෙන ආවට්ටො එකදිවසම්පි සත්ථාරං ආරබ්භ සතිං න උප්පාදෙසි. වෙරඤ්ජාපි දුබ්භික්ඛා අහොසි. භික්ඛූ සන්තරබාහිරං වෙරඤ්ජං පිණ්ඩාය චරිත්වා පිණ්ඩපාතං අලභන්තා කිළමිංසු. තෙසං අස්සවාණිජකා පත්ථපත්ථපුලකං භික්ඛං පඤ්ඤාපෙංසු*[1].

බුදුරජාණන් වහන්සේ වේරඤ්ජාවට වැඩම කළ අවස්ථාවේ වේරඤ්ජාබ්‍රාහ්මණයා එහි වස් එළඹෙන්නට අයැදියේ ය. ඇරයුම පිළිගත් තථාගතයෝ තවත් භික්ෂූන් පන්සියයක් සමඟ වේරඤ්ජාවේ වස් එළඹුණහ. ආරාධනය කළ වේරඤ්ජාබ්‍රහ්මණයාට මාරාවිෂ්ට වූ හෙයින් ශාස්තෘන් වහන්සේ පිළිබඳ ව සිහි වූයේ ම නැත. සිවුපසයෙන් උපස්ථාන නො කෙළේ ය.
අශ්වවෙළඳුන් වෙසෙන අස්හලට පිඩුසිඟා ගොස් යන්තමින් ලැබුණ පිණ්ඩාහාරයෙන් යැපුණාහ.

---

[1] ධපඅ. පි.. 360, සම I පි 178

# දීඝනිකායෙහි.

## අකාල ආරාධනය

### මහාපරිනිබ්බාන සූත්‍රය 3

බුදුහු උරුවෙල් දනව්වේ නේරඤ්ජරා ගංගාතීරයේ අජපාල නුගරුක්මුල වැඩවසද්දී පවිටු මාරයා තථාගතයන් වහන්සේට පිරිනිවන්පාන ලෙස අකල් ආරාධනය කෙළේ ය. බුදුහු තම ශාසනය තවම ස්ථාවර බවට පත් නො වූණ බව වදාරා මාරයාගේ ආරාධනය නො පිළිගත්හ.

*73 එකමිදාහං ආනන්ද සමයං උරුවෙලායං විහරාමි නජ්ජා නෙරඤ්ජරාය තීරෙ අජපාලනිග්‍රොධමූලෙ පඨමාභි සම්බුද්ධො. අථ ඛො ආනන්ද මාරො පාපිමා යෙනාහං තෙනුපසංකමි උපසංකමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා මං එතදවොචඃ පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො' දානි භන්තෙ භගවතො'ති.*

73 අනඳයෙනි, එක් කලෙක මම බුදු වැ පළමුකොට ම උරුවෙල් දනව්වෙහි නිල්දලා නී තෙර (ගංගාතීරයේ ) අජපල් නුගරුක්මුලැ වෙසෙමි. අනඳයෙනි, එ කලැ පවිටු මරු මාවෙත එළැඹියේ ය. එළැඹ එකත්පස් වැ සිටියේ ය. අනඳයෙනි, එකත්පස් වැ සිටියා වූ ම මර තෙම 'වහන්ස, භගවත්හු දැන් පිරිනිවෙත්වා, සුගත්හු පිරිනිවෙත්වා දැන් භගවත්නට පිරිනිවෙන්නට කල් ය' යි මෙ බස් කී ය.

*එවං වුත්තො'හං ආනන්ද, මාරං පාපිමන්තං එතදවොචංඃ 'න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි යාව මෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිපටිපන්නා*

*අනුධම්මචාරිනො, සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤාපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති, උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති.*

අනඳයෙනි, මෙසේ කියන ලද මම පවිටු මරහට මෙය කීමි. 'පවිට, මා සවු (ශ්‍රාවක) මහණහු යම්තාක් කල් ව්‍යක්ත ද විනීත ද විසාරද ද බහුශ්‍රැතද ධර්මධර ද ධරමානුධර්මප්‍රතිපන්න ද සම්‍යක්ප්‍රතිපන්න ද අනුධර්මචාරී ද නො වන්නාහු නම්, ස්වකීය ආචාර්යවාදය ඉගෙන නො කියන්නාහු නම්, නො දෙසන්නාහු නම්, නො පනවන්නාහු නම්, නො පිහිටුවන්නාහු නම්, විවෘත නො කරන්නාහු නම්, බෙදා නො දක්වන්නාහු නම්, ප්‍රකට නො කරන්නාහු නම්, පහළවූ පරප්‍රවාදය කරුණු සහිත ව මොනවට නිගහා නෛර්යාණික කොට දහම් නො දෙසන්නාහු නම්, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි.

*න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි- යාව මෙ ඉදං බ්‍රහ්මචරියං න ඉද්ධඤ්චෙව භවිස්සති ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙව මනුස්සෙහි සුප්පකාසිතන් 'ති* [1] .

යම්තාක් මගේ මේ සසුන් බඹසර සමෘද්ධ නො වන්නේද, ස්ඵීත නො වන්නේ ද, විස්තාරිත නො වන්නේ ද, බොහෝ දෙනා අතර පැතුරුණේත් පෘථුභූතයක් නො වන්නේ ද, යම්තාක් දෙවි මිනිසුන් විසින් සුප්‍රකාශිතත් නො වන්නේ ද, ඒ තාක් නො පිරිනිවෙන්නෙමි යි.

නැවත පවිටු මාරයා චාපාල චෛතියෙහිදී ද ශාසනය ස්ථාවර වූ හෙයින් පිරිනිවීමට දැන් සුදුසු යි තථාගතයන්ට පිරිනිවන්පාන්නට ආරාධනා කෙළේ ය.

---

[1] දීනි. II. පි. 177

*74 ඉදානෙව බො ආනන්ද, අජ්ජ චාපාලෙ චෙතියෙ මාරො පාපිමා යෙනාහං තෙනුපසංකමි උපසංකමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො බො ආනන්ද මාරො පාපිමා මං එතදවොචඃ පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො' දානි භන්තෙ භගවතො* [1] . ...

අනඳයෙනි, දැනුදු අද චාපාල චෛත්‍යයෙහි එ කලැ පවිටු මරතෙම මා කරා එළැඹියේ ය. එළැඹ එකත්පස් වැ සිටියේ ය. , එකත්පස් වැ සිටියේම 'වහන්ස, භගවත්හු දැන් පිරිනිවෙත් වා, සුගත්හු පිරිනිවෙත් වා දැන් භගවත්නට පිරිනිවෙත්නට කල් ය'. ...

*එතරහි බො පන භන්තෙ භගවතො බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව ඵීතඤ්ච විත්ථාරිකං බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙව මනුස්සෙහි සුප්පකාසිතං පරිනිබ්බාතු'දානි භන්තෙ භගවා, පරිනිබ්බාතු සුගතො. පරිනිබ්බානකාලො' දානි භන්තෙ භගවතො'ති* [2]

වහන්ස, දැන් වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සසුන් බඹසර සමෘද්ධ ද, ස්ඵීත ද විස්තාරිත ද, බහුජන්‍ය ද පෘථුභූත ද දෙව් මිනිසුන් විසින් සුප්‍රකාශිත ද වේ. වහන්ස, දැන් භගවත්හුට පිරිනිවෙත්නට කල්වේ යැ යි කීය.

*එවං වුත්තෙ අහං ආනන්ද, මාරං පාපිමන්තං එතදවොචංඃ 'අප්පොස්සුක්කො ත්වං පාපිම හොහි. න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති. ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී ' ති ඉදානෙව බො ආනන්ද අජ්ජ චාපාලෙ චෙතියෙ තථාගතෙන සතෙන සම්පජානෙන ආයුසංඛාරො ඔස්සට්ඨො' ති.* [3] .

අනඳයෙනි, මෙසේ කී කල්හි මම 'පවිට, තෝ මන්දෝත්සාහ වව. නො බෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවන වන්නේ ය.

---

[1] එම කෘතියෙහිම. පි .178

[2] එහිම. පි. .178

[3] එහිම. පි.180

මෙයින් තුන්මසක් ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ යි කීමි. අනඳයෙනි, අද මේ දැන් චාපාල චෛත්‍යයෙහි දී තථාගතයන් සිහි ඇතියවුන් නුවණින් දන්නවුන් විසින් ආයුසංස්කාරය හරන ලද්දේ යැ යි වදාළහ.

## සිතට ඇතුල්වෙයි

බුදුරජාණන් වහන්සේ චාපාලචේතියේදී එදින සිට තෙමසකට පසු පිරිනිවන් පාන බව මාරයාට වදාළහ. එය දැන ගත් අනඳ තෙරහු තථාගතයන්ට ආයුකල්පයක් වැඩසිටිනලෙස ආයාචනා කළ නමුත් එම ඇරයුම ප්‍රමාදව (මාරආරාධනයට පසුව) කළ හෙයින් බුදුහු නො පිළිගත්හ.

*එවං වුත්තෙ ආයස්මා ආනන්දො භගවන්තං එතදවොචඃ 'තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං, බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දෙව මනුස්සානන් 'ති.*

*අලං ආනන්ද, මා තථාගතං යාචි. අකාලොදා'නි ආනන්ද, තථාගතං යාචනායා'ති*[1] .

මෙසේ වදාළ කලැ අනඳ තෙරණුවෝ 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට හිත සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ට අර්ථය පිණිස, හිත පිණිස, සුව පිණිස, කපක් වැඩ සිටුනා සේක්වා, සුගතයන් වහන්සේ කපක් වැඩ සිටුනා සේක්වා' යි කීහ.

අනඳයෙනි, කම් නැත තථාගතයන් නො යදින්න, අනඳයෙනි, තථාගතයන් යදිනට දැන් කල් නො වේ' යි වදාළහ. අනඳතෙරණුවෝ තෙවරක් ම කපක් වැඩසිටින

---

[1] දීනි. II . පි. 180

ලෙස තථාගතයන්ට ආයාචනා කළහ. ඒ සියල්ල ව්‍යර්ථ විය. මෙහිදී සතර ඍද්ධිපාද ඇත්හුට කල්පයක් හෝ ඊට වැඩිව හෝ සිටිය හැකි බවත් භාග්‍යවතුන් වහන්සේ සතර ඉද්ධිපාද මැනවින් භාවිත බහුලීකෘත හෙයින් කල්පයක් හෝ ඊට වැඩිව හෝ සිටිය හැකි බවත් බුදුහු නිමිති වශයෙන් කීපවරක්ම වදාළහ. එම අවස්ථාවේ කපක් වැඩවෙසෙන ලෙස අයදියේ නම් එය තථාගතයෝ පිළිගනිති. එසේ නො කළ හෙයින් අනඳ තෙර දුෂ්කෘතයකට, වරදකට පත් වනබවත් දෙසූහ.

76 ... *තථාගතස්ස ඛො ආනන්ද චත්තාරො ඉද්ධිපාදා භාවිතා බහුලීකතා යානීකතා වත්ථුකතා අනුට්ඨිතා පරිචිතා සුසමාරද්ධා. සො ආකංඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පසෙසං වා'ති එවම්පි ඛො ත්වං ආනන්ද තථාගතෙන ඔළාරිකෙ නිමිත්තෙ කයිරමානෙ ඔළාරිකෙ ඔභාසෙ කයිරමානෙ නාසක්ඛි පටිවිජ්ඣිතුං න තථාගතං යාචි:'තිට්ඨතු භන්තෙ භගවා කප්පං, තිට්ඨතු සුගතො කප්පං, බහුජනහිතාය බහුජන සුඛාය ලොකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය ද්වෙ ව මනුස්සානන් 'ති. සචෙ ත්වං ආනන්ද තථාගතං යාචෙය්‍යාසි , ද්වෙ තෙ වාචා තථාගතො පටික්ඛිපෙය්‍ය අථ තතියකං අධිවාසෙය්‍ය. තස්මාතිහානන්ද තුය්හෙවෙතං දුක්කටං, තුය්හෙවෙතං අපරද්ධං*[1] .

76...තථාගතයන් විසින් වනාහි සතරඍද්ධිපාදයෝ භාවිතහ, බහුලීකෘත හ, යානීකෘත හ, වාස්තු කෘත හ, අනුෂ්ඨිත හ, පරිචිත හ, සුසමාරබ්ධ හ. අනඳයෙනි, ඒ තථාගතයෝ කැමැත්තෝ කපක් හෝ කපටඅඩුවෙන් හෝ සිටිය හැකි වන්නාහ. අනඳයෙනි, තථාගතයන් විසින් ඖදාරික නිමිත්ත කරනු ලබන කල්හි, ඖදාරික ආභාසය කරනු ලබන කල්හි, එය දැන ගන්නට නොහැකි වූහු. තථාගතයනට 'වහන්ස, භාග්‍යවතුන් වහන්සේ බොහෝ දෙනාට හිත පිණිස, බොහෝ දෙනාට සුව පිණිස, ලොවට අනුකම්පා පිණිස, දෙවිමිනිසුන්ට අර්ථය පිණිස, හිත

---

[1]දීඝ. II පි. 182

පිණිස, සුව පිණිස, කපක් වැඩ සිටුනා සේක්වා, සුගතයන් වහන්සේ කපක් වැඩ සිටුනා සේක්වා'යි. යාචනය නො කළහු ය. අනඳයෙනි, ඉදින් තෙපි තථාගතයන් යැදූහු නම්, තථාගතයෝ තොප වචන දෙකක් ම පිළිකෙව්නාහ, වැලි තෙවැන්න ඉවසන්නාහ. අනඳයෙනි, එබැවින් මෙහි තොපගේ ම දුෂ්කෘතය, තොපගේ ම වරදය.

තථාගතයන් විසින් චාපාල චෛතියේදී ගත් තීරණය වෙනස් නො කළ හ.

*78 ... 'න චිරං තථාගතස්ස පරිනිබ්බානං භවිස්සති, ඉතො තිණ්ණං මාසානං අච්චයෙන තථාගතො පරිනිබ්බායිස්සතී'ති තඤ්චෙතං තථාගතො ජීවිතහෙතු පුන පච්චාවමිස්සතී'ති නෙතං ඨානං විජ්ජති* [1] .

78 ... නො බෝ කල්හි තථාගතයන්ගේ පිරිනිවීම වන්නේ යැ යි, මෙයින් තෙමසක් ඇවෑමෙන් තථාගතයෝ පිරිනිවෙන්නාහ' යි යම් ඒකාන්ත වචනයෙක් තථාගතයන් විසින් කියන ලද ද ඒ වචනය තථාගතයෝ දිවි හෙයින් නුමුදු වළහන්නාහ යන මෙය නැත්තේය. මේ කාරණය අවිද්‍යමානය.

(අම්බපාලී තමනිවසෙහි හෙටදවස දනට වඩිනලෙස බුදුන්ට ආරාධනා කළාය. ඒ ඇරයුම පිළිගත් තථාගතයන්ට, ඉන් පසු පැමිණි ලිච්ඡවිරජවරු ද අම්බපාලීගේ ආරාධනය දැන දැන ම හෙටදවස ඔවුන්ගේ දනට වඩිනලෙස බුදුන්ට ආරාධනා කළහ. බුදුහු අම්බපාලීගේ ආරාධනය පිළිගෙන ඇති බව වදාරා ලිච්ඡවිරජවරුන්ගේ ඇරයුම නො පිළිගත්හ[2]. )
චාපාල චෛතියෙහිදී තථාගතයන් විසින් ඖදාරික නිමිත්ත කරනු ලබන කල්හි, ඖදාරික ආභාසය කරනු ලබන කල්හි, එය දැන ගන්නට නොහැකිවූයේ, කල්පයක් වැඩසිටින

[1] දීඝ II පි. 186
[2] ඒ පොතේම පි. 153

ලෙස තථාගතයන්ට ආරාධනා කිරීමට ආනන්ද හාමුදුරුවන්ට අමතකවූයේ මාරයා උන්වහන්සේගේ සිතට ඇතුළු වූ හෙයිනි. අනඳතෙරට තිබුණේ පරියුට්ඨාන සිතකි. එහෙයින් පවිටු මරු එසේ කිරීමට අවකාශ ලැබුයේ ය.

57 ... *යථා තං මාරෙන පරියුට්ඨිතචිත්තො*[1].

57... මරහු විසින් මඬනාලද සිතැතියක්හු

( සතරසෘද්ධිපාදයෝ - *චත්තාරො ඉද්ධිපාදා*

කැමැත්ත -(*ඡන්ද*), සිත -(*චිත්ත*), වීර්යය- (*විරිය*), විමසීම- (*වීමංසා*), යනු සතරසෘද්ධිපාදයෝ ය.
සතර ඉද්ධිපාද යන්නෙන් අදහස් කරන්නේ විමුක්තිය නම් වූ සමෘද්ධිය හෙවත් බලය කෙරේ යොමුවන ප්‍රතිපදාව යන්නයි. එම ප්‍රතිපදාව අංග හතරකින් සමන්විත බව කියවෙයි. එනම්, පධාන සංඛ්‍යාත හෙවත් වීර්ය වැඩිම සහිත ඡන්ද සමාධි හෙවත් යහපත කෙරේ ඇති කැමැත්ත කේන්ද්‍රගත කිරීම, ඒ ඇසුරින්ම සිත සමාධි ගත කිරීම (*චිත්තසමාධි*) ඒ ඇසුරින් ම වීර්යය කේන්ද්‍රගත කිරීම (*විරිය*) ඒ ඇසුරින් ම වීමංසනය (*වීමංසා*) කේන්ද්‍ර ගත කිරීම යන හතරය. මේවා විමුක්ති ඵලය හා බැඳෙන හෙයින් ලෝකෝත්තර ධර්ම නම් වෙයි. එහෙත් මාර්ගය සමඟ සම්බන්ධ වනවිට (ආසන්න කාරණය) වන හෙයින් ලෞකික ද වෙයි[2].

කල්පයක් - *කප්පං*

මෙහි දී කපල්පයක් යනුවෙන් අදහස් වන්නේ මනුෂ්‍ය ආයුෂ ප්‍රමාණය යි. සතරසෘද්ධිපාද වැඩූ තථාගතයන්ට කල්පයක් සිටිය හැකි යනුවෙන් සඳහන්වන්නේ මනුෂ්‍ය ආයුෂ ප්‍රමාණයකි.

*'කප්පන්ති': ආයුකප්පං, තස්මිං තස්මිං කාලෙ යං මනුස්සානං*

---

[1]දීනි. II පි. 160
[2]දීනිඅ. II පි. 453

*ආයුප්පමාණං හොති තං පරිපූණ්ණං කරොන්තො තිට්ඨෙයන්*[1].

'කල්ප' යනු ආයුෂ කල්පයෙකි. ඒ ඒ කාලයන්හි මනුෂ්‍ය යන්ගේ ආයුෂ ප්‍රමාණයක් වෙ යි එය පරිපූර්ණ වන තුරු විසීම ය

කල්පය පිළිබඳව දීර්ඝවිස්තර පෙළ, අටුවා දෙකෙහි ම සඳහන් වෙ යි. අනි. අසංඛ්‍ය සූත්‍රය කියන පරිදි අවුරුදු සියදහස් ගනනක් ඇති කල්ප හතරකි[2] .

මඬනාලද- *පරියුට්ඨිතචිත්තෙ*

*ටෙරස්ස චත්තාරො විපල්ලාසා අප්පහීනා තෙනස්ස මාරො චිත්තං පරියුට්ඨාසි*[3].

අනඳ තෙරුන්ගේ සතර විපල්ලාස-විපර්යාස අප්‍රහීණය. එහෙයින් මාරයා විසින් සිත මඬනා ලදි.

(විපර්යාස - *විපල්ලාසා*

සඤ්ඤා, චිත්ත, දිට්ඨි හා අත්ත වශයෙන් විපර්යාස ග්‍රහණ හතරක් වෙයි. අනිත්‍ය දේ නිත්‍යයයි ගැනීම, දුක්ඛදායක දේ සුඛ යයි ගැනීම, අනාත්ම දේ ආත්ම වශයෙන් ගැනීම, අසුභ දේ සුභ යැයි ගැනීම සඤ්ඤා, චිත්ත, දිට්ඨි හා අත්ත උපාදාන වලට අදාල ලක්ෂණ වෙයි[4]. )

---

[1] දිනිඅ I පි. 384
[2] අනි V පි . 277
[3] දිනිඅ I පි. 385
[4] අනි V පි . 102

## දේවසමාගමයටත් පැමිණියේ ය

මහාසමය සූත්‍රය 8

එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත් පුර අසල මහාවනයෙහි රහතුන් පන්සියයක් සමඟ වැඩවිසූහ. එකල මහා දේවසමාගමයක් පැවතුණි. මේ දේවසමාගමයට බියකරු අසුරයන් සමඟ මාරයා ද (බාධා කරණ අටියෙන්) පැමිණියේ ය. එහිදී මාරයා පරාජිත ව කුපිත ව ගියේ ය.

*කාලකඤ්ජා මහා භිස්මා*
*අසුරා දානවෙඝසා*
*වෙපචිත්ති සුචිත්තී ච*
*පහාරාදො නමුචී සහ*[1]

කාලකඤ්ජ දානවෙඝස යන නම් ඇති මහ බියකරු අසුරයෝ ද, වේපචිත්ති සුචිත්ති යන අසුරයෝ ද, පහාරාද නම් අසුර ද නමුචි කැටුව ආහ.

*තෙ ච සබ්බෙ අභික්කන්තෙ*
*සඉන්දෙ දෙවෙ සබ්‍රහ්මකෙ*
*මාරසෙනා අභික්කාමුං*
*පස්ස කණ්හස්ස මන්දියං*[2]

එළැඹැ සිටි ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ඒසියලු දෙවියන්කරා මරසෙන්හු පැමිණියාහ. බලව මරහුගේ මූළාවෙක සැටි.

---

[1]දීනි. II පි. 390

[2]දීනිඅ II පි. 494 පසස කණ්හස්ස මන්දියන් 'ති කාළධම්මස්ස මාරස්ස බාල භාවං පස්සථ- පසස කණ්හස්ස මන්දියන් 'ති යනු කාළ ස්වභාව ඇති මාරයාගේ මෝඩ බව බලව්

*'එථ ගණ්හථ බන්ධථ*
*රාගෙන බන්ධමත්ථුවො*
*සමන්තා පරිවාරෙථ*
*මා වො මුඤ්චිත්ථ කොචිනං*

එවූ, ගනිවූ, බඳිවූ, මොහු හැම රාගයෙන් බඳනා ලදුවෝ ම වෙත්වා. හාත්පසින් පිරිවරවූ, (වටා මුරකොට සිටිවූ) තෙපි ඒ කිසිවකු දූ නො මුදවූ

*ඉති තත්ථ මහා සෙනො*
*කණ්හසෙනං අපෙසයි*
*පාණිනා ථලමහච්ච*
*සරං කත්වාන භෙරවං*

'මෙසේ බිහිසුණු හඬ කොට, අත්ලෙන් පොළව පැහැර මහසෙන් (මරදෙව්පුත්) තෙම මරසෙන් එහි යැවී ය.

*යථා පාවුස්සකො මෙඝො*
*ථනයන්තො සවිජ්ජුකො*
*තදා සො පච්චුදාවත්ති*
*සංකුද්ධො අසයං වසී*

යම් සේ වැසි සමයෙහි වසින මේඝගර්ජනා කරනුයේ විදුලිය සහිතවනුයේ ද ,එසේම එදා ඒ මරදෙව් පුත් ඒ දෙව්පිරිස තමා වශයෙහි පැවැත්විය නුහුණුයේ, ඉතා කිපියේ, පෙරළා නැඟී ගියේ ය.

*තඤ්ච සබ්බං අභිඤ්ඤාය*
*වවත්ථිත්වානචක්ඛුමා*
*තතො ආමන්තයි සත්ථා*
*සාවකෙ සාසනෙ රතෙ*
*මාරසෙනා අභික්කන්තා*
*තෙ විජානාථ භික්ඛවො*

පසැස් ඇති ශාස්තෘන්වහන්සේ ඒ සියල්ල දැන, වෙසෙසා දැක, ඉක්බිති සස්න ඇලුණ ඒ සවුවන් බණවා, මහනෙනි, මරසෙන්හු ආහ. ඔවුන් දැන ගනිවු යි වදාළසේක.

*තෙ ච ආතප්ප මකරුං*
*සුත්වා බුද්ධස්ස සාසානං*
*වීතරාගේහි පක්කාමුං*
*නෙසං ලොමම්පි ඉඤ්ජයුං*

ඔවුහු ද බුදුරජුන්ගේ අනුශාසනය අසා වැර වැඩූහ. පහවූ රාගඇති ඒ භික්ෂූන් කෙරෙන් මරසෙන්හු ඉවත්ව ගියහ. ඒ රහතුන්ගේ ලෝමයකු දු සොලොවනු නො හැකි වූහ.

ඉක්බිති මාරයා භික්ෂූන් අරභයා මේ ගාථාව පැවසීය. *අථ මාරො භික්ඛුසංඝං ආරබ්භ ඉමං ගාථං අභාසි* [1]

*සබ්බෙ විජිත සංගාමා*
*භයාතීතා යසස්සිනො*
*මොදන්ති සහ භූතෙහි*
*සාවකා තෙ ජනෙ සුතාති*

ජනයා කෙරහි ප්‍රකට වූ ඒ සියලු බුදුසවුවෝ ජයගත් මරයුද ඇතියහු, බිය ඉක්මියාහු, එහෙයින් ම කීර්තිමත් වූවාහු අරිය සච්චන් හා සතුටු වෙත්.

*සංකුද්ධො අසයං වසී 'ති සුට්ඨු කුද්ධො කුපිතො කඤ්චි වසෙ වත්තෙතුං අසක්කොන්තො අසයං වසී න අත්තනො වසෙන අකාමකො හුත්වා නිවත්තො* [2]. ...

ඒ අය තම වසඟයට ගත නො හැකි වූයෙන් මාරයා අතිශයින් කුපිතව ආපසු ගියේ ය.

---

[1] දීනිඅ. II පි. 495
[2] එහිම

( චක්ඛුමා එනම් බුදුරජාණන් වහන්සේ ය. පසැස් ඇති හෙයිනි.

*'චක්ඛුමාති ' පඤ්චහි චක්ඛූහි චක්ඛුමා*[1] -පසැස් ඇති හෙයින් (බුදුහු) චක්ඛුමා නම්.

*චක්ඛුමාති භගවා පඤ්චහි චක්ඛූහි චක්ඛුමා-මංසචක්ඛුනාපි...*

පසැස් - පඤ්ච චක්ඛු

චූලනිද්දේසයේ ඇස් පහ විස්තර වශයෙන් සඳහන් වෙයි.

මසැස- *මංස චක්ඛු,*
දිවැස- *දිබ්බ චක්ඛු,*
පැණැස- *පඤ්ඤා චක්ඛු,*
බුදු ඇස- *බුද්ධ චක්ඛු,*
සියල්ල පෙනෙන ඇස- *සමන්ත චක්ඛු,*

බුදුරජාණන්වහන්සේට ප්‍රකෘති දෙඇස් ඇතුළුව ඇස් පහක් ඇති බව ග්‍රන්ථාගතය. මසැස් (*මංස චක්ඛු*) මෙයින් අදහස් වන්නේ ස්වාභාවිකව ලැබෙන නේත්‍ර දෙකයි. දිවැස් එනම්, මනුෂ්‍ය බලය ඉක්මවා අන්‍ය සතුන් පිළිබඳව දැනීම. සෝපාක, මට්ටකුණ්ඩලී ආදීන්ගේ අසරණ භාවය පෙනුනේ දිව්‍ය ඇස් වලටය. (*දිබ්බචක්ඛු*) ප්‍රඥාවම ඇස් ලෙස ගෙන පඤ්ඤා චක්ඛු යනුවෙන් කියවෙයි. බුදුන්ගේ ඇස් බුද්ධචක්ඛු නම්. සියල්ල දකින්නේය යන අරුතින් සමන්ත චක්ඛු ගෙන ඇත. )

---

[1] දීනිඅ. I පි. 393

# මජ්ඣිමනිකායෙහි.

## මාරග්‍රහණයට පත් නො වන්නා

### ආර්යපර්යේෂණ සූත්‍රය

ආර්යපර්යේෂණ සූත්‍රයෙහි මාරයාගේ ග්‍රහණයට අසු නොවන පිළිවෙළ දේශනා කර තිබේ. වනමුවෙකු පාශයෙන් බේරී යෑමේ උපමාව පෙන්නුම් කරයි.

*49 සෙය්‍යථාපි භික්ඛවෙ ආරඤ්ඤකො මිගො අරඤ්ඤෙ පවනෙ විස්සත්ථො ගච්ඡති විස්සත්ථො තිට්ඨති විස්සත්ථො නිසීදති විස්සත්ථො සෙය්‍යං කප්පෙති තං කිස්ස හෙතු? අනාපාථගතො භික්ඛවෙ ලුද්දදස්ස. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි සවිතක්කං සවිචාරංවිවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො* [1]

49 මහණෙනි, යම්සේ වනමුවෙක් මහ වනයෙහි හැසිරෙන්නේ බිය රහිත වූ යේ නම්, බියරහිත වූ යේ සිටී නම්, බියරහිත වූ යේ හිඳී නම්, බියරහිත වූ යේ හොවී නම්, මහණෙනි, ඒ කවර හෙයින යත්ඃ වැද්දාට හමු නො වූ හෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මහණ තෙමෙ කාමයන්ගෙන් වෙන් ව ම අකුශල ධර්මයන්ගෙන් වෙන් ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ද ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි ද, මහණෙනි, මේ භික්ෂු තෙමේ මාරයා අන්ධකෙළේයයි ද, මාරයාගේ ඇස පිහිටක් නැති සේ නසා පාපී මාරයාගේ නො දැක්මට පැමිණියේ යයි ද කියනු ලැබේ.

---

[1] මජ්. I පි. 401

# මුවවැද්දෙකු ලෙස

## නිවාප සූත්‍රය 1.3.5

මෙහි මාරයා මුවවැද්දකුට උපමා කර තිබේ.
එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි ජේතවන නම් වූ අනේපිඩු සිටුවරයාගේ ආරාමයෙහි වැඩවසද්දී භික්ෂූන් අමතා මේ සූත්‍රය දේශනා කළහ.
මුවවැද්දා මුවන් මරා ගැනීම පිණිස තෘණ වව යි. තණකොල කෑමට ගිජු වූ මුවෝ එහි පැමිණ මුවවැද්දාට අහුවෙති. මෙසේ පස්කම්සැපතෙහි ආශක්ත වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ පවිටු මාරවසඟයට පත්වෙති. මාරයාගෙන් බේරෙණ ආකාරය ද මේ සූත්‍රයෙහි විස්තර වෙ යි.

2 *න භික්ඛවෙ නෙවාපිකො නිවාපං නිවපති මිගජාතානං 'ඉමං මෙ නිවාපං නිවුත්තං මිගජාතා පරිභුඤ්ජන්තා දීඝායුකා වණ්ණවන්තො චිරං දීඝමද්ධානං යාපෙන්තූ'ති. එවඤ්ච ඛො භික්ඛවෙ නෙවාපිකො නිවාපං නිවපති මිගජාතානං 'ඉමං මෙ නිවාපං නිවුත්තං මිගජාතා අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජිස්සන්ති අනුපඛජ්ජ මුච්ඡිතා භොජනානි භුඤ්ජමානා මදං ආපජ්ජිස්සන්ති. මත්තා සමානා පමාදං ආපජ්ජිස්සන්ති. පමත්තා සමානා යථාකාමකරණීයා භවිස්සන්ති ඉමස්මිං නිවාපෙ'ති.*

2 මහණෙනි, නිම්වැද්දෙක් (තෘණාදි ගොදුරු කරණ වැද්දෙක් ) 'මාවිසින් වපුළ මේ ගොදුරු අනුභව කරන්නා වූ මුවසමූහයෝ දිගා (දීර්ඝායුෂ) ඇත්තෝ පැහපත් වූවෝ බොහෝ කලක් යැපෙත්වා' යි (සිතා) මුවසමූහයකට තණ (ඇට )නො වපුරයි. මහණෙනි, නේවාපික තෙමේ මුවන් සඳහා 'මාවිසින් වපුළ මේ කෙතට මුවසමූහයෝ වැදගෙන මුසපත්ව බොජුන් අනුභව කෙරෙත්. වැදගෙන මුසපත්ව බොජුන් අනුභව කරන්නෝ මදයට පැමිණෙන්නාහු ය. මත් වූවෝ ප්‍රමාදයට පැමිණෙන්නාහු ය. ප්‍රමත්ත වූවෝ මේ නිවාපයෙහි කැමැති සේ කට යුත්තෝ වන්නාහු ය'යි (මරා ගනී යි) මෙ සේ සිතා ම තණ

(බීජ ) වපුරයි.

මුවවැද්දා සහ ඔහුගේ අනුගාමිකයන් මාරයා සහ මාරපිරිසට ද තණකොල (මාරපාස) පස්කම් සැප ලෙසට ද කෑමට එන මුවන් ශ්‍රමණබ්‍රාහ්මණයන් ලෙසට ද පෙන්නුම් කර ඇත.

*9 උපමා ඛො මෙ අයං භික්ඛවෙ, කතා අත්ථස්ස විඤ්ඤාපනාය අයඤ්චෙත්ථ අත්ථො: නිවාපොති ඛො භික්ඛවෙ, පඤ්චන්නෙතංකාමගුණානං අධිවචනං. නිවාපිකොති ඛො භික්ඛවෙ, මාරස්සෙතං පාපිමතො අධිවචනං. නෙවාපිකපරිසාති ඛො භික්ඛවෙ, මාරපරිසායෙතං අධිවචනං. මිගජාතාති ඛො භික්ඛවෙ, සමණබ්‍රාහ්මණෙතං අධිවචනං.*

9 මහණෙනි, එහි අර්ථය හැඟවීම (පැහැදිලි කිරීම) පිණිස මා විසින් මේ උපමාව කරණ ලදී. මේ මෙහි අර්ථයි: මහණෙනි, 'නිවාප' යනු පස්කම්ගුනයන්ට මේ නමෙකි. මහණෙනි, 'නෙවාපික' යනු පවිටු මාරයාට මේ නමෙකි. මහණෙනි, 'නෙවාපිකපිරිස' යනු මාරපිරිසට මේ නමෙකි. මහණෙනි, 'මුවසමූහය' යනු ශ්‍රමණබ්‍රාහ්මණයන්ට මේ නමෙකි.

13 *කථඤ්ච භික්ඛවෙ, අගති මාරස්ස ච මාරපරිසාය ච ? ඉධ භික්ඛවෙ, භික්ඛු විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු 'අන්ධමකාසි මාරං, අපදං වධිත්වා මාරචක්ඛුං අදස්සනං ගතො පාපිමතො'*

13 මහණෙනි, මාරයාගේත් මාරපිරිසේත් අගතිය(විෂය නැති තැන) කෙසේ ද? මහණෙනි, මේ ශාසනයේ මහණ තෙමේ කාමයන්ගෙන් වෙන් ව අකුශල ධර්මයන්ගෙන් වෙන් ව විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරෙයි. මහණෙනි, මේ මහණ තෙමේ 'මාරයා අන්ධ කෙළේ ය යයි ද, මරු ඇස අපද කොට (පිහිට නැති සේ නසා) පවිටු මාරයාගේ නො දැක්මට ගියේ ය

යි ද' කියනු ලැබේ[1].

## බඹලොවට යයි

### බ්‍රහ්මනිමන්තනික සූත්‍රය 1.5.9

බකබ්‍රහ්මයා ශාශ්වත දෘෂ්ටිය පිළිගත්තෙකි. තථාගතයෝ ඔහුට දහම් දෙසීමට බඹලොවට වැඩම කළහ. එහිදී බකබ්‍රහ්මයාට උන්වහන්සේ මෙසේ වදාළහ.

*4 එවං වුත්තෙ අහං භික්ඛවෙ බකං බ්‍රාහ්මණං එතදවොචං: අවිජ්ජා ගතො වත භො බකො බ්‍රහ්මා, අවිජ්ජා ගතො වත භො බකො බ්‍රහ්මා: යත්‍ර හි නාම අනිච්චං යෙව සමානං නිච්චන්ති වක්ඛති, අද්ධුවංයෙව සමානං ධුවන්ති වක්ඛති, අසස්සතං යෙව සමානං සස්සතන්ති වක්ඛති, අකෙවලංයෙව සමානං කෙවලන්ති වක්ඛති, චවනධම්මං යෙව සමානං අචවනධම්මන්ති වක්ඛති. යත්ථ ච පන ජායති ච ජීයති ච මීයති ච චවති ච උප්පජ්ජති ච, තං තථා වක්ඛති: ඉදං හි න ජායති න ජීයති න මීයති න චවති න උප්පජ්ජතීති සන්තඤ්ච පනඤ්ඤං උත්තරිං නිස්සරණං නත්ථඤ්ඤං උත්තරිං නිස්සරණන්ති වක්ඛතීති.*

4 මහණෙනි, මෙසේ කී කල මම බක බ්‍රහ්ම හට තෙල (මේ) බස කීමි: මේ බඹ අනිත්‍ය වූවක් ම නිත්‍ය ය යි කියා ද?, අධ්‍රැව වූවක් ම ධ්‍රැව යයි කියා ද?, අශාශ්වත වූවක් ම ශාශ්වත යයි කියා ද?, අකෙවල (සියල්ල-හුදෙක් ) වූවක් ම කෙවල යයි කියා ද?, චවන (නැතිවන) ස්වභාව ඇති යක් ම අචවන ස්වභාව යයි කියා ද?, යම් බඹලොවෙක උපදිනුයේත් දිරනුයේත් (දිරා යන) මියනුයේත් (මැරෙණ) ච්‍යුතවනුයේත් පහළ වනුයේත් වේ ද?, මෙහි දෙනුයේත් දිරනුයේත් මියනුයේත් නො පහළ වනුයේත් වේ ය යි ඒ බඹලොව ගෙන එසේ කියා ද, මින් මතු (මෙයහැර)

[1] ම නි I පි. 374

අන් නිස්සරණ ඇති ද, මින් මතු අන් නිස්සරණ නැතියි කියා ද හවත්හි, එහෙයින් මේ බක බඹ අවිද්‍යාගතයෙක් අඥානයෙක් ම ය.

*5 අථ බො භික්ඛවෙ මාරො පාපිමා අඤ්ඤතරං බ්‍රහ්මපාරිසජ්ජං අන්වාවිසිත්වා මං එතදවොචඃ භික්ඛු, භික්ඛු, මෙතමාසදො, මෙතමාසදො, එසො හි භික්ඛු බ්‍රහ්මා මහාබ්‍රහ්ම අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථුදසො වසවත්ති ඉස්සරො කත්තා නිම්මාතා සෙට්ඨො සජ්ජිතා වසී පිතා භූතභව්‍යානං.*

...

5 මහණෙනි, එකල පවිටු මර (මාරයා ) එක්තරා බ්‍රහ්මපාරිෂද්‍ය බඹකු සිරුරෙහි ආවිෂ්ටව මට තෙල (මේ) බස කී : මහණ, මහණ, තෙල බඹහට නින්දා නො කර. තෙල බඹහට නින්දා නො කර. තෙල බඹ මහබඹය, හැම බඹුන් අභිබවයි (මැඩලයි). තෙමෙ අනභිභූතය. ඒකාන්තයෙන් සියල්ල දක්නේ ය. (හැමදෙනා) තම වසඟයෙහි පවත්වයි. ඊශ්වරය, (ලෝකයෙහි කර්තෘ ය. නිරමාතෘ ය. (ලෝයට උත්තම ය. ( තෝ ක්ෂත්‍රිය වෙව, තෝ බ්‍රාහ්මණ වෙව, යනාදීන් ) ප්‍රජාව සකස් නරන්නේ ය. වශීය (යටත්ය). උපන් සත්ත්වයන්ගේ ද උපදනා සත්ත්වයන්ගේ ද පිතෘ ය.

...

*6 එවං වුත්තෙ අහං භික්ඛවෙ මාරං පාපිමන්තං එතදවොචංඃ ජානාමි බො තාහං පාපිම. මා ත්වං මඤ්ඤිත්ථො න මං ජානාතීති. මාරො ත්වමසි පාපිම. යො චෙව පාපිම බ්‍රහ්මා යා ච බ්‍රහ්මපරිසා යෙ ච බ්‍රහ්මපාරිසජ්ජා සබ්බෙව තව හත්ථ ගතා, සබ්බෙව තව වසං ගතා, තුය්හං හි පාපිම එවං හොතිඃ එසොපි මෙ අස්ස හත්ථගතො, එසොපි මෙ අස්ස වසං ගතොති. අහං බො පාපිම, නෙව තව හත්ථගතො, නෙව තව වසං ගතොති.*

6 මහණෙනි, මෙසේ කී කල මම අයස උදාකරණ පාපි වූ මරුහට තෙල බස කීමිඃ 'මාරය, මම තා දන්මි (දනිමි). මා තා නො හඳුනති යි නහමක් සිත. පවිට, තෝ මාරයෙහි, පවිට, මෙහි

යම් බඹෙක් ඇද්ද?, යම් බඹපිරිසෙක් ඇද්ද?, යම් ම බඹපිරිසැවූවෝ ( බ්‍රහ්මපාරිසජ්ජයේ අය) ඇද්ද?, ඔහු (ඔවුහු ) හැම තා හස්තගතයහ. ඔහු (ඔවුහු ) හැම තා වසංගතයහ (වසඟයට පත්වූහ). ' මෙ තෙමෙ ද මා හස්තගතය, මෙ තෙමෙ ද මා වසඟය' යනුදු තට මෙසේ සිතෙයි. පවිට, මම තා හස්ත ගතයෙම් නො ම වෙමි. තා වසඟයෙමි' නො ම වෙමි[1].

( ශාශ්වතදෘෂ්ටිය - *සස්සතදිට්ඨි*

රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ මේවා ආත්මය වශයෙන් ගෙන ඒවා සදා කාලිකය, ස්ථිරය යි ගැනීම ශාශ්වතදෘෂ්ටි ය යි. )

## ආබාධයක් ලෙස

මාරතජ්ජනීය සූත්‍රය 1. 5. 10

මහමුගලන් මහරහතන් වහන්සේ මාරයාට තර්ජනය කළ හෙයින් මේ සූත්‍රය මාරතජ්ජනීය සූත්‍රය නම් විය.
එක්කලෙක මහමුගලන් රහතන් වහන්සේ භගුරට සුංසුමාරගිරි නුවර මිගදායේ විසූහ. එකල උන්වහන්සේ එළිමහනේ සක්මන් කළහ. එවිට පවිටු මාරයා මහමුගලන් කෙරහුගේ කුක්ෂි (උදරයට) යට පිවිසියේ ය. එසඳ මහමුගලන් මහතෙරණුවනට තම කුසය බරය. මැ ඇට පිරූ මල්ලක් වැනි ය. යි සිතා වෙහෙරට පැමිණ අසුනෙහි ඉඳ තමා කෙරහි මෙනෙහි කළහ.

3 *අද්දසා ඛො ආයස්මා මහාමොග්ගල්ලානො මාරං පාපිමන්තං කුච්ඡිගතං කොට්ඨමනුපවිට්ඨං. දිස්වාන මාරං පාපිමන්තං එතදවොච: නික්ඛම පාපිම, මා තථාගතං විහෙසෙසි*

---

[1] ම නි I පි. 766

*මා තථාගතසාවකං. මා තෙ අහොසි දීඝරත්තං අහිතාය දුක්ඛායාති.*

3 මහමුගලන් මහතෙරහු පවිටුමරහු කුසට වැද පක්වාශයට පිවිසියහු දුටහ. දැක පවිටුමරහට තෙල(මේ)බස් කීහ: 'පවිට, නික්ම යා, ('පවිට, නික්ම යා.) තථාගතයන් නො පෙළා, තථාගතශ්‍රාවකයන් නො පෙළා, තට දීර්ඝරාත්‍රයෙහි (බොහෝකාලයක්) අහිතයට දුක්ඛයට කරුණෙක් නො වේවා' කියායි.
එවිට පවිටු මරු මුගලන් තෙර මාව දන්නේය යි කියා මුගලන් තෙරණුවන්ගේ සිරුරෙන් නික්ම දොරබාවට ගියේ ය. එහි සිටින මරු දුටු උන්වහන්සේ තථාගතයන්ට හෝ තථාගතශ්‍රාවකයන්ට හෝ ගැහවි බමුණන්ට හෝ හිරිහැර බාධා නින්දා නො කරණ ලෙසත් පැහදිළි කර එසේ කෙළේනම් ඒ අකුශලයෙන් ඉබොහෝ කලක් නිරාදුක් පවිටුමරුට විදීමට හේතුභූතවන බවත් වදාළහ.

නිදසුන්වශයෙන් අතීත සිද්ධිය දේශනා කළහ. යටගිය දවස කකුසඳබුදුන් සමයේ තමන් (මුගලන්තෙර) දූසීමාරයා නමින් ඉපිද කකුසඳ තථාගතයන්ටද එම ශ්‍රාවකයනට ද ගැහැවි බමුණන්ට ද හිරිහැර බාධා නින්දා කළ හෙයින් නිරාගතවැ අනන්ත දුක් වින්ද බව පැවසූහ.

18 *න වෙ අග්ගි චෙථයති*
*අහං බාලං ඩහාමීති*
*බාලොව ජලිතං අග්ගිං*
*ආසජ්ජන සඩය්හති*

18 ගින්න වනාහි 'මම බාලයා දවාලමි' යි ඒකාන්තයෙන් නො වෙලා ගන්නේය. ඒ බාලයා ම දිලිසෙන ගිනි වැදගෙන දැවෙන්නේ ය.

*19 එව මෙව තුවං මාර*
*ආසජ්ජ නං තථාගතං*
*සයං ඩහිස්සති අත්තානං*
*බාලො අග්ගිංව සම්ඵුසං*

19 මාරය, එපරිදි ම තෝ තථාගතයන් වහන්සේ සටා (බාධා කර) තමා දවාගන්නෙහි ය. ගින්න ස්පර්ශ කරණ බාලයකු තමා දවා ගන්නා සෙයිනි.

*20 අපුඤ්ඤං පසවි මාරො*
*ආසජ්ජ නං තථාගතං*
*කින්නු මඤ්ඤසි පාපිම*
*න මෙ පාපං විපච්චති*

20 කකුසඳ තථාගතයන් වහන්සේ සටා (බාධා කර) දූසීමාරයා පව් ලැබී ය. පවිට, කිම තෝ 'මා පිළිබඳ පව් නො පැසේ ය' යි සිතහි ද?
මුගලන් තෙරණුවෝ නැති ගැන්වූහ. මරුට තර්ජනය කළහ. එයින් පසු මාරදෙව් අකුරුදහන් විය[1].

මජ්ඣිමනිකායේ ආනෙඤ්ජසප්පාය සූත්‍රයේ උභය කාමයෝ මාර විෂය යි දක්වා තිබේ.

*අනිච්චා භික්ඛවෙ, කාමා තුච්ඡා මොසධම්මා. මායා කතමෙතං භික්ඛවෙ, බාලලාපනං. යෙ ච දිට්ඨධම්මිකා කාමා, යෙ ච සම්පරායිකා කාමා යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා, යා ච සම්පරායිකා කාමසඤ්ඤා උභයමෙතං මාරධෙය්‍යං, මාරස්සෙසවිසයො, මාරස්සෙස නිවාපො, මාරස්සෙස ගොචරො, එත්ථෙතෙ පාපකා අකුසලා මානසා අභිජ්ඣාපි ව්‍යාපාදාපි සාරම්භාපි සංවත්තන්ති. තෙව අරියසාවකස්ස ඉධමනුසික්ඛතො*

[1] ම නි I පි. 776

*අන්තරාය සම්භවන්ති.* [1]

මහණෙනි, වත්කම් කෙලෙස්කම්හු ඇතිවැ නැතිවන අර්ථ (අර්ථයෙන්) අනිත්‍යයහ (අනිත්‍යසාර ධ්‍රැවසාර ආත්මසාර විරහිතයෙන්) සිස්හ, නැසෙනුවහ, නැසෙනසැහවී ඇතියව්හ. මහණෙනි, මායාවෙන් කරන ලද බාලලාපන යෙක (බාලයන්ලවා මාගේ යයි කියවනු යෙක). දෘෂ්ටධාර්මික වූ යම් මානුෂක පඤ්චකාමගුණ කෙනෙක් ඇද්ද, සාම්පරායික වූ යම් තදවශේෂ කාම කෙනෙක් ඇද්ද, දෘෂ්ටධාර්මික වූ යම් කාමසඤ්ඥාවකුත් ඇද්ද, සාම්පරායික වූ යම් කාමසඤ්ඥාවකුත් ඇද්ද, තෙල (මේ) කාම කාමසඤ්ඥා යන දෙකම මාරයත්ත යෙක (මාරයාගේ වශයෙහි වැටෙයි ) තෙල මාරයාගේ විෂයයෙක, තෙල මාරයාගේ නිවාපයෙක, තෙල මාරයාගේ ගෝචරයෙක. මේ පස්කම් විෂයෙහි මෙනෙහි උපදනා අභිධ්‍යාව ද ව්‍යාපාදය ද(කරණුත්තරිය කරණ ලක්ෂණ) සාරම්භය ද යන තෙල ලාමක අකුශල ධර්මයෝ පවත්නාහ. ඒ තුන් කෙලෙස්හු මෙ සස්නෙහි හික්මෙන ආර්යශ්‍රාවකහට අන්තරාය පිණිස වෙත් .

## අරමුණු නො ලබයි

කායගතාසති සූත්‍රය 3. 2. 9

කායගතාසතිය-කයපිළිබඳව භාවනා කරන්නේ නම් මාරයා අරමුණු නො ලබයි යන්න මේ සූත්‍රයෙහි සඳහන් වෙයි.

*යස්ස කස්සචි භික්ඛවෙ, භික්ඛුනො කායගතා සති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං, ලභති තස්ස මාරො ආරම්මණං.*

*සෙය්‍යථාපි භික්ඛවෙ, සුක්ඛං කට්ඨං කොළාපං, අථ පුරිසො*

[1] ම නි III පි. 83

*ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි. තෙජො පාතුකරිස්සාමීති. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං සුක්ඛං කට්ඨං කොළාපං, උත්තරාරණිං ආදාය අභිමත්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යාති.*

*එවං භන්තෙ.*

*එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතාසති අභාවිතා අබහුලීකතා, ලභති තස්ස මාරො ඔතාරං, ලභති තස්ස මාරො ආරම්මණං.*

මහණෙනි, යම්කිසි මහණක්හු විසින් කායගියාසී (කය පිළිබඳ සිහිය) අභාවිත වේ ද අබහුලීකෘත ද, ඔහුට (ඔවුන්හට) මාරයා අවතරණ ලබයි. ඔහුට (ඔවුන්හට) මාරයා ආලම්බන ලබයි.

මහණෙනි, යම්පරිදි වියළි කොළපු වූ කාෂ්ටයෙක් (දර) ඇත් ද, එසඳ කිසි පුරුෂයෙක් 'ගිනි තිපදවමි තෙජෝ ධාතු පහළ කරමි' උතුරුරිණි (ගිනිගානාදඬු) ගෙන එන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ හඟනහු (සිතන්නහු)ඃ ඒ පුරුෂයා වියළි කොළපු වූ මේ කාෂ්ටය (දර) උතුරුරිණි (ගිනිගානාදඬු) ගෙන මඬනේ ගිනි තිපද වන්නේවේද? තෙජෝ ධාතු පහළ කරන්නේ වේ ද?

වහන්ස, එසේ යැ.

මහණෙනි, එපරිදි ම යම්කිසි මහණක්හු විසින් කාය ගත ස්මෘතිය අභාවිත වේ ද අබහුලීකෘත වේ ද, ඒ මහණහු පිළිබඳ මාරයා අවතරණ ලබයි. ඔහු (ඔවුහු) පිළිබඳ මාරයා අරමුණු ලබයි.

*යස්ස කස්සචි භික්ඛවෙ, කායගතා සති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං, න තස්ස ලභති මාරො ආරම්මණං.*

*සෙය්‍යථාපි භික්ඛවෙ, අල්ලං කට්ඨං සස්නෙහං, අථ පුරිසො ආගච්ඡෙය්‍ය උත්තරාරණිං ආදාය අග්ගිං අභිනිබ්බත්තෙස්සාමි. තෙජො පාතුකරිස්සාමීති. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ, අපි නු සො පුරිසො අමුං අල්ලං කට්ඨං සස්නෙහං, උත්තරාරණිං ආදාය අභිමත්ථෙන්තො අග්ගිං අභිනිබ්බත්තෙය්‍ය තෙජො පාතුකරෙය්‍යාති.*

*නො හෙතං භන්තෙ.*

*එවමෙව ඛො භික්ඛවෙ, යස්ස කස්සචි කායගතාසති භාවිතා බහුලීකතා, න තස්ස ලභති මාරො ඔතාරං, න තස්ස ලභති මාරො ආරම්මණං.*

මහණෙනි, එපරිදි මැ යම්කිසි මහණක්හු විසින් කාගියාසී (කය පිළිබඳ සිහිය) භාවිත  බහුලීකෘත වේ ද, ඔහු (ඔවුන්) පිළිබඳ ව මාරයා අවකාශ නො ලබයි. ඔහු (ඔවුන්) පිළිබඳ ව මාරයා අරමුණු නො ලබයි.

මහණෙනි, යම්සේ කිරිසහිත අමු දිඹුල් කැටෙක් වේ ද, එසඳ පුරුෂයෙක් උතුරුරිණි (ගිනිගානාදඬු) ගෙන ගිනි නිපදවමි තෙද ධාතු පහළ කෙරමි' එන්නේ වේ ද, මහණෙනි, ඒ කෙසේ හඟනාව (සිතන්නහු): කිම ඒ පුරුෂ දියසහිත වූ තෙත් මේ උදුම්බර කාෂ්ටය උතුරු (ගිනිගානාදඬු) ගෙන කොළපු වූ මේ කාෂ්ටය (දර) උතුරුරිණි ගිනිගානාදඬු ගෙන මඩනේ ගිනි නිපද වා ද? තෙද පහළ කෙරේ ද?

වහන්ස, නෙල (එය) නොවේ මැ.

මහණෙනි, එසෙයින් ම යම්කිසි මහණක්හු විසින් කාගියාසී භාවිත බහුලීකෘත වේ ද, මාරයා ඔහුට අවතරණ නො ලබයි. මාරයා ඔහුට අරමුණු නො ලබයි[1].

---

[1] ම නි III  පි. 248

( කය පිළිබඳ සිහි කිරීම= කායගතාසති

ශරීරය-කය අනුව සිතමින් භාවනා කිරීමයි. සතර සතිපට්ඨාන යන්හි කායානුපස්සනා යනු ද මේ කායගතාසතිය මය.

සතිපට්ඨාන සූත්‍රයේදී මෙන්ම තවත් සූත්‍ර රැසකදී බුදුරදුන් විසින් කායගතාසතිය දක්වා තිබේ. ආනාපාන සති, චතු ඉරියා පථ, ද්වත්තිංසාකාර යනාදිය ඇතුළත් වන පරිදි ශරීරය මුල් කරගෙන කරනු ලබන සිහිය පිහිටුවීම කායගතා සති නම්.
ආනාපාන සති වශයෙන් කය අනුව භාවනාව වැඩීම, එනම්; ආශ්වාස ප්‍රශ්වාස කිරීම මෙනෙහි කිරීම ය. චතු ඉරියා පථ, එනම්; යෑම, ඉඳීම, සිටීම, සයනය සිහි නුවණින් කිරීම යි. ද්වත්තිංසාකාරය, මෙම ශරීරයෙහි තිස්දෙකක් කුණප කොටස් ඇත, එනම්;

*අත්ථි ඉමස්මිං කායෙ, කෙසා ලොමා නඛා දන්තා තචො මංසං නහාරු, අට්ඨී, අට්ඨී මිඤ්ජා, වක්කං, හදයං, යකනං, කිලොමකං, පිහකං, පප්ඵාසං, අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, පිත්තං, සෙම්හං, පුබ්බො, ලොහිතං, සෙදො, මෙදො, අස්සු, වසා, ඛෙලො, සිංඝානිකා,ලසිකා, මුත්තං, මත්ථකෙ මත්ථ ලුංගං.*

කෙස්, ලොම්, නිය, දත්, සම, මස්, නහර, ඇට, ඇට මිදුලු, වකුගඩුව, හදවත, අක්මාව, බඩදිව, කිලෝමකය, පෙනහැල්ල, බඩවැල, අතුණු බහන, නො පැසුණු අහර, අසුචි, පිත, සෙම, සැරව, ලේ, දහදිය, මේදය, කඳුළු, තෙල්, කෙළ, සොටු, හන්දිපත්වල ඇති දියරය, මුත්‍ර, හිසෙහි මොළය.

ශරීරයෙහි ඇති කුණප කොටස් තිස්දෙක කායගතාසති සූත්‍රයෙහි දී භාවානාවෙහි කමටහන් (අරමුණු) වශයෙන් දක්වා ඇත.

මෙම කුණප කොටස් භාවනාවෙහි දී මෙනෙහි කිරීමේ අරමුණ වන්නේ මෙම කොටස් තනි තනි වශයෙන් මෙන්ම සමූහය

වශයෙන් ද පිළිකුල් සහගත අනිත්‍ය අස්ථාවර දේ ලෙස අවබෝධ කොට ගැනීමයි.

දශඅසුභ කායගතා සතියට අයත් වෙයි

ඉදිමුණු මළ සිරුර- *උද්ධුමාතක*
නිල් වූ -*විනීලක*
තැනින් තැන කැඩුණු -*විපුබ්බක,*
සන්ධිවලින් වෙන් වූ -*විච්ඡිද්දක,*
සෑරිගිය -*වික්ඛායිතක,*
විසුරුණු -*වික්ඛිත්තක,*
වෙන් වෙන්ව විසුරුණු- *හත වික්ඛිත්තක,*
ලේ වැගිරෙන - *ලොහිතක,*
පණුවන් ගැසූ- *පුලවක,*
ඇටසැකිල්ල- *අට්ඨික.*

අසුභ යනු අපිවිතුරු, කැත, කුණු යනුයි. යෝගාවචරයාට භාවනාවට අරමුණු වශයෙන් තබා ගත හැකි අසුභ කරුණුය. මේ අනුව සිතීමෙන් අනිත්‍ය තාවය ඇතිවෙයි. එසේ ඇතිවන අවබෝධය නිසා තමා තුළ ආත්මයක් ඇතැයි යන විශ්වාසය නැති වී මම ය, මගේ ය යන හැඟීම් ද නැති වෙයි. එබැවින් ශරීරය හෝ ශරීරයේ කොටස් පිළිබඳ ඇල්ම මෙන්ම ඒවා දැඩි ලෙස ග්‍රහණය කරගන්නා උපාදානය ද නැති වෙයි. )

# සංයුත්තනිකායෙහි

## ආරූඪ වෙයි

### නානාතිත්ථියසාවක සූත්‍රය. 2. 3. 10[1]

සංයුත්තනිකායේ නානාතිත්ථියසාවක සූත්‍රයේ සඳහන් පරිදි පව්ටුමාර තෙමේ වේටම්බරී දේවපුත්‍රයාට ආවිෂ්ට ව තථාගතයන් සමීපයේ මෙසේ පැවසීය.

(මාරයා) *තපො ජිගුච්ඡාය ආයුත්තා*
*පාලයං පවිවෙකියං*
*රූපෙච යෙ නිවිට්ඨාසෙ*
*දෙවලොකාභිනන්දිනො*
*තෙ වෙ සම්මානුසාසන්ති*
*පරලොකාය මාතියාති*

තපසෙහි ද පවට පිළිකුල් කිරීමෙහි ද විවේකබව රකින රූපයෙහි පිහිටි යම් කෙනෙක් දෙව්ලොව පතත් ද. ඒ මනුෂ්‍යයෝ ඒකාන්තයෙන් පරලොව පිණිස මැනවින් අනුශාසනා කෙරෙත්.

ඒ පැවසීම පව්ටුමාරයාගේ බව දැන ගත් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

( භගවත්හු ) *යෙ කෙචි රූපා ඉධ වා හුරං වා*
*යෙ අන්තලික්ඛස්මිං පභාසවණ්ණා*
*සබ්බෙව තෙ තෙ නමුචිප්පසත්ථා*
*ආමිසංච මච්ඡානං වධාය ඛිත්තාති.*

මෙ ලොව හෝ පරලොව හෝ අහසෙහි හෝ පැහපත්වර්ණ

[1] මෙහි අංක වලින් අදහස් වන්නේ, 2 වැනි සංයුත්ත යයි, 3 වැනි වර්ගයයි, 10 වැනි සූත්‍රයයි. මෙම ක්‍රමය සංයුත්ත නිකායේ සූත්‍ර සඳහන් ක්‍රමයයි.

ඇති යම්කිසි රූපයෝ වෙද්ද, මාරය, ඒ සියල්ලෝ තා විසින් පසස්නා ලදහ. මසුන් නැසීම පිණිස ලූ ඇමක් මෙනි.[1]

## තපස්කර්මයෙන් ඉවත්වන්නයයි කියයි

තපොකම්ම සූත්‍රය. 4. 1. 1.

තථාගතයන්වහන්සේ බුදුවීමෙන් පසු පස්වැනි සතියේ උරුවෙල් දනව්වෙහි නේරඤ්ජරා ගන්තෙර අජපාල නුගරුකමුල වැඩවිසූහ. එකල්හි හුදකලාව චිත්තවිවේකයෙන් වෙසෙන උන්වහන්සේට, ඒ දුෂ්කරක්‍රියායෙන් ඒකාන්තයෙන් මිදුණෙමි, ඒ නො වැඩ ඇසුරු කළ දුෂ්කරක්‍රියායෙන් ඒකාන්තයෙන් මැනවින් මිදුණෙමි වෙමි. ඒ ස්ථිර ව එළඹසිටි සිහිඇත්තේම මැනවින් සත්‍යාවබෝධය කෙළෙමි'යි යන චිත්තවිතර්කයක් පහළවිය. ඉක්බිති පව්ටු මාර තෙමේ තථාගතයන් වහන්සේගේ මේ විතර්කය දැන බුදුන් වෙතට පැමිණ මෙසේ පැවසීය.

(මාරයා) *තපොකම්මා අපක්කම්ම*
*යෙන සුජ්ඣන්ති මාණවා*
*අසුද්ධො මඤ්ඤසි සුද්ධො*
*සුද්ධි මග්ගමපරද්ධොති.*

යම් තපසකින් මනුෂ්‍යයෝ පිරිසිදුවෙද්ද, ඒ තපස්කර්මයෙන් ඉවත්ව අශුද්ධවූයේ ම ශුද්ධිමාර්ගය වැරදවූයේ ශුද්ධි යයි හඟිහිද.

මේ පව්ටුමාරයා බව දැන ගත් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

---

[1] සනි. I පි.128

(භගවත්හු) *අනත්ථ සංහිතං ඤත්වා*
*යං කිඤ්චි අමරං තපං*
*සබ්බං නත්ථාවහං හොති*
*පියාරිත්තංව ධම්මනි*

*සීලං සමාධි පඤ්ඤඤ්ච*
*මග්ගංබොධය භාවයං*
*පත්තොස්මි පරමං සුද්ධිං*
*නිහතො ත්වමසි අන්තකාති.*

අමර නම් වූ යම්කිසි තපසෙක් වේද්ද, (ඒ සියල්ල) අනර්ථසංහිත යයි දැන (අත්හළෙමි). ඒ සියල්ල වැඩ සිදුකරන්නේ නොවේ. මරුකතරෙහි රිටිපලුපත් මෙනි. ( මරුකතරෙහි වූ නැවක් රිටිපලුපත් ගෙන පදවන්නට නො හැක්කා මෙනි)
ශීලය ද සමාධිය ද ප්‍රඥාව ද යන ආර්ය මාර්ගය සත්‍යාවබෝධය පිණිස වඩමින් පරමශුද්ධියට පැමිණියෙම් වෙමි. මාරය, තෝ නැසුනේ වෙහි.[1]

ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නොසතුටු ව නොපෙණී ගියේය.

( *සීලං සමාධි පඤ්ඤඤ්ච* මේ පද තපොකම්ම සුත්‍ර වර්ණනාවට (අටුවාවට) අනුව මෙසේය.

*තත්ථ සීලන්ති වචනෙන සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව ගහිතා-* මෙහි සීල යන වචනයෙන් යහපත් වචන, යහපත් කර්මාන්ත, යහපත් ආජීවය ගන්නා ලදී.

*සමාධිනා සම්මා වායාම සම්මා සති ආදයො-* සමාධි යන්නෙන්

---

[1] එමකෘතියෙම. පි. 188-189

යහපත් ව්‍යායාමය, යහපත් සිහිය ආදිය යි.

*පඤ්ඤාය සම්මා දිට්ඨි සම්මා සංකප්ප*- ප්‍රඥා යන්නෙන් යහපත් දෘෂ්ටිය, යහපත් කල්පනාව ගැනෙයි[1] .
මෙයින් ආර්ය අෂ්ටාංගික මාර්ගය සීල, සමාධි හා පඤ්ඤා යන තුනට බෙදා ඇත.

( ශීලය - *සීලං*

ශීලය නම් : සතුන් මැරීමආදියෙන් වලකින්නාගේ හෝ වත්පළිවෙත් පුරන්නාගේ හෝ චේතනා ශීලය නම්වෙයි. (*පාණාතිපාතාදීහි වා විරමන්තස්ස වත්තපටිපත්තිං වා පූරෙන්තස්ස චෙතනාදයො ධම්මා*) ශීලය වනාහි සෑම කුසලයකටම පදනමවෙයි. ශීලයෙහි පිහිටා භාවනා කිරීමෙන් නිවන් පසක්කෙරෙයි.
ශීලය සංසාර සාගරයෙන් එතරවීමට පිහිටවන රන් නැවකට සමානකර ඇත. ශීලානිසංස පහක් ගැන සඳහන්වෙයි. ශීලයෙහි අනුසස්නම්. උඩු සුලඟටත් යටි සුලඟටත් හමායන සිල්සුවඳට සමාන සුවඳක් නැත. පන්සිල්, අටසිල්, දසසිල්, අධිශීලය ආදී ශීලයෙහි ප්‍රභේද රාශියක් පෙන්නා ඇත.[2]

සමාධිය - *සමාධි.*

සමාධි නම් 'කුසල් සිත් පිළිබඳ එකඟබවයි (*කුසලචිත්තෙකග්ගතා සමාධි* ) එහි ප්‍රභේද රාශියක් ඇත. සමාධිය ලබාගැනීමට බුදුසමයෙහි පිළිගැනෙන භාවනා ක්‍රම දෙකකි. එනම් සමථ හා විදර්ශනා වයි. සමථයෙන් මානසික සංසුන්බව, ඒකාග්‍රතාව හා ක්‍රියාකාරී (වැඩුණු) බව ඇති වෙයි, සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, ලක්ෂණ පසක් කරන්නේ විදර්ශනාවෙනි.[3]

---

[1] සතිඅ. I . 133
[2] සිවි. 8. 8 . BD .170,
[3] එහිම. 8 .133

ප්‍රඥාව - පඤ්ඤා.
නුවණ, දැනීම, අවබෝධය යන තේරුම් දෙයි. කුසල් සිතක යෙදුණු විදර්ශනා ඥානය මෙහිදී ප්‍රඥා යනුවෙන් අදහස්වෙයි. ප්‍රඥාව හෙවත් පූර්ණ ප්‍රතිභා ඥානය එය ලබා ගන්නා ක්‍රම අනුව ත්‍රිවිධව දක්වනු ලැබේ. එනම්: චින්තාමය, සුතමය, භාවනාමය වශයෙනි. අන්‍යයන්ගෙන් ඉගෙනුමක් නො ලබා තමන්ගේම චින්තනය හා විමංසනය මෙහෙයවා ලබා ගන්නා ප්‍රඥාව චින්තාමය ප්‍රඥාව ය. අනුන් වෙතින් ඉගෙනීමෙන්, බණ පොත කියවීමෙන් ලබා ගන්නා ප්‍රඥාව සුතමය ප්‍රඥාවයි. භාවනාව මගින් ලබා ගන්නා ප්‍රඥාව භාවනාමය ප්‍රඥාවයි.[1]

සිල්හි පිහිටා සමාධිය වඩා ප්‍රඥාව ලැබීමෙන් නිවන් අවබෝධය වෙයි, සියලු දුක් නැතිවෙයි.

බුදුරදුන්ගේ ත්‍රිවිධ ශාසනය සියලු පාපයන්ගෙන් වැළකීම, කුසල් දහම් වැඩීම හා සිය සිත පිරිසිදු කිරීම යන තුන් කරුණින් සමන්විත වෙයි. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂා මෙයින් අදහස් වෙයි. නිර්වාණාවබෝධය සඳහා ශීලයෙහි පිහිටා සමාධිය වැඩිය යුතුය. බුදු දහමේ හරය නම් සියලු පව් නොකිරීම, කුසල් කිරීම හා තම සිත පිරිසිදු කිරීම වෙයි. සියලු බුදුවරයන්ගේ ඉගැන්වීම හෙවත් අනුශාසනය මේ කරුණු ම ය.[2]

*සබ්බපාපස්ස අකරණං*
*කුසලස්ස උපසම්පදා*
*සචිත්ත පරියොදපනං*
*එතං බුද්ධාන සාසනං"* [3]

ජටා සූත්‍රයට (1. 3. 3) අනුව එක්තරා දෙව් කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ මෙසේ ඇසුවේය.

---

[1] එහිම. ස්කන්ධනිර්දේශය. පි .157
[2] සිවි. පි. 6
[3] ධප. 183

(දෙවතා) *අන්තො ජටා බහි ජටා*
*ජටාය ජටිතා පජා*
*තං තං ගොතම පුච්ඡාමි*
*කො ඉමං විජටයෙ ජටන්'ති*

ඇතුළත අවුල්ය, පිටත අවුල්ය, සත්ත්ව ප්‍රජාව අවුලෙන් වෙළුනේය, එහෙයින් ගෞතමයන් වහන්ස, කවර කෙනෙක් මේ අවුල නිරවුල් කරන්නේ දැ යි? එකරුණ පුළුවුස්මි (විමසමි). එයට පිළිතුරු දෙන බුදුහු මෙසේ දෙසූහ.

(භගවත්හු) *සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො*
*චිත්තංපඤ්ඤඤ්ච භාවයං*
*ආතාපී නිපකො භික්ඛූ*
*සො ඉමං විජටයෙ ජටන්'ති*

පිළිසඳනුවණ ඇති කෙලෙස් තවන වෙර ඇති තීරණප්‍රඥායෙන් යුත් සසර බිය දක්නා සුලු ඒ සත්ත්ව තෙමේ ශීලයෙහි පිහිටා, සමාධිය හා ප්‍රඥාව වඩමින් මේ අවුල නිරවුල් කරන්නේ යි.[1] )

## ඇතෙකු ලෙස

නාග සූත්‍රය. 4. 1. 2.

තථාගතයන්වහන්සේ බුදුවීමෙන් පසු පස්වැනි සතියේ උරුවෙල් දනව්වෙහි නේරඤ්ජරා ගන්තෙර අජපාල නුගරුකමුල වැඩවිසූහ. එකල්හි බුදුන් වහන්සේ රාත්‍රී දැඩිගනඳුරෙහි එළිමහනෙක වැඩඋන්සේක. ඒ අවස්ථාවේ පවිටුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට භය වෙවුළුම උපදවීමට මහත් ඇත් රජ වෙසක් මවාගෙන බුදුන් වෙතට පැමිණියේ ය. මේ පවිටු මාරයා බව තේරුම් ගත් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

---

[1] සනි. I . පි.26

(භගවත්හු) *සංසාරං දීඝමද්ධානං*
*වණ්ණං කත්වා සුභාසුභං*
*අලං තෙ තෙන පාපිම*
*නිහතො ත්වමසි අන්තකාති.*

දීර්ඝ කාලයක් මුළුල්ලේ සැරිසරන්නේ ශුභාශුභ වේශ විලාස කොට මාවෙත පැමිණියෙහිය. මාරය, එයින් තට කම් නැත. මාරය, තෝ නැසුනේ වෙහි.[1]
ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නො සතුටු ව නො පෙණී ගියේය.

## විසිතුරු සටහන් මවයි

### සුභ සූත්‍රය 4.1.3

තථාගතයන්වහන්සේ බුදුවීමෙන් පසු උරුවෙල් දනව්වෙහි වැඩවිසූහ. එකල්හි බුදුන් වහන්සේ රාත්‍රි දැඩිගනඳුරෙහි එළිමහනෙක වැඩඋන්සේක. ඒ අවස්ථාවේ පවිටුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට භය වෙවුළුම උපදවීමට උන්වහන්සේ වෙතට පැමිණ ප්‍රිය වූත් අප්‍රිය වූත් විසිතුරු සටහන් පෙන්වීය.
මේ පවිටු මාරයා බව තේරුම් ගත් තථාගතයන්වහන්සේ මෙසේ දෙසූහ.

(භගවත්හු) *සංසාරං දීඝමද්ධානං*
*වණ්ණං කත්වා සුභාසුභං*
*අලං තෙ තෙන පාපිම*
*නිහතො ත්වමසි අන්තකාති.*

දීර්ඝ කාලයක් මුළුල්ලේ සැරිසරන්නේ ශුභාශුභ වේශ විලාස

---
[1] ස නි I . පි.190

කොට මාවෙත පැමිණියෙහිය. මාරය, එයින් තට කම් නැත. මාරය, තෝ නැසුනේ වෙහි.

*යෙ ච කායෙන වාචාය*
*මනසා ච සුසංවුතා*
*න තෙ මාර වසානුගා*
*න තෙ මාරස්ස බද්ධගූති*

යම් කෙනෙක් කයින් ද වචනයෙන් ද සිතින් ද මනාව සංවෘත වෙද්ද, මරුව, ඔහු තට වසඟ නො වෙත්. ඔවුහු මාරයාගේ බැම්මට අසු නො වෙත්.[1]

ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නොසතුටු ව නොපෙණී ගියේය.

( මනාව සංවෘත - *සුසංවුතා*

කය, වචනය, සිත සංවර කර ගත්තේ නම් ඔවුහු මාරයාගේ බැම්මට අසු නො වෙත්. තුන් දොරින් කෙරෙණ අකුසල් වලින් වැලකීම මනා සංවර යයි.

කායික කර්ම:- සතුන් මැරිම, සොරකම, කාමයෙහි වරදවා හැසිරීම.

වාචසික කර්ම:- බොරුකීම, කේලාම් කීම, රළු වචන කීම, හිස්බස් දෙඩීම.

මනො කර්ම:- දැඩි ලෝභය, ද්වේෂය, මිථ්‍යා දෘෂ්ටිය.

කවර නම් කාය කර්මයක් කිරීමෙන් අයහපත් ප්‍රතිඵල වැඩිවීමත් යහපත් ප්‍රතිඵල හීන වීමත් සිදුවෙද?

---

[1] එහිම

මෙලොව කෙනෙක් සතුන් මරයි, ලේ තැවරුණු අතින් සතුන්ට පහර දෙයි හිංසා කරයි, සතුනට කිසිදු කරුණාවක් නොදක්වයි. කෙනෙක් නුදුන් දෙය ගනියි. නගරයෙහි දී හෝ කැලයෙහිදී හෝ අනුන්ගේ ධනධාන්‍ය වස්තුව පැහැර ගිනියි. ඔහු කාමයෙහි වරදවා හැසිරෙයි, මව විසින් රක්නා ලද, පියා විසින් රක්නා ලද, දෙමාපියන් විසින් රක්නා ලද, සොහොයුරා විසින්, සොහොයුරිය විසින්, ඥාතීන් විසින්, සැමියා විසින්, ඒකාන්තයෙන් රක්නා ලද ස්ත්‍රීන් සමඟ යටත් පිරිසෙයින් විවාහයට නියමිතව මල්දමක් හෝ පළඳනා ලද කාන්තාවන් සමඟ අයථා කාම සේවනයෙහි යෙදෙයි. එබඳු කායික කර්ම අකුශල තත්ත්වයන් වර්ධනය වී කුශල තත්ත්වයන් හීන වීම ඇති කරවයි.

කවර නම් කායික කර්ම කිරීමෙන් අකුශල තත්ත්වයන් යටපත් වී කුශල තත්ත්වයන් වර්ධනයට පත්වේද?

මෙලොව යමෙක් සතුන් මැරීමෙන් වෙන් වී සත්ව ඝාතනය අතහැර, දඬු මුගුරු අවි ආයුධ ඉවත දමා සියලු සත්වයන් කෙරෙහි දයානුකම්පාව පතුරුවයි ද, නුදුන් දෙය නොගෙන සොරකමෙන් ඉවත්ව ගමෙහි හෝ නගරයෙහි හෝ කැලයෙහි හෝ අනුන් සතු දේපල ධනධාන්‍ය පැහැර නොගනියි ද යමෙක් කාමමිථ්‍යාචාරයෙන් වෙන්ව මාපියන් සොයුරු සොයුරියන් ආදීන් විසින් රක්නා ලද අනුන් භාරයේ සිටින කාන්තාවන් හා අයථා කාමසේවනයෙහි නොයෙදේද එබඳු කායික කර්ම කිරීමෙන් කුසල් වර්ධනය වී අකුසල් පිරිහී යයි.

කවර නම් වාචසික කර්ම කිරීමෙන් අකුසල් වර්ධනය වී කුශල තත්වයන් මැඩ පැවැත්වේ ද?

මේ ලෝකයෙහි යමෙක් බොරුකීමෙන් වළකී ද, අධිකරණයකට හෝ සභාවකට හෝ ඥාතීන් ඉදිරියට හෝ රජ මැදුරට හෝ පමුණුවා සාක්ෂ්‍යකරුවකු වශයෙන් ගෙන ප්‍රශ්න කළ විට තමා නොදත් දෙයක් දනිමියි කියා ද දත් දෙයක් නොදනිමියි කියා ද නොදුටු දෙයක් දුටුවෙමියි කියා ද දුටු දෙයක් නො දුටුවෙමි.යි

කියා ද තමා නිසා හෝ අනුන් නිසා හෝ ලාභ ප්‍රයෝජනයක් නිසා හෝ දැන දැන අසත්‍ය කීම ප්‍රකාශ කෙරේ ද, එසේම යමෙක් මිතුරන් සතුරන් කරණ අදහසින් එක්කෙනෙකුගෙන් ඇසූ දෙය තවත් කෙනකුට කේලමක් වශයෙන් කියයි ද? මිතුරන් අතර සමගියට සමාදානයට අකමැතිව අසමගිය අසමාදානය කැමති වෙයි ද යමෙක් පරුෂ වචන රළුවචන, ද්වේෂ සහගත වචන කියයි ද, යමෙක් හිස් නිෂ්ඵල වචන කියයි ද අරුත් සුන් වචන තැන නොතැන නොබලා කියයි ද ධර්මයට විනයට විරුද්ධ වචන ප්‍රකාශ කරයි ද එබඳු වාචසික කර්ම කිරීමෙන් එසේ කරන්නාගේ කුශලතත්ත්වයන් පිරිහී අකුශල තත්ත්වයන් වර්ධනය වෙයි.

කවර නම් වාචසික කර්ම කිරීමෙන් කරන්නාගේ අකුශල තත්ත්වයන් පිරිහී කුශල තත්ත්වයන් වර්ධනය වේද?

යමෙක් මෙලොව බොරුව අතහැර සත්‍යයම කියන්නේ ද? අධිකරණයට හෝ සභාවකට හෝ ඥාති මධ්‍යයට හෝ රාජ මන්දිරයට හෝ සාක්ෂිකරුවකු ලෙස කැඳවා 'යහපත් මිනිස, ඔබ දන්නා දෙය කියන්නැයි ප්‍රශ්න කළ විට, නොදත් දෙය නොදනිමියි කියා ද දත් දෙය දනිමිය කියා ද ඇසූ දෙය ඇසීමියි කියා ද නොඇසූ දෙය නොඇසීමියි කියා ද? තමා නිසා හෝ අනුන් නිසා හෝ කිසියම් ලාභ ප්‍රයෝජනයක් නිසා හෝ දැන දැන අසත්‍යයක් ප්‍රකාශ නොකෙරේ ද? එසේම දුෂ්ට අදහස හැරදමා කේලාම් කීමෙන් වෙන්ව මිතුරන් බිඳවීම සඳහා කෙනකුගෙන් ඇසූ දෙය තවකෙනකුට කේළාම් වශයෙන් නොකියයි ද බිඳුනු මිතුරන් සමගි කරයි ද සමගියම සතුටුවෙයි ද, පරුෂ වචනයෙන් වැළකී, මෘදු සිළිටි කණට මිහිරි කන්කළු වදන් පවසයි ද බෙහෙවින් ආදරණීය වචන සිෂ්ට වචන ප්‍රකාශ කරයි ද, හිස්වචන කීමෙන් වැළකී අර්ථ සහිත වැඩදායක අරුත්බර වචන ප්‍රකාශ කරයි ද එබඳු වාචසික කර්ම කිරීමෙන් කරන්නාගේ කුශල තත්ත්වයන් වර්ධනය වී අකුශල තත්වයන් මැඩ පැවැත්වෙයි.

කවර නම් මානසික කර්ම කිරීමෙන් කරන්නාගේ අකුශල් වර්ධනය වී කුශල් මැඩ පැවැත්වෙයි ද?

මෙලොව යමෙක් දැඩි ලෝභයෙන් යුතුව අන්සතු වස්තුවෙහි දැඩි ලෝභයෙන් එම වස්තුව මට වේවායි සිතයි ද, දැඩි ද්වේෂයෙන් යුතුව වෛරී මනසින් අනුන් වැනසේවා මියේවායි පතන්නේ ද? එසේම කර්මයක් කර්ම විපාකයක් නැත මෙලොවක් නැත පරලොවක් නැත ආදී වශයෙන් මිසදිටු දරන්නේ ද? එබඳු මානසික කර්ම කිරීමෙන් අකුශල තත්වයන් වර්ධනය වී කුශලතත්වයන් මැඩ පැවැත්වෙයි.

කවර නම් මානසික කර්ම කිරීමෙන් කරන්නා තුළ කුශලයන් වර්ධනය වී අකුශල මැඩ පැවැත්වේ ද?

මෙලොව යමෙක් දැඩි ලෝභයෙන් වෙන්ව අනුන්ට අයත් වස්තුවෙන් ලෝභ නොඋපදවයි ද, අනුන් කෙරෙහි ද්වේෂයෙන් තොරව මෛත්‍රී සහගත සිතින් යුක්ත වේද කර්ම ඇත කර්ම විපාක ඇත මෙලොව ඇත පරලොව ඇත ආදී වශයෙන් සම්‍යක් දෘෂ්ටියෙන් යුතුව මිථ්‍යා දෘෂ්ටිය හැර දමයි ද එබඳු මානසික ක්‍රියා කිරීමෙන් කුශලය වර්ධනය වී අකුශලය මැඩ පැවැත්වෙයි.[1]

*'පාණඝාත පරද්දබ්බං පරදාරඤ්ච කායතො*
*මුසා පෙසුඤ්ඤ ඵරුසා සම්ඵප්පලාපා ච වාචසො*
*අභිජ්ඣාචෙව ව්‍යාපාදො මිච්ඡාදිට්ඨී ච මානසො'*

*කායෙන සංවුතා ධීරා අථො වාචාය සංවුතා*
*මනසා සංවුතා ධීරා තෙ වෙ සුපරිසංවුතා*

ඥානවන්තයෝ කයින් සංවර වෙති වචනයෙන් සංවර වෙති සිතින් සංවර වෙති එසේ වූ වෝ ඒකාන්තයෙන් ම මනා ලෙස සංවර වූ අය වෙති[2] . )

---

[1] මනි. I පි.655
[2] ධප. 234

පඨමපාස සූත්‍රය 4.1.4. දුතියපාස සූත්‍රය 4.1.5. බ. පි. 22[1]

## නාගයෙකු ලෙස

### සප්ප සූත්‍රය. 4. 1. 6.

එක් කලෙක තථාගතයෝ රජගහනුවර කලන්දකනිවාපයේ වේළුවනාරාමයේ වැඩවිසූහ. එකල්හි පවිටු මාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට භය වෙවුළුම උපදවීමට උන්වහන්සේ වෙතට විශාල නාගරජවෙසක් මවාගෙන පැමිණියේය. ඔහුගේ සිරුර එක්රුක්නෙන් මැවූ (එක් ගසකියේ තැනූ) මහ ඔරුවක් බඳු වෙයි. ඔහුගේ පෙණය රාකරුවන්ගේ රා පෙරණ මහත් මටුලුකස්සක් බඳු වෙයි. ඔහුගේ ඇස් කොසොල්රජුගේ කස්තලියක් ( භුඤ්ජනපාතියක් - ආහාර අනුභව කරණ රන් බඳුන) බඳු වෙයි. මේඝය ගිගිරි කරණ කල යම්සේ විදුලිය නික්මෙයි ද, එපරිද්දෙන් ඔහුගේ මුවින් දිව නික්මෙයි. කඹුරුසම වායු පුරණ කල්හි ශබ්දය යම්සේ ද, ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාස ශබ්දය එබඳු වෙයි.

මේ පවිටු මාරයා බව තේරුම් ගත් තථාගතයන්වහන්සේ ඔහුට මෙසේ දෙසූහ.

(භගවත්හු) *චරකා බහූ භෙරවා බහූ*
*අථො ඩංසසිරිංසපා බහූ*
*ලොමම්පි න තත්ථ ඉඤ්ජයෙ*
*සුඤ්ඤාගාරගතො මහා මුනී*

(සිංහ ව්‍යාඝ්‍රාදී) බිහිසුනු ජංගම සත්තු ද බොහෝ හ. බිසුනු ස්ථාවර අරමුණු ද බොහෝය. වැලි (තව ද) ඩැහ ලේ බොන

[1] සංයුත්තනිකායේ මේ සූත්‍ර දෙකට සමාන අදහස් මහාවග්ග පාළියේ සඳහන්වෙයි.

මැස්සෝ ද සර්පයෝ ද බොහෝහ. ශූන්‍යාගාරයට වන් සර්වඥමුනි තෙමේ ඒ අරමුණු නිමිති කොට ලෝම මාත්‍රයකුදු කම්පන නො කරන්නේ ය.
කෙලෙසුන් නැසූ තථාගතයන්ට කම්පාවීම් බියවීම් ආදිය නැත යයි දෙසූහ. ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක ය යි නොසතුටු ව නොපෙණී ගියේය.[1]

## කිම නිදයි ද? විමසයි

සොප්පසි සූත්‍රය. 4. 1. 7. ★

එක්කලෙක තථාගතයන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාපයේ වේළුවනාරාමයේ වැඩවිසූහ. එකල්හි එක් දිනක රෑ බෝවන තුරු සක්මනෙහි යෙදී යහනට සැපත්ව සිහි නුවණ ඇතිව සිංහසෙය්‍යාවෙන් සිටියහ.
එකල්හි පවිටුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණ මෙසේ කීය.

(මාරයා) *කිං සොප්පසි කින්නු සොප්පසි*
*කිමිදං සොප්පසි දුබ්භගො විය*
*සුඤ්ඤමගාරන්ති සොප්පසි*
*කිමිදං සොප්පසි සුරියෙ උග්ගතෙ.*

කිම නිදයි ද? කුමක්හෙයින් නිදයි ද? මළ එකකු මෙන් කුමකට නිදයි ද? ශූන්‍යාගාරයක් මා විසින් ලදැයි නිදයි ද? කුමක් හෙයින් හිරු නැගිකල්හි නිදයි ද?

---

[1] සනි. I. පි.195
★ සුපති සුත්තං ඡට්ඨ සංගීති, සුප්පති සුත්තං PTS

(භගවත්හු) *යස්ස ජාලිනී විසත්තිකා*
*තණ්හා නත්ථි කුහිඤ්චි නෙතවෙ*
*සබ්බූපධීනං පරික්ඛයා බුද්ධො*
*සොප්පති කිං තවෙත්ථ මාරා'ති*

යමෙකුගේ ජාලිනී (දැලක් වැනි) නම් වූ විසත්තිකා (ඇලෙනසුලු) නම් වූ තෘෂ්ණාව භවයෙක්හි පමුණුවන්නට නැද් ද ඒ සර්වඥ තෙමේ සියලු උපධීන් ක්ෂය කිරීමෙන් හොවී, මරුව, මෙහිලා තට කිම?.[1]

ඉන්පසු පවිටු මාර තෙමේ භාග්‍යවතුන්වහන්සේ මා දන්නා සේක යයි නොසතුටු ව නොපෙණී ගියේය.

## සතුටට හේතුවන කරුණු කියයි.

නන්දති සූත්‍රය 4. 1. 8.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩවසද්දී පවිටු මාරයා උන්වහන්සේ වෙතට එළඹ මෙසේ පැවසී ය.

(මාරයා) *නන්දති පුත්තෙහි පුත්තිමා*
*ගොමිකො ගොහි තථෙව නන්දති*
*උපධී හි නරස්ස නන්දනා*
*න හි සො නන්දති යො නිරූපධීති*

දරුවන් ඇත්තේ දරුවන් හේතු කොට ගෙණ සතුටුවෙයි. එසේ ම ගවයන් ඇත්තේ ගවයන් හේතු කොට ගෙන සතුටුවෙයි. උපධීහු (කෙලෙස්) මිනිසාගේ නන්දනයෝ ය ( සතුටට

[1] සනි I පි. 196

හේතුවෙයි). යමෙක් උපධි රහිත වේ නම් හෙ තෙමෙ සතුටු නො වෙයි.

(භගවත්හු ) *සොචති පුත්තෙහි පුත්තිමා*
*ගොමිකො ගොහි තථෙව සොචති*
*උපධි හි නරස්ස සොචනා*
*න හි සො සොචති යො නිරූපධීති*

දරුවන් ඇත්තේ දරුවන් හේතු කොට ගෙන ශෝක කෙරෙයි. එසේ ම ගවයන් ඇත්තේ ගවයන් හේතු කොට ගෙන ශෝක කෙරෙයි. උපධීහු (කෙලෙස්) මිනිසාගේ ශෝචන යෝ ය ( ශෝකයට හේතුවෙයි). යමෙක් උපධි රහිත නම් හෙ තෙමෙ ශෝක නො කරේ මැයි.
මාර තෙමේ නො සතුටු ව නොපෙණී ගියේය.[1]

*( පුත්තාමත්ථි ධනම්මත්ථි*
*ඉතිබාලො විහඤ්ඤති*
*අත්තා හි අත්තනො නත්ථි*
*කුතො පුත්තා කුතො ධනං*

දූදරුවෝ මට ඇත, ධනය මට ඇත කියමින් අඥානයා වෙහෙසෙයි. තමාට තමා වත් නැති කල දූදරුවන් කොහින් ද? ධනයක් කොහින් ද[2] ? )

## ආයුෂ දීර්ඝ ලෙස පෙනෙයි .

පඨම ආයු සූත්‍රය. 4. 1. 9.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාපයේ වේළුවනාරාමයේ වැඩවිසූහ. එහි දී

[1] එහිම.
[2] ධප 62

උන්වහන්සේ භික්ෂූන් අමතා මෙසේ වදාළසේක.

*අප්ප මිදං භික්ඛවෙ මනුස්සානං ආයු, ගමනීයො සම්පරායො, කත්තබ්බං කුසලං, චරිතබ්බං බ්‍රහ්මචරියං, නත්ථි ජාතස්ස අමරණං. යො භික්ඛවෙ චිරං ජීවති. සො වස්ස සතං අප්පංවා භීයෙ‍‍‍ය්‍යති.*

මහණෙනි, මිනිසුන්ගේ ආයුෂය අල්පය, පරලොව යායුතු ය, කුසල් කළයුතු ය, බඹසර හැසිරිය යුතු ය, උපන්අයට නොමැරීමක් නැත. මහණෙනි, යමෙක් බොහෝ කලක් ජීවත් වේ නම් හෙතෙමේ මඳක් අඩුවැඩි වශයෙන් සියක් වසක් ජීවත් වෙයි.

ඉක්බිති බුදුන් වෙතට පැමිණි මාරයා මෙසේ පැවසීය

(මාරයා) *දීඝමායු මනුස්සානං*
*න නං හීළෙ සුපොරිසො*
*චරෙය්‍ය ඛීරමත්තොව*
*නත්ථි මච්චුස්ස ආගමො'ති.*

මිනිසුන්ගේ ආයුෂ දිගය. සත්පුරුෂ තෙමේ එය හෙලා නොදක්නේ ය. කිරිබොන දරුවකු මෙන් හැසිරෙන්නේ ය. මරණයාගේ ඊමෙක් නැත

ඒ මාරයාගේ කීමක් බව තේරුම්ගත් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

(භගවත්හු) *අප්පමායු මනුස්සානං*
*හීළෙය්‍ය නං සුපොරිසො*
*චරෙය්‍යාදිත්ත සීසොව*
*නත්ථි මච්චුස්ස නාගමො'ති.*

මිනිසුන්ගේ ආයුෂ අල්පය. සත්පුරුෂ තෙමේ එය හෙලා දක්නේ

ය. හිස ගිනි ගත්තෙකු මෙන් හැසිරෙන්නේ ය. මරණයාගේ නො ඊමෙක් නැත.
ඉන්පසු මාර තෙමෙ අතුරුදහන් වි ය.[1]

දුතියආයු සූත්‍රය. 4. 1. 10

මෙය පඨම ආයු සූත්‍රයට සමානය. වෙනත් අවස්ථාවක මාරයා බුදුන් වෙතට පැමිණ ඔහුගේ මරණය පිළිබඳ මතය පැවසීය. බුදුහු එය ප්‍රතික්ෂේප කළහ.[2]

## ගල් පෙරලයි

පාසාණ සූත්‍රය. 4. 2. 1.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර සමීපයේ ගිජුකුළු පවුවෙහි වැඩවිසූහ. එකල්හි එක් දිනක බුදුන් වහන්සේ රාත්‍රි දැඩිගනඳුරෙහි එළිමහනෙක වැඩඋන්සේක. ඒ අවස්ථාවේ පවිටුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට භය වෙවුළුම උපදවීමට උන්වහන්සේ නුදුරේ මහත් ගල් විසුරුවේය. භාග්‍යවතුන් වහන්සේ එයට කම්පා නො වූහ.[3]

## සිංහනාද නො කරන්න

සීහ සූත්‍රය. 4. 2. 2.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දාහු දහම්

---

[1]සනි. I පි. 198
[2] එහිම.
[3] එහිම.

දෙසූහ.
එකල්හි පවිටුමාර, මේ ශ්‍රමණ ගෝතම තෙමේ මහත් පිරිසක් පිරිවරා ගෙන දහම් දෙසයි. බණ අසන්නවුන්ගේ නුවණැස වසන්නේ නම් මැනවයි සිතා බුදුන් වෙතට එළඹ මෙසේ පැවසීය.

(මාරයා) *කින්නු සීහොව නදසි පරිසායං විසාරදො*
*පටිමල්ලො හි තෙ අත්ථි විජිතාවී නු මඤ්ඤසීති*

කිම? පිරිස් මැද සිංහයකු මෙන් විශාරදව නොබියව නාද කරන්නේ ද? දිනූ විජය ඇතියෙමි යි සිතන්නේ ද? ඔබට ප්‍රතිමල්ලවයෙක්, හතුරෙක් ඇත්තේමය.

මෙයට පිළිරු දෙන බුදුහු මෙසේ වදාළහ.

(භගවත්හු) *නදන්ති වෙ මහා වීරා*
*පරිසාසු විසාරදා*
*තථාගතාබලප්පත්තා*
*තිණ්ණා ලොකෙ විසත්තිකන් 'ති.*[1]

ලොව තෘෂ්ණාව තරණය කළ බලයට පැමිණි මහා වීර වූ තථාගතයෝ ඒකාන්තයෙන් පිරිස් මැද විසාරදව නාද කෙරෙත්. ඉන්පසු මාර තෙමේ අතුරුදහන්විය.

( බලයට පැමිණි - *බලප්පත්තා* යන්නෙන් අදහස් කරන්නේ දසවිධ ඥාන බලයට පැමිණි බවයි. මහා සීහනාද සූත්‍රයට අනුව උන්වහන්සේට දසවිධ ඤාණ බල තිබුණි.

එම දසවිධ ඤාණ බල මෙ සේ ය.[2]
තථාගතයන් වහන්සේ විය හැකි දේ විය හැකි දේ ලෙසත් නොවිය හැකි දේ නොවිය හැකි දේ ලෙසත් වටහා ගනිති.

---

[1] සනි. I පි. 202
[2] මනි. පි. 164

එය තථාගතයන් වහන්සේගේ බලයක් වන අතර එයින් උන්වහන්සේ පිරිස් මැද සිංහනාද නගමින් ධර්මචක්‍රය පවත්වති.
තථාගතයන් වහන්සේ අතීත අනාගත වර්තමාන යන කාලත්‍රයවර්තී කර්මයන්ගේ විපාකයන් හේතු ප්‍රත්‍ය සහිතව තත් වූ පරිද්දෙන් දනිති. එය ද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ සෑම දෙසකටම විහිදී යන පිළිවෙත් මාර්ගය මනාව තත්වූ පරිද්දෙන් දනිති. එයද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ විවිධ වූ මූලද්‍රව්‍යයන්ගෙන් සැදුණු ලෝකය තත්වූ පරිද්දෙන් දනිති. එයද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ අනෙක් සත්වයන්ගේ, පුද්ගලයන්ගේ ඉන්ද්‍රියන්ගේ ක්‍රියාකාරිත්වය තත් වූ පරිද්දෙන් දනිති. එය ද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ ධ්‍යාන විමුක්ති සමාධි සමාපත්තින්ගේ කිළිටි වීම, පිරිසිදු වීම සහ එම කෙළෙසුන්ගෙන් නැගී සිටීම ද තත්වූ පරිද්දෙන් දනිති. එයද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ තමන්ගේ අතීත උප්පත්ති භවයන්ගේ එක් ජාතියක් ජාති දෙකක් ආදි වශයෙන් කල්ප ගණන්හි වූ ජාතීන් සියලු විස්තර සහිතව ස්මරණය කරති. එයද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ තමන්ගේ මනුෂ්‍යත්වය ඉක්මවා සිටි දිව ඇසින් අනෙක් සත්වයන් ඔවුන්ගේ කර්මානුරූපව විවිධ භවයන්හි උපදින සැටිත් මියයන සැටිත් තත් වූ පරිද්දෙන් දනිති. එය ද තථාගත බලයෙකි.
තථාගතයන් වහන්සේ ආශ්‍රවයන් ක්ෂය වීමෙන් අනාශ්‍රව වූ චෙතොවිමුක්තිය හා ප්‍රඥා විමුක්තිය ස්වකීය නුවණින් ප්‍රත්‍යක්ෂ කොට මෙම අත්බැව්හිම ඊට සමවැද වාසය කරන සේක. එය ද තථාගත බලයෙකි.
මෙම තථාගත බලයන් නිසා උන්වහන්සේ පිරිස් මැදට එළඹ විශාරද ව තම ධර්මය දෙසමින් සිංහනාද නඟති.[1] )

[1] මනි. I පි. 164, පි. ස ධ ච පි. 446

## වැඩ නැද්දැ යි? විමසයි

### සකලික සූත්‍රය 4. 2. 3.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර මද්දකුච්ඡි නම් මුවවනයේ වැඩවිසූහ. එකල්හි මාර තෙමේ පැමින මෙසේ පැවසීය,

(මාරයා) *මන්දියා නු ඛො සෙසි*
*උදාහු කාවෙය්‍යමත්තො*
*අත්ථානු තෙ සම්පචුරා න සන්ති*
*එකො විවිත්තෙ සයනාසනම්හි*
*නිද්දා මුඛො කිමිදං සොප්පසෙවා'ති*

මුළාබැවින් හෝ කවිභාවයෙන් මත්වූයේ හෝනෙහි ද? තොපට බොහෝ වූ වැඩ නැද් ද? ජනයාගෙන් වෙන් වූ සෙනසුන්හි නිදිබර මුහුණු ඇතිව හුදකලාව ම කුමක් හෙයින් හෝනෙහි ද?.

මෙයට පිළිරු දෙන බුදුහු මෙසේ වදාළහ.

(භගවත්හු) *න මන්දියා සයාමි නාපි කාව්‍යමත්තො*
*අත්ථං සමෙච්චාහමපෙතසොකො*
*එකො විවිත්තො සයනාසනම්හි*
*සයාමහං සබ්බභූතානුකම්පී.*

මුළාබවෙන් නො නිදමි. කවිභාවයෙන් මත් වූ යේම් නො නිදමි. මම පරමාර්ථයට මැවින් පැමිණ පහව ගිය ශෝක ඇත්තේම් වෙමි. මම සියලු සත්ත්වානුකම්පීව ජනයාගෙන් වෙන් වූ සෙනසුන්හි හුදකලාවම හෝනෙමි. මාරයා අතුරුදහන්විය.[1]

---

[1] ස නි පි .202

## අනුශාසනා සුදුසු නො වේ යයි පවසයි

පතිරූප සූත්‍රය. 4.2.4.

එක් කලෙක කොසොල් දනව්වේ ඒකසාලා නම් බමුණු ගමේ වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ මහත් පිරිසක් විසින් පිරිවරණ ලද්දාහු දහම් දෙසූහ.
එකල්හි පව්ටුමාරයා මේ ශ්‍රමණ ගෝතම තෙමේ මහත්පිරිසක් පිරිවරා ගෙන දහම් දෙසයි. බණ අසන්නවුන්ගේ නුවණැස වසන්නේ නම් මැනවයි සිතා බුදුන් වෙතට එළඹ මෙසේ පැවසීය.

(මාරයා) *නෙතං තව පතිරූපං*
*යදඤ්ඤමනුසාසි*
*අනුරොධවිරොධෙසු*
*මා සජ්ජිත්ථො තදාචරන්'ති.*

යම් හෙයකින් මෙරමාහට අනුශාසනා කෙරෙහි ද, එය ඔබට සුදුසු නො වේ. එය කෙරමින් රාග- ප්‍රතිඝ දෙක්හි නො ලැගව.
මෙයට පිළිතුරු දෙන බුදුහු මෙසේ වදාළහ.

(භගවත්හු) *හිතානුකම්පී සම්බුද්ධො*
*යදඤ්ඤමනුසාසති*
*අනුරොධවිරොධෙහි*
*විප්පමුත්තො තථාගතො'ති*

යම් හෙයකින් සර්වඥ තෙමේ හිතානුකම්පා ඇතිව මෙරමා හට අනුශාසනා කෙරේ ද, ඒ තථාගත තෙමේ රාග ප්‍රතිඝ දෙකින් විශේෂයෙන් මිදුනේ වෙයි.[1]
මාරයා අතුරුදහන්විය.

---

[1] එහිම

මානස සූත්‍රය. 4. 2. 5

මේ සූත්‍රයේ අදහස් මහාවග්ගපාළියේ එන කරුණු වලට සමානය බ. පි. 20

## ගවයෙකු ලෙස

පත්ත සූත්‍රය. 4. 2. 6

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ උපාදානස්කන්ධ පහ පිළිබඳව භික්ෂූන්ට දෙසූහ. භික්ෂූහු එයට සැදැහයෙන් ම සවන් දුන්හ.
එකල්හි පාත්‍ර ගනනාවක් එළිමහනේ තිබුණි. මාරයා බණ අසන්නවුන්ගේ නුවණැස වසන්නේ නම් මැනවයි සිතා මහත් ගොන් වෙසක් මවාගෙන ඒ පාත්‍රයන් වෙතට එළඹියේ ය.
ඒ දුටු එක්තරා මහණ කෙනෙක් තවත් මහණෙකුට ' මහණ, මහණ, මේ ගොණා පාත්‍ර බිඳින්නේ ය' යි කී ය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට ' මහණ, හේ ගොණෙක් නො වේ මේ පවිටු මරු ය. තොපගේ පැණැස වනසන්නට පැමිණියේ ය '. ඉක්බිති තථාගතයෝ මාරයාට මෙසේ දෙසූහ.

(භගවත්හු) *රූපං වෙදයිතං සඤ්ඤං*
*විඤ්ඤාණං යඤ්ච සංඛතං*
*නෙසො හමස්මි නෙතං මෙ*
*එවං තත්ථ විරජ්ජති*

රූපය, වේදනාව, සංඥාව , විඥානය හා යම් සංස්කාර ධර්මයෙක් වේ නම් එය හා මේ පස්කඳ මම නො වෙමි තෙල මා ගැත්තේ නොවේ යයි මෙසේ එහි නො ඇලේ.

*එවං විරත්තං ඛෙමත්තං*
*සබ්බසංයොජනාතිගං*
*අන්වෙසං සබ්බඨානෙසු*
*මාරසෙනාපි නාජ්ඣගා'ති.*

මෙසේ නො ඇලුණු ක්ෂේමප්‍රාප්ත අත්බැව් ඇති සියලු බවබැඳුම් ඉක්මවා සිටි රහත්හු කොහි දැයි සියලු තන්හි සොයන මාරපිරිස ද නො දැක්කේය.[1]
ඉන් පසු මාරයා අතුරුදහන්විය.

( උපාදානස්කන්ධ පහ - *පඤ්ච උපාදානක්ඛන්ධා.*

එනම්: රූප උපාදාන ස්කන්ධය *(රූපූපාදානක්ඛන්ධ), වේදනා* උපාදාන ස්කන්ධය *(වේදනූපාදාන ක්ඛන්ධ),* සංඥා උපාදාන ස්කන්ධය *(සංඤ්ඤූපාදානක්ඛන්ධ),* සංස්කාර උපාදාන ස්කන්ධය (*සංඛාරූපාදානක්ඛන්ධ),* විඥාන උපාදාන ස්කන්ධය (*විඤ්ඤාණූපාදාන ක්ඛන්ධ)*[2]

උපාදානය යනු දැඩිව ගැනීමයි. පඤ්චස්කන්ධ හේතු කොට තෘෂ්ණාව ඇති වෙයි. ඒ හේතු කොට දැඩිව ගැනීම සිදු වෙයි.

(සියලු බවබැඳුම් ඉක්මවා- *සබ්බසංයොජනාතිගං*

මෙයින් දස සංයෝජන අදහස් කරයි. එනම් :
ස්වකීය ආත්ම දෘෂ්ටිය (*සක්කාය දිට්ඨි,)* සැකය (*විචිකිච්ඡා),* වැරදි ව්‍රතවල බැඳීම *(සීලබ්බතපරාමාස),* කම්සැප, *කාමරාගය (කාමරාගො),* ව්‍යාපාදය *(බ්‍යාපාදො)* රූපරාගය (*රූප රාගො,)* අරූප රාගය (අරූප *රාගො)* මානය (මානො), උඩඟුකම (*උද්ධච්චො,)* අවිද්‍යාව *(අවිජ්ජා)* .යනුයි.

---

[1] ස නි පි .206
[2] ම නි. I පි. 702, දී නි III පි. 396, ස ධ ච පි. 237, 241

සංයෝජන: පදගතාර්ථ වශයෙන් තදින් බැඳ තබයි. (*සසරෙහි*) යොදයි යනුයි. සත්ත්වයා සසර බැඳ තබන කරුණු සංයොජන නම් වෙයි. (*සංයොජයන්ති, බන්ධන්ති, සංයොජනානි*) ඔරං භාගිය සංයොජනා: ඔරං + භාග + ඉය = ඔරංභාගිය. ඔරං යනු කාම ලෝකයයි. එයට පරියාපන්න වූ, ප්‍රත්‍ය වූ එහි බැඳ තබන්නා වූ කරුණු ඔරංභාගිය සංයෝජන නම්. පහත ලොකය හා බැඳෙන සංයොජන යන්න එයින් අදහස් කරයි. එම ඔරම්භාගිය සංයොජන මෙසේය.

1. ආත්මයක් ඇත යන විශ්වාසය (*සක්කාය දිට්ඨි* ). ආර්ය මාර්ගය නොදන්නා පෘථග්ජනයා (පුහුදුන්) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන පඤ්චස්කන්ධය ආත්ම වශයෙන් සලකා එය සදාකාලිකය, අවිනස්වරය, වෙනස් නොවේය යනුවෙන් ගන්නාවූ ආත්ම දෘෂ්ටිය සක්කාය දිට්ඨි යන්නෙහි අදහසයි. රූප ආදී මේ එකක් එකක් බැලීම ද මෙයට ඇතුලත්ය.

2. ඔරම්භාගිය දෙවන සංයොජනය වන්නේ සැකයයි. (*විචිකිච්ඡා* ). සාංඛාව, තීරණයක් ගත නොහැකිව සැලෙන ගතිය, සැක කිරීම මෙහිදී අදහස් කරයි. බුදුරජාණන්වහන්සේ සැක කිරීම (*බුද්ධෙ කංඛති*) එවැනි කෙනෙක් සිටියේ ද? තථාගත දසවිධකාය බල, දස විධ ඤාණ බල තිබුණේද? නව අරහාදී බුදුගුණ සත්‍යයද? යනුවෙන් සැක කිරීම විචිකිච්ඡාවයි. මෙසේ ධර්මය, සංඝයා, ශික්ෂාපද, අතීතය, අනාගතය, අතීත අනාගත දෙකම, පටිච්ච සමුප්පන්න ධර්ම යන කරුණු කෙරෙහි සැක කිරීම මේ විචිකිච්ඡා යන්නෙන් අදහස් වෙයි.

3. සීලබ්බත පරාමාස තුන් වැනි ඔරම්භාගිය සංයොජනයයි. බුදු දහමින් බැහැර සාවද්‍ය නෛර්යානික නොවුණ ව්‍රත, ශීල රැකීම සීලබ්බත පරාමාස නම් වෙයි.

4. සිව්වැනි ඔරම්භාගිය සංයොජනය නම් කාම සැපයෙහි

ඇල්මය (*කාමරාග*). මෙයින් අදහස් වන්නේ ඇස ආදී පසිඳුරන් පිනවීමට ඇති ආශාවයි.

5. ඔරම්භාගිය සංයොජනයන්හි පස්වැනි වන්නේ ව්‍යාපාදයයි, පටිඝයයි. අන්‍යයන් කෙරෙහි ජනිත කර ගන්නා වෛරය, ක්‍රෝධය මෙයින් අදහස් කරයි. මෙහි ප්‍රථම සංයෝජන තුන සෝවාන් වීමේදී නැති වෙයි.
හතර සහ පහ දුබලවී / සෙලවීම සකදා ගාමීවෙයි. සියල්ල (පහව) නැතිවීම අනාගාමී වීමෙන් සිදුවෙයි.

උද්ධංභාගිය යනු, ඉහල, උඩ යන අර්ථයයි. ඉහල ලෝකය හා බැඳුන සංයෝජන 'උද්ධංභාගිය' සංයෝජන නම්. මෙම සංයෝජනයන් සංඛ්‍යා වශයෙන් පහකි.

1. රූප ලෝකයේ ඉපදීමට ඇති ආශාව රූප රාගයයි. උද්ධංභාගිය සංයෝජනයකි.

2. උද්ධංභාගිය සංයෝජනවලට අයත් අරූපරාග යනු. අරූප ලෝකයෙහි ඇලුණ, ආශක්ත ආශාවයි.

3. උඩඟුකම, උද්ධච්චය එහි තුන්වැන්නයි. උද්ධච්ච යනු සිතෙහි ඇති නො සන්සුන් බවයි. විසිරුණ ස්වභාවය මෙයින් අදහස් කරයි. අළු ගොඩක් මතට ගලක් වැටුනේ නම් එය විසිරී පැතිරී යයි. මෙසේ සිතේ උපසමනය නොවීම, ඇවිස්සී තිබීම උද්ධච්ච වශයෙන් ගැනෙයි.

*'තත්ථකතමං උද්ධච්චං? යං චිත්තස්ස උද්ධච්චං අවූපසමො චෙතසො වික්ඛෙපො භන්තත්තං චිත්තස්ස ඉදං වුච්චති උද්ධච්චං'*

4. මාන, තමා උසස් යැයි සිතීම මානයයි. කුලය, ධනය ආදී හේතු කොට ඇති කර ගන්නා වූ උඩඟු සිතුවිල්ලයි.

*'සෙය්‍යො හමස්මීති මානො සදිසො හමස්මීති මානො, හීනො හමස්මීති මානො යො එව රූපො මානො, මඤ්ඤනා මඤ්ඤිතත්තං උන්නති. උන්නාමො ධජො සම්පග්ගාහො කෙතුකම්‍යතා චිත්තස්ස ඉදං වුච්චති මාන සංයොජනං'*

5. අවිජ්ජා සංයොජනය නම්, නොදැනීම, මෝහය යන්නයි. චතුරාර්ය සත්‍ය පිළිබඳ නොදැනීමයි. අවිද්‍යාව අකුසල ඇති වීමට හේතු වෙයි.
මේ සියලු සංයෝජන නැති කිරීමෙන් රහත් ඵලයට පත් වන්නේය.[1] )

## භයානක ශබ්දයක් කෙළේය

ආයතන සූත්‍රය. 4. 2. 7.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්පුර කූටාගාර ශාලාවෙහි වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ ස්පර්ශායතන හය (*ඡන්නං ඵස්සායතනානං*) පිළිබඳව භික්ෂූන්ට දෙසූහ. භික්ෂූහු එයට සැදැහයෙන් ම සවන් දුන්හ. මාරයා බණ අසන්නවුන්ගේ නුවණැස වසන්නේ නම් මැනවයි සිතා භාග්‍යවතුන් වහන්සේ වෙතට පැමිණියේ ය. බිය දනවන ශබ්දයක් ඇතිකෙළේ ය. ඒ ඇසූ එක්තරා මහණ කෙනෙක් තවත් මහණෙකුට ' මහණ, මහණ, මේ පොළොව පෙරලන්නාක් වැනිය යි කී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ මහණහට ' මහණ, ඒ පොළොව පෙරලන්නක් නො වේ. මේ පවිටු මරු ය. තොපගේ පැණැස වනසන්නට පැමිණියේ ය. ඉක්බිති තථාගතයෝ මාරයාට මෙසේ දෙසූහ.

---

[1] දීනි .III පි 396, දීනිඅ. I පි. 375
BD. 161, ස ධ ව පි. 237, 241

(භගවත්හු) *රූපා සද්දා රසා ගන්ධා*
*ඵස්සා ධම්මා ච කෙවලා*
*එතං ලොකාමිසං ඝොරං*
*එත්ථ ලොකො'ධිමුච්ඡිතො*

*එතඤ්ච සමතික්කම්ම*
*සතො බුද්ධස්ස සාවකො*
*මාරධෙය්‍යමතික්කම්ම*
*ආදිච්චොව විරොචති*

සියලු රූප ද ශබ්ද ද රස ද ගන්ධ ද ස්පර්ශ ද ධර්ම ද යන මෙය දරුණු ලෝකාමිෂය වේ. ලෝ වැස්සා මෙහි දැඩි ලෙස ඇලුණේ ය.

බුදුරජාණන් වහන්සේගේ සිහියෙන් යුත් ශ්‍රාවක තෙමේ සළායතනය ද ඉක්මවා මරුට ස්ථාන වූ භවත්‍රය ද පසුකොට හිරු මෙන් බබලයි.[1] ඉන්පසු මාරයා අතුරුදහන්විය.

( ස්පර්ශායතන - *ඵස්සායතනා*

ස්පර්ශායතන හය, *ඡන්නං ඵස්සායතනානං එනම්: චක්ඛුං ඵස්සායතනං. සොතං ඵස්සායතනං. ඝානං ඵස්සායතනං. ජිව්හා ඵස්සායතනං. කායො ඵස්සායතනං. මනො ඵස්සායතනං.*

ඇස ස්පර්ශායතනය, කණ ස්පර්ශායතනය, නාසය ස්පර්ශායතනය, දිව ස්පර්ශායතනය, සිරුර ස්පර්ශායතනය, මනස ස්පර්ශායතනය.

*චක්ඛුඤ්ච පටිච්ච රූපෙචුප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං, තිණ්ණං සංගති ඵස්සො*

---

[1] සනි .I පි ..208

ඇසත් රූපයත් හේතුවෙන් චක්ඛුවිඤ්ඤාණය ඇති වෙයි මෙ තුනේ එකතුවෙන් ස්පර්ශය තැනෙයි.[1] මේ න්‍යාය කණ, නාසය, දිව, සිරුර, මනස යන මේ වාට ද යොදා ගත යුතු ය.)

## පිණ්ඩපාත දීම වලකයි

පිණ්ඩ සූත්‍රය. 4. 2.8 .

එක් කලෙක බුදුරජාණන් වහන්සේ මගධදනව්වේ පඤ්චශාලා නම් බමුණු ගමේ වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ පිඩු පිණිස එම ගමට වැඩම කළහ. මාරයා ඒ පඤ්චශාලා ග්‍රාමවාසීන්ට ආවිෂ්ටව පිණ්ඩපාත නො ලැබෙන ලෙසට ක්‍රියා කෙළේය.
මාරයා තථාගතයන් වෙතට පැමිණ,

*'අපි භන්තෙ පිණ්ඩපාතං අලභමානො (පිසච්ඡා) ජිගච්ඡාදුක්ඛෙන පීළිතත්ථා'ති*

වහන්ස පිණ්ඩපාත නො ලැබ සාගින්නෙන් පෙළෙන්නේ ද? යි ඇසුවේය.

*සත්ථා 'අජ්ජ මයා පාපිම කිඤ්චි අලභිත්වාපි ආභස්සරලොකෙ බ්‍රහ්මාණො විය පීතිසුඛෙනෙව වීතිනාමෙස්සාමී 'ති*

ශාස්තෲන් වහන්සේ ' පව්ට අද කිසිදු ආහාරයක් නො ලැබුව ද ආභස්සරලෝකයෙහි බ්‍රාහ්මණයන් මෙන් සතුටුසුවයෙන් වෙසෙමි යි වදාළහ.

---

[1] දනිඅ. I පි. 89

*සුසුඛං වත ජීවාම*
*යෙසං නො නත්ථි කිඤ්චනා*
*පීතිභක්ඛා භවිස්සාම*
*දෙවා ආභස්සරා යථා*

යම් කෙනකුහට රාගාදි පළිබෝධයක් නැද් ද එබඳු වූ අපි ආභස්සර බඹලොවේ බ්‍රාහ්මයන් (දෙවියන්) මෙන් සමවත් සුවයෙන් ඇති වන ප්‍රීතිය වළඳන්නෝ වන්නෙමු. යි බුදුහු වදාළහ.

එයින් මාරයා අකුසල් රැස්කරගත් බවත් තමන් වහන්සේ රාගාදිය නො මැතිහෙයින් සැපසේ වෙසෙන බවත් දෙසූහ. ධම්මපදට්ඨකථාහි මාරස්ස කථා මීට සමාන වෙ යි. ඉක්බිති මාර තෙමේ නො පෙණී ගියේය.[1]

## ගොවියෙකු ලෙස

කස්සක සූත්‍රය. 4. 2. 9

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩවසද්දී එක් දිනක් උන් වහන්සේ නිවණ පිළිබඳව *(නිබ්බාණපටිසංයුත්තාය)* භික්ෂූන්ට දහම් දෙසූහ. භික්ෂූහු එයට සැදැහයෙන් ම, ඕනෑකමින් ම සවන් දුන්හ.
මාරයා බණ අසන්නවුන්ගේ නුවණැස වසන්නේ නම් මැනවයි සිතා නඟුලක් කරතබාගෙන කෙවිටක් ගෙන විසුරුණු කෙස් ඇතිව හන ඇඳුමෙන් සැරසී මඩ වැකුණු පයින් ගොවියෙකු මෙන් බුදුන් වෙතට එළඹුණේය. එළඹ මෙසේ පැවසීය.

---

[1] සනි. I පි ..208

(මාරයා) *යං වදන්ති මම ඉදන්ති*
*යෙ වදන්ති මමන්ති ච*
*එත්ථ චෙ තෙ මනො අත්ථි*
*නාමෙ සමණ මොක්ඛ සී'ති*

මේ මාගේ ය යි යමක් කියද් ද, යම් කෙනෙක් මා ගැත්තෝ ය යි කියද් ද, ඉදින් එහි ලා ඔබගේ සිතෙක් ඇත්තේ නම් ශ්‍රමණය, මා කෙරෙන් නො මිදෙන්නෙහිය.
එහි දී කරුණු පැහදිළි කළ බුදුහු මෙසේ දෙසූහ.

(භගවත්හු) *යං වදන්ති න තං මය්හං*
*යෙ වදන්ති න තෙ අහං*
*එවං පාපිම ජානාහි*
*න මෙ මග්ගම්පි දක්ඛසී'ති.*

මාගේයයි යමක් කියද් ද, එය මාගේ නොවෙයි. යම් කෙනෙක් මා ගැත්තෝ ය යි කියද් ද, මම'ඔහු' ද නො වෙමි. පවිට, මෙසේ දනුව මා ගිය මඟත් නොදන්නෙහිය. ඉත් පසු මාරයා අතුරුදහන්විය.[1]

(නිවණ පිළිබඳව- *නිබ්බාණපටිසංයුත්තාය,* මෙයින් කියවෙන්නේ එම ධර්ම දේශනාව නිර්වාණය පිළිබඳව වූ වකි.

*නිබ්බාණපටිසංයුත්තායාති නිබ්බාණං අපදිසිත්වා පවත්තාය*[2] - නිවණ යොමු කර දේසිතය යනුයි.

*නිබ්බාණපටිසංයුත්තායාති අමතධාතු සන්නිස්සිතාය අසංඛතාය ධාතුයා පවෙදන වසෙන පවත්තාය,*
නිබ්බාණපටිසංයුත්තාය යනු අමෘතධාතුව ආශ්‍රිතව, අසංස්කෘතධාතුව ප්‍රකාශනය වශයෙන් පැවැත්වූ හෙයිනි.[3]

---

[1] එහිම. පි .212
[2] සනිඅ. I පි . 141
[3] උඅ. පි. 258

නිර්වාණය - නිබ්බාණං

බුදු සමයෙහි පරම නිෂ්ටාව වූ නිර්වාණය උසස්ම සැපත වශයෙන් හඳුන්වන්නේ සියලු දුක් එමගින් ම කෙළවර වන හෙයිනි. සියලු සාංසාරික දුකෙහි හේතු වශයෙන් දැක්වෙන රාග, ද්වේෂ හා මෝහ නිර්වාණ ලාභය සමග සමුලොත්පාඨනය වන හෙයින් ද නිවන පරම සුවය සේ හැඳින්වෙයි. මෙම ලොවුතුරා සුවය ලබාගත හැක්කේ ත්‍රිවිධ ශික්ෂාව සංඛ්‍යාත වූ සීල, සමාධි හා ප්‍රඥා පරිපූරණය කිරීමෙනි. බෞද්ධ ප්‍රාර්ථනාවන්හි අග්‍රස්ථානය නිර්වාණය යි.

' රාගක්ෂය, ද්වේෂක්ෂය, මෝහක්ෂය, යන මෙය නිර්වාණය වෙයි. '

සංයුත්තනිකායේ නිබ්බාණ සූත්‍රයට අනුව සැරියුත් මහරහතන්වහන්සේ මගධරට නාලක ගමේ වැඩවසද්දී උන්වහන්සේ වෙතට පැමිණි ජම්බුඛාදක පිරිවැජියා (පරිබ්‍රාජකයා) නිර්වාණය කුමක්ද? එහි ප්‍රතිපදාව කුමක්ද? නිර්වාණයට මාර්ගය කෙසේද? යනුවෙන් විමසුවේය. සැරියුත් තෙරණුවෝ එයට පිළිතුරු වශයෙන් රාගය නැතිකිරීම, ද්වේෂය නැතිකිරීම, මෝහය නැතිකිරීම නිර්වාණය යයි වදාළහ.

... *යො ඛො ආවුසො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො ඉදං වුච්චති නිබ්බාණං* ... :

එය ලබාගැණීමේ මාර්ගය නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි . ... *අය මෙව අරියො අට්ඨංගිකො මග්ගො එතස්ස නිබ්බානස්ස සච්ඡිකිරියාය* ... යනුවෙන් ද වදාළහ.

අජාත, ( නූපන් ) අභූත, ( හටගැනීම යැයි යමක් නැති ) අකෘත , (කිසිවකු විසින් නිර්මාණය නො කළ ) අසංස්කෘත ( ප්‍රත්‍ය සාමාග්‍රියෙන් සකස් වීමක් නොවූ) දෙයක් ඇත .

එවැන්නක් නැත්නම් ජාත , භූත , කෘත හා සංස්කෘත සියල්ලෙන් මිදීමක් අපේක්ෂා කළ නො හැක.[1] )

## රජවන ලෙස කියයි

රජ්ජ සූත්‍රය. 4. 2. 10 .

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ හිමාලය ආසන්නයේ කොසොල්හි ආරණ්‍ය කුටියක විසූහ. එහි හුදකලාව වසන උන්වහන්සේට, නො නසමින් නොනස්වමින් අනුන්ගේ ධනහානි නො කරමින් අනුන්ගේ ධනහානි නො කරවමින් ශෝක නො කරමින් ශෝක නො කරවමින් දැහමින් රජය කරන්නට හැකිවේ ද යන විතර්කය පහළවිය.

ඉක්බිති මාර තෙමේ බුදුන් වෙතට පැමිණ, වහන්ස නොනස්මින් නොනස්වමින් අනුන්ගේ ධනහානි නො කරමින් අනුන්ගේ ධනහානි නො කරවමින් ශෝක නො කරමින් ශෝක නො කරවමින් දැහමින් රජය කෙරේවා යි පැවසීය. තථාගතයෝ එය ප්‍රතික්ෂේප කළහ. ඉන්පසු මාරයා අතුරුදහන්විය.[2]

ධම්මපදට්ඨ කථාවේ 'මාරස්සවත්ථු' වෙහි ද මේ පුවත සමාන ලෙස ඇත. සංයුක්ත නිකායට වෙනස්වන්නේ ගාථා තුනක් දෙසීම ය. 'මාරස්සවත්ථු' වෙහි තථාගතයෝ මරුට මෙ සේ දෙසූහ.

(තථාගතො) *'අසද්සෙදා එව පාපිම තව ඔවාදො, අසද්සදා මම. තයා සද්ධිං සම්මන්තනා නාම නත්ථි . අහං හි එවං වදාමීති වත්වා ඉමා ගාථා අභාසි.*

---

[1] BD ' 107
මනි . I පි. 10,12.
[2] සනි. I පි ..212

(තථාගතයෝ) පවිට තාගේ අවවාදය අතිකකි, මගේ අවාද ඊට වෙනස් ය. තා සමඟ සංමන්ත්‍රණයක් (කතාබහක්) නම් නැත. මෙසේ වදාරා මේ ගාථා දෙසූහ.

*අත්ථම්හි ජාතම්හි සුඛා සහායා*
*තුට්ඨී සුඛා යා ඉතරීතරෙන*
*පුඤ්ඤං සුඛං ජීවිතසංඛයම්හි*
*සබ්බස්ස දුක්ඛස්ස සුඛං පහාණං*

වැඩක් ඇතිකල්හි මිතුරෝ සැප ය. තමා සතුව ඇති දෙයින් සතුටුවීම සැප ය. මියයන අවස්ථාවේ පින සැප ය. සියලු දුක් නැතිවීම උතුම් සැප ය.

*සුඛා මත්තෙය්‍යතා ලොකෙ*
*අථො පෙත්තෙය්‍යතා සුඛා*
*සුඛා සාමඤ්ඤතා ලොකෙ*
*අථො බ්‍රහ්මඤ්ඤතා සුඛා*

ලෝකයෙහි මවට උපස්ථාන කිරීම සැප ය. පියාට උපස්ථාන කිරීම සැප ය. මහණුන්ට උපස්ථාන කිරීම සැප ය. රහතුන්ට උපස්ථාන කිරීම සැප ය.

*සුඛං යාව ජරා සීලං*
*සුඛං සද්ධා පතිට්ඨිතා*
*සුඛො පඤ්ඤාය පටිලාභො*
*පාපානං අකරණං සුඛං*

(ජරාව) වයස්ගතවීම තෙක් සිල් රැකීම සැප ය. ස්ථිරව පිහිටි ශ්‍රද්ධාව සැප ය. නුවණ ලැබීම සැප ය[1].

---

[1] ධපඅ. පි. 736

## මහලුබමුණෙකු ලෙස

### සම්බහුල සූත්‍රය. 4. 3. 1

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වේ සීලවතී නම් ගමෙහි වැඩවසන සේක. එකල්හි බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ නුදුරෙහි නො පමාව කෙලෙස් තවන වීර්ය කරමින් නිවන් පිණිසම යෙද වූ සිත් ඇතිව විසූහ.

*අථඛො මාරො පාපිමා බ්‍රාහ්මණවණ්ණං අභිනිම්මිනිත්වා මහන්තෙන ජටණ්ඩුවෙන අජිනක්ඛිපනිවත්ථො ජිණ්ණො ගොපානසිවංකො සුරු සුරු- පස්සාසී උදුම්බරදණ්ඩං ගහෙත්වා යෙන තෙ භික්ඛූ තෙනුපසංකමි උපසංකමිත්වා තෙ භික්ඛූ එතදවොචඃ දහරා භවන්තො පබ්බජිතා සුසුකාලකෙසා භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතා පඨමෙන වයසා අනික්කීළිතාවිනො කාමෙසු, භුඤ්ජන්තු භොන්තො මානුසකෙ කාමෙ, මා සන්දිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවිත්ථා'ති.*

එකල්හි පවිටු මාර තෙමේ බමුණු වෙසක් මවාගෙන මහත් දළසුඹුළුයෙන් යුක්ත ව හැඳි පෙරව් අඳුම්දිවිසම් ඇතියේ ජරායෙන් දිරූයේ ගොවනැස්සක් මෙන් වක් වූයේ සුරුසුරුහඬින් ප්‍රශ්වාසකරණසුලු වූයේ දිඹුල්දණ්ඩක් අතින්ගෙන ඒ භික්ෂූන් වෙතට එළඹියේ ය. එළඹ ඒ භික්ෂූන්ට

'' භවත් පැවිද්දෙෝ දහරයහ (තරුණයහ). මනා අභිනීල කෙහෙ ඇතියහ. සොඳුරු යොවුනෙන් පළමු වයසින් යුක්තයහ. කම්කෙළියෙහි කෙළුම් නො කළසුල්ලහ (සුලුය). භවත්හු මිනිස් කම්සුව විඳිත්වා. මේ අත්බැව්හි වින්ද යුතු සුව හැර කල් ගෙවා වින්ද යුතු වූ සුව කරා නුදුවත්වා''යි කී.

*න ඛො මයං බ්‍රාහ්මණ සංදිට්ඨිකං හිත්වා කාලිකං අනුධාවාම, කාලිකඤ්ච ඛො මයං බ්‍රාහ්මණ හිත්වා සංදිට්ඨිකං අනුධාවාම. කාලිකා හි බ්‍රාහ්මණ කාමා වුත්තා භගවතා බහු දුක්ඛා*

*බහුපායාසා ආදීනවො එත්ථ භියෙ‍යා. සංදිට්ඨිකො අයං ධම්මො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.*

භික්ෂූහු මෙසේ පැවසූහ.
බමුණ, අපි මේ අත්බැව්හි වින්ද යුතු සුවහැර කල් ගෙවා වින්ද යුතු සුව කරා නො දුවමු. බමුණ, අපි කල්ගෙවා වින්ද යුතු සුව හැර මේ අත්බැව්හි වින්ද යුතු සුවකරා දුවමු, බමුණ, කාමයෝ කාලිකයහ. බොහෝ දුක් ඇතියහ දැඩි ආයාස ඇතියහ. මෙහි දොස් බොහෝය. මේ ලොවුතුරා දහම මේ අත්බැව්හි තමන් විසින් ම වින්ද යුතුය. කල් නොයවා විපාක දෙන සුළුය. එව බලව යි කීමට සුදුසු ය. තම සිත්හි පමුණුවා ලිමට සුදුසු ය. නුවණැත්තන් විසින් තමතමන් කෙරෙහි ලා දතයුතුය යි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය.

*එවං වුත්තෙ මාරො පාපිමා සීසං ඔකම්පෙත්වා ජිව්හං නිල්ලාලෙත්වා තිවිසාඛං නලාටෙ නලාටිකං උට්ඨාපෙත්වා දණ්ඩමොලුබ්භ පක්කාමි.*

මෙ සේ කී කල්හි පවිටු මාර තෙමේ හිස යටිකුරු කොට සලා දිව නෙරා ලෙළවා නලළෙහි තුන් රැළි ඇති බැමබිඳුන් නංවා දණ්ඩෙහිඑල්බ ගෙන ගියේය.

ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹ උන්වහන්සේට මේ සිද්ධිය සැලකළහ.

ඒ අවස්ථාවේ බුදුරජාණන්වහන්සේ ඒ පැමිණියේ බමුණෙක් නොව පවිටු මාරයා බවත් ඔවුන්ගේ (භික්ෂූන්ගේ) නුවණැස වනසාලීමට පැමිණි බවත් වදාරා මෙසේ දෙසූහ.

(භගවත්හු) *යො දුක්ඛ මද්දක්ඛි යතො නිදානං*
*කාමෙසු සො ජන්තු කථං නමෙය්‍ය*
*උපධිං විදිත්වා සංගොති ලොකෙ*
*තස්සෙව ජන්තු විනයාය සික්ඛෙති*

යමෙක් දුක යම් පඤ්චකාම ගුණයක් නිදානකොට ඇතැයි දුටුයේ ද, ඒ සත්ත්ව තෙමේ කාමයන්හි කෙසේ නැමෙන්නේද,(නො නැමැන්නේ මැ යි). ඒ සත්ත්ව තෙමේ ලෙව්හි කාමගුණොපධිය (රාගාදි) සංගය යි දැන ඒ කාමගුණොපධිය ම දුරලනු පිණිස හික්මෙන්නේ ය.[1]

( පඤ්චකාම - *කාමෙසු.*

මෙයින් වස්තුකාම ක්ලේශ කාම අදහස් වෙයි.

*කාමා' ති වත්ථුකාමා ච කිලෙසකාමා ච . ද්වෙපි සපරිළාහතට්ඨෙන අංගාර කාසු විය සුදිට්ඨා හොන්ති.*

කාමා යනු වස්තුකාම ක්ලේශ කාමයෝය. දෙකම දැවීම කරණ හෙයින් ගිනිඅඟුරු වළක් යයි මනාව දක්වා ඇත.[2]

මේ පිළිබඳව විස්තර මාරසේනා යටතේ, *කාමා තෙ පඨමා සෙනා ඛ.*

---

[1] සනි. I පි . 216
[2] දීනිඅ. II පි . 777

# දෙවරක් පැමිණෙයි

සමිද්ධි සූත්‍රය 4.3.2.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය දනව්වේ සීලවතී නම් ගමෙහි වැඩවසන සේක. එකල්හි සමිද්ධි තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ හුදුරෙහි නො පමාව කෙලෙස් තවන වීර්ය කරමින් නිවන් පිණිසම යෙද වූ සිත් ඇතිව වෙසෙති.
එකල්හි එක් දිනක් සමිද්ධි තෙරණුවෝ මම අර්හත් සම්මා සම්බුදුන්ගේ ශාසනයෙහි පැවිදි වූ යෙමි. එය මට මහත් සතුටකි ලාභයකි. සිල්වත් කලණ දහම් ඇති සබ්‍රම්සරුන් ලැබුවෙමි. යන යනුවෙන් සිතූහ.
එකල්හි පවිටු මාර තෙමේ සමිද්ධි තෙරුන් හුදුරේ පොළොව පෙරළන්නාක් මෙන් මහත් ශබ්ද ඇතිකෙළේය.

ඉන්පසු ඒ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹ ඒ සිද්ධිය උන්වහන්සෙට සැලකළහ.

ඒ අවස්ථාවේ බුදුරජාණන්වහන්සේ ඒ ශබ්දය පොළොව පෙරළීමක් නොව පවිටු මාරයා බවත් තොපගේ නුවණැස වනසාලීමට පැමිණි බවත් වදාරා ඒ ගැන නොසිතා පෙර සේම නිවන් සඳහා උත්සාහ කරණ ලෙස දෙසූහ.
සමිද්ධි තෙරණුවෝ බුදුන්ගේ අනුශාසනය අනුව ක්‍රියා කළහ.

දෙවැනි වරට ද පවිටු මාර තෙමේ සමිද්ධි තෙරුන් හුදුරේ පොළොව පෙරළන්නාක් මෙන් මහත් ශබ්ද ඇතිකෙළේය.
ඒ මහත් ශබ්ද ඇති කරන්නේ පවිටු මාරයා බව තේරුම් ගෙන සමිද්ධි තෙරණුවෝ මෙසේ පැවසූහ.

*සද්ධායාහං පබ්බජිතො*
*අගාරස්මා අනගාරියං*
*සති පඤ්ඤා ච මෙ බුද්ධා*
*චිත්තඤ්ච සුසමාහිතං*
*කාමං කරස්සු රූපානි*
*නෙව මං බ්‍යාධයිස්සසී'ති*

මම සැදැහැයෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වීමි. මා විසින් සිහිය හා නුවන අවබෝධ කරණලදි. සිත ද මොනවට පිහිටුවන ලද්දේ ය. (එහෙයින් බිහිසුණු ) රූපයන් කැමති පරිද්දෙන් කරව. මා නොම පෙළන්නෙහි ය.

( මම සැදැහැයෙන් - *සද්ධායාහං.*

මෙයින් විස්තර වන්නේ තෙරුවන් කෙරෙහි භක්තියයි. ශ්‍රද්ධාවේ ප්‍රභේද ප්‍රධාන වශයෙන් දෙකකි. එනම් ආකාරවතී ශ්‍රද්ධාව, අමූලිකා ශ්‍රද්ධාව යනුයි

7 *යස්ස කස්ස චි භික්ඛවෙ ඉමෙහි ආකාරෙහි ඉමෙහි පදෙහි ඉමෙහි බ්‍යඤ්ජනෙහි තථාගතෙ සද්ධා නිවිට්ඨා හොති මූලජාතා පතිට්ඨා, අයං වුච්චති භික්ඛවෙ ආකාරවතී සද්ධා දස්සන මූලිකා දළ්හා. අසංහාරියා සමණෙන වා බ්‍රහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මිං.*[1]

7 මහණෙනි යම් කිවෙක් හට මේ අයුරින් මේ පෙදෙන් මේ ව්‍යඤ්ජනයෙන් තථාගතයන් වහන්සේ කෙරෙහි සැදැහැ පිහිටියේ වේ ද, (සොතාපන්න මාර්ගයෙන් හටගත් මුල් ඇති වේ ද) මහණෙනි, මේ සකාරණ ( ප්‍රතිවේධ සහිත) ශ්‍රද්ධාව දර්ශන (ශ්‍රෝතාපත්ති මාර්ග) මූලිකය, දෘඪය. මහණකු විසින් වේවයි, බමුණකු විසින් වේවයි, දෙවියකු විසින් වේවයි, මරහු විසින් වේවයි, බඹහු විසින් වේවයි, ලොව අන් කිසිවකු විසින් වේවයි,

---

[1] මනි . I පි . 750

හැරලිය නො හෙයි.

තෙරුවන් කෙරෙහි නිසි ආකාර තේරුම් ගෙන ඇතිවන ශ්‍රද්ධාව ආකාරවතී ශ්‍රද්ධාව නම්. ඇසූ පමණින් අන්ධ භක්තියෙන් පිළිගැනීම අමූලිකා ශ්‍රද්ධා නම් වෙයි. මේ අමූලිකා ශ්‍රද්ධාව කන වැල අල්ලාගත් අන්ධයන්ගේ ක්‍රියාවක් ලෙස දක්වා ඇත. මේ අන්ධ භක්තිය බුදු සමය ප්‍රතික්ෂේප කරයි.

මේ ශ්‍රද්ධාවම සද්ධින්ද්‍රිය, සද්ධා බල යනුවෙන් ද සඳහන් වෙයි. විභංගයේ (*යා සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදො සද්ධින්ද්‍රියං සද්ධා බලං*)[1] යනුවෙන් ඇත. ශ්‍රද්ධාව ඇති වන්නේ දුක හේතුවෙනි. (*දුක්ඛූපනිස්සයාහි සද්ධා*)[2] කුසල ධර්ම කිරීමට අවශ්‍යතම වෙයි. කුසල් වලට නිතර ශ්‍රද්ධාව බීජයක් වෙයි. (*සද්ධා හි කුසලමූලානං බීජං*) නිතර දුක් පැතිර ඇති සසර කතරින් එතර වීමට, කෙලෙස් සැඩ පහර තරණය කිරීමට ශ්‍රද්ධාව ප්‍රබලවෙයි. (*සද්ධාය තරති ඔඝං*) කෙනෙකුට ඇති උසස් ම ධනය ශ්‍රද්ධාවයි. (*සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං*)[3]

..... *සා පනෙසා ආගමනසද්ධා, අධිගමනසද්ධා, ඔකප්පනසද්ධා, පසාදසද්ධා..*[4] ( අඅ. *ආගමසද්ධා, අධිගමසද්ධා, ඔකප්පනසද්ධා, පසාදසද්ධා)*

ආගමන ශ්‍රද්ධාවඃ-එනම් බෝධිසත්ත්වයන් ගේ අභිනීහාරයේ පටන් එන ශ්‍රද්ධාව ආගම හෙවත් ආගමනසද්ධා නම්.

අධිගමන ශ්‍රද්ධාව :- ආර්ය ශ්‍රාවකයන් ගේ දැනීම හා බැඳුන ශ්‍රද්ධාව අධිගම සද්ධා නම් වෙයි.

ඕකප්පන ශ්‍රද්ධාව ඃ- තෙරුවන් කෙරෙහි ඇති අචල ශ්‍රද්ධාව.

---

[1] චූනි පි .67
[2] විමා අ 30 . අ අ ..නිසාය
[3] සනි I පි . 78
[4] දීනි අ II පි . 753, 547

ඕකප්පන ශ්‍රද්ධාව නම් වෙයි.

පසාද ශ්‍රද්ධාව :- එනම් පැහැදීමක් ඇති කරණ ශ්‍රද්ධාව ප්‍රසාද සද්ධා නමි.

සිහිය - සති
(*'යා සති අනුස්සති, පටිස්සති, සරණතා, ධාරණතා, අපිලාපනතා, අසම්මුස්සනතා සති, සතින්ද්‍රියං . සති බලං සම්මා සති, සම්බොජ්ඣංගො එකායනමග්ගො අයං වුච්චති සති.*)

නැවත මෙනෙහි කිරීම, නැවත නැවත සිතීම, සිහි කිරීම, ධාරණය/ දැරීම, නැවත හෝ අනුකූලව ඉහළට සිතීම, මුළා නොවූ සිහිය, සති ඉන්ද්‍රිය, සිහි බලය, යහපත් සිහිය සති සංබොජ්ඣංගය මේ සති නම් වෙයි. )

සංයුත්තනිකායේ ඛන්ධක වර්ගයේ සමිද්ධි සූත්‍රයේ සමිද්ධි තෙරණුවෝ මාරයා කවරෙක් දැයි තථාගතයන්ගෙන් විමසූහ. ඇසත්, රූපයත්, චක්ඛුවිඤ්ඤාණයත්. චක්ඛුවිඤ්ඤාතබ්බ ධර්මත් ඇති කල්හි මාරයා ඇති බවත් ඒවා නැති කල්හි මාරයා නැති බවත් බුදුහු වදාළහ.

## දූතයකු ලෙස

ගොධික සූත්‍රය 4.3.3.

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාපයේ වේළුවනාරාමයේ විසූහ. එකල ගෝධික තෙරණුවෝ ඉසිගිලි පවුඇළයෙහි කළුගල් තලාවේ විසූහ. උන්වහන්සේ නිවන් පිණිස යෙද වූ සිත්ඇත්තේ ලෞකික සමවතක් ලැබූහ. එහෙත්, ඒ ලෞකික සමවතින් පිරිහුණහ. ගෝධික තෙරණුවෝ හයවැනි වරටත් ලෞකික සමවතක් ලැබූහ. එහෙත් ඒ ලෞකික සමවතින් පිරිහුණහ. හත්වැනි වරට ද උන්වහන්සේ නිවන් පිණිස යෙද වූ සිත්ඇත්තේ ලෞකික

සමවතක් ලැබූහ. ඉක්බිති ආයුෂ්මත් ගෝධික තෙරණුවෝ, 'මම හය වැනි වර තෙක් ලෞකික සමවතින් පිරිහුණෙමි. මම දිවි නසා ගන්නේ නම් මැනවයි' සිතූහ.

පවිටු මාර තෙමේ ගෝධික තෙරණුවන්ගේ මේ පුවත තථාගතයන්ට සැලකොට එය වලක්වන ලෙස පැවසී ය.

(මාරයා) *සාවකො තෙ මහාවීර*
*මරණං මරණාභිභූ*
*ආකංඛති චෙතයති*
*තං නිසෙධ ජුතින්ධර*

ඔබවහන්සේගේ ශ්‍රාවක සියදිවි නසාගන්නට සිතයි එය වලක්වනු යයි පැව සීය.
ඒ පවිටු මරු බව තේරුම් තථාගතයෝ මෙසේ වදාළහ.

(භගවත්හු) *එවං හි ධීරා කුබ්බන්ති*
*නාවකංඛන්ති ජීවිතං*
*සමූලං තණ්හං අබ්බුය්හ*
*ගොධිකො පරිනිබ්බුතො'ති*

නුවණැත්තෝ මෙසේ ද කෙරෙත්. දිවි නො පතත්. ගෝධික තෙමේ මුල්සහිත තෘෂ්ණාව උපුටා හැර පිරිනිවියේ ය. [1] මියයෑමත් ස්කන්ධපරිනිර්වාණයත් එකවරම සිදුවිය. (සමසීසී)

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමඟ ගෝධික තෙරණුවන් විසූ ඉසිගිලි පවුඇළයෙහි කළුගල් තලාවේ එම තෙරුන් ආවුධයත් සමඟ හොත් තැනට වැඩම කළහ. ඒ වෙලාවේ පවිටු මාරයා සුදුධූමයක් මෙන් කළුවළාවක් මෙන් ගෝධික තෙරගේ විඥානය සොයමින් ඉහළ පහළ හා සිවු දිසාවේ පාවූයේ ය. බුදුහු ඒ ධූමතිමිරය භික්ෂූන්ට පෙන්වා මෙසේ වදාළහ.

---

[1] සනි. I පි .220

*... එසො ඛො භික්ඛවෙ මාරො පාපිමා ගොධිකස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං සමන්නෙසති, කත්ථ ගොධිකස්ස කුලපුත්තස්ස විඤ්ඤාණං පතිට්ඨිතන්ති, අප්පතිට්ඨිතෙන ච භික්ඛවෙ, විඤ්ඤාණෙන ගොධිකො කුලපුත්තො' පරිනිබ්බුතොති ආහ....*

මහණෙනි, මේ පවිටු මාරයා ගොධිකගේ විඥානය කොතැනක පිහිටියේ දැයි සොයයි. මහණෙනි, ගොධිකතෙරගේ විඥානය නොපිහිටියේ පිරිනිවන්පෑයේ යි වදාළහ.
මාරයා ගොධිකතෙරගේ විඥානය සොයාගත නො හැකිව කුමාර වෙසකින් බේලුවපණ්ඩු වීණාව රැගෙන බුදුන් වෙතට පැමිණ මෙසේ කී ය.

(මාරයා) *උද්ධං අධො ච තිරියං*
*දිසා අනුදිසාස්වහං*
*අන්වෙසං නාධි ගච්ඡාමි*
*ගොධිකො සො කුහිං ගතො' ති.*

ගොධික කොහෙ ගියේ දැයි උඩ යට හරහ අනු දිශා වන්හි සොයා බැලුවෙමි. එහෙත් සොයා ගත නො හැකිවිය.

ඉක්බිති භාගයවතුන් වහන්සේ ඔහුට මෙසේ වදාළහ.

(භගවත්හු) *ජෙත්වාන මච්චුනො සෙනං*
*අනාගන්ත්වා පුනබ්භවං*
*සමූලං තණ්හමබ්බුය්හ*
*ගොධිකො පරිනිබ්බුතො*

ගොධික නමුචිගේ සේනාව පරදා තෘෂ්ණාව සහමුලින් නසා පුනර්භවයට නො පැමිණෙන නිවනට පත්වූ යේ ය.
ගෝධික කථාව ධම්මපදට්ඨකථාවේ ද සඳහන් වෙයි.

*තෙසං සම්පන්න සීලානං*
*අප්පමාද විහාරිනං*
*සම්මදඤ්ඤා විමුත්තානං*
*මාරො මග්ගං න වින්දති*[1]

සීලගුණයෙන් සම්පූර්ණ වූ නො පමා විහරණ ඇති මනාව සිවුසස් දැන මිදුණා වූ ඒ උත්තමයන් ගිය මඟ මාරයා නො දනී.

වක්කලි තෙරුන්ගේ පිරිනිවීම ද මීට සමාන ය. වක්කලි සූත්‍රයට අනුව පවිටු මාරයා වක්කලි තෙරුන්ගේ විඤ්ඤාණය සෙවූ බව සඳහන්වෙයි[2]

ගෝධික තෙරහු ගෙල සිඳගන්නා අවස්ථාවේ වේදනානුපස්සනාව මෙනෙහි කිරීමෙන් රහත් වූහ යයි අටුවාව කියයි. මාරො ව.බ. DPPN

( ලෞකික සමවතක් - *සාමයිකං චෙතොවිමුත්තිං.*

ලෞකික සමාපත්ති ලැබීම ය. රූපාවචර අරූපාවචර ධ්‍යානයන් ය.

*සාමයිකං චෙතොවිමුත්තින් 'ති ලොකිය සමාපත්තිං සා හි අප්පිතප්පිත සමයෙ එව පච්චනීකෙහි විමුච්චනතො සාමයිකං චෙතොවිමුත්තින් 'ති වුච්චති.*[3]

මුල්සහිත තෘෂ්ණාව- *සමූලං තණ්හං* .

ආශාව. ඇලීම, ලෝභය, කැමැත්ත යන අර්ථ තෘෂ්ණාව යන්නෙහි ඇත. සියලු දුක් ඇති වීමට හේතුව තණ්හාව යි.

---

[1] ධපඅ. පි .264
[2] සනි . III පි . 214
[3] සුනිඅ. පි .108

දුක්ඛසමුදය සත්‍යයෙන් විස්තරවන්නේ මේ තෘෂ්ණාවයි. මෙය ත්‍රිවිධවෙයි.

කාම ආශාව (*කාම තණ්හා*), භවය හා බැඳුණ ආශාව (*භවතණ්හා*), විභවය හා බැඳුණ ආශාව (*විභව තණ්හා*)

දුකට හේතුව වූ තෘෂ්ණාව සත්ත්වයා ගේ පුනර්භවය ඇති කරයි. පඤ්චකාම වස්තූන් විෂයෙහි ඇතිවන තෘෂ්ණාව කාමාශාව සේ ද සසර දිගට පවතිනු පිණිස ඇතිවන තෘෂ්ණාව භවය හා බැඳුණ ආශාව සේ ද විනාශ වී යනු පිණිස ඇතිවන තෘෂ්ණාව විභවය හා බැඳුණු තෘෂ්ණාව සේ ද තුන් වැදෑරුම්ව විග්‍රහ වෙයි.

*පඤ්චකාම ගුණිකො රාගො කාම තණ්හා*

*භවදිට්ඨිසහගතො රාගො, සාරාගො චිත්තස්ස සාරාගො අයං වුච්චති භව තණ්හා*

*උච්ඡේද දිට්ඨි සහගතො රාගො චිත්තස්ස සාරාගො අයං වුච්චති විභව තණ්හා*

සත්ත්වයන්ගේ ත්‍රිවිධ භවයනට අනුරූපව ද තෘෂ්ණාව ත්‍රිවිධව වර්ග කෙරේ. කාම ලෝකයන්හි ඉපදීම පිණිස ඇති තෘෂ්ණාව කාම තණ්හා වශයෙන්ද, රූප ලෝකයන්හි ඉපදීම සඳහා ඇති ආශාව රූප තණ්හා වශයෙන් ද, අරූප ලෝකවල ඉපදීම සඳහා ඇති ආශාව අරූප තණ්හා වශයෙන්ද දක්වනු ලැබේ.[1]

තෘෂ්ණාව 108 වැදෑරුම් වෙයි. ආධ්‍යාත්මිකව හා බාහිරව ඇතිවන තෘෂ්ණා තිස්හය අතීත, වර්තමාන, අනාගත යන කාලත්‍රයට සම්බන්ධ කොට ගැනීමෙන් එකසිය අටක් බවට පත්වෙයි.[2]

---

[1] දීනිඅ. II පි. 722

[2] අනි . II තණ්හා සුත්තං 9 . II. 211.PTS

'මහණෙනි, මම තොපට සත්ත්වයාගේ සංසාරය ඇති කරවන සංසාරය දික් කරවන සත්වයා අවුල් වූ නූල් බෝලයක් මෙන් මංමුළා කරවන මෙම තෘෂ්ණාව ගැන කියමි. මෙම තෘෂ්ණාව සත්ත්වයා සසරට ඇද දමයි. දුකට ඇද දමයි. විනාශයට ඇද දමයි.

ඒ කවර නම් තෘෂ්ණාවක් ද? ආධ්‍යාත්මිකව ඇතිවන්නා වූ තෘෂ්ණා අටළොසකි. බාහිරව ඇති වන්නාවූ තෘෂ්ණා අටළොසකි.

එම ආධ්‍යාත්මික තෘෂ්ණා කවරේද? මම වෙමියි සිතක් ඇති වෙයි. මම මෙම ලෝකයෙහි වෙමි. මම මෙසේ වෙමි. මම වෙනත් ආකාර වෙමි. මම ශාස්වත නොවෙමි. මම ශාස්වත වෙමි. මා අනාගතයෙහි විය හැකිද? අනාගතයෙහි මා මෙම ලෝකයෙහි සිටිය හැකිද? මෙසේ මා විය හැකිද? මා වෙනස් විය හැකිද? මම මෙසේ වෙම්ද? මම වෙනස් ලෙසකින් වෙම්ද? මහණෙනි, මේ අයුරින් දහ අට වැදෑරුම්ව ආධ්‍යාත්මික තෘෂ්ණාව ඇති වෙයි.

මහණෙනි, බාහිර වූ අටළොස් තෘෂ්ණාව කවරේද? මම වෙමියි යන සිතීම නිසා මෙසේ අදහස් කරයි. මම මේ ලොව වෙමි. මම මෙසේ වෙමි. මම වෙනස් අයුරකින් වෙමි. මම ශාස්වත නොවෙමි. මම ශාස්වත වෙමි. මම මෙසේ විය හැකිද? මම මෙසේ මෙලොව විය හැකිද? මම මෙසේ මෙලොව වෙමි. මම මෙසේ වෙමි. මම වෙනස් ලෙසකින් වන්නෙමි. මම මෙසේ අනාගතයෙහි වන්නෙමි. මේ අයුරින් මහණෙනි, බාහිරව අටළොස් වැදෑරුම් තෘෂ්ණාවක් ඇති වෙයි.'

මෙසේ වර්තමාන ආධ්‍යාත්මික බාහිර තෘෂ්ණා තිස් හයද අතීත තෘෂ්ණා තිස් හය ද අනාගත තෘෂ්ණා තිස් හයද එකතුව සියලු තෘෂ්ණා සංඛ්‍යාව එකසිය අටක් බවට පත්වෙයි. තණ්හා ව. බ. DPPN, BD,

*තණ්හා ජනෙති පුරිසං*
*චිත්තමස්ස විධාවති*
*සත්තො සංසාරමාපාදි*
*කම්මං තස්ස පරායනන්'ති*

තෘෂ්ණාව සත්ත්වයා උපදවයි. ඔහුගේ සිත ඔබ මොබ දිවේ. සත්ත්වයා සසරට පැමිණියේය. කර්මය ඔහුට පිහිට වෙයි.[1]

*යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ*
*ඡින්නොපි රුක්ඛො පුනරෙව රූහති*
*එවම්පි තණ්හානුසයෙ අනූහතෙ*
*නිබ්බත්තති දුක්ඛ මිදං පුනප්පුනං*

මුල්වලට හානි නොකර ගස කපා හැරියේ නමුත් නැවත දලුලා හටගනී. තෘෂ්ණා අනුශය සහමුලින් නො නැසුවේ නම් මේ දුක නැවත හට ගනියි[2] )

මාරකොක්ක - *මාරබළිසං* [3]

*දුරුග්ගිලනට්ඨෙන බළිසං වියාති බළිසං මාරස්සබළිසං මාරබළිසං*
අපහසුවෙන් ගිලගත යුතු හෙයින් කොක්ක නමි. මාරයාගේ කොක්ක මාරකොක්ක ය.

මාරපාශය- *මාරපාසො*

*බන්ධනට්ඨෙන පාසො විය මාරස්ස පාසො මාරපාසො*
බැඳීම යන අර්ථයෙන් මද්ද- තොණ්ඩුව-මළපුඩුව නමි.

---

[1] සංනි. I පි .68
[2] ධප. 338
[3] මහානිඅ. පි. 29 තෘෂ්ණාව විස්තරකිරීමෙ දී තණ්හාවට මාරබළිස, මාරපාස, මාරබන්ධන මේ නම් කියා තිබේ.

*තණ්හාභිභූතා මාරස්ස විසයං නාතික්කමන්ති තෙසං උපරි මාරො වසං වත්තෙතීති ඉමිනා පරියායෙන මාරස්ස විසයොති මාරවිසයො*

තෘෂ්ණාභිභූත අය මාරයාගේ විෂය නො ඉක්මවති. ඔවුන් මත මාරයාගේ විෂය පවත්වන්නේය. මේ නයින් මාරයාගේ විෂය මාරවිෂය නම් වෙයි.

## සත්වසක් ලුහුබැන්දේ ය

සත්තවස්ස සූත්‍රය 4.3.4.

එක්කලෙක තථාගතයන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නෙරඤ්ජරා ගංතෙර අජපාල නුගරුකමුල වැඩවිසූහ. එකල්හි පවිටු මාර තෙමේ සත්වසක් තුළ සිදුරු (වරදක්) සොයමින් බුදුන් ලුහු බැන්දේය. එවැන්නක් නොලැබ තථාගතයන් වෙතට පැමිණ මෙසේ පැවසී ය.[1]

(මාරයා) වනයෙහි සිතිවිලි සිතයි ද? ශෝකයට බටුයෙහි ද? ධනයක් පැරදුනෙහි ද? වැලි , (නැතහොත්) පතමින් (හිඳිහි ද?) ගමෙහි කිසියම් අපරාධයක් කෙළෙහි ද? කුමක්හෙයින් මහජනයා සමග මිත්‍රභාවය නො කෙරෙහි ද? කිසිවකු හා මුබගේ මිත්‍රභාවයෙක් නො සැපයේ ද?,

මාරයාගේ මේ විමසීමට තථාගතයෝ මෙසේ වදාළහ.

---

[1] සංයුත්ත නිකාය අටුවාට අනුව මාරයා බුදුන්ගේ සිදුරක් (වරදක්) සෙවීමට බුදුවීමට පෙර වසර හයක් ද බුදුවීමෙන් පසු වසරක් ද උන්වහන්සේ ලුහුබැන්දේය. පි.145

(භගවත්හු) *සොකස්ස මූලං පලිඛාය සබ්බං*
*අනාගු ඣායාමි අසොචමානො*
*ඡෙත්වාන සබ්බං භවලොභජප්පං*
*අනාසවො ඣායාමි පමත්තබන්ධු*

මාරය, ශෝකමුල හැම සාරා දමා ශෝක නො කරමින් නිරපරාධ ව සිට ධ්‍යාන කරමි, සියලු භවලෝභසංඛ්‍යාත තෘෂ්ණාව සිඳ ආස්‍රව රහිත වූයෙමි ධ්‍යාන කරමි.

මින්පසු , අළ නැසුන (අඩු කැඩුන) කකුළුවාට දියට යා නො හැකිසේ මාරයා තථාගතයන් වෙතට පැමිණිය නොහැකි බව තේරුම් ගත්තේය.[1]

( ආස්‍රව රහිත - *අනාසවො,*

තථාගතයන් වහන්සේ ආස්‍රව (ආස්‍රව) නැති කළසේක.

ආස්‍රව. ආසව නම් කෙලෙස් ය. එනම්:

කාමසම්පත්තියෙහි ඇලීම - *කාම ආසව*
භවයට ඇති ආශාව - *භව ආසව*
දෘෂ්ටිය - *දිට්ඨි ආසව*
අවිද්‍යාව - *අවිජ්ජා ආසව*

ආසව/ ආස්‍රව පදගතාර්ථ වශයෙන් ගලායන අර්ථයයි. මේ කෙළෙස් නිසා භවය වැඩෙයි. භවය නොනැවතීම දිගින් දිගටම පැවතීමට හේතු වන්නේය. චක්ඛුද්වාරාදී මගින් පවත්වන හෙයින් ද භවාග්‍රය දක්වා පවත්වන හෙයින් ද ආස්‍රව නම් වෙයි.

*'ආසවන්තීති ආසවා, චක්ඛු ද්වාරාදීහි සවන්තීති අත්ථො අථවා ... ආභවග්ගං වා සවන්තීති ආසවා'*[2]

---

[1] සනි පි .224
[2] දීනි අ II පි. 723

## ත්‍රිවිධ භවයන්

කාමභවය , රූපභව, අරූප භවය,

සකල සචේතනික ලෝකය කාම, රූප හා අරූප වශයෙන් තෙ වැදෑරුම්ය. කාම භව නමින් හඳුන්වන්නේ සත්වයන් කුශලාකුශල කර්ම විපාක පරිදි ඉදුරන් පිණවීම පිණිස උපදිනා ස්ථාන ය. අකුසල් කළ පුද්ගලයෝ සතර අපායේ උපදිති. කුසල් කළ අය කාම ස්වර්ගයන්හි උපත ලබති. කුසලාකුසල කර්ම මිශ්‍ර වශයෙන් ඇත්තෝ මනුලොව උපදිති.

දහසය වැදෑරුම් රූප ලෝකයන්හි උපදින්නේ රූප ධ්‍යාන වැඩීමෙනි. ඒ රූප භව නමි. අරූප සමාපත්ති ලද්දවුන් උපදින ස්ථානය හඳුන්වන්නේ සතර වැදෑරුම් අරූප භව වශයෙනි[1]. )

## මාරදූවරු

මාරධීතු සූත්‍රය 4.3.5

එක්කලෙක තථාගතයන් වහන්සේ උරුවෙල්දනව්වෙහි නෙරඤ්ජරා ගංතෙර අජපාල නුගරුකමුල වැඩවිසූහ. එකල තණ්හා අරති රගා යන මාර දූවරු පව්වූ මාරයා වෙතට එළඹ, පියාණෙනි, නො සතුටුව වෙසෙනු කිම? යමෙකු ගැන සිතන්නේ නම් ඔහුව රාගපාශයෙන් බැඳ ගෙන එන්නෙමු. එවිට තොපට වසඟ වන්නේ යයි කීහ. ඒ අවස්ථාවේ මාරයා මෙසේ පැවසීය.

---

[1] සනිඅ. I පි ..47

(මාරයා) *අරහං සුගතො ලොකෙ*
*න රාගෙන සුවාතයො*
*මාරධෙය්‍යමතික්කන්තො*
*තස්මා සොචාමහං භුසන්ති*

සුගත තෙමේ ලෝකයේ අර්හත්ය. රාගයෙන් බැඳ සුවසේ ගෙන ආ නො හැක්කේය. මාරවිෂය ඉක්ම වූයේය. එහෙයින් මම අතිශයින් තැවෙමි.

ඉක්බිති මාරදූහිතෘහු තථාගතයන් වෙතට එළඹ විවිධ වේෂයන් ගනිමින් තථාගතයන් වසඟකර ගැනීමට උත්සාහ කළහ. ඔවුන්ගේ සියලු උත්සාහයන් ව්‍යර්ථ විය. භාග්‍යවතුන් වහන්සේ ඒ කිසිවකට වසඟ නො වූහ.[1]

(6 සුගතය. අර්හත්ය - *අරහං සුගතො*
සුගතය. සුගතො යනු නව බුදුගුණවලින් එකකි. භාග්‍යවතුන්වහන්සේ ශෝභන ගමන් ඇති බැවින් ද සුන්දර තැනට ගිය බැවින් ද මනාකොට ගිය බැවින් ද මනාතෙපුල් බැවින් ද සුගත නම් වෙති.

අර්හත්ය - *අරහං*

නව බුදුගුණවලින් එකකි. කෙලෙස් වලින් දුරුව සිටිනා බැවින් ක්ලේශ අරි (කෙලෙස් සතුරන්) නොහොත් පුඤ්ඤාභි සංඛාරාදි අර නැසූ බැවින්, ප්‍රත්‍ය (පුද පූජා) ලැබීමට සුදුසු බැවින්, රහසෙන් වත් පව් නො කරණ බැවින් අර්හත් නම් වන්නාහ.

[1] සනි. I පි ..226

*ආරකත්තා හතත්තාච*
*කිලෙසාරීන සො මුනි*
*හත සංසාර චක්කාරො*
*පච්චයාදීන චාරහො*
*න රහො කරොති පාපානි*
*අරහං තෙන වුච්චති* [1]

මාගන්දියබ්‍රාහ්මණයා බුද්ධශරීරයේ ලක්ෂණ දැක තමදියණියට සුදුසු ස්වාමියෙකැයි සිතා ඒ බව තථාගතයන්ට සැල කෙළේය. භාග්‍යවතුන්වහන්සේ මාගන්දියබ්‍රාහ්මණයාට මෙසේ වදාළහ[2].

*දිස්වාන තණ්හං අරතිං රගඤ්ච*
*නාහොසි ඡන්දො අපි මෙථුනස්මිං*
*කිමෙවිදං මුත්තකරීස පුණ්ණං*
*පාදා'පි නං සංඵුසිතුං න ඉච්ඡෙ'ති*[3] )

තණ්හා අරති රගා යන අය දැක ද මෛථුනයෙහි කැමැත්තක් ඇති නො වුණි. දෙතිස් කුණපයෙන් පිරුණ ශරීරය පයෙනුදු ස්පර්ශ කිරීමට කැමැති නො වෙමි. මාර ව.බ. DPPN

## මෙසේ පවසයි -නිවණෙක් නැත

ආළවිකා සූත්‍රය 5.1.1

ආළවිකා භික්ෂුණී හා බැඳෙන හෙයින් මේ සූත්‍රය මෙනම් විය. අළවිරට රජුගේ දියණිය වූහෙයින් ආළවිකා නම් වූවාය. ථෙරීගාථාවේ ඇය සේලා නමින් සඳහන්වෙයි[4].

---

[1] සිව් පි. 288
[2] ධප. අ පි. 127, 547
[3] සුනි. 839
[4] ථෙරී . 57

තථාගතයන් වහන්සේ ආළවක සමග ආළවියට වැඩමකළහ. ඒ අවස්ථාවේ සේලා සිය පියා සමග බුදුන් වෙතට ගොස් ධර්මය අසා ශ්‍රාවිකාවක් ව පසුව පැවදිව රහත්ඵලය ලැබූවාය. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි සේලා මෙහෙණ සැවැත්හි අන්ධවනයෙහි විවේක සුවයෙන් විසූවාය. ඉක්බිති පවිටු මාර තෙමේ සේලා මෙහෙණට බිය උපද වනු කැමතිව ඇයවෙතට පැමිණ මෙසේ පැවසීය.

(මාරයා) *නත්ථි නිස්සරණං ලොකෙ*
*කිං විවෙකෙන කාහසි*
*භුඤ්ජස්සු කාමරතියො*
*මාහු පච්ඡානුතාපිනී'ති*

ලොව නිවණෙක් නැත. විවේකයෙන් කුමක් කරන්නේ ද, කාමරතීන් විඳුව.

මේ පවිටු මාරයා බව තේරුම් ගත් මෙහෙණ මෙසේ පැවසූවාය.

(ආළවිවකා) *අත්ථි නිස්සරණං ලොකෙ*
*පඤ්ඤාය මෙ සුඵුස්සිතං*
*පමත්තබන්ධු පාපිම*
*න ත්වං ජානාසි තං පදං*

ලොව නිවණෙක් ඇත. මා විසින් නුවණින් දන්නා ලදි. පවිටු මරුව, තෝ ඒ නිවන්පදය නො දනිහි ය.

*සත්තිසූලූපමා කාමං*
*ඛන්ධාසං අධිකුට්ටනා*
*යං ත්වං කාමරතිං බ්‍රූසි*
*අරතා මය්හං සා අහූ'ති*

කාමයෝ අඩයටි (ආවුද) හුල්වැන්නාහ. ස්කන්ධයෝ මොවුන්ට මස්ලොඹු වැන්නහ. තෝ යම් කාමරතියෙක් කියහි ද, එය මට අරතියක් විය.
ඉන්පසු මාරයා අතුරුදහන් විය.[1]

## ස්ත්‍රීයකට නොහැකැ යි කියයි

සෝමා සූත්‍රය 5.1.2

සෝමා මෙහෙණ බිම්බිසාර රජුගේ පුරෝහිතයාගේ දුව වූවාය. බුදුරජාණන් වහන්සේ රජගහනුවරට ප්‍රථමවර වැඩම කළ අවස්ථාවේ ගිහි ශ්‍රාවිකාවක් වූ සෝමා පසුව පැවිදිව රහත් ඵල ලබාගත්තාය.
එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි සෝමා මෙහෙණ සැවැත්හි අන්ධවනයෙහි විවේක සුවයෙන් විසුවාය. ඉක්බිති පවිටු මාර තෙමේ සෝමා මෙහෙණට බිය හා ත්‍රාශය උපද වනු කැමතිව සමාධියෙන් තොරකිරීමට ඇයවෙතට පැමිණ මෙසේ පැවසීය.[2]

(මාරයා) *යං තං ඉසීහි පත්තබ්බං*
*ඨානං දුරභි සම්භවං*
*න තං ද්වංගුලපඤ්ඤාය*
*සක්කා පප්පොතුමිත්ථියා'ති*

ඉසිවරුන් විසින් ලැබියයුතු දුලබ වූ යම් ඒ පදවියක් වේ ද, එය දෑඟුල් නුවණ ඇති ස්ත්‍රිය විසින් ලැබිය නො හැක.

මේ පවිටු මාරයා බව තේරුම් ගත් සෝමා මෙහෙණ පාපී මරුට මෙසේ පැවසුවාය.

---

[1] සනි I පි 2.35
[2] සනි I පි 2.35

(සෝමා) *ඉත්ථීභාවො කිං කයිරා*
*චිත්තම්හි සුසමාහිතෙ*
*ඤාණම්හි වත්තමානම්හි*
*සම්මා ධම්මං විපස්සතො*

*යස්ස නූන සියා එවං*
*ඉත්ථාහං පුරිසොති වා*
*කිඤ්චි වා පන අඤ්ඤස්මිං*
*තං මාරො වත්තුමරහතී'ති*[1]

සිතමැනවින් සමාධිගත වූ කල්හි නුවණ පවත්නා කල්හි මනාකොට දහම දක්නහුට ඉතිරිබව (ස්ත්‍රීභාවය) කුමක් කරන්නේ ද? මම ස්ත්‍රියක් මු යි හෝ පුරුෂයෙක් මි යි හෝ අන් කිසිවෙක් වෙමි යි හෝ යමෙකුට මෙසේ අදහස් වන්නේ නම් මාරතෙමේ ඔහුට කියන්නට සුදුසු වෙයි.
ඉක්බිති මාරයා අතුරුදහන් විය.

## පුරුෂයකු සොයයි ද ? යනුවෙන් අසයි

ගෝතමී සූත්‍රය 5.1.3

සැවැත්හි උපන් ගෝතමී කෘශ ශරීරයක් ඇති හෙයින් 'කිසාගෝතමී' නමින් ප්‍රසිද්ධ වූවා ය. සිටුවරයෙකු හා විවාහ වූ ඇයට ලැබුණ දරුවා ළදරු වියේදී ම මියගියේ ය. එවැනි දුකක් නො දත් කිසාගෝතමී මියගිය සිය දරුවාට නැවත පණ ලබාගැනීමට උත්සාහ කළාය. පුතුගෙ මළකඳ උරෙන් ගෙන නගරයේ හැසුරුණේ නැවත තම දරුවාට පෙරසේ සජීවී ව සිටින්ට ඖෂධ දන්නා වෛද්‍ය වරයෙකු සොයා ගැනීමට ය. බොහෝ දෙනාගේ සිනහවට ලක් වූ ඇයට එක් ඤාණවන්ත

---

[1] ථෙරී. 66.

පුරුෂයෙක්, බුදුන්වහන්සේ මෙයට හොඳ ම වෛද්‍ය වරයා බවත් උන්වහන්සේ වෙතට යන ලෙසත් පැවසී ය. ඒ අනුව කිසාගෝතමී දෙව්රම් වෙහෙර වැඩසිටි බුදුන් වෙතට පැමිණ තම අභිප්‍රාය තථාගතයන්ට සැලකළාය.

කිසාගෝතමීගේ තත්ත්වය තේරුම් ගත් භාග්‍යවතුන්වහන්සේ කිසිවෙකු නො මළ නිවසකින් අබමිටක් ගෙනෙන ලෙස ඇයට වදාළහ. කිසාගෝතමී නිවසක් පාසා ගිය ද කිසිවෙක් නො මළ ගෙදරක් සොයාගත නොහැකි වූවාය. එයින් මරණයේ ස්වාභාවය තේරුම් ගත් ඇය දරුවාගේ මෘතදේහය සුසාන භූමියක වලලා තථාගතයන් වෙතට ගොස් දහම් අසා පැවිදිව රහත් ඵල ලබා ශ්‍රාවිකාවන්ගෙන් රූක්ෂචීවර ධාරීන් අතර අගතනතුර ලැබුවාය.[1]

ගෝතමී සූත්‍රයට අනුව එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි ගෝතමී මෙහෙණ සැවැත්හි අන්ධවනයෙහි විවේක සුවයෙන් විසුවාය. ඉක්බිති පවිටු මාර තෙමේ ගෝතමී මෙහෙණට බිය හා ත්‍රාශය උපද වනු කැමතිව සමාධියෙන් තොරකිරීමට ඇයවෙතට පැමිණ මෙසේ පැවසීය.[2]

(මාරයා) *කින්නු ත්වං හතපුත්තාව*
*එකමාසි රුදම්මුඛී*
*වනමජ්ඣ ගතා එකා*
*පුරිසං නු ගවෙසසී'ති*

කිම, තෝ මළ පුතුන් ඇති කඳුළු මුසු මුහුණැතියක සෙයින් එකලා ව හිඳහි ද? කිම, එකලා ව වනමැදට පැමිණි තෝ පුරුෂයකු සොයයි ද?

---

[1] ධපඅ. පි . 423
[2] සනි . I පි 2.36

මේ පවිටු මාරයා බව තේරුම් ගත් කිසාගෝතමී මෙහෙණ පාපී මරුට මෙසේ පැවසුවාය.

( කිසාගෝතමී) *අච්චන්තං මතපුත්තා'ම්හි*
*පුරිසා එතදන්තිකා*
*න සොචාමි න රොදාමි*
*න තං භායාමි ආවුසො*

අත්‍යන්ත කොට මළපුතුන් ඇත්තියක් වෙමි. ස්වාමි පුරුෂයෝ ද එසේය. ( පුත්‍රාන්තය සේම පුරුෂයන්ගේ අන්තය ද ඇත) ශෝක නො කරමි. නො හඬමි. ඇවත්නි, තට බිය නො වෙමි.

*සබ්බත්ථ විහතා නන්දි*
*තමොක්ඛන්ධො පදාලිතො*
*ජෙත්වාන මච්චුනො සෙනං*
*විහරාමි අනාසවා*

හැමතන්හි තෘෂ්ණාව නසනලදි, අඳුරුකඳ බිඳිණ, ලදි මරසෙන් දිනා නිකලෙස් ව වෙසෙමි.

ඉන්පසු මාරයා අතුරුදහන් විය.

## දේවලෝක ගැන කියයි

උපචාලා සූත්‍රය 5.1.7

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි උපචාලා මෙහෙණ සැවැත්හි පිඩු සිඟා පැමිණ

අන්ධවනයෙහි එක් ගසක්මුල විවේක සුවයෙන් විසුවාය. ඉක්බිති පවිටු මාර තෙමේ උපචාලා මෙහෙණ වෙතට එළඹ මෙසේ පැවසීය.[1]
(මාරයා) *කත්ථ නු ත්වං භික්ඛුනී උප්පජ්ජිතුකාමාසි ?*

මෙහෙණ, තො කොහි උපදිනු කැමැත්තෙහි ද? යනු වෙයි

(උපචාලා) *න ඛ්වාහං ආවුසො කත්ථචි උප්පජ්ජිතුකාමාසි*
ඇවැත්නි, මම කොහිදු උපදිනු නො කැමැත්තෙමි යි.

(මාරයා) *තාවතිංසා ච යාමා ච*
*තුසිතා චාපි දෙවතා*
*නිම්මාණරතිනො දෙවා*
*යෙ දෙවා වසවත්තිනො*
*තත්ථ චිත්තං පණිධෙහි*
*රතිං පච්චනුහොස්සසීති*

තව්තිසා දෙවියෝ ය, යාම දෙවියෝ ය, තුසිත දෙවියෝ ය, නිර්මාණරති දෙවියෝ ය, යම් වශවර්ති දෙවිකෙනෙක් වෙත් නම් ඔවුහු ය යන මොවුන් කෙරහි සිත පිහිටුව, පඤ්ච කාමරතිය විඳුනෙහි ය.

(උපචාලා) *තාවතිංසා ච යාමා ච*
*තුසිතා චාපි දෙවතා*
*නිම්මාණරතිනො දෙවා*
*යෙ දෙවා වසවත්තිනො*
*කාමබන්ධනබද්ධා තෙ*
*එන්ති මාරවසං පුන*

තව්තිසා දෙවියෝ ය, යාම දෙවියෝ ය, තුසිත දෙවියෝ ය, නිර්මාණරති දෙවියෝ ය, යම් වශවර්ති දෙවිකෙනෙක් වෙත්

---

[1] සනි. පි 240

නම් ඔවුහු ය. යන ඒ සියල්ලෝ පඤ්චකාමබන්ධනයෙන් බැඳුණාහු නැවත මාර වශයට පැමිනෙත්.

*අකම්පිතං අජලිතං*
*අපුථුජ්ජන සෙවිතං*
*අගති යත්ථ මාරස්ස*
*තත්ථ මෙ නිරතො මනො.*

යමෙක් අකම්පිත ද, අචල ද, පුහුදුන් විසින් නො සෙවුනා ලද ද, යම් තැනක මරුට පිහිටෙක් නැද් ද, එහි මාගේ සිත ඇලුනේ ය.

ඉක්බිති පවිටු මාර තෙමේ එහි ම අතුරු දහන් විය.

( දිව්‍ය ලෝක
පාලිසාහිත්‍යයේ දිව්‍යලෝක හයක් සඳහන්වෙතත් මෙහි පහක් පමණක් කිය වෙයි. ඒ මෙසේ ය.
තාවතිංස ය, යාම ය, තුසිත ය, නිර්මාණරති ය, (පරනිර්මිත) වශවර්ති ය. බ. පි. 7 )

( පෘථග්ජන නොවන අය සෙවුනා ලද - *අපුථුජ්ජන සෙවිතං*

මෙයින් අදහස් වන්නේ නිවණයි. සෝවාන් ආදි මාර්ග- ඵල වලට පත් වූ අය සෙවුනා ලද නිර්වාණය යි. අපුථුජ්ජන- පෘථග්ජන නොවන අය එනම්, ආර්ය පුද්ගලයෝ අට දෙනා වෙති. *අට්ඨ අරිය පුග්ගලා* .

ආර්යපුද්ගලයෝ - *අරිය පුග්ගලා*

*කතමෙ ච පුග්ගලො අරියො ? අට්ඨ අරිය පුග්ගලා අරියා, අවසෙසා පුග්ගලා අනරියා*[1].

---

[1] පුප පි .268

කවරනම් පුද්ගලයෙක් ආර්ය වෙත් ද? අෂ්ටාර්ය පුද්ගලයෝ ආර්ය වෙත්, සෙසු පුද්ගලයෝ අනාර්යයෝ වෙති.

1 සෝවාන් මාර්ගයට පිළිපන් පුද්ගලයා
  සෝවාන් ඵලයට පිළිපන් පුද්ගලයා
2 සකෘදාගාමී මාර්ගයට පිළිපන් පුද්ගලයා
  සකෘදාගාමී ඵලයට පිළිපන් පුද්ගලයා
3 අනාගාමී මාර්ගයට පිළිපන් පුද්ගලයා
  අනාගාමී ඵලයට පිළිපන් පුද්ගලයා
4 අර්හත් මාර්ගයට පිළිපන් පුද්ගලයා
  අර්හත් ඵලයට පිළිපන් පුද්ගලයා

පළමු සංයෝජන තුන මුලිනුපුටා කෙනෙක් සොතාපත්ති මාර්ග ඵලයන්ට පත්වන අතර දුගති භවයන්හි යළි උපතක් නොලබා නිවන අත්පත් කර ගැනීම පිළිබඳ නිශ්චිත භාවයට, වෙනත් ලෙසකින් කිවහොත් යළි පහත් තත්වයට නොපැමිණෙන බවට (*අවිනිපාතධම්මො*) ද පත් වේ. මෙයින් අදහස්වන්නේ පළමු සංයොජන තුන වන ස්වකීය ආත්ම දෘෂ්ටිය (*සක්කාය දිට්ඨි*), සැකය (*විචිකිච්ඡා*), වැරදි ව්‍රතවල බැඳීම (*සීලබ්බතපරාමාස*), මුලිනුපුටා සෝවාන් බවට පත් වූ පුද්ගලයාය.

ඉදිරි සංයෝජන දෙක කම්සැප- *කාමරාගය (කාමරාගො)*, ව්‍යාපාදය *(බ්‍යාපාදො.)* දුර්වල කොට සකෘදාගාමී මාර්ග ඵලයන් ලබා නිවන අත් කරගැනීමට පෙර මේ භවයෙහි එක්වරක් පමණක් උපත ලබන තැනැත්තකු බවට පත්වේ.

අනෙක් සංයෝජන රූප භවයෙහි ඉපදීමේ ආශාව,( *රූපරාග*) අරූපභවයෙහි ඉපදීමේ කැමැත්ත, *(අරූපරාග)* මානය,(*මානො*) උද්ධච්චය ( *උද්ධච්ච*) හා අවිද්‍යා (*අවිජ්ජා*) යන පහ ම සම්පූර්ණයෙන් බිඳහෙළා පුද්ගලයා අනාගාමී මාර්ගඵලයන් ලබා යළි මේ භවයෙහි කිසිදිනක උපතක් නො ලබන පුද්ගලයකු බවට පත් වෙයි. ඉහාත්මයේදීම රහත් බවට පත් නො වූවහොත්

බඹලොව ඉපිද එහිදී අරහත් මාර්ග ඵලයන් ලබා නිවන අත්පත් කර ගනියි.
අරහත් මාර්ග ඵලයන් ලැබීමේ දී මෙම සංයෝජන පහම සම්පූර්ණයෙන් විනාශයට පත් වෙයි[1].

( පෘථග්ජනයා - *පුථුජ්ජනා-අනරියා*

කෙලෙස් වලින් යුක්ත පුද්ගලයෝ පුහුදුන් - පෘථග්ජනයෝ වෙති. දස සංයෝජන වලින් සමන්විත වූ වෝ ය. ගිහි- පැවිදි කවර කෙනෙක් නමුත් දස සංයෝජන හේතු කොට සසරට බැඳී ඇතිහෙයින් පෘථග්ජනයා නම් වන්නාහ. ඔවුහු ඉඳුරන් පිනවීමට ම වෙහෙසෙති.

*සො හි පුථූනං නානප්පකාරකානං කිලෙසාදීනං ජනනාදීහි කාරණෙහි පුථුජ්ජනො. යථාහ:- පුථු කිලෙසෙ ජනෙන්තීති= පුථුජ්ජනා; පුථු අවිහත සක්කායදිට්ඨිකාති= පුථුජ්ජනා; පුථු සත්ථාරානං මුඛුල්ලොකකාති, පුථුජ්ජනා; පුථු සබ්බගතීහි අවුට්ඨිතාති, පුථුජ්ජනා; පුථු නානාභිසංඛාරෙ අභිසංඛරොන්තීති පුථුජ්ජනා; පුථු නානා ඔඝෙහි වුය්හන්තීති, පුථුජ්ජනා; පුථු නානා සන්තාපෙහි සන්තප්පන්තීති, පුථුජ්ජනා; පුථු නානා පරිළාහෙහි පරිඩය්හන්තීති, පුථුජ්ජනා; පුථු පඤ්චසු කාමගුණෙසු රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා ලග්ගා ලගිතා පලිබුද්ධාති, පුථුජ්ජනා; පුථු පඤ්චහි නීවරණෙහි ආවුතා නිවුතා ඔවුතා පටිච්ඡන්නා පටිකුජ්ජිතාති පුථුජ්ජනා; පුථූනං බහූනං ගණනපථමතීතානං අරිය ධම්මපරම්මුඛානං නීචධම්මසමාචාරානං ජනානං අන්තොගධත්තාති, පුථුජ්ජනා; පුථු වා අයං විසුං යෙව සංඛං ගතො විසංසට්ඨො සීලසුතාදි ගුණයුත්තෙහි අරියෙහි ජනෙහීතිපි, පුථුජ්ජනා'ති*[2].

ඔහු (පෘථග්ජනයා)වනාහි නොයෙක් ආකාර මහත් කෙලෙස් උපදවා ගති යන කරුණින් පෘථග්ජනයා නම් වෙයි.

---

[1] BD .20
[2] දීනිඅ. I . 45

යම්සේ කීහ:- (මෙසේ විග්‍රහ කර තිබේ) මහත් කෙලෙස් උපදවන නිසා පෘථග්ජනයෝ නම් වෙති. සක්කාය දෘෂ්ටිය නො නැසූ හෙයින් පෘථග්ජනයෝ නම් වෙති. මහත්(බොහෝ )ශාස්තෲන්ගේ මුහුන බලන්නෝ පෘථග්ජනයෝ නම් වෙති. මහත් සංස්කාර රැස්කරණ හෙයින් පෘථග්ජනයෝ නම් වෙති. විශාල කෙලෙස් ඔසය උසුලන නිසා පෘථග්ජනයෝ නම් වෙති. නා නා සන්තාපයන්ගෙන් තැවෙන නිසා පෘථග්ජනයෝ නම් වෙති. පරිලාහයන්ගෙන් දැවෙන නිසා පෘථග්ජනයෝ නම් වෙති. මහත්කවූ පඤ්චකාමගුණයන්හි ගිජු වූ ලැගගත් මූර්ඡා වූ යේ පෘථග්ජනයෝ නම් වෙති. පඤ්ච නීවරණ වලින් වැසුනාහු පෘථග්ජනයෝ නම් වෙති. පහත් හැසිරීම් ඇති, ආර්ය ධර්ම නො මැත්තෝ පෘථග්ජනයෝ නම් වෙති.

පුථුජ්ජන; පදගතාර්ථ වශයෙන්, බොහෝ දෙනාගෙන් එකෙකි. ලෞකික සාමාන්‍ය මිනිසා. ගිහි හෝ පැවිදි හෝ යමෙක් දස සංයෝජන යුක්ත නම් පෘථග්ජන වෙ යි[1] .

*උම්මත්තකො විය හි පුථුජ්ජනො යථා යථා උපට්ඨාති තථා තථා ගණ්හාති*[2]

පෘථග්ජනයා උම්මතකයෙකු වැනිය, යම් යම් ආකාරය කින් එයි ද ඒ ඒ ආකාරයෙන් ගනියි.
පුහුදුන් තෙමේ උමතුවකු මෙනි[3] . )

සනි. භික්ඛුනී සංයුත්තයට අනුව විජයා, උප්පලවණ්ණා, චාලා, සිසූපචාලා යන භික්ෂුණීහු අන්ධවනයේ විවේකව භාවනාවේ යෙදී සිටිද්දී මාරයා ඔවුන් වෙතට පැමිණ ප්‍රශ්න අසා ඇත. ඒ

---

[1] PUTHUJJANA lit. : 'one of the many folk', 'worlding' , ordinary man , is any layman or monk who is still possessed of all the 10 fetters (samyojana q v) bindinding to the round of rebirth .........BD.146

[2] පටිඅ II 450

[3] සිව් පඤ්ඤාභූමි නිද්දේශය පි 440

තෙරණියන්ගේ පිළිතුරුවලින් පරාජිත මරු අතුරුදහන්විය[1] .

## අත්බව කවරකු විසින් කරණලදදැ? යි විමසයි

සේලා සූත්‍රය 5.1.9

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි සේලා තෙරණිය සැවැත්හි පිඩුපිණිස හැසිර නිමවා අන්ධවනයෙහි එක්තරා රුක්මුලක විවේක සුවයෙන් විසුවාය. ඉක්බිති පවිටු මාර තෙමේ සේලා මෙහෙණට බිය හා ත්‍රාශය උපද වනු කැමතිව සමාධියෙන් තොරකිරීමට ඇය වෙතට පැමිණ මෙසේ පැවසීය.

(මාරයා) *කෙනිදං පකතං බිම්බං*
*ක්වන්නු බිම්බස්ස කාරකො*
*ක්වන්නු බිම්බං සමුප්පන්නං*
*ක්වන්නු බිම්බං නිරුජ්ඣතී'ති*

මේ අත්බව කවරකු විසින් කරණලද ද? මේ අත්බැව්හි කාරකයා කවරේ ද? මේ අත්බව කුමක්නිසා උපන්නේ ද? මේ අත්බව කෙසේ නිරුද්ධ වේ ද?
ඒ අවස්ථාවේ මේ පවිටු මාරයා බව තේරුම් ගත් සේලා මෙහෙණ පාපී මරුට මෙසේ පැවසුවාය.

( සේලා) *නයිදං අත්තකතං බිම්බං*
*නයිදං පරකතං අඝං*
*හෙතුං පටිච්ච සම්භූතං*
*හෙතු භංගා නිරුජ්ඣති*

---

[1] සනි. I ඊ. 2.36-244

මේ අත්බව තමාවිසින් කරණලද්දක් නො වේ. මේ දුකට පිහිටවූ (දුක් දෙන) අත්බව මෙරමා විසින් (අනුන්විසින්) කරණලද්දක් ද නො වේ. හේතුව නිසා හට ගත්තේය. හේතුව බිඳීමෙන් නිරුද්ධ වෙයි.

*යථා අඤ්ඤතරං බීජං*
*ඛෙත්තෙ වුත්තං විරූහති*
*පඨවිරසඤ්ච ආගම්ම*
*සිනෙහඤ්ච තදුභයං*

කෙතෙක වපුළ යම්කිසි බිජුවටෙක් පොළෝරසය ද ජලය ද යන ඒ දෙක ලැබ ගෙන යම්සේ අකුරු (පැල හටගනී) නගා ද.

*එවං ඛන්ධා ච ධාතුයො*
*ඡ ච ආයතනා ඉමෙ*
*හෙතුං පටිච්ච සම්භූතං*
*හෙතු භංගා නිරුජ්ඣරෙති*

එසෙයින් ම ස්කන්ධයෝ ද ධාතුහු ද ෂඩායතනයෝ ද යන මොවුහු හේතුව නිසා හටගත්තෝ ය. හේතුභංගයෙන් නිරුද්ධ වෙති[1] .
ඉන්පසු මාරයා අතුරුදහන් විය.

( ස්කන්ධයෝ - *ඛන්ධා*

ස්කන්ධ පහ මෙයින් අදහස් වෙයි (*පඤ්චක්ඛන්ධා*). රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥාන යනු පඤ්චස්කන්ධයයි. මේ කරුණු පහ නිතරම රාශි වශයෙන්, සමූහයක් ලෙස සඳහන් වෙයි.

[1]සනි. I පි . 244

රූපස්කන්ධය නම් ශීත, උෂ්ණාදිය නිසා වෙනස් වන සියල්ලයි (*රූපක්ඛන්ධො, රුප්පතීති ඛො භික්ඛවෙ තස්මා රූපන්ති වුච්චති*).
වේදනා දෙන හෙයින්, වෙනස්වන හෙයින් රූප නම් වෙයි[1].

වේදනා ස්කන්ධ නම් විඳීම ස්වභාව කොට ඇති සුඛ, දුක්ඛ, උපෙක්ඛා ආදී වේදනා සියල්ලයි. (*වෙදනක්ඛන්ධා, වෙදෙති වෙදෙතීති ඛො ආවුසො තස්මා වෙදනාති වුච්චති*[2] )

අරමුණු සලකුණු වශයෙන් ගෙන නැවත නැවත ඇතිවන හැඳිනීම සංඥා ස්කන්ධ නම් වෙයි. (*සඤ්ඤාඛන්ධො සඤ්ජානාතීති ඛො ආවුසො තස්මා සඤ්ඤාති වුච්චති*[3] )

හැඳිනීම, දැනීම විඥාන ස්කන්ධයයි. (*විඤ්ඤාණක්ඛන්ධො විජානාති විජානාතීති ඛො ආවුසො තස්මා විඤ්ඤාණන්ති වුච්චති*[4] )

සංස්කාර යනු රැස්කිරීමයි. කුසලාකුසල අව්‍යාකෘත වශයෙන් ගන්නා සියල්ල සංස්කාර ස්ඛන්ධයයි. (*සංඛාරක්ඛන්ධා සංඛතමභිසංඛාරොන්තීති ඛො භික්ඛවෙ තස්මා සංඛාරාති වුච්චති* )

මේ ස්කන්ධ දුක් වශයෙන් ද අනිත්‍ය වශයෙන් ද දක්වා ඇත.[5]

ධාතුහු - *ධාතුයො*

චක්ඛු ධාතුව, රූප ධාතුව, චක්ඛු විඤ්ඤාණ ධාතුව.
සෝත ධාතුව, සද්ද ධාතුව, සොත විඤ්ඤාණ ධාතුව.

---

[1] සනි . III පි . 104
[2] මනි . I පි . 688
[3] එහිම
[4] එහිම පි . 686
[5] සිව්. ස්කන්ධනිර්දේශය පි. 157

ඝාන ධාතුව, ගන්ධ ධාතුව, ඝාන විඤ්ඤාණ ධාතුව.
ජිව්හා ධාතුව, රස ධාතුව, ජිව්හා විඤ්ඤාණ ධාතුව.
කාය ධාතුව, ස්පර්ශ ධාතුව, කාය විඤ්ඤාණ ධාතුව.
මනො ධාතුව, ධර්ම ධාතුව, මනො විඤ්ඤාණ ධාතුව.

බර උසුලන්නවුන් විසින් උසුලනු ලබන බරමෙන්, සත්ත්වයන් විසින් චක්ෂුරාදි ධාතුහු උසුලනු ලබත් යැ යන අර්ථයි.

පුද්ගලපැවැත්මේ ස්වභාවය පැදිලි කිරීම සඳහා බෞද්ධ දර්ශනය මගින් ක්‍රම දෙකක් අනුගමනය කර තිබේ. විශ්ලේෂණ න්‍යාය හා සංශ්ලේෂණ න්‍යාය යනු ඒ ක්‍රම දෙකයි. විශ්ලේෂණ හෙවත් විග්‍රහ කර දක්වීමේ ක්‍රමය යොදාගැනීමෙහි අරමුණ වන්නේ ආනුභවික ලෝකයේ අනිත්‍ය ස්වභාවය තහවුරු කරමින් ශාස්වත වාදිත්වය පිළිබඳ සංකල්පය දුරු කරනු සඳහාය. සංශ්ලේෂණ ක්‍රමය භාවිතයට ගෙන ඇත්තේ උච්ඡේද වාදිත්වය පිළිබඳ සංකල්පය දුරුකරනු සඳහාය.

විශ්ලේෂණ ක්‍රමයට බුදුන් වහන්සේ විසින් ආනුභවික පැවැත්ම, මූල ධාතු (මහා භූත) සතරකට, ස්කන්ධ පහකට, ආයතන දෙළොසකට, ධාතු දහ අටකට ආදී වශයෙන් බෙදා දක්වා ඇත.

විවිධ විශ්ලේෂණයන් කෙරෙහි අවධානය දක්වා ඇත්තේ එක් එක් විශේෂ අංශයන් මතු කරලනු සඳහාය. මෙම විශ්ලේෂණයේදී (ආධ්‍යාත්මික) අභ්‍යන්තර ඉන්ද්‍රිය, බාහිර විෂය වස්තුව හා ඒ දෙකේ සම්බන්ධතාව නිසා ඇති වන විඤ්ඤාණය යන කරුණු තුන විෂය වස්තු හයට හා ඉන්ද්‍රිය හයට සම්බන්ධව ධාතු දහ අටක් වශයෙන් දක්වා ඇත. මෙහිදී ධාතු පදය යොදා ඇත්තේ ආත්ම සංකල්පය බැහැර කරනු සඳහායි[1].

(ෂඩායතනයෝ - *ඡ ආයතනා*

[1] සිව් ආයතන ධාතු නිර්දේශය පි. 248

ඉන්ද්‍රිය හා අරමුණු අනුව ආයතන දොළසකි.
චක්ඛායතනය (චක්ඛු), රූපායතනය (රූප), කණ-සෝතායතනය (සොත), ශබ්දායතනය(සද්ද) දිව-ජිව්හායතනය (ජිව්හා), රසායතනය (රස), නාසය -ඝාණායතනය (ඝාන), ගන්ධායතනය (ගන්ධ), සිරුර-කායායතනය(කාය), ස්පර්ශායතනය (ඵොට්ඨබ්බ), මනස-මනායතනය(මනො), ධර්ම ආයතනය (ධම්ම)

ආයතන යන්න පදනම, විෂය ක්ෂේත්‍රය, ප්‍රමාණය යන අරුත්හි යෙදෙයි. සාමාන්‍ය අදහසින් ගතහොත් බුදුදහමෙහි ආයතන යන පදය යෙදී ඇත්තේ පහත සඳහන් අර්ථ උද්දීපනය වන අයුරිනි.

එහි පෙළඹවීමක් ක්‍රියාවෙහි යෙදවීමක් ඇති බැවින්
ආයතන නම් වේ.

සමුද්‍රයෙහි හෙවත් හටගැනීම් ක්ෂේත්‍රයෙහි පවත්නා
බැවින්(*ආය*) ආයතන නම් වේ.

පොළඹවන ලද දෙයෙහි මෙහෙයවන බැවින් (*නයන*) ආයතන නම් වේ.

විසුද්ධි මග්ගය මේ එක් එක් ආයතනයක් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අර්ථ නිරූපණ මෙසේ දැක්විය හැකිය.

ආස්වාදය කරයි, රස විඳියි (*චක්ඛති*) යන අරුතින් ඇස චක්ඛු නම් වේ.
එය දෘශ්‍යමාන දෙය වින්දනය කරයි. දෘශ්‍යමානත්වයෙහි වෙනස් කම්වලට භාජනය වෙමින් මනසෙහි පවත්නා තත්ත්වය වර්ණවත් කර දක්වයි යන අරුත්ය.

ශ්‍රවණය කෙරෙන බැවින් සොත නම්. විහිදුවයි (*සප්පත්ති*) යන අරුතින් සද්ද නම්.

ගන්ධවත් කරයි. *(ඝායති)* යන අරුතින් නැහැය ඝාන

නම්. ගන්ධවත් බැවින් ගන්ධ නම්.
තමන්ගේ ම භෞතික පදනමෙන් ඉවත් වේය යන අරුත්ය.

ජිවිතය ප්‍රබෝධ කරවයි (*අව්හායති*) යන අරුතින් ජිව්හා නම්. සත්ත්වයන් රසවත් කරයි යන්නෙන් රස නම්. ආස්වාදනය කරයි යන අරුත්ය.

ආස්‍රවයන්ට විෂය වන අපවිත්‍ර දෑ (*කුච්ඡිත*) උපදවයි. (*ආය*) යන අරුතින් කාය නම්. ස්පර්ශ කරවයි යන අරුතින් (*ඵොට්ඨබ්බ*) නම්.

මනස යන අරුතින් සිත (*මනො*) නම්. තමන්ගේ ම ලක්ෂණයන් ඉපදීමට හේතු වන බැවින් (*ධාරයති*) ධම්ම නම් වෙයි[1] .

*ඛන්ධානඤ්ච පටිපාටි ධාතු ආයතනානි ච*
*අබ්බොච්ඡින්නං වත්තමානං සංසාරොති පවුච්චති*

ස්කන්ධ ධාතු ආයතනයන්ගේ නො සිඳෙන සේ පවත්නා පටිපාටිය සංසාරය යයි කියනුලැබේ[2] . )

## සත්ත්වයා කවරෙක්දැයි? විමසයි

වජිරා සූත්‍රය 5.1.10

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.
එකල්හි වජිරා තෙරණිය සැවැත්හි පිඩුපිණිස හැසිර නිමවා අන්ධවනයෙහි එක්තරා රුක්මුලක විවේක සුවයෙන් විසූවාය.

---

[1] සිවි. ආයතන ධාතුනිර්දේශය පි. 242
[2] සිවි. පඤ්ඤාභූමි නිර්දේශය පි. 388 . සුනිඅ. පි. 355

ඉක්බිති පවිටු මාර තෙමේ වජිරා මෙහෙණට බිය හා ත්‍රාශය උපදා වනු කැමතිව සමාධියෙන් තොරකිරීමට ඇය වෙතට පැමිණ මෙසේ පැවසීය.

(මාරයා) *කෙනායං පකතො සත්තො*
*කුවං සත්තස්ස කාරකො*
*කුවං සත්තො සමුප්පන්නො*
*කුවං සත්තො නිරුජ්ඣති*

මේ සත්ත්වයා කවරකු විසින් කරණ ලද්දේ ද? මේ සත්ත්වයා කළ තැනත්තා කොහි ද? මේ සත්ත්වයා කොහි හටගත්තේ ද? මේ සත්ත්වයා කොහි නිරුද්ධ වේ ද?.

ඒ අවස්ථාවේ මේ පවිටු මාරයා බව තේරුම් ගත් වජිරා මෙහෙණ පාපී මරුට මෙසේ පිළිතුරු පැවසුවාය.

(වජිරා) *කින්නු සත්තොති පච්චෙසි*
*මාරදිට්ඨිගතන් නු තෙ*
*සුද්ධසංඛාරපුඤ්ජොයං*
*නයිධ සත්තුපලබ්භති*

මරුව, කිම සත්ත්වයෙකැයි අදහන්නෙහි ද? තාගේ මාරදෘෂ්ටියෙක් නො වේ ද? මේ හුදු සංස්කාර පිණ්ඩයෙකි. මෙහි සතෙක් නො ලැබේ.

*යථා හි අංගසම්භාරා*
*හොති සද්දො රථො ඉති*
*එවං ඛන්ධෙසු සන්තෙසු*
*හොති සත්තොති සම්මුති*

අවයව සමූහය හේතු කොට ගෙන යම්සේ රථය යන ශබ්දයෙක් වේ ද?
එසේ ම පඤ්චස්කන්ධයන් ඇතිකල්හි සත්ත්වයාය යන

ලෝකව්‍යවහාරය වේ.

*දුක්ඛමෙව හි සම්භොති*
*දුක්ඛං තිට්ඨති වෙති ච*
*නාඤ්ඤත්‍ර දුක්ඛා සම්භොති*
*නාඤ්ඤත්‍ර දුක්ඛා නිරුජ්ඣති*

දුක ම ලැබේ. දුක ම පවතී. දුක ම විඳී. දුක හැර අනිකක් නො ලැබේ. දුක හැර අනිකක් නිරුද්ධ නොවේ.

ඉක්බිති මාරයා අතුරුදහන් විය.[1]

( දුක - දුක්ඛං

පාලි 'දුක්ඛ' යන්න දු +ඛ = දුක්ඛ. 'දු' යන්නෙහි නරක, අප්‍රිය, නින්දිත, යන අර්ථය ඇත. දුච්චරිත- දුසිරිත්.
'ඛ' යන්නෙහි හිස් යන අර්ථයයි . ආකාශයට ඛ යයි වහරයි. මේ අනුව අප්‍රිය, නරක. පිළිකුල්, හිස් හෙයින් (දුක්ඛ) දුක යයි කියනු ලැබේ.[2]

සත්ත්වයා විඳින දුක්රාශිය, (භවය) ඇතිවන ආකාරය පටිච්චසමුප්පාදයෙන් පැහැදිලි වෙයි. ඒ මෙසේය.
පටිච්චසමුප්පාදය.

*... කතමො ච භික්ඛවෙ, පටිච්චසමුප්පාදො අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා. සංඛාර පච්චයා විඤ්ඤාණං. විඤ්ඤාණ පච්චයා නාමරූපං. නාම රූප පච්චයා සළායතනං. සළායතන පච්චයා ඵස්සො. ඵස්ස පච්චයා වේදනා. වේදනා පච්චයා තණ්හා. තණ්හා පච්චයා උපාදානං. උපාදාන පච්චයා භවො. භව පච්චයා ජාති. ජාති පච්චයා ජරාමරණං. දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස*

---

[1] සනි. 1 පි . 246
[2] සිව්. සත්‍යනිර්දෙශය පි .266

*දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදොති*[1]

අවිජ්ජා පච්චයා සංඛාරා - අවිද්‍යාව නිසා සංස්කාර ඇති වෙයි. සංස්කාර යනු පුනර්භවය ඇති කරවන චේතනාත්මක කර්ම සංස්කාරයි.

සංඛාර පච්චයා විඤ්ඤාණං - අතීත භවයෙහි කර්ම සංස්කාර නිසා වර්තමාන භවයෙහි විඥානය ඇති වෙයි.

විඤ්ඤාණ පච්චයා නාමරූපං - විඥානය නිසා නාම රූප ඇති වෙයි. (මානසික හා භෞතික ප්‍රපඤ්චයන්)

නාම රූප පච්චයා සළායතනං - නාමරූප හෙවත් මානසික හා භෞතික ප්‍රපඤ්චයන්, ආයතන හෙවත් ඉන්ද්‍රිය සය (භෞතික ඉන්ද්‍රිය පහ සහ මානසික ඉන්ද්‍රිය) ඇති වෙයි.

සළායතන පච්චයා ඵස්සො - ආයතන සය නිසා ස්පර්ශය (ඉන්ද්‍රිය උපස්ථිති, දත්ත) ඇති වෙයි.

ඵස්ස පච්චයා වේදනා - ස්පර්ශය හෙවත් ඉන්ද්‍රිය උපස්ථිති නිසා වේදනා ඇති වෙයි.

වේදනා පච්චයා තණ්හා - වේදනාව නිසා තෘෂ්ණාව ඇති වෙයි.

තණ්හා පච්චයා උපාදානං - තෘෂ්ණාව නිසා දැඩිව අල්ලා ගැනීම ඇති වෙයි.

උපාදාන පච්චයා භවො - දැඩිව අල්වා ගැනීම නිසා භවය හෙවත් පුනර්භවය ලබා දෙන කර්ම ව්‍යාපෘතිය (කම්ම භව) මෙන්ම එහි ප්‍රතිඵල වශයෙන් උත්පත්ති භවය ඇති වෙයි.

---

[1] සනි. .II පි . 1.
සිවි. පඤ්ඤා භූමි නිර්දේශය පි . 319

භව පච්චයා ජාති - පුනර්භවය ඇති කරවන කර්ම භවය නිසා උපත ලබා දෙයි.

ජාති පච්චයා ජරාමරණං දුක්ඛ දොමනස්සුපායාසා සම් භවන්ති - උපත නිසා ජරා මරණ දුක් දොම්නස් උපායාස හට ගනියි. *එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.* මෙසේ මේ දුක් කඳ හටගැනීම සිදුවෙයි.

ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි ද විස්තර වශයෙන් සච්චවිභංග සූත්‍රයේ හා විශුද්ධි මාර්ගයේ ද සඳහන් පරිදි දුක් මෙසේ ය.

*ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණංපි දුක්ඛං සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං නලභති තම්පි, සංඛිත්තෙන පඤ්චුපාදානක්ධන්ධා.*

ඉපදීම, ජරාව, ව්‍යාධි, මරණය, ශෝකය, වැලපීම, දුක්වීම, දොම්නස, උපායාසය, අප්‍රියයන් හා එක්වීම, ප්‍රියයන්ගෙන් වෙන්වීම, කැමති දෙය නොලැබීම, සැකෙවින් පංච උපාදානස්කන්ධය දුක්ය.

විවිධ සත්ත්ව නිකායයන්හි හා භවයන්හි සත්වයෙකු වශයෙන් පිළිසිඳ ගැනීම, පහළවීම, උත්පත්තිය හෙවත් පංච උපාදානස්කන්ධයේ පහළ වීම, දක්නට ලැබීම ජාති නම් වේ.

විවිධ සත්ව නිකායයන්හි හා භවයන්හි සත්වයා ජරාවට පත් වීම, දිරායාම, දත් නිය වැටීම, කුදු ගැසීම සම රැළි වැටීම අත්පා දුබල වීම, ඇස් කන් නාසාදී ඉන්ද්‍රියයන් දුර්වල වීම ආදිය ජරාවයි.

මිය යෑම, ජීවිතින්ද්‍රිය ක්‍රියා විරහිත වීම, පඤ්ච උපාදානස්කන්ධයන් බිඳී යාම, චුත වීම යන්නෙන් අදහස් වන්නේ මරණයයි.

හිතවතකුගේ හෝ ඥාතියකුගේ මරණයෙන් හිතේ ඇතිවන දැවීම ශෝකයයි. එහි විශේෂ ලක්ෂණය වනතේ ඇතුළත දැවීමයි. ඥාකියකුගේ නැතිවීම් ආදිය බලපෑමෙන් ඇතුළත ඇතිවන ශෝකය පිටට වචන මඟින් පිට කරන්නේ පරිදේවය හෙවත් වැළපීම මඟිනි. එසේ වැළපීම පරිදේවයයි. හඩා වැටීම, යන්නෙන් අදහස් වන්නේ ද එයයි. මානසිකව ඇති වන දුක් වේදනාව දුක්ඛ නම්. දොමනස්ස යනු මානසික සන්තාපයයි. එහි ක්‍රියා කාරිත්වය වන්නේ මනස දුකට පත් කිරීමයි. වියවුලට පත් කිරීමයි. එය නිසර්ග දුකක් වන බැවින් දොම්නස් දුක් ගොඩටම අයත් වේ. උපායාස යනු වැළපීම් හඩා වැටීම් පපුවට ගසා ගැනීම් පෙරලි පෙරලී හැඩීම් ආදියට මිනිසා පොළඹවන මානසික ස්වභාවයයි. තමාට නො ගැලපෙන තමාට අප්‍රිය කරන පුද්ගලයන් හා එක්වීම, ඇසුරට ලැබීම ද දුකෙකි. ඒ නිසා මානසික තැවුලක් ඇති වේ. එමෙන් ම තමා ප්‍රිය කරණ ඇසුරට කැමති පුද්ගලයන්ගේ වියෝව, නැතිවීම හා අභාවය ද මානසික තැවුලට හේතුවකි. එබැවින් අප්‍රියයන් හා එක්වීම ද දුකෙකි. තමා ලබා ගැනීමට කැමති ප්‍රිය කරණ දෙයක් ලබා ගත නොහැකි වීම ද මානසික තැවුලට දුකට හේතුවකි. ඒ නිසාම පුද්ගලයා දුකට පත් වෙයි. කෙටියෙන් සලකන විට පඤ්ච උපාදානස්කන්ධයම දුකෙකි. ඉහත සඳහන් සියලු දුක් ඇති වන්නේ පංච උපාදානස්කන්ධයන්ගේ පහළ වීම නිසාය.[1] )

## බිළිවැද්දෙකු ලෙස

බළිස සූත්‍රය 5.1. 2

මෙම සූත්‍රයෙහි පවිටු මාරයා බිළිවැද්දෙකුටත් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා බිළිකටුව (ඇම)ටත් උපමාකර ඇත[2] .

---

[1] සිවි. සත්‍යනිර්දෙශය පි .276

[2] සනි. II පි . 344

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ. එකල්හි උන්වහන්සේ භික්ෂූන්ට මෙසේ වදාළහ.

*දාරුණො භික්ඛවෙ, ලාභසක්කාර සිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. සෙය්‍යථාපි භික්ඛවෙ බාළිසිකො ආමිසගතං බළිසං ගම්භීරෙ උදකරහදෙ පක්ඛිපෙය්‍ය තමෙනං අඤ්ඤතරො ආමිසචක්ඛු මච්ඡො ගිලෙය්‍ය. එවංහි සො භික්ඛවෙ, මච්ඡො ගිලබළිසො බාළිසිකස්ස අනයං ආපන්නො, ව්‍යසනං ආපන්නො යථාකාමකරණීයො බාළිසිකස්ස. බාළිසිකොති ඛො භික්ඛවෙ මාරස්සෙතං පාපිමතො අධිවචනං. බළිසන්ති ඛො භික්ඛවෙ ලාභසක්කාර සිලොකස්සෙතං අධිවචනං.*

මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා දරුණුය, තියුණුය, රළුය අනුත්තරවූ අර්හත්ත්වය අවබෝධය පිණිස අන්තරාය කරය. මහණෙනි, යම්සේ බිළී වැද්දෙක් ඇමින් යුත් බිළිය ගැඹුරු දිය විලෙක බහන්නේ ද,ඇමෙහි ලූ ඇස් ඇති එක්තරා මසෙක් එය ගිලින්නේය. මහණෙනි, මෙසේ ඒ මසු තෙමේ බිළිය ගිලගත්තේ දුකට පැමිණියේ වැනසුමට පැමිණියේ බිළීවැදි විසින් කැමති සේ කටයුත්තෙක් වන්නේය. මහණෙනි, 'බිළීවැද්දා' යනු පවිටු මරුට මේ නමෙකි. මහණෙනි, 'බිළීය' යනු ලාභසත්කාර කීර්ති ප්‍රශංසාවනට මේ නමෙකි.

*යො හි කොචි භික්ඛවෙ, භික්ඛු උප්පන්නං ලාභසක්කාරසිලොකං අස්සාදෙති නිකාමෙති, අයං වුච්චති භික්ඛවෙ, භික්ඛු ගිලබළිසො මාරස්ස අනයං ආපන්නො, ව්‍යසනං ආපන්නො, යථාකාමකරණීයො, පාපිමතො, එවං දාරුණො ඛො භික්ඛවෙ, ලාභසක්කාරසිලොකො කටුකො ඵරුසො අන්තරායිකො අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය. තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: 'උපපන්නං ලාභසක්කාරසිලොකං පජහිස්සාම න ච නො උප්පන්නො ලාභසක්කාරසිලෙකො චිත්තං පරියාදාය ඨස්සතී'ති*

*එවං හි වො භික්ඛවෙ, සික්ඛිතබ්බන්ති.*

මහණෙනි, යම්කිසි මහණෙක් උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා ආස්වාද කෙරේ ද,
කැමති වේ ද, මහණෙනි, මේ මහණ තෙමේ ගිල ගත් බිළීඇත්තේ දුකට පැමිණියේ වැනසුමට පැමිණියේ පවිටු මරු විසින් කැමති සේ කටයුත්තෙක් ය යි කියනුලැබේ.
මහණෙනි, ලාභසත්කාර කීර්ති ප්‍රශංසා මෙසේ දරුණුය, තියුණුය, රළුය, අනුත්තරවූ අර්හත්ත්වය අවබෝධය පිණිස අන්තරාය කරය. මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මවිය යුතු යි. ' උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා දුරුකරන්නෙමු. උපන් ලාභසත්කාර කීර්ති ප්‍රශංසා අපගේ සිතේ ක්ෂය කොටනොම සිටින්නේ ය' යි මහණෙනි, මෙසේ තොප විසින් හික්මිය යුතු මැ යි.
මෙයට සමාන අදහස් සනි. දෙවැනි භාගයේ කුම්ම සූත්‍රයේ සඳහන් වෙයි. එහි මාරයා වැද්දකුට උපමාකර ඇත.

( ලාභසත්කාර කීර්ති ප්‍රශංසා - *ලාභසක්කාර සිලොකො*

*එත්ථ චත්තාරො පච්චයා ලබ්භන්තීති ලාභා තෙ යෙව සුට්ඨු කත්වා පටිසංඛරිත්වා ලද්ධා සක්කාරො. වණ්ණභණනං සිලොකො.*

මෙහි ලාභා යනු සිවුපසය ලැබීම ය. එය මනාව සකස්කොට ලැබීම සක්කාර නම්. වර්ණනා කිරීම සිලොක නම්වෙ යි[1] .

*සත්තා සක්කාරෙන අභිභූතා පරියාදින්න චිත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං විනිපාතං නිරයං උප්පජ්ජන්ති* [2] .

සත්ත්වයෝ සත්කාරයෙන් අභිභූතව එහි ඇලුණ ක්ෂය වූ කුසල්

---

[1] දීනිඅ. II පි . 606
[2] ඉති . පි. 416

සිත් ඇත්තෝ මරණින් පසු අපායෙහි උපදිති. )

## අවකාශ ලබයි

කාලිංගරූපධාන සූත්‍රය 8.1. 8

මෙම සූත්‍රයෙන් මාරයා පුද්ගලයාට බාධාකරණ අවකාශ, සිදුරු, ඉඩකඩ විස්තරවෙයි.
එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විසල්හි මහාවනයෙහි කූටාගාර ශාලාවෙහි වැඩවසද්දී භික්ෂූන්ට මෙසේ දෙසූහ.

*කලිංගරූපධානා භික්ඛවෙ, එතරහි ලිච්ඡවී විහරන්ති අප්පමත්තා ආතාපිනො උපාසනස්මිං. තෙසං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො න ලභති ඔතාරං, නලභති ආරම්මණං. භවිස්සන්ති භික්ඛවෙ, අනාගතමද්ධානං ලිච්ඡවී සුඛුමාලා මුදුතළුණහත්ථපාදා. තෙ මුදුකාසු සෙය්‍යාසු තූලබිම්බොහනාදිසු යාව සුරියුග්ගමනා සෙය්‍යං කප්පෙස්සන්ති තෙසං රාජා මාගධො අජාතසත්තු වෙදෙහිපුත්තො ලච්ඡති ඔතාරං, ලච්ඡති ආරම්මණං.*

මහණෙනි, දැන් ලිච්ඡවීහු ලීකොටයක් කන්වයින් කොට (කොට්ටයක් කොට) ඇත්තාහු අප්‍රමත්ත ව, වීර්ය ඇතිව ගුරූපසනයෙහි (ශිල්ප හැදෑ රීමෙහි) යෙදුනාහු වාසය කෙරෙති. මගධාධිපති වේදේහිපුත් අජාසත් රජ තෙමේ ඔවුන්ගේ සිදුරක් නො ලබයි. අරමුණක්( ප්‍රත්‍යයයක් ) නො ලබයි. මහණෙනි, අනාගත කාලයෙහි ලිච්ඡවීහු සියුමැලි වූවෝ මුදුතුරුණු අත් පා ඇත්තෝ වන්නාහ. ඔහු පුලුන් කන්වයින් (=කොට්ට ) ඇති මුදු යහන්හි හිරු උදා වන තෙක් ශයනය කරන්නාහ. මගධාධිපති වේදේහිපුත් අජාසත් රජ තෙමේ (ඔවුන් දිනුමට) ඔවුන්ගේ සිදුරක් ලබන්නේය. අරමුණක් ලබන්නේය.

*කලිංගරූපධානා භික්ඛවෙ, එතරහි භික්ඛූ විහරන්ති අප්පමත්තා ආතාපිනො පධානස්මිං. තෙසං මාරො පාපිමා න ලභති ඔතාරං,*

*න ලභති ආරම්මණං. භවිස්සන්ති භික්ඛවෙ, අනාගතමද්ධානං භික්ඛූ සුඛුමාලා මුදුතළුණහත්ථපාදා. තෙ මුදුකාසු සෙය්‍යාසු තූලබිම්බොහනාදිසු යාව සුරියුග්ගමනා සෙය්‍යං කප්පෙස්සන්ති තෙසං මාරො පාපිමා ලච්ඡති ඔතාරං, ලච්ඡති ආරම්මණං.*

මහණෙනි, දැන් භික්ෂූහු ලීකොටයක් කන්වයින් කොට (කොට්ටයක් කොට) ඇත්තාහු අප්‍රමත්ත ව, කෙලෙස් තවන වීර්ය ඇතිව ප්‍රධන්වීර්ය යෙහි යෙදුනාහු වාසය කෙරෙති. පවිටු මාර තෙමේ ඔවුන්ගේ සිදුරක් නො ලබයි. අරමුණක්( ප්‍රත්‍යයයක්) නො ලබයි. මහණෙනි, අනාගත කාලයෙහි භික්ෂූහු සියුමැලි වූවෝ මුදුතුරුණු අත් පා ඇත්තෝ වන්නාහ. ඔහු පුලුන් කන්වයින් (කොට්ට ) ඇති මුදු යහන්හි හිරු උදා වන තෙක් ශයනය කරන්නාහ. පවිටු මාර තෙමේ ඔවුන්ගේ සිදුරක් (අවකාශයක්) ලබන්නේය. අරමුණක් ලබන්නේය.

සූත්‍රය අවසන් වන්නේ මරුට අවකාශයක් නො තබන ලෙස භික්ෂූන්ට කරනුලබන අනුශාසනාවකිනි

*තස්මාතිහ භික්ඛවෙ, එවං සික්ඛිතබ්බං: 'කලිංගරූපධානා විහරිස්සාම අප්පමත්තා ආතාපිනො පධානස්මින්'ති. එවං හි වො, භික්ඛවෙ සික්ඛිතබ්බන්ති .*[1]

මහණෙනි, එහෙයින් මෙහි මෙසේ හික්මිය යුතු : ' දැව කඩක් කන්වයින් කොට ඇත්තමෝ අප්‍රමත්ත ව, කෙලෙස් තවන වැර ඇතිව ප්‍රධන්වීර්ය යෙහි යෙදුනමෝ වාසය කරන්නෙමු' යි මහණෙනි, තොප විසින් මෙසේ හික්මිය යුතු ම ය.

---

[1] සනි. II පි . 414

## රාධ තෙරුන්ගේ මාර ප්‍රශ්නය

### මාර සූත්‍රය. 2.1.1

මාරයා පිළිබඳ ව ප්‍රශ්න සහ පිළිතුරු ඇතුළත් හෙයින් 'මාර සූත්‍රය' නම් විය. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්හි අනේපිඩු සිටුවරයාගේ ජේතවන නම් වූ ආරාමයෙහි වැඩ විසූහ.

*ආයස්මා රාධො භගවන්තං එතදවොචඃ මාරො, මාරොති,' භන්තෙ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තෙ, මාරොති*

ආයුෂ්මත් රාධ තෙරණුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹ මෙය සැලකළහඃ වහන්ස, 'මාර මාර' යී කියනු ලැබෙයි, වහන්ස, කොපමණෙකින් මාර වේ ද ?. ( භාග්‍යවතුන්වහන්ස, මාරයා මාරයා යයි කියනව ඒ කවු ද ?)

*රූපෙ ඛො රාධ සති මාරො වා අස්ස මාරෙතා වා සො වා පන මීයති තස්මා තිහත්වං රාධ රූපං මාරොති පස්ස, මාරෙතාති පස්ස, මීයතීති පස්ස, රොගොති පස්ස, ගණ්ඩොති පස්ස, සල්ලන්ති පස්ස, අඝන්ති පස්ස, අඝභූතන්ති පස්ස, යෙ නං එවං පස්සන්ති තෙ සම්මා පස්සන්ති. වෙදනා...පෙ... සඤ්ඤා...පෙ...සංඛාර...පෙ...විඤ්ඤාණං...පෙ...[1].*

රාධය, රූපය ඇති කල්හි මරු (මරණය) හෝ මැරෙන්නා හෝ වන්නේ යැ. රාධය, එ හෙයින් මෙහි ලා තෙපි රූපය මරු යයි දකිවු, මැරිය යුත්තා යයි දකිවු, මැරෙන්නා යයි දකිවු, රාග ය යයි දකිවු, ගඩ යයි දකිවු, හුල යයි දකිවු, ව්‍යසන යයි දකිවු, ව්‍යසනයට පැමිණියකැ යි දකිවු. යම් කෙනෙක් එය ( රූපය) මෙ සේ දකිද් ද ඔහු මැනවින් දකිති.
වෙදනාව, ... සඤ්ඤාව,... සංස්කාර,... විඤ්ඤාණය... යන කරුණු ද මේ නයින් ම ගත යුතු යි.

---

[1] සනි. III පි . 340

## මාර ධම්ම සූත්‍රය. 2.3.2

මේ සූත්‍රය ද රාධ තෙරුන්ටම දෙසසූහ.

*යො බො, රාධ, මාරධම්මො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො රාගො පහාතබ්බො ඡන්දරාගො පහාතබ්බො. කො ච රාධ මාරධම්මො : රූපං බො රාධ මාරධම්මො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො, රාගො පහාතබ්බො, ඡන්දරාගො පහාතබ්බො. ...වෙදනා...සඤ්ඤා..සංඛාරා... විඤ්ඤාණං මාරධම්මො තත්‍ර තෙ ඡන්දො පහාතබ්බො රාගො පහාතබ්බො ඡන්දරාගො පහාතබ්බො.*

රාධය, යමෙක් මරණධර්ම (මැරෙණසුලු) නම් එහි ලා තොපගේ ඡන්දය පහකට යුතුයැ. රාගය පහකට යුතුයැ. ඡන්දරාග පහකට යුතුයැ. රාධය, කවරෙක් මරණධර්ම වේ ද යත් : රාධය, රූපය මරණධර්මයැ. එහි ලා තොපගේ ඡන්දය පහකට යුතුයැ. රාගය පහකට යුතුයැ. ඡන්දරාග පහකට යුතුයැ. .....වේදනාව.... සංඥාව.... සංස්කාර.....විඥානය මරණධර්ම ය. එහි ලා තොපගේ ඡන්දය පහකට යුතුයැ. රාගය පහකට යුතුයැ. ඡන්දරාග පහකට යුතුයැ[1].

( රාගය - *රාගො*

ඇලීම, ගැලීම, චක්ඛු-ඇස ආදි ඉඳුරන් වලින් රූපාදිය ගෙන එම අරමුණු වල ඇලීම 'රාග' නම් වෙ යි. රූප ශබ්ද ගන්ධ-සුවඳ රස ස්පර්ශ ආරම්මණ සුභ වශයෙන් ගැනීමෙන් රාගය වර්ධනය වෙයි[2].

අයෝනිසෝ මනසිකාරය ද නිමිති- අරමුණු සුභවශයෙන් ගැනීම ද රාගය වැඩි වීමට හේතුභූත වෙ යි.

---

[1] සනි. III පි . 360
[2] මහානි. පි. 722

රාගය යනු ඇල්ම, ආශාවයි. මෙය ඇති වීමට හේතු දෙකකි එනම් සුභ නිමිත්ත හා අනුවණ මනසිකාරයයි.

*ද්වෙමෙ භික්ඛවෙ, පච්චයා රාගස්ස උප්පාදාය කතමෙ ද්වෙ? සුභනිමිත්තඤ්ච අයොනිසො මනසිකාරො[1]...*

මහණෙනි, රාගය ඇති වීමට හේතු දෙකකි. කිනම් දෙකක් ද? සුභ නිමිත්ත සහ අනුවණ මනසිකාරය යි.

ප්‍රියංකර හා ආකර්ෂණීය වස්තුවක් (සුභ අරමුණක්) ඇසට-සිතට ගෝචර වූ විට රාගය ඇතිවෙයි. ඇසින් රූපයක් දැක එය සුභ වශයෙන් නිමිති වශයෙන් ගත්තේ නම් රාගය වැඩෙයි. මෙයට නිදසුන් පුවතක් විශුද්ධිමාර්ගයේ [2] හා සංයුත්තනිකායේ [3] සඳහන්ය. ඒ මෙසේය, පැවිදි වූ අලුත වංගීස තෙර ආනන්ද තෙරුන් සමග පිඩු පිණිස වඩින්නේ එක් කාන්තාවක දැක ඇතිවූ රාගයෙන් පෙළී ' කාම රාගයෙන් පෙළෙමි. මගේ සිත අතිශයින් රාගයෙන් දැවෙයි ගෝතම පුතණුවනි, එය නිවාගතහැකි ක්‍රමයක් අනුකම්පාකර කියනු මැනවි ' එයට පිළිතුරු දෙන ආනන්ද තෙරණුවෝ
'විපරීතසංඥාව/රාගය ඇතිවීමට හේතු වූ නිමිත්ත සිතින් දුරුකරනු' ය යි දෙසූහ. ඒ අනුගමනය කළ වංගීස තෙර රාගය සිතින් දුරු කරගත්තේය. අයෝනිසෝ මනසිකාරය හේතුවෙන් ද රාගය ඇතිවෙයි

*සුභානුපස්සිං විහරන්තං*
*ඉන්ද්‍රියෙසු අසංවුතං*
*භොජනම්හි ච අමත්තඤ්ඤුං*
*කුසීතං හීන වීරියං*
*තං වෙ පසහති මාරො*

---

[1] අනි. I පි. 98
[2] සිවි. පි . 60
[3] සනි. I පි . 336

*වාතො රුක්ඛංව දුබ්බලං*[1]

යම් කෙනෙක් රූප ආදි නිමිති-අරමුණු ශුභ වශයෙන් ගනිමින් ඉන්ද්‍රිය සංවර නො කර භෝජනයෙහි පමණ ද නො දැන කුසීත වූ යේ ද හීන වීර්ය ඇත්තේ ද ඔහු දිරූ ගහක් සුළඟින් පෙරළා දමන්නා සේ මාරයාට-මරණයට යටත් වෙ යි.

*අසුභානුපස්සිං විහරන්තං*
*ඉන්ද්‍රියෙසු සුසංවුතං*
*භොජනම්හි ච මත්තඤ්ඤුං*
*සද්ධං ආරද්ධ වීරියං*
*තං වෙ නප්පසහති මාරො*
*වාතො සෙලංව පබ්බතං*

යම් කෙනෙක් රූප ආදි නිමිති-අරමුණු අශුභ වශයෙන් ගනිමින් ඉන්ද්‍රිය සංවරය ඇතිව භෝජනයෙහි පමණ ද දැන ශ්‍රද්ධාව ඇතිව ඇරඹූවීර්ය ඇත්තේ ද ඔහු පර්වතයක් සුළඟින් පෙරළා දැමිය නො හැකි සේ මාරයාට-මරණයට යටත් නො වෙ යි.

නිමිති-අරමුණු ශුභ වශයෙන් බැලීම රාගය ඉපදීමට හේතු වෙ යි. සුභානුපස්සිං- ශුභ යයි බලන්නා, මෙය විස්තරකරණ අටුවාව මෙ සේ කියයි.

*සුභානුපස්සිං විහරන්තන්ති සුභං අනුපස්සන්තං ඉට්ඨාරම්මණෙ මානසං විස්සජ්ජෙත්වා විහරන්තීති අත්ථො. යො හි පුග්ගලො නිමිත්තග්ගාහං අනුබ්‍යඤ්ජනග්ගාහං ගණ්හන්තො නඛා සොභනාති ගණ්හාති, අංගුලියො සොභනාති ගණ්හාති, හත්ථපාදා ජංඝා ඌරු කටි උදරං ථනං ගීවා ඔට්ඨා දන්තා මුඛං නාසා අක්ඛීනි කණ්ණා භමුකා නලාටං කෙසා සොභනාති ගණ්හාති, වණ්ණො සුභො, සණ්ඨානං සොභනාති ගණ්හාති, අයං සුභානුපස්සී නාම*[2].

---

[1]ධප. 7 - 8
[2]ධපඅ. පි 14

නිමිති-අරමුණු ශුභ වශයෙන් බැලීම, ශුභ යයි ඉටු අරමුණෙහි නැවත නැවත සිත යොදා විසීම යන අර්ථය යි. යම් පුද්ගලයෙක් නිමිති වශයෙන් ලක්ෂණ (ලස්සන) වශයෙන් ගන්නේ නිය සෝභන ය යි(ග්‍රහනය කරයි- ගනියි) සිතයි, ඇඟිලි සෝභන ය යි සිතයි, අත්පා කෙණ්ඩා කලවා නිතඹ බඩපෙදෙස පියයුරු බෙල්ල දෙතොල දසන් (දත්) මුව (කට)නාසය ඇස් සවන් (කන්) බැම නලළ කෙස් සෝභන ය යි සිතයි. මේ ශුභ ලෙස බැලීම යනු ය.

රාධ තෙරණුවෝ

සැවැත්හි දුප්පත් බමුණු පවුලක රාධ උපන්නේ ය. වයසට පත් හෙතෙම ආරාමයකට ගියේ පැවිදි වීමේ අදහසිනි. එහෙත් රාධගේ වයස හේතුකොට භික්ෂූහු පැවිදි බවට පත් නො කළහ. හෙතෙම ආරාමයේ වත්පිළිවෙත් කරමින් විසුවේ ය. රාධ පෙර කළ පින් නිසා මාර්ග ඵල ලැබීමේ වාසනාව ඇති බව දුටු බුදුහු ඔහුට පිහිටවනු පිණිස එම ආරාමයට වැඩමකළහ. එදින භාග්‍යවතුන් වහන්සේ කරුණු විමසා භික්ෂූන් රැස්කර රාධගේ උපකාර ලද කෙනෙක් ඇද්දැ යි විමසූහ. සාරිපුත්ත තෙරහු ඔහුගෙන් පිණ්ඩපාතදානයක් ලැබූ බව පවසා රාධ පැවිදි කිරීමට භාරගත්හ. සාරිපුත්ත තෙරගේ අනුශාසනා මැණවින් අනුගමනය කළ හෙයින් නො බෝ කලකින් රාධ තෙරණුවෝ රහත්ඵලය ලැබූහ[1].
මේ තෙරහු පටිභාණක ශ්‍රාවකයන් අතර අග්‍රස්ථානය ලබාගත්තේ. ය (පටිභාණෙයායකානං)[2]
අසූ මහා ශ්‍රාවකයෙකු වූ රාධ තෙරහු භාවිත සිත පිළබඳව ගාථා දෙකක් කීහ[3].

---

[1] ධපඅ. පි . 332
[2] අනි. එතදග්ගපාළි
[3] ථෙර. 253

*යථා අගාරං දුච්ඡන්නං*
*වුට්ඨී සමතිවිජ්ඣති*
*එවං අභාවිතං චිත්තං*
*රාගො සමතිවිජ්ඣති*

මනාව හෙවිලි නො කළ ගෙය වැස්සෙන් තෙමෙන්නාක් මෙන් අභාවිත සිත රාගයෙන් තෙමෙයි- තෙත් වෙයි.

*යථා අගාරං සුච්ඡන්නං*
*වුට්ඨී න සමතිවිජ්ඣති*
*එවං සුභාවිතං චිත්තං*
*රාගො න සමතිවිජ්ඣති*

මනාව හෙවිලි කළ ගෙය වැස්සෙන් නො තෙමෙන්නාක් මෙන් භාවිත සිත රාගයෙන් නො තෙමෙයි- තෙත් නො වෙයි.

මාර සූත්‍රය. 2.3.1-

මේ සූත්‍ර ඉහත කියන ලද සූත්‍රයට සමානය. රාධ තෙරුන්ට ම දේශනා කර තිබේ. පඤ්චස්කන්ධය පිළිබඳ ඇති කැමැත්ත, ඇල්ම දුරු කළ යුතු බව විස්තර වෙ යි[1]. )

## මරසෙන් මඩින අයුරු

මාර සූත්‍රය 2. 5. 3

මෙම සූත්‍රයෙන් මාරසේනාව මර්ධනය කරන මාර්ගය විස්තර වන්නේ ය.

589. *මාරසෙනප්පමද්දනං වො භික්ඛවෙ, මග්ගං දෙසිස්සාමි. තං*

[1] සනි. III. පි . 360

*සුණාථ. කතමො ච භික්ඛවෙ, මාරසෙනප්පමද්දනො මග්ගො යදිදං සත්ත බොජ්ඣංගා. කතමෙ සත්තඃ සතිසම්බොජ්ඣංගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣංගො අයං බො භික්ඛවෙ, මාරසෙනප්පමද්දනො මග්ගොති*[1].

589. මහණෙනි, මරසෙන් මඩිනා මඟ තොපට දේශනා කරන්නෙමි. එය අසවු. මහණෙනි, මරසෙන් මඩිනා මඟ කවරේ ද යත්ඃ මේ සත් බොජඟ (බෝධ්‍යංග) යි. කවර සතෙක් (හතක්) ද යත්ඃ සිහිසම්බොජඟ ... උපෙසම්බොජඟ (උපේක්ෂා). මහණෙනි, මේ මරසෙන් මඩිනා මඟ යි.

මෙයින් උගන්වන්නේ බෝධ්‍යංග සත වැඩීමෙන් මාරසේනාව නැතිකළ හැකි බව ය.

( බෝධ්‍යංග සත - *සත්ත බොජ්ඣංගා*

සති , ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යනු සම්බෝධ්‍යංග සතයි.

බොධි + අංග =බොජ්ඣංග, සම්බෝධිය ඇති කරගැනීමට හේතුවෙයි යන අර්ථය දෙයි. මෙම බොධ්‍යංග හත වර්ධනය කර ගැනීමෙන් සම්මා සම්බෝධිය අවබෝධ කිරීමට හැකි වෙයි. සම්බෝධියට හෙවත් සත්‍යාවබෝධයට හේතු භූත වන ධර්ම යන අරුතෙන් මේවා බොජ්ඣංග යනුවෙන් හැඳින්වී ඇත.

සම්බෝධිය සඳහා වන ක්‍රියාමාර්ගයේ පදනම මෙන්ම ප්‍රධානතම ගුණාංගය වන්නේ *සති* යයි. සතිය යනු සිහියෙන් යුක්ත වීමයි. තමාගේ ශරීරය, වේදනාවන්, මනස හා චෛතසික ධර්මයන් පිළිබඳව සිහියෙන් යුක්ත වන විට පුද්ගලයෙක් තමාගේ කායික මානසික අනුභූතීන් පිළිබඳව තව දුරටත් විමර්ශනය කරයි. මෙම විමර්ශනය *ධම්ම විචය*

---

[1] සනි .V පි. 196, දීනිඅ පි . 535

බොජ්ඣංගයෙන් නියෝජනය වෙයි.

මෙම තත්ත්වය වර්ධනය කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීම බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. මෙසේ ප්‍රයත්න දැරීම හෙවත් විර්යය වැඩීම බොජ්ඣංගයක් වන අතර එය වීර්ය නමින් හැඳින් වී ඇත.
අනෙක් ගුණාංගයන් සමඟ මෙම වීර්යය ද වැඩිය යුතුය. වීර්යය මතින් තම කාර්යෙහි සාර්ථකත්වය ලබන පුද්ගලයාට ප්‍රීතිය හෙවත් සතුට ඇති වෙයි. එය පීති සම්බොජ්ඣංගයයි.

ප්‍රීතිය මානසික උපශාන්ත භාවයට හේතු වෙයි. මානසික වශයෙන් අත්පත් වන එම සන්සුන් බව පස්සද්ධි සම්බොජ්ඣංගයයි.

මානසික සංසුන් බව හෙවත් සන්හිඳියාව ඇති විට මානසික ඒකග්‍රතාව හෙවත් සමාධිය ඇති වෙයි. සමාධිය මගින් පුද්ගලයෙකුගේ මනස බෙහෙවින් කර්මණ්‍ය බවට පත් වේ. එවිට පුද්ගලයාට තමාගේ සියලු අනුභූතීන් අන්තගාමීත්වයෙන් තොරව මැදහත් බවින් යුක්තව විමසා බැලීමට හැකි වෙයි. මෙම මැදහත් බව උපෙක්ඛා සම්බොජ්ඣංගයෙන් නියෝජනය වෙයි. වස්තූන් ගේ යථා භූත තත්වය හෙවත් ඒවා ඇති සැටියෙන් දැකීමට පුදුගලයාට ඉවහල් වන්නේ මෙම උපේක්ෂාවයි. එමගින් වස්තූන් විදර්ශනයට නඟා ගනිමින් ප්‍රඥාව වර්ධනය කර ගත හැකිය. )

## ඉදිබුවා කෙරෙන් හිවලා මෙන්

### කුම්මෝපම සූත්‍රය 1. 19. 3

*භූතපුබ්බං, භික්ඛවෙ, කුම්මො කච්ඡපො සායණ්හසමයං අනුනදීතීරෙ ගොචරපසුතො අහොසි. සිගාලොපි ඛො භික්ඛවෙ, සායණ්හසමයං අනුනදීතීරෙ ගොචරපසුතො අහොසි. අද්දසා ඛො භික්ඛවෙ, කුම්මො කච්ඡපො සිගාලං දූරතොව*

*ගොචරපසුතං, දිස්වාන සොණ්ඩිපඤ්චමානි අංගානි සකෙ කපාලෙ සමොදහිත්වා අප්පොස්සුක්කො තුණ්හීභූතො සංකසායති. සිගාලොපි ඛො භික්ඛවෙ, අද්දස කුම්මං කච්ඡපං දූරවතොව, දිස්වාන යෙන කුම්මො කච්ඡපො තෙනුපසංකමි උපසංකමිත්වා කුම්මං කච්ඡපං පච්චුපට්ඨිතො අහොසි යදායං කුම්මො කච්ඡපො සොණ්ඩිපඤ්චමානං අංගානං අඤ්ඤතරංවා අඤ්ඤතරං වා අංගං අභිනින්නාමෙස්සති, තත්ථෙව නං ගහෙත්වා උද්දාලිත්වා ඛාදිස්සාමී'ති යදා ඛො භික්ඛවෙ, කුම්මො කච්ඡපො සොණ්ඩිපඤ්චමානං අංගානං අඤ්ඤතරංවා අඤ්ඤතරං වා අංගං න අභිනින්නාමෙසි, අථ සිගාලො කුම්මම්හා නිබ්බිජ්ජ පක්කමි, ඔතාරං අලභමානො.*

*එවමෙව ඛො භික්ඛවෙ, තුම්හෙපි මාරො පාපිමා සතතං සමිතං පච්චුපට්ඨිතො හොති- 'අප්පෙව නාමාහං ඉමෙසං චක්ඛුතො වා ඔතාරං ලභෙය්‍යං, සොතතො වා ඔතාරං ලභෙය්‍යං, ඝානතොවා ඔතාරං ලභෙය්‍යං, ජිව්හාතොවා ඔතාරං ලභෙය්‍යං කායතොවා ඔතාරං ලභෙය්‍යං, මනතො වා ඔතාරං ලභෙය්‍යන්ති. තස්මාතිහ, භික්ඛවෙ, ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරා විහරථ. චක්ඛුනා රූපං දිස්වා මා නිමිත්තග්ගාහිනො අහුවත්ථ, මා අනුබ්‍යඤ්ජනග්ගාහිනො. යත්වාධිකරණ මෙනං චක්ඛුන්ද්‍රියං අසංවුත- විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං, තස්ස සංවරාය පටිපජ්ජථ, රක්ඛථ චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජථ . ...*
*අථ තුම්හෙපි මාරො පාපිමා නිබ්බිජ්ජ පක්කමිස්සති ඔතාරං අලභමානො- කුම්මම්හාව සිගාලොති*[1] .

මහණෙනි, පෙර, ඉදිබුවෙක් සවස්වේලෙහි ගංඉවුර අසබඩ ගොදුරු සෙවීමේ යෙදුනේ වි ය.
මහණෙනි, සිවලෙක් ද සවස්වේලෙහි ගංඉවුර අසබඩ ගොදුරු සෙවීමේ යෙදුනේ වෙයි.

---

[1] සනි. IV . පි. 348

මහණෙනි, ඉදිබුවා ගොදුරු සෙවීමේ යෙදුණු හිවලා දුරදී ම දුටුයේ ය. දැක හිස පස්වැනිකොට ඇති අවයව සිය කබලෙහි බහාගෙන නිස්සුක ව නිහඬ ව හිඳී (ඉඳී) මහණෙනි, හිවලා ද ඉදිබුවා දුරදී ම දුටුයේ ය. දැක ඉදිබුවා වෙත එළඹියේ ය. එළඹ 'යම් කලෙක මේ ඉදිබුවා හිස පස්වැනිකොට ඇති අවයව යන්ගෙන් එක් අවයවයක් හෝ පිටතට නිකුත්කරන්නේ නම් එහි ම එය ඩැහගෙන කඩා කන්නෙම් යි' ඉදිබුවාට ලන්ව සිටියේ ය. මහණෙනි, යම් කලෙක ඉදිබුවා හිස පස්වැනිකොට ඇති අවයවයන්ගෙන් එක් අවයවයක් හෝ පිටතට නිකුත් නො කෙළේ ද එකල්හි හිවලා ඉඩක් නො ලබනුයේ ඉදිබුවාගෙන් ඉවත්ව ගියේ ය.

මහණෙනි, තොප ද පවිටු මරු තෙමේ 'මම මොවුන්ගේ ඇසින් හෝ ඉඩක් ලබන්නෙම් නම්, කනින් හෝ ඉඩක් ලබන්නෙම් නම්, නැහැයෙන් හෝ ඉඩක් ලබන්නෙම් නම්, දිවෙන් හෝ ඉඩක් ලබන්නෙම් නම්, කයෙන් හෝ ඉඩක් ලබන්නෙම් නම්, සිතින් හෝ ඉඩක් ලබන්නෙම් නම් නිතර එළඹ සිටියේ වෙ යි. මහණෙනි, එහෙයින් මෙහි ලා ඉඳුරන්හි වැසූ දොර ඇතිව වසව්.

ඇසින් රූපයක් දැක නිමිති වශයෙන් ගන්නෝ නො වව්. අනුබ්‍යඤ්ජන වශයෙන් ගන්නෝ නො වව්. යමක් හේතු කොට ගෙන චක්ඛු ඉන්ද්‍රියසංවෘත නො කොට වෙසෙන හෙයින් අභිජ්ඣා දෝමනස්ස යන ලාමක අකුසල් දහම්හු අනුබඳනාහු නම් එහි සංවරය පිණිස පිළිපදිව්.

මහණෙනි, යම් කලෙක තෙපි ඉඳුරන්හි වැසූ දොර ඇතිව වසන්නාහු නම් එකල්හි පවිටු මරු තෙමේ ඉඩක් නො ලැබ හුන්නේ කලකිරි ඉදිබුවා කෙරෙන් හිවලා මෙන් තොප කෙරෙනුදු ඉවත් ව යන්නේ ය.

# ගිජුලිහිණියක මෙන්

## සකුණග්ඝි සූත්‍රය 3. 1. 6

මේ සූත්‍රයෙහි මාරයා ගිජුළිහිණියකට උපමා කරතිබේ.

*භූතපුබ්බං භික්ඛවෙ, සකුණග්ඝි ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා අග්ගහෙසි. අථඛො භික්ඛවෙ, ලාපො සකුණො සකුණග්ඝියා හරීයමානො එවං හි පරිදෙවිසි 'මයමෙවම්හ අලක්ඛිකා මයං අප්පපුඤ්ඤා, යෙ මයං අගොචරෙ චරිම්හ පරවිසයෙ. සචජ්ජ මයං ගොචරෙ චරෙය්‍යාම සකෙ පෙත්තිකෙ විසයෙ, නචායං සකුණග්ඝි අලං අභවිස්ස යදිදං යුද්ධායා'ති.*

මහණෙනි, පෙර ගිජුලිහිණියක් සැහැසිකමින් පැමිණ කැට කුරුල්ලකු අල්ලා ගත්තා ය. මහණෙනි, කැට කුරුලු තෙමේ ගිජුලිහිණියාවිසින් හැරගෙන යනු ලබන්නේ මෙසේ හැඬී යඃ යම් බඳු අපි අගෝචර වූ අනුන් අයත් විෂයෙහි හැසුරුණුමෝ නම් (ඒ) අපි ම කාලකන්නි වම්හ (වෙමු) අපි ම පින් නැත්තම්හ. ඉදින් අපි ගොදුරු වූ සිය පිය සතු විෂයෙහි හැසුරුණුමෝ නම් මේ ගිජුළිහිණියා මේ යුද්ධයට නො ද සමත් වන්නී ය යි.

*කො පන තෙ ලාප, ගොචරො සකො පෙත්තිකො විසයොති. යදි දං නංගලකට්ඨකරණං ලෙඩ්ඩුට්ඨානන්ති. අථ ඛො භික්ඛවෙ, සකුණග්ඝි සකෙ බලෙ අපත්ථද්ධා සකෙ බලෙ අවචමානා අමුඤ්චි, ගච්ඡ කො ත්වං ලාප, තත්‍ථාපි මෙ ගන්ත්වා න මොක්ඛසීති.*

'එම්බල කැට කුරුල්ල තාගේ ගොදුරු වූ සිය පියසතු විෂය කිමෙක් දැ' යි. නඟුලෙන් සාන ලද කෙතෙහි කැට නැඟි තැනයි. මහණෙනි, එකල්හි ගිජුළිහිණී සිය බලයෙහි තදව සිට සිය බලය වනමින් එම්බල කැට කුරුල්ල, තෝ යා (තෝ පල), එහි ද ගොස් මාගෙන් නො මිදෙන්නේ යැ යි මිදුවා ය.

*අථ ඛො භික්ඛවෙ, ලාපො සකුණො නංගලකට්ඨකරණං ලෙඩ්ඩුට්ඨානං ගන්ත්වා මහන්තං ලෙඩ්ඩුං අභිරුහිත්වා සකුණග්ඝිං අවවමානො අට්ඨාසි, එහි ඛොදානි සකුණග්ඝි, සකුණග්ඝීති.*

මහණෙනි, ඉක්බිති කැට කුරුලු තෙමේ නඟුලෙන් සාන ලද කැට නැඟි තැනකට ගොස් මහත් කැටයකට නැඟ 'ගිජුලිහිණිය' දැන් එව' 'ගිජුලිහිණිය' දැන් එව' යි ගිජුලිහිණියට කියමින් සිටියේ ය.

*අථ ඛො සා භික්ඛවෙ, සකුණග්ඝි සකෙ බලෙ අපත්ථද්ධා සකෙ බලෙ අවවමානං උභො පක්ඛේ සන්ධාය ලාපං සකුණං සහසා අජ්ඣප්පත්තා. යදා ඛො භික්ඛවෙ, අඤ්ඤාසි ලාපො සකුණො බහු ආගතා ඛො මයායං සකුණග්ඝීති. අථ තස්සායෙව ලෙඩ්ඩුස්ස අන්තරං පච්චුපාදි අථ ඛො භික්ඛවෙ, සකුණග්ඝි තත්ථෙව උරං පච්චතාළෙසි. එවං හෙතං භික්ඛවෙ, හොති යො අගොචරෙ පර විසයෙ.*

මහණෙනි, එකල්හි ඒ ගිජුලිහිණි සිය බලයෙහි තදකොට සිටගෙන සිය බලය වනමින් දෙ පියාපත් නගා කැටකුරුල්ලා වෙත සැහැසිකමින් පැමිණියා ය. මහණෙනි, යම් කලෙක කැට කුරුලු තෙමේ ගිජුලිහිණි මා පිණිස බොහෝ දුර ආවා යි දැන ගත්තේ නම් එකල්හි ඒ කැටෙහිම ඇතුළට පිවිසියේ ය. මහණෙනි, එකල ගිජුලිහිණිය එහි ම ළය තළාගත්තා ය. මහණෙනි, යමෙක් අගෝචර වූ මෙරමා අයත් විෂයෙහි හැසිරේ නම් එය මෙසේ ම වේ.

*තස්මා තිහ භික්ඛවෙ, මා අගොචරෙ චරිත්ථ පරවිසයෙ. අගොචරෙ භික්ඛවෙ, චරතං පරවිසයෙ ලච්ඡති මාරො ඔතාරං. ලච්ඡති මාරො ආරම්මණං.*

*කො ච භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයොඃ යදිදං පඤ්ච කාමගුණා. කතමෙ පඤ්චඃ චක්ඛුවිඤ්ඤෙය්‍යා රූපා*

*ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූප සංහිතා රජනීයා.සොත විඤ්ඤෙයයාසද්දා...පෙ...ඝානවිඤ්ඤෙයයා ගන්ධා...පෙ...ජිව්හාවි ඤ්ඤෙයයා රසා...පෙ... කායවිඤ්ඤෙයයා ඵොට්ඨබ්බා...පෙ... ඉට්ඨා කන්තා මනාපා පියරූපා කාමූප සංහිතා රජනීයා. අයං භික්ඛවෙ, භික්ඛුනො අගොචරො පරවිසයො.*

මහණෙනි, එහෙයින් මෙහි ලා අගෝචර වූ මෙරමා අයත් විෂයෙහි නහමක් හැසිරෙව් (කිසිසේත් නො හැසිරෙව්). මහණෙනි, අගෝචර වූ මෙරමා අයත් විෂයෙහි හැසිරෙන්නවුන් පිළිබඳව මරු අවකාශ ලබන්නේ ය. මරු අරමුණක් ලබන්නේ ය.

මහණෙනි, මහණහට අගෝචර වූ මෙරමා අයත් විෂය කිමෙක් ද යත්: මේ පඤ්ච කාමගුණයෝ යි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මන වඩන පිය දෑ වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපයෝ යෑ. කනින් දතයුතු ශබ්ද යෝ යෑ... නැහයෙන් දතයුතු ගන්ධයෝ යෑ... දිවෙන් දතයුතු රසයෝ යෑ... කයින් දතයුතු ස්පර්ශයෝ යි. මහණෙනි, මේ මහණහට අගෝචර වූ මෙරමා අයත් විෂය යි.

*ගොචරෙ භික්ඛවෙ, චරථ සකෙ පෙත්තිකෙ විසයෙ. ගොචරෙ භික්ඛවෙ, චරතං සකෙ පෙත්තිකෙ විසයෙ න ලච්ඡති මාරො ඔතාරං. න ලච්ඡති මාරො ආරම්මණං.*
*කො ච භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයො , යදිදං චත්තාරො සතිපට්ඨානා. කතමෙ චත්තාරො සතිපට්ඨානා: ඉධ භික්ඛවෙ, භික්ඛු කායානුපස්සී විහරති...පෙ... වෙදනාසු....පෙ...චිත්තෙ... පෙ...ධම්මෙසු...පෙ... අයං භික්ඛවෙ, භික්ඛුනො ගොචරො සකො පෙත්තිකො විසයොති.*

මහණෙනි, ගෝචර වූ සිය පියසතු විෂයෙහි හැසිරෙව්. මහණෙනි, ගෝචර වූ සිය පියසතු විෂයෙහි හැසිරෙන්නවුන් පිළිබඳව මරු අවකාශයක් නො ලබන්නේ ය. මරු අරමුණක් නො ලබන්නේ ය.
මහණෙනි, මහණහට ගෝචර වූ සිය පියසතු විෂය කිමෙක් ද

යත්ඃ මේ සිවු සීවටත්හු (සතරසතිපට්ඨාන යෝ)යි. කවර සතරෙක් ද යත්ඃ මෙහි මහණ කයඅනුව බලනසුලුව වෙසෙයි...විඳුම්හි ... සිත්හි... දහම්හි... මහණෙනි, මේ මහණහට ගෝචර වූ සියපිය සතු විෂය[1] යි.

මෙයට සමාන අදහසක් එහි ම මක්කට සූත්‍රයේ කියවෙයි. හිමාලය අඩවියේ වඳුරුවැද්දෝ වඳුරන් අල්ලා ගැනීම පිණිස ඔවුන් ගැවසෙන තැනක (වඳුරුමංහි) ලහටු [2] (තදින් ඇලෙන ලාටු) තැබූහ. වඳුරා එය අතින් අල්ලයි. ඒ අත ඇලුණි. එය ගැලවීමට අනික් අත ද තබයි. එය ද ඇලුණි. මෙසේ දෙපය ද තුඩ (මුඛය) ද ඇලුණේ වඳුරුවැද්දෝ පස්පොලින් ම බැඳුණු වඳුරා මරාගනිති. මෙසේ පසිඳුරන්ගෙන් පස්කම්හි ඇලුණේ අගෝචරයේ යෙදුනේ මෙරමා සතු විෂයෙහි යෙදුණේ මාර වසඟයට පත්වෙයි. මෙසේ නො වන්නට නම් සතර සතිපටට්ඨාන වැඩිය යුතු ය[3].

( සතර සතිපටට්ඨාන - *චත්තාරො සතිපට්ඨානා*

කය පිළිබඳව මෙනෙහි කිරීම (*කායානුපස්සනා),* වේදනාව පිළිබඳව මෙනෙහි කිරීම (*වෙදනානුපස්සනා),* සිත පිළිබඳව මෙනෙහි කිරීම (*චිත්තානුපස්සනා),* ධර්මය පිළිබඳව මෙනෙහි කිරීම (*ධම්මානුපස්සනා).*

සිහිය පිහිටු වීම, සිහිය එළඹවීම ය යි පදගතාර්ථ වශයෙන් අර්ථය ලැබේ. සිහිය පිහිටු වන තැන.

*පධානට්ඨානන්ති වා පට්ඨානං, සතියා පට්ඨානං සතිපට්ඨානං, හත්ථිට්ඨාන- අස්සට්ඨානාදීනි විය*[4] .

---

[1] සනි .V පි . 271

[2] තුගකිරි ආදිය ගෙන තැනූ තදින් ඇලෙන ලාටු වර්ගයක් -වටරුක්ඛ ඛීරාදීනි යොජෙත්වා ලෙපං කරොන්ති සනිඅ. පි .164

[3] එහිම

[4] මහානි අ. I පි .40

සතිපට්ඨාන සූත්‍රයේදී මෙන්ම තවත් සූත්‍ර රැසකදී බුදුරදුන් විසින් සති පට්ඨාන හතරක් දක්වා තිබේ. ආනාපාන සති, චතු ඉරියා පථ, ද්වත්තිංසාකාර යනාදිය ඇතුළත් වන පරිදි ශරීරය මුල් කරගෙන කරනු ලබන සිහිය පිහිටුවීම කායානුපස්සනා නම්. (කායගතාසති ව.බ.) වින්දනයන්හි ඇති වීම හා නැති වීම පදනම් කර ගත් භාවනාව වේදනානුපස්සනාව නම් වෙයි. සිතපිළිබඳව බැලීම චිත්තානුපස්සනා වන අතර චිත්ත විෂය වූ ධර්ම පිළිබඳව වඩනු ලබන භාවනාව ධම්මානුපස්සනා සතිපට්ඨානය වෙයි. සිත පිරිසිදු කර ගැනීමට හා නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට ඇති ඍජු මාර්ගය සතර සතිපට්ඨානය යි.

## අංගුත්තරනිකායෙහි

### අග්‍රය

අග්ගපඤ්ඤත්ති සූත්‍රය 4. 1. 2. 5

මේ සූත්‍රයෙන් අග්‍ර වන අය සතර දෙනෙක් පිළිබඳ විස්තරවෙයි. ඒ සිවු දෙනාගෙන් මාරයා ද කෙනෙකි.
*එතදග්ගං භික්ඛවෙ ආධිපතෙය්‍යානං යදිදං මාරො පාපිමා*[1]

මහණෙනි, ආධිපත්‍යය කරණුවන් අතුරෙන් යම් මේ පාපී මාරයෙක් වේ ද, මෙ තෙම අග්‍ර ය.

### සූරඅම්බට්ඨ හමුවීමට යයි

නො සැලෙන ශ්‍රද්ධාවක් තිබූ සූරඅම්බට්ඨ ගිහිශ්‍රාවකයන් අතර අග්‍රස්ථාන ලැබූවෙකි. සැවත්හි සිටු පවුලක උපන් සූරඅම්බට්ඨ තථාගතයන් තමනිවසට වැඩම කළ අවස්ථාවේ දහම් අසා සෝවාන් ඵලයට පත්විය.

---

[1] අනි V පි 34

ඉන්පසු මාරයා බුදුන්ගේ වේශය මවාගෙන සූරඅම්බට්ඨ වෙතට එළඹ, තමන් කලින් පඤ්චස්කන්ධය ම අනිත්‍ය දුක්ඛ අනාත්ම යයි ප්‍රකාශ කළත් එහි එකක් වෙනස් ය, ස්ථිරය යනුවෙන් පැවසී ය. සූරඅම්බට්ඨ, දසබලයන් වහන්සේ එවැනි දේශනයක් නො කරණබවත් මේ මාරයා බවත් තේරුම් ගෙන 'මාරය ඔබ වැනි අය දහසක් ආව ද බුදුන් කෙරහි ඇති මගේ ශ්‍රද්ධාව වෙනස් නො වන බව කියා එතැනින් යන ලෙස කී ය. ඉන්පසු මාරයා අතුරුදහන් විය[1].

# ඛුද්දකනිකායෙහි

## සුත්තනිපාතයෙහි

### කාරුණික වචන

පධානසූත්‍රය 3-2

නේරඤ්ජරා ගංගා තීරයේ පධන් විරිය වඩන අවස්ථාවේ තථාගතයන් වෙතට පැමිණි නමුචි[2]

428 (මාරයා) *නමුචි කරුණං වාචං*
*භාසමානො උපාගමි*
*කිසො ත්වමසි දුබ්බණ්ණො*
*සන්තිකෙ මරණං තව*

නමුචි කුළුණුබර තෙපුල් කියමින් එළඹියේ යඃ තෙපි වැහැරි වවූ, දුර්වර්ණ වවූ, දැන් මරණය තොප හමුයෙහි වේ.

---

[1] අනිඅ. I පි 396
[2] බ. පි. 10

429 *සහස්ස භාගො මරණස්ස*
*එකංසො තව ජීවිතං*
*ජීව භො ජීවිතං සෙය්‍යං*
*ජීවං පුඤ්ඤානි කාහසි*

තොපගේ මරණය දහස් කොටසකින් ආසන්නව තිබේ. තොපගේ ජීවිතය එක් කොටසක් පමණක් ඉතිරිව ඇතියෙකි. ජීවත් වවු, ජීවිතය උතුම්. ජීවත්වනුවෝ පින් කරන්නහු.

430 *චරතො ච තෙ බ්‍රහ්මචරියං*
*අග්ගිහුත්තඤ්ච ජූහතො*
*පහූතං චියතෙ පුඤ්ඤං*
*කිං පධානෙන කාහසි*

බ්‍රහ්මචර්යය රක්නා අග්නි හෝම (ගිනිදෙවියාපිදීම) කරණ තොපට බොහෝ පින් රැස් වේ. ප්‍රධන්වීර්යයෙන් කුමක් කරන්නේද?

431 *දුග්ගො මග්ගො පධානාය*
*දුක්කරො දුරභිසම්භවො*
*ඉමා ගාථා භණං මාරො*
*අට්ඨා බුද්ධස්ස සන්තිකෙ*

ප්‍රධානය (නිර්වාණය) සඳහා වූ මාර්ගය දුර්ගමයැ. දුෂ්කරය. නො ලැබිය හෙයි. මේ ගාථා කියමින් මාරයා බුදුරදුන් හමුයෙහි සිටි යේ යැ.

433 (භගවත්හු) *අණුමත්තෙනාපි පුඤ්ඤෙන*
*අත්ථො මෙ න විජ්ජති*
*යෙසං ච අත්ථො පුඤ්ඤෙන*
*තෙ මාරො වත්තුමරහති*

එසේ කී ප්‍රමත්තබන්ධු[1] පවිටු මරහට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.'අනුමාත්‍ර වූ ද සංසාර ගාමී පිනකින් මට අර්ථයෙක් නැත යම්කෙනකුට පිනෙන් පලක් ඇද්ද ඔහුට එසේ කීමට සුදුසු වන්නේය. '

*434 අත්ථි සද්ධා තථා විරියං*
*පඤ්ඤා ච මම විජ්ජති*
*එවං මං පහිතත්තම්පි*
*කිං ජීව මම පුච්ඡසි*

මට ශ්‍රද්ධාව[2] ද වීර්යය ද ප්‍රඥාව[3] ද ඇත මෙසේයින් නිවන්කරා යොමු කළ සිත් ඇති (භාවනා වඩන) මාගෙන් ජීවිතය ගැන කුමකට ප්‍රශ්න කෙරෙහිද?

436 *ලොහිතෙ සුස්සමානම්හි*
*පිත්තං සෙම්හඤ්ච සුස්සති*
*මංසෙසු ඛීයමානෙසු*
*භීයො චිත්තං පසීදති*
*භීයො සති ච පඤ්ඤා ච*
*සමාධි මම තිට්ඨති*

ලේ වියලෙන කල්හි පිත් හා සෙම ද වියලෙනවිට මාංසය ක්ෂීණ වෙත් ම බෙහවින් සිත පහදියි. මාගේ ස්මෘතියත් ප්‍රඥාවත් සමාධියත් බෙහවින් වැඩෙයි .

*437 තස්ස මෙවං විහරතො*
*පත්තස්සුත්තම වෙදනං*
*කාමෙසු නාපෙක්ඛතෙ චිත්තං*
*පස්ස සත්තස්ස සුද්ධතං*

---

[1] ප්‍රමත්තබන්ධු බ. පි. 11
[2] ශ්‍රද්ධා බ. පි. 86
[3] පඤ්ඤා බ. පි. 53

මේ නයින් වසන්නාවූ උතුම් සැපයට පැමිණි මාගේ චිත්තය උභය කාමයන් අපේක්ෂා නො කෙරෙයි. සත්ත්වයාගේ පිරිසිදු බව බලව.

( වීර්යය-*විරියං*

කායික හා මානසික උත්සාහය වීර්යය නම්. මෙහිදී චතුරංග වීර්යය අදහස්වෙ යි.

චතුරංගවීර්යය - චතුරංගවීරියං

*තචො අවසුස්සතු, නහාරු අට්ඨී මංසඤ්ච ලෝහිතං උපසුස්සතු.*

හම ඉතිරි වේවා; නහර ඉතිරිවේවා; ඇට ඉතිරිවේවා; මස් ලේ වියලේවා.

පදගතාර්ථ වශයෙන් අංග සතරකින් සමන්විත උත්සාහයයි . ඉහත සඳහන් වන්නේ එම අංග හතරයි. බෝසත්වරුන් බුද්ධත්ත්වය සඳහා වීර්යය වඩන පිළිවෙළයි. මේ සඳහා යමක් මනුෂ්‍ය විර්යයෙන් ලබා ගත හැකි නම් ''එය ලබා ගෙන මිස නො නවතිමි'' යන අධිෂ්ඨානය අත්‍යවශ්‍ය ය.

*කාමං තචොච නහරුච*
*අට්ඨී ච අවසුස්සතු*
*උපසුස්සතු නිස්සෙසං*
*සරීරෙ මංස ලොහිතං*[1] )

[1] සුනිඅ. I 391 , මනි මජ්ඣිමපණ්ණාසකයේ කීටාගිරි සූත්‍රය බ.

## මාරසේනාව

438 *කාමා තෙ පඨමා සෙනා*
*දුතියා අරති වුච්චති*
*තතියා ඛුප්පිපාසා තෙ*
*චතුත්ථි තණ්හා පවුච්චති*

කාමයෝ තාගේ ප්‍රථම සේනාව ය, අරතිය (නො ඇලීම) දෙවැනි සේනාව ය, සා පිපාසාව තුන්වැනි සේනාව ය, තෘෂ්ණාව සිව් වැනි සේනාව ය,

439 *පඤ්චමී ථීනමිද්ධං තෙ*
*ඡට්ඨා භිරූ පවුච්චති*
*සත්තමී විචිකිච්ඡා තෙ*
*මක්ඛො ථම්භො තෙ අට්ඨමී*

ථීනමිද්ධය පස්වැනි සේනාව ය, භය හයවැනි සේනාව ය, විචිකිච්ඡාව (සැකය) හත් වැනි සේනාව ය, මක්ඛය ථම්භය (මකුබව- අනුන්ගෙ ගුණ මැකීම, තද බව-මුරණ්ඩුකම) අට වැනි සේනාව ය,

440 *ලාභො සිලොකො සක්කාරො*
*මිච්ඡා ලද්ධො ච යො යසො*
*යො චත්තානං සමුක්කංසෙ*
*පරෙ ච අවජානති*

ලාභ ප්‍රශංසා සත්කාර යන මෙයින් වූ යසස, (නවවැනි) සේනාව ය, තමන් උසස් ලෙසත් අනුන් පහත් ලෙසත් සිතීම (දසවැනි) සේනාව ය.

*441* *එසා නමුචි තෙ සෙනා*
*කණ්හස්සාභිප්පහාරිණී*
*න තං අසූරො ජිනාති*

*ජෙත්වා ච ලභතෙ සුඛං*[1]

නමුචිය, මෙ තාගේ සේනාය. අශූර පුරුෂයා පරදියි. ශූර පුරුෂයා දිනයි.

මාරසේනාව නම්; කාමයෝ, අරතිය (අධිකුශලයන්හි නො ඇලීම), සා පිපාසා, තෘෂ්ණාව, ථීනමිද්ධය, භය, විචිකිච්ඡාව, මක්ඛො, ථම්භ, ලාභ ප්‍රශංසා සත්කාරය යන මෙයින් වූ යසස, තමන් උසස් ලෙසත් අනුන්පහත් ලෙසත් සිතීම

( කාමයෝ - කාමා

වස්තුකාම, ක්ලේශකාම යන කාමයෝ ය.

භෞතික වූ කාම වස්තූන් විෂයෙහි ඇති වන ආශාව වස්තු කාමය වශයෙන් හැඳින්වේ. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන ඉන්ද්‍රිය ගෝචර අරමුණු (පසිඳුරන් ගේ විෂය) කාම වස්තු වෙති. මෙම කාම වස්තූන් සුභ වශයෙන් ගැනීමෙන් මනසෙහි ඇතිවන ආශාව ක්ලේශ කාමය උපදවයි. කාම වස්තූන් විෂයෙහි ඇතිවන ආශාව කාමච්ඡන්ද වශයෙන්ද සිතිවිලි විෂයෙහි ඇතිවන ආශාව සංකල්ප රාග වශයෙන්ද හඳුන්වන චූල නිද්දේසය ඒවා ක්ලේශ කාම බව අවධාරණය කරයි

නො ඇලීම - *අරති*

වනසෙනසුන්හි උසස් කුශලධර්මයන්හි අනභිරතිය අකැමැත්ත අරති නම් වෙයි.

*පන්තෙසු වා සෙනාසනෙසු අඤ්ඤතරඤ්ඤතරෙසු වා අධිකුසලෙසු ධම්මෙසු අරති අරතිතා අනභිරති අනභිරමණා*

---

[1] සුනි. පි. 128

*උක්කණ්ඨිතා පරිතස්සිතා අයංවුච්චති අරති*

ථිනමිද්ධය=ථිනමිද්ධ

නීවරණ පහකි. ථිනමිද්ධය එයින් එකකි.
ඥාණය / නුවණ, සිතේ එකඟ බව ආවරණය කරන කෙලෙස් කරුණු පහකි. (*පඤ්ච නීවරණ*) ධ්‍යානාංග ආදී යහපත් අදහස් වළක්වන හෙයින් නිවරණ නම් වෙයි. විවිධ වර්ණයෙන් යුතු වතුරක් මෙනි.

*ථිනං චිත්තගෙලඤ්ඤං, මිද්ධං චෙතසිකගෙලඤ්ඤං ථිනඤ්ච මිද්ධඤ්ච ථිනමිද්ධං*[2]

ථිනං සිතෙහි හැකුලුන බව, මිද්ධං චෛතසිකයන්ගේ හැකුලුන බව ය.

ථිනමිද්ධ නීවරණයඃ ගත සිත දෙකෙහි හැකිලෙන බව, අක්‍රියාශීලීභාවය යනු ථිනමිද්ධ නීවරණ යයි.

තෘෂ්ණාව- තණ්හා ව.බ.
විචිකිච්ඡාව- විචිකිච්ඡා ව. බ.

ලාභ ප්‍රශංසා සත්කාර යන මෙයින් වූ යසස,-*ලාභො සිලොකො සක්කාරො මිච්ඡාලාභ* බ. පි . 122

තමන් උසස් ලෙසත් අනුන්පහත්ලෙසත් සිතීම
*යො චත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති*

මෙයින් විස්තර වන්නේ අත්තුක්කංසන පරවම්භන යනුවෙන් සඳන්වන මානයයි.
මාන, යනු අහංකාරයයි. උඩඟුව, ආඩම්බරය යන පදයන් ද ඒ

[1] විභ . පි .369
[2] දිනිඅ II පි .147

සඳහා යෙදෙයි. එය ප්‍රකට වන ආකාර දෙකකි. එනම්; තමා උසස්යයි සිතීම ( *අත්තුක්කංසන*) හා අනුන් හෙලා දැකීම ( *පරවම්භන*) යනුවෙනි.

සුනි. ධනිය සූත්‍රය සහ එහි අටුවාවට අනුව ධනියගෝපාල හා ඔහුගේ බිරිඳ බඹසර විසීමට (මහණදම් පිරීමට) සිතූහ.

32 *ගොපී ච අහං ච අස්සවා*
*බ්‍රහ්මචරියං සුගතො චරාමසෙ*
*ජාතිමරණස්ස පාරගා*
*දුක්ඛස්සන්තකරා භවාමසෙ* [1]

ගොපි ද මම ද කීකරුව සුගතයන් වහන්සේ වෙත, බඹසර වස් වසම්හ (පැවිදිවන්නෙමු) ජාතිමරණයාගේ පාරයට(එතරට) යන්නාමෝ වම්හ. දුක්කෙළවර කරන්නාමෝ වම්හ.

මාරයා ඔවුනට බාධා කරන්නට සිතා ඔවුන් වෙතට පැමිණ ගවමහිසාදියෙන් හා දූදරුවන් නිසා ලැබෙන සතුට කියා පැවිදි නො වන ලෙස කී ය. එහෙත් ඒ දෙදන පැවිදි වූහ.

---

[1] සුනි. පි. 10

## ජාතකට්ඨකථාවෙහි

### නික්ම නො යන ලෙස කියයි

සිද්ධාර්ථකුමාරයන් මහාභිනිෂ්ක්‍රමණය කළ අවස්ථාවේ මාරයා එයට බාධා කෙළේ ය. මෙයින් සත්වැනි දින චක්‍රරත්නය පහළ වන්නේය. අභිනිෂ්ක්‍රමණය නො කරන්න යි පැවසීය.

*මාරො බොධිසත්තං නිවත්තෙස්සාමීති ආගන්ත්වා ආකාසෙ ඨිතො ආහ 'මාරිස' මා නික්ඛම, ඉතො තෙ සත්තමෙ දිවසෙ චක්කරතනං පාතුභවිස්සති ... නිවත්ත මාරිසාති ...*[1]

මාරයා බෝසතුන් නවත් වමි යි එහි පැමිණ අහසෙහි සිට නිදුකාණෙනි, අභිනිෂ්ක්‍රමණය නො කරන්න මෙයින් සත් වැනි දින චක්‍රරත්නය පහලවන්නේය. ... නවතිනු නිදුකාණෙනි,...යි කීය. බෝධසත්ත්වයෝ එය ප්‍රතික්ෂේප කර අභිනිෂ්ක්‍රමණය කළහ.

(මාරයා) *මා නික්ඛම මහාවීර*
*ඉතො තෙ සත්තමෙ දිනෙ*
*දිබ්බං තු චක්ක රතනං*
*අද්ධා පාතු භවිස්සති*

මහාවීරය, අභිනිෂ්ක්‍රමණය නොකරන්න මෙයින් හත් වැනි දින ඒකාන්තයෙන් දිව්‍යමය චක්‍රරත්නය ඔබට පහළවන්නේය.

(බෝධි සත්ත්වයෝ) *ජානාමහං මහාරාජ*
*මය්හං චක්කස්ස සම්භවං*
*අනත්ථිකොහං රජ්ජෙන*
*ගච්ඡ ත්වං මාර මා ඉධ*

---

[1] ජාඅ I. පි . 69

මහරජ, චක්‍රරත්නය පහළවන බව දනිමි. මට රජකමින් පලක් නැත. මාරය මෙහි නො සිට පහවයනු.

*සකලං දසසහස්සම්පි*
*ලොකධාතුමහං පන*
*උන්නාදෙත්වා භවිස්සාමි*
*බුද්ධො ලොකෙ විනායකො*[1]

මම දසදහසක් සක්වළ උන්නාද කොට ලෝකයෙහි බුදුවන්නෙමි ලෝක නායක වෙමි.

එයින් ද නො නැවතුන මාරයා බෝසතුන්ගේ වරදක්-දුබල තැනක් සොයමින් ලුහුබැඳ සිටියේ ය.

## මාරපරාජය

මහාභිනිෂ්ක්‍රමණය කළ බෝසත්හු කිං කුසලගවේෂීව හැසුරුණෝ ය. සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කර එයින් සත්‍යාවබෝධය කළ නො හැකි බව තේරුම් ගෙන එම අත්තකිළමථානු යෝගය (ශරීරයට දුක් දී කරන භාවනාව) අතහැර ගයාවේ බෝධියමුල, එදිනම සොත්ථිය බමුණා දෙන ලද කුසතණ අතුරා තනා ගත් අසුනෙහි පළක්බැඳ (හිඳ) ඉඳ චතුරංගසමන්නාගත වීර්යයෙන් යුක්තව භානාවේ යෙදුනාහ.

*තස්මිං සමයෙ මාරොදෙවපුත්තො 'සිද්ධත්ථකුමාරො මය්හං වසං අතික්කමෙතු කාමො, න දානිස්ස අතික්කමිතුං දස්සාමීති' මාරබලස්ස සන්තිකං ගන්ත්වා එතමත්ථං ආරොචෙත්වා මාරඝොසං නාම ඝොසාපෙත්වා මාරබලං ආදාය නික්ඛමි .*

---

[1] බුවඅ. පි. 282

එසමයෙහි මාරදිව්‍යපුත්‍රයා සිදුහත්කුමරු මාගේ විෂය ඉක්මවනු පිණිස ක්‍රියා කරයි, 'දැන් එයට ඉඩ නො දෙමි යි, මාරසෙනඟ වෙත ගොස් ඒ බව කියා මාරඝෝෂාවක් කර මාරබලකාය (දස මරසෙන් ) බණවාගෙන බෝසතුන් වෙතට ගියේ ය.

ඉන් පසු බෝසතුන් වෙතින් මාරසෙනඟ පැරද හිස් ලූ ලූ අතට පලා ගියේය. මාරයා කළ සියල්ල ව්‍යර්ථ විය. වැලිදු මාරයා ගිරිමේඛලා ඇතුපිටින් බැස බෝසතුන් වෙතට ගොස් ඒ පළඟ (ආසනය) තමන්ට (මරුට) අයත් බවත් එය අතහැර යනලෙස පැවසීය . එකල බෝධිසත්ත්වයෝ හේතු සාධක සහිතව පළඟ තමන්ට උරුම බව හා එය හැර දමා නො යන බව ප්‍රකාශ කළහ.

*...බොධිසත්තං උපසංකමිත්වා 'සිද්ධත්ථ උට්ඨෙහි එතස්මා පල්ලංකා නායං තුය්හං පාපුණාති මය්හං එව පාපුණාති ' ති ආහ. මහාසත්තො තස්ස වචනං සුත්වා අවොච- 'මාර, නෙව තයා දස පාරමියො පූරිතා, න උප පාරමියො, න පරමත්ථ පාරමියො, න පඤ්ච මහාපරිච්චාගා පරිච්චත්තා, න ඤාවත්ථචරියා, න ලොකත්ථචරියා න බුද්ධිචරියා චරිතා සබ්බා තා මයායෙව පූරිතා, තස්මා නායං පල්ලංකො තුය්හං පාපුණාති මය්හෙවෙසො පාපුණාතී 'ති*[1]

... (මාරයා) බෝ සතුන් වෙතට එළඹ 'සිද්ධාර්ථයෙනි, මේ පළඟ හැර ( මේ පළඟ බැද සිටීමෙන් නැගිට) පහව යනු. මෙය තොපට (නො පැමිණේ) අහිමිය, මට ම ( පැමිණේ) හිමි යි කී ය. මහසත්හු ඔහුගේ වදන් අසා මෙසේ පැවසූහ. මාරය, තා විසින් දස පාරමිතා, උපපාරමිතා, පරමත්ථපාරමිතා නො පූරණ ලදි. පඤ්ච මහාපරිත්‍යාග නො දෙන ලදි. ඤාකාර්ථ චර්යා, ලෝකාර්ථ චර්යා, බුද්ධි චර්යා, නො කරණ ලදි. ඒ සියල්ල මා විසින් ඉටු කරන ලදි එහෙයින් මේ පළඟ තට නො පැමිණෙයි . මට ම පැමිණෙ යි ' කීහ.

---

[1] ජාඅ. I. පි . 80

දස පාරමිතා බලයෙන් දස මාරසේනාවෝ පරාජයට පත්වූහ.

*අථ මහා පුරිසො තං සමාරං මාරබලං ඛන්ති මෙත්ත විරිය පඤ්ඤාදීනං අත්තනො පාරමීනමානුභාවෙන විද්ධංසෙත්වා[1]...*

ඉක්බිති මහාපුරිසයන් ඛන්ති මෙත්ත විරිය පඤ්ඤා ආදී තමාගේ පාරමිතා බලයෙන් සේනා සහිත මාරයා වනසා...

දස පාරමිතා බෝධිසත්ත්ව වරයකු සතු විය යුතු උත්තම ගුණාංගයෝය. බුද්ධත්ත්වය ලබාගැනීම සඳහා නියමිත විවරණ ලද පුද්ගලයා බෝධිසත්ත්වයා ලෙස සැලකෙයි. පාරමී හෝ පාරමිතා යන්නෙහි වචනාර්ථය වන්නේ කෙනකුට එතරට යෑමට ඉවහල්වන කරුණු යනුයි. බෝධිසත්ව වරයකු බුද්ධත්ත්වයට යොමු කරවන ධර්ම ලෙස පාරමිතා සලකනු ලැබේ. එබැවින් මෙම පාරමිතා බුද්ධකාරක ධර්ම යනුවෙන් ද හැඳින් වී ඇත. බෝසත්වරුන් තම අතීත ජන්මයන්හිදී මෙම පාරමිතා සම්පූර්ණ කර ඒවා පූර්ණත්වයට පමුණුවයි.

ගෞතම බෝසතුන් වහන්සේ බුද්ධත්ත්වය අපේක්ෂාවෙන් පාරමිතා පිරූ අන්දම ජාතක කථාවලින් පැහැදිලි වෙයි. පරිත්‍යාග ශීලිත්වය වර්ධනය කිරීම හා තෘෂ්ණාව නැතිකිරීම දාන පාරමිතාවෙන් අපේක්ෂා කෙරෙයි. තමන්ගේ ධන ධාන්‍යාදිය පමණක් නොව ඇස්, ඉස්, මස්, ලේ පවා දන් දෙමින් ආත්මාර්ථකාමීත්වය, තෘෂ්ණාව බැහැර කිරීම දාන පාරමිතාවේ මුඛ්‍යාර්ථය වෙයි.

ගෞතම බෝසතුන් ධන ධාන්‍ය වස්තුව ඇස්, ඉස්, මස්, ලේ දන් දෙමින් දාන පාරිමිතාව වර්ධනය කිරීමේ කථාපුවත් රාශියක් ජාතක කථා අතර දැකගත හැකිය. විශේෂයෙන් වෙස්සන්තර

---

[1] බුවඅ පි . 289

ජාතකය, (547) සිවි ජාතකය, (499), සස ජාතකය, (316) (ව්‍යාඝ්‍රී ජාතකය) ආදිය මේ අතුරින් ප්‍රමුඛ වෙයි.

බෝධිසත්ත්වයෝ තා හට දානපාරමිතාව පිරූබවට සාක්ෂි කවරේද? යි මරුගෙන් විමසූහ. එවිට මාරසේනා 'මම සාක්ෂි 'මම සාක්ෂි යයි බෙරිහන් දුන්හ.

මාරයා පෙරළා බෝසතුන්ට සාක්ෂි ඇද්දැ යි විමසීය. සචේතනික කිසිවෙක් නො මැත. දක්ෂිණ හස්තය මහාපෘථුවියට දිගුකොට වෙස්සන්තර සමයේ පඤ්ච මහා පරිත්‍යාග කළබවට සාක්ෂි වන්නැයි කීහ. පයවිතොමෝ 'මම සාක්ෂි, මම සාක්ෂි' යි උන්නාද කළාය.
දානපාරමිතාවෙන් තෘෂ්ණාව නැමැති සේනාව පැරදුනේය.

ශීලය දෙවැනි පාරමිතාවට ඇතුළත් වෙයි. අවම මට්ටමින් සචෙතනිකව පස් පවුවලින් වැළකෙමින් පංචශීලය ආරක්ෂා කිරීම එහිලා අපේක්ෂා කෙරෙයි. ශිලය වූ කලි ආධ්‍යාත්මික සංවර්ධනයේ පදනමයි. අප මහ බෝසතුන් සීලවනාග, (72) සංකපාල, (524) වැනි ජාතකයන්හි දී ශීල පාරමිතාව ආරක්ෂා කළ ආකාරය පැහැදිලි කොට තිබේ.
ශීල පාරමිතාවෙන් අරති නැමැති සේනාව පැරදුනේය.

නෙක්ඛම්ම හෙවත් නෛෂ්ක්‍රම්‍යය යනු අත්හැරීමයි. ලෞකික සැප සම්පත් අත්හැර දමා ගිහිගෙන් නික්ම පැවිද්දට පත්ව දුකින් එතරවීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීම නෙක්ඛම්ම පාරමිතාව පිරීමෙන් බලාපොරොත්තුවෙයි. ගෘහ ජීවිතය සම්බාධක කෙලෙස් උපදවන තැනක් වශයෙන් සලකා බෝසතුන් පැවිද්දට පත් වූ ආකාරය මඛාදෙව ජාතකය (9) තුළින් මනාව පැහැදිලි වෙයි.
නෙක්ඛම්මපාරමිතාවෙන් කාමයෝ නැමැති සේනාව පැරදුනේය.

ප්‍රඥා පාරමිතාව (*පඤ්ඤා පාරමී*) සම්‍යක් අවබෝධය සහ ප්‍රඥාව වර්ධනය කිරීමයි. බුදු දහමේ ඉතා පෘථුල ක්ෂේත්‍රයක් ප්‍රඥාවට

අයත් වෙයි. පූර්ණ සත්‍යාවබෝධයට මෙන්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් සංස්කාර ධර්මයන්ගේ ත්‍රිලක්ෂණය අවබෝධ කරගැනීමට ප්‍රඥාව ඉවහල් වෙයි. දුක්ඛ සමුදය නිරෝධ මග්ග වශයෙන් එන චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය ද ප්‍රඥාවවට ඇතුළත් වෙයි. සත්තුභස්ත ජාතකය හා උම්මග්ග ජාතකය ප්‍රඥා පාරමිතාවට නිදර්ශන සපයයි.
ප්‍රඥා පාරමිතාවෙන් විචිකිච්ඡා නැමැති සේනාව පැරදුනේය.

විරිය පාරමිතාවෙහි විරිය යන්නේ වචනාර්ථය උත්සාහය හෝ ශක්තිය යන්නයි. විරිය යන්නෙන් අදහස් කරනුයේ හුදෙක් කායික ශක්තිය නොවේ. එයින් බෙහෙවින්ම අදහස් කරනුයේ මානසික ශක්තිය හෝ සදාචාර වර්ධනයෙහි දරන ප්‍රයත්නයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහි එය සම්මා වායාම යනුවෙන් හැඳින්වෙයි. වීර්යය බෝසතුන් තුළ පැවතුණු කැපී පෙනෙන ලක්ෂණයකි. වීර්යවත් පුද්ගලයා ඉදිරිපත් වන බාධක මැඩ අභිමතාර්ථය දක්වා යාමට උත්සාහවත් වෙයි. බෝසතාණෝ වීර්ය පාරමිතාව එහි උපරිම තලයෙන් සම්පූර්ණ කළහ. මහා ජනක ජාතකය (539) හා වණ්ණුපථ ජාතකය (02) ඒ සඳහා නිදසුන්ය.
විරිය පාරමිතාවෙන් ථීනමිද්ධ නැමැති සේනාව පැරදුනේය.

ක්ෂාන්ති (ඛන්ති) පාරමිතාව සයවැන්නයි. පුද්ගලයකු තුළ ක්ෂාන්තිය හෙවත් ඉවසීම ඇත්තේ නම් ඔහු වෙනකකු තමාට දොස් නැගුව ද නොකිපෙයි. ඉවසීම මගින් පුද්ගලයකුගේ ප්‍රකෝපවත් වන චරිත ස්වභාවය මැඩලිය හැකිය. ක්ෂාන්තියට ප්‍රතිවිරුද්ධ ලක්ෂණය වන්නේ ද්වේෂයයි. විමුක්තිලාභය සඳහා බාධකයක් වන ද්වේෂය තෘෂ්ණාව මෙන්ම මුලිනුපුටා දැමිය යුතු ක්ලේශ ධර්මයකි. කෙනකු මට දොස් කීවේය, බැන්නේය, ජයගත්තේය, පහර දුන්නේය යනුවෙන් සිතමින් ඇති කරගන්නා වෛරය ක්ෂාන්තියෙන් මැඩ පවත්වන ලෙස බුදුන් වහන්සේ විසින් අවධාරණය කොට තිබේ. ඛන්තිවාදී ජාතකය (313) බෝසතුන් ප්‍රගුණ කළ ක්ෂාන්තිය ප්‍රකට කර දක්වන ජාතක කථාවකි.

ක්ෂාන්ති පාරමිතාවෙන් සා පිපාසා නැමැති සේනාව පැරදූනේය. සත්‍ය පාරමිතාව (සච්ච) තුළින් සත්‍යවාදීත්වය ප්‍රගුණ කෙරෙයි. මරණය ඉදිරියේ වුවද සත්‍යයෙන් නොවෙන්ව මුසාවාදී වීම ප්‍රතික්ෂේප කිරීමට කෙනකුට හැකිවන්නේ සත්‍ය පාරමිතාව පිරීමෙනි. මහා සුතසෝම ජාතකය (537) හා හිරි ජාතකය (363) බෝසතුන්ගේ සත්‍ය පාරමිතාව සම්පූර්ණ කළ අවස්ථා පෙන්නුම් කරයි.
සත්‍ය පාරමිතාවෙන් මිථ්‍යාලාභ ප්‍රශංසා සත්කාර යන මෙයින් ඇතිවන යසස නැමැති සේනාව පැරදූනේය.

අටවැනි පාරමිතාව අධිට්ඨාන පාරමිතා නමින් ගැනෙයි. කිසියම් යහපත් ක්‍රියාවක් සඳහා ඇති කරගන්නා දැඩි අධිෂ්ඨානය කාර්ය සමාප්තිය තෙක් ආරක්ෂා කර ගැනීමට මෙම පාරමිතාව ප්‍රගුණ කළ පුද්ගලයාට හැකිවෙයි. අධිෂ්ඨාන පාරමිතාව නොමැතිව අනෙක් පාරමිතා පූරණය ද කළ නොහැකිය. එබැවින් මෙම පාරමිතාව සෙසු සියලු පාරමිතාවන්ගේ පදනම ලෙස සැලකිය හැකිය . සැලෙන මනසකින් කිසිදු කාර්යයක් නිෂ්ටාව දැකිය නොහැකිය. සිද්ධාර්ථ ගෞතම බෝසතුන් ජය ශ්‍රී මහා බෝධි පල්ලංකය අරා වැඩ සිටියේ චතුරංග වීර්යයෙන් යුතු මහා අධිෂ්ඨානයකිනි. බුදුව මිස මින් නොනැගිටිමි යන අධිෂ්ඨානය අත් නොහළ උන්වහන්සේ පැමිණි සැම බාධකයක්ම බිඳ දමා සම්‍යක් සම්බුද්ධත්වය අවබෝධ කළහ. උන්වහන්සේ අතීත ජන්මයන්හි අධිෂ්ඨානය පුරුදු පුහුණු කළ අවස්ථා තේමිය (538) වැනි ජාතකයන්ගෙන් පෙනේ.
අධිට්ඨාන පාරමිතාවෙන් භය නැමැති සේනාව පැරදූනේය.

නවවැනි මෛත්‍රී (මෙත්තා) පාරමිතාව තුළින් ප්‍රගුණ කෙරෙන්නේ මෛත්‍රිය හෙවත් මිතුරකුගේ ස්වභාවයයි. හොඳ හිතයි, දයාවයි, සැම කෙනෙකුටම යහපතක් වේවායි සිතන හොඳ හිත අප්‍රමාණව අසීමිතව සමස්ත ලෝකවාසී සියලු සත්ව ප්‍රජාව කෙරෙහිම සමානව යොමු කිරීම මෛත්‍රිය ප්‍රගුණ කිරීම යන්නෙන් අදහස් කෙරෙයි. හදවත පිරුණු ආදරයෙන් යුතුව

ද්වේෂය සම්පූර්ණයෙන් ඉවත් කිරීමට මේ මගින් හැකි වෙයි. මෛත්‍රිය බ්‍රහ්ම විහාර සතරින් එකකි. කැරුණා, මුදිතා හා උපෙක්ඛා යනු එහි අනෙක් ගුණාංගයි. චූල ධම්මපාල ජාතකය (338) බෝසතුන් මෙත්තා පාරමිතාව ප්‍රගුණ කළ අවස්ථාවක් නිරූපණය කරයි.
මෛත්‍රීපාරමිතාවෙන් මක්ඛො ථම්භො නැමැති සේනාව පැරදූහෝය.

දසවැනි පාරමිතාව උපෙක්ෂාවයි. සාධාරණව මැදහත්ව පක්ෂපාතී නොවී යමක් දෙස බැලීමේ ශක්තිය උපේක්ෂාව නමින් හැඳින්වෙයි. කිසිදු බැඳීමකට හෝ ද්වේෂයකට නොපැමිණ හොඳ නරක, සුවදුක් වැනි තත්ත්වයන් හමුවේ මධ්‍යස්ථව සිටිම බුද්ධත්වය සඳහා වැඩිය යුතු ගුණාංගයකි. ලාභ අලාභ වැනි අෂ්ටලෝක ධර්මයන්හි (*අට්ඨලොකධම්ම*) නොසැලී සිටීම ද උපේක්ෂාවටම අයත් ලක්ෂණයකි. බුදුරජාණන් වහන්සේ තුළ මෙම ගුණාංගය පූර්ණ වශයෙන් පැවති බැවින් උන්වහන්සේ තාදි ගුණයෙන් යුක්තවූ බව පැවසෙයි. අතීත බෝධිසත්ත්ව ජන්මයන්හි දී උපේක්ෂා පාරමිතාව ප්‍රගුණ කළ අවස්ථා ලෝමහංස (94) වැනි ජාතක කථාවලින් පැහැදිලි වෙයි.
උපෙක්ඛා පාරමිතාවෙන් අත්තුක්කංසන පරවම්භන නැමැති සේනාව පරාජය කළහ.

*ජයො හි බුද්ධස්ස සිරීමතො අයං*
*මාරස්ස ච පාපිමතො පරාජයො*
*උග්ඝොසයුං බොධිමණ්ඩෙ පමුදිතා*
*ජයං තදා දෙවගණා මහෙසිනො* [1]

බෝසතාණෝ දසමරුන් පරදා බුද්ධත්ත්වය ලැබූහ. එයින් දේව සමූහය ප්‍රමුදිත වූහ. ශ්‍රීඝණ බුදුරජාණන් වහන්සේ විජයග්‍රාහී වූහ. මාරයා පරාජිතය යි ජයඝෝෂා කළහ.

---

[1] ජාඅ..පි. 72

## අඟුරුවළක් මවයි

බදිරංගාරජාතකය (40)

මේ ජාතකය අනාථපිණ්ඩික සිටුවරයාගේ පරිත්‍යාගශීලිත්වය හා සම්බන්ධවෙයි.

අතීතයේ බෝධිසත්ත්වයෝ බරණැස සිටුපවුලක උපන්ණෝය. කුසල් කිරීමේ නිරත වූ හෙතෙම දන්දීම පුරුද්දක් කරගත්තේය. පසේබුදුවරු සත් දිනක් ධ්‍යානගතව සිට එයින් නැගීසිට ධර්මාභිසමය හිමි කෙනෙකු වෙතට පිඩු පිණිස වඩිති. (බෝධිසත්ත්වයන්) සිටුපුත්‍රයා එම හේතු වාසනා ඇති හෙයින් එක් පසේබුවරයෙක් ධ්‍යානයෙන් මිදී එදින පිඩු පිණිස බෝධිසත්ත්වයන්ගේ නිවසට වැඩමකිරීමට තීරණය කළහ.

පසේ බුදුහු එම නිවසට ගිහ. ඒ අවස්ථාවේ මාරයා දන්දීම වළකනු පිණිස එහි බෝසතුන් හා පසේබුදුන් අතර විශාල ගිනිඅඟුරුවළක් මැවීය. බෝසත්හු ආහාර ගෙන ගිනිඅඟුරුවළට බැස්සාහ. එකෙණෙහි නෙළුම් මලක් පිපී බෝසතුන්ගේ පාද එහි පිහිටියෙන් නිසිපරිදි ආහාර පසේබුදුන්ට පිළිගැන්වීමට හැකි විය[1].

---

[1] ජාඅ I. පි . 229

# ධම්මපදයෙහි- ධම්මපදට්ඨකථාවෙහි

## රාහුලතෙර වෙතට පැමිණියේය

රාහුලත්ථේර කථාවස්තුව 248

භාග්‍යවතුන් වහන්සේ දෙව්රම වැඩවසද්දී එක්දිනක් බොහෝ ආගන්තුක භික්ෂුහු පැමිණියාහ. එදින රාහුල තෙරුන්ට සයනය කිරීමට තැනක් නොතිබුණ හෙයින් ගඳකිළියේ දොර අසල හොත්තේ ය. ගඳකිළියේ දොර අසල හොවින රාහුල තෙරුන් දුටු මාරයා මෙසේ සිතී ය

*'සමණස්ස ගොතමස්ස රුජනකඅංගුලී බහි නිපන්නො සයං අත්තො ගන්ධකුටියං නිපන්නො අංගුලියා පීළියමානාය සයම්පි පීළිතො භවිස්සති ' ති*

'ශ්‍රමණ ගෞතමයන්ගේ මේ පුත්‍රයා ගඳකිළියේ දොර අසල සයනය කරයි. තෙමේ ගඳකිළිය තුළ හොවි පුත්‍රයාට පීඩා කළ කල්හි තෙමේ ද පෙළනලද්දේ වන්නේය තුවෙනි'.

මෙසේ සිතා මහත් ඇත් වෙසක් මවා ගෙන පැමිණ ශබ්දයක් කර හොඬ රාහුල තෙරුන්ගේ හිසමත තැබීය. ගඳකිළිය තුළ සිටි බුදුහු ඒ මාරයා බව දැන, මාරය, ඔවැනි අය කෙතරම් ආව ද මගේ පුතු බියනොවේ. ඔහු තෘෂ්ණාව නැසුවේ ය. වීර්ය හා ප්‍රඥාව ඇත්තේය. යි වදාරා මේ ගාථා දෙසූහ.

*නිට්ඨං ගතො අසන්තාසී*
*වීතතණ්හො අනංගණො*
*අච්ජින්දි භවසල්ලානි*
*අන්තිමොයං සමුස්සයො*

යමෙක් නිමාවට-රහත්බවට පැමිණියේ ද, තැකි නො ගනී.

ද, තෘෂ්ණාව දුරු කෙළේ ද, රාගාදී අංගණ රහිත වේ ද, කෙලෙස් උල් නැසුවේ ද, මේ ඔහුගේ අන්තිම ආත්ම භාවය යි.

*වීත තණ්හො අනාදානො*
*නිරුත්තිපද කොවිදො*
*අක්ඛරානං සන්නිපාතං*
*ජඤ්ඤා පුබ්බ පරානි ච*
*සවෙ අන්තිම සාරීරො*
*මහා පඤ්ඤො මහා පුරිසොති වුච්චති*[1]

යමෙක් තෘෂ්ණාව දුරු කෙළේද, සිවු පිළිසිඹියාවේ දක්ෂ ද, අකුරුසමුදාය හා පෙරඅපර අකුරුත් දනී ද, අන්තිම ආත්ම භාව යෙහි සිටින ඒ පුද්ගලයා මහා නුවණැත්තෙක් යයි ද, මහා පුරුෂයෙක් යයි ද කියනු ලැබේ. ඉන්පසු මාරයා අතුරුදහන්විය.

(සිවු පිළිසිඹියා - *නිරුත්ති පද*

සතර ප්‍රතිසම්භිදා චත්තාරො පටිසම්භිදායනුවෙන් ද සඳහන් වෙයි.

අර්ථ, ධර්ම, නිරුක්ති, ප්‍රතිභාන. යනු සිවු පිළිසිඹියා වෝ ය.

ඇතැම් මහ රහතන් වහන්සේලාට සිවු වැදෑරුම් පටිසම්භිදා හෙවත් ගැඹුරුවූත් විශ්ලේෂණාත්මක වූත් ඥාන විශේෂ තිබිණි. ඒවා අර්ථ ප්‍රතිසම්භිදා, ධර්ම ප්‍රතිසම්භිදා, නිරුක්ති ප්‍රතිසම්භිදා, ප්‍රතිභාන ප්‍රතිසම්භිදාය. විභංගයෙහි අර්ථ දක්වා ඇති පරිදි පළමුවැන්න අරුත් පිළිබඳවය. දෙවැන්න දහම පිළිබඳවය. තෙවැන්න මුල් දෙකෙහි භාෂාව පිළිබඳවය. සිවුවැන්න මුල් තුන පිළිබඳව වටහා ගන්නා නුවණය.

*'අත්ථෙ ඤාණං අත්ථ පටිසම්භිදා, ධම්මෙ ඤාණං ධම්ම*

---

[1] ධපඅ. පි . 56

*පටිසම්භිදා, ධම්ම නිරුත්තාභිලාපෙ ඤාණං නිරුත්ති පටිසම්භිදා, ඤාණෙසු ඤාණං පටිභාන පටිසම්භිදා*[1]

## මාරකායික දෙවිවරු

විසාඛා සහායිකාවන්ගේ කථාවස්තුව

මාරකායික දෙවිවරුන් යනු මාරපාක්ෂික, මාරයා අනුගමනය කළ දෙවියෝ වෙති. අවැඩ, අනර්ථ කරන්නෝ වෙති.

*අඤ්ඤතරා මාරකායිකාති නාමවසෙන අපාකටා එකා භුම්මදෙවතා මිච්ඡාදිට්ඨිකා මාරපක්ඛිකා මාරස්සනුවත්තිකා 'එව මය්හං මාරධෙය්‍යං' නාතික්කමිස්සතීති චින්තෙත්වා..*[2]

විසාඛාවගේ සහායිකාවෝ සුරාපානයට පුරුදු වූවෝ ය. එක් දිනක් සහායිකාවන් සමඟ විසාඛාව වෙහෙරට ගොස් ධර්ශාලාවේ බුදුන් ඉදිරියේ ඉඳ සහායිකාවන්ට දහම් දෙසන ලෙස ඇයද සිටියා ය. සුරාපානය කර සිටි ඒ සහායිකාවන්ට මාරකායික දේවතාවියක් ආවිෂ්ට වූවාය.

*...අථෙකා මාරකායිකා දෙවතා 'ඉමෙසං සරීරෙ අධිමුච්චිත්වා සමණස්ස ගොතමස්ස පුරතො විප්පකාරං දස්සෙස්සාමී' ති චින්තෙත්වා තාසං සරීරෙ අධිමුච්චි. තාසු එකච්චා සත්ථු පුරතො පාණිං පහරිත්වා හසිතුං එකච්චා නච්චිතුං ආරභිංසු ...*

... ඉක්බිති එක් මාරකායික දේවතාවියක් 'මොවුන්ගේ සිරුරට ඇතුල් ව ශ්‍රමණ ගෞතමයන් ඉදිරියේ විකාර දක්වමියි ' ඇලාගේ සිරුරට ඇතුල් වූවාය. ඒ කාන්තාවන් අතර සමහරු බුදුන් ඉදිරියේ අප්පුඩි ගසමින් සිහවෙමින් නැටුම් ඇරඹූහ...

---

[1] පටිඅ. පි. 2

[2] සමන්තපාසාදිකා I පි 289

මේ මාරකායිකයින්ගේ ක්‍රියාවක් බව තේරුම් ගත් බුදුහු ඔවුනට ඒ බව වදාරා දැන් එම රාගාදි අග්නි නිවාළීමට උත්සාහ කරන ලෙසත් සුරාපානයේ ආදීනවත් පහදා මෙ සේ දේශනාකළහ.

*කො නු හාසො කිමානන්දො*
*නිච්චං පජ්ජලිතෙ සති*
*අන්ධකාරෙන ඔනද්ධා*
*පදීපං න ගවෙස්සථාති* [1]

(සත්ත්වයා රාගාදී එකළොස් ) ගින්නෙන් නිතර දැවෙද්දී කවර සිනහවක් ද කවර සතුටක් ද (අවිද්‍යා) අඳුරෙන් වෙළුණු නුඹලා ආලෝකයක් නො සොයන්නාහු ද?

( එකළොස් ගිනි - *එකාදස අග්ගී*

ආශාව- *රාගො*
ද්වේෂය- *දොසො*
මෝහය - *මොහො,*
ඉපදීම- *ජාති,*
වයස්ගතවීම -*ජරා*
මියයෑම- *මරණං*
ශෝක කිරීම- *සොක*
වැලපීම- *පරිදෙව*
දුක්පීඩා- *දුක්ඛ*
දොම්නස- *දොමනස්ස*
උපායාසය- *උපායාස*

මෙහි සඳහන් වන්නේ එකොළොස් වැදෑරුම් ගින්නයි. මේ ගින්නෙන් සත්ත්වයා ආභ්‍යන්තරික වශයෙන් දවාලන්නේය. එක එකක් අනුව මෙනෙහි කිරීමෙන් හෝ වෙනත් අයට

---

[1] ධපඅ. පි . 488

ඇතිවීමෙන් තමා තුළ ඇති කරගත්ත. තාපය නිසා දැවෙන්නේය.

*ඉමස්මිං ලොකසන්නිවාසෙ රාගාදීහි එකාදසහි අග්ගීහි නිච්චං පජ්ජලිතෙ සති කො නු තුම්හාකං හාසොවා තුට්ඨී වා*

මේ ලෝකයේ සත්ත්වයෝ රාගාදි එළොස් ගින්නකින් දැවෙති. එසේ තිබියදී කුමන නැටම් කෙළි කවට සිනහ දෝ ? )

## ථෙරගාථා - ථෙරගාථාට්ඨකථාවෙහි

## දැරියකගේ අත අල්ලයි

සාටිමත්තිය ථේර

පෙර ආත්මභාවයන්හි ද කුසල් කළ සාටිමත්තිය තෙරණුවෝ ගෞතමබුදුන් සමයේ මගධරට බ්‍රාහ්මණ කුලයක උපන්නාහ. නිසිවයසට පැමිණ ආරණ්‍ය වාසී භික්ෂූන් වෙත පැවිදි වූ මේ තෙරහු විපස්සනා වඩා ෂළභිඤ්ඤා ලාභී වූහ.

*ඡළභිඤ්ඤො පන හුත්වා භික්ඛු ඔවදති අනුසාසති බහූ ච සත්තෙ ධම්මං කථෙත්වා සරණෙසු ච සීලෙසු ච පතිට්ඨාපෙසි. අඤ්ඤතරඤ්ච කුලං අස්සද්ධං අප්පසන්නං විප්පසන්නං අකාසි. තෙන තස්මිං කුලෙ මනුස්සා ථෙරෙ අභිප්පසන්නා අහෙසුං. තත්ථෙකා දාරිකා අභිරූපා දස්සනීයා ථෙරං පිණ්ඩාය පවිට්ඨං සක්කච්චං භොජනෙන පරිවිසති.*

ෂට්අභිඥා ලැබ බොහෝ දෙනාට අවවාද අනුශාසනා කළහ. බොහෝ දෙනකුට දහම්දෙසා සරණසිල්හි පිහිටවූහ. එක්තරා අශ්‍රද්ධාවත් පවුලක් සැදැහැවත් කර බුද්ධමාමක වූ යේ ය. එම පවුලෙහි සුරූපී පියකරු දැරියක් පිණ්ඩපාත දීමෙන් නිතර

සාටිමත්තිය තෙරුන්ට සංගහ කළා ය.

මාරයා එම තෙරුන්ට අපකීර්ති ඇති කිරීමට මාන බැලීය.

*...අථෙකදිවසං මාරො එවං ඉමස්ස අයසො වඩ්ඪිස්සති අප්පතිට්ඨියො භවිස්සතීති චින්තෙත්වා ථෙරස්ස රූපෙන ගන්ත්වා තං දාරිකං හත්ථෙන අග්ගහෙසි. දාරිකා 'නායං මනුස්සඵස්සොති' ච අඤ්ඤාසි හත්ථඤ්ච මුඤ්ඤාපෙසි. තං දිස්වා සරජනො ථෙරෙ අප්පසාදං ජනෙසි. පුන දිවසෙ ථෙරො තං කාරණං අනාවජ්ජෙන්තො තං ඝරං අගමාසි, තත්ථ මනුස්සා අනාදරං අකංසු. ථෙරො තං කාරණං ආවජ්ජෙන්තො මාරස්ස කිරියං දිස්වා ... තං තජ්ජෙත්වා විස්සජ්ජෙසි ... ඝරසාමිකො ඛමථ, භන්තෙ, අච්චයන්ති ඛමාපෙත්වා අජ්ජතග්ගෙ අහමෙව භන්තෙ , තුම්හං උපට්ඨාමීති ආහ. ථෙරො තස්ස ධම්මං කථෙන්තො ...* [1]

...ඉක්බිති එක්දිනක් මාරයා මෙසේ මොහුගේ අපකීර්තිය වැඩෙන්නේ යි සිතා තෙරණුවන්ගේ ස්වරූපයෙන් එහි ගොස් දාරිකාවගේ අත ඇල්ලුවේ ය. දැරිය මේ මිනිස්අතක ස්පර්ශයක් නො වේ යි දැන අත මුදා ගත්තාය. ඒ දැක ගෘහයෙහි ජනකෙමේ තෙරුන් කෙරෙහි කලකිරුණේය. තෙරහු ඒ බව ආවර්ජනය නො කර ඊළඟ දින එහි ගියහ, එහි වැසියෝ ගරුබුහුමන් නො කළහ. සාටිමත්තිය තෙරණුවෝ ඒ බව ආවර්ජනය කර මාරයාගේ ක්‍රියාවක් බව තේරුම් ගෙන මරුට තර්ජනය කර පලවා හැරියහ. ගෙහිමියා වරදට සමාව ගෙන, අද පටන් මම ම උපස්ථාන කරමි යි ප්‍රකාශ කෙළේ ය. තෙරහු ඔහුට දහම් දෙසමින් මෙ සේ වදාළහ.

[1] ථෙරඅ. පි. 359

*246* *අනු තුය්හං පුරෙ සද්ධා*
*සා තෙ අජ්ජ න විජ්ජති*
*යං තුය්හං තුය්හමෙවෙතං*
*නත්ථි දුච්චරිතං මම*

පෙර තට (ඔබට මාකෙරහි) ශ්‍රද්ධාවිය. එය දැන් තට (ඔබට)නැත. යමක් තාගේ (ඔබගේ) නම් තෙල දැය (ඒ දෙය) තට මැ(ඔබට ම) වේවා මාගේ දුශ්චරිතයෙක් නැත.

247 *අනිච්චා හි චලා සද්ධා*
*එවං දිට්ඨා හි සා මයා*
*රජ්ජන්තිපි විරජ්ජන්ති*
*තත්ථ කිං ජීයතෙ මුනි*

යම්හෙයකින් (පෘථග්ජන, පුහුදුන්) ශ්‍රද්ධාව අනිත්‍ය ද එහෙයින් චල වෙයි. මා විසින් ඒ මෙසේ දක්නා ලද ය, රක්ත ද වෙති, විරක්ත ද වෙති, කිම එහි මුනි තෙම පිරිහේ ද ?

248 *පච්චති මුනිනො භත්තං*
*ථොක ථොකං කුලෙ කුලෙ*
*පිණ්ඩිකාය චරිස්සාමි*
*අත්ථි ජංඝා බලං මමාති* [1]

මුනිහුට (මුනිවරයන්ට) කුලයක් (ගෙයක්) පාසා බත් ටික ටික පැසෙයි. (පිළියෙල) වෙයි, පිඩුපිණිස හැසිරෙමි. මාගේ ජංගාබලය ( ජංඝා) (දෙපයෙහි වාරු) ඇත.

---

[1] ථෙර. පි . 88

( ෂට්අභිඥා ලැබ - *ඡළභිඤ්ඤා පත හුත්වා*

සෘද්ධිවිධ ඥානය, *ඉද්ධිවිධං,*

දිව්‍ය ශ්‍රෝත, *දිබ්බසොත* ,

චෙතොපරිය, *චෙතොපරිය,*

දිව්‍ය චක්ෂු,*දිබ්බචක්ඛු,*

පූර්වේනිවාසානුස්මෘති ඥානය, *පුබ්බෙනිවාසානුස්සති,*

ආශ්‍රවක්ෂය ඥානය.*ආසවක්ඛය.*

(*ඡළභිඤ්ඤා*). එනම් සෘද්ධිවිධ ඥානය; (*ඉද්ධිවිධ*) ප්‍රාතිහාර්ය පෑමයි. විවිධ දේ මවා පෑම, එකෙක්ව බොහෝ දෙනෙක් වීම, අහසෙන් යෑම, දියෙහි පොළොවෙහි මෙන් ගමන් කිරීම, ආදී අසිරිමත් දේ කිරීමය. දිව්‍යකර්ණ - දෙව්කන් (*දිබ්බ සොත*) දෙවියන්ගේ කන්වලට සමානව ඇසිය හැකි හෙයින් දිව්‍ය ශ්‍රෝත යයි කියනු ලැබේ. ලඟ දුර ආදී ශබ්ද ඇසීමේ හැකියාව මෙහිලා ගත යුතුයි. චෙතෝපරිය ඥානය (*පරචිත්තවිජානන ඤාණං*) මෙයින් විස්තර වන්නේ අනුන්ගේ සිත් දන්නා ඥානයයි. රාග සහිත රාග රහිත ආදි වශයෙන් දැන ගැනීමය. ඊලඟට දිවැස් (*දිබ්බ චක්ඛු* ) විස්තර වෙයි. ඒ ඒ අය කර්ම අනුව මිය යන උපදින සැටි පිළිබඳව දැනීමේ හැකියාවයි. චූතුපපාත ඥානය යනු ද මෙය ම වේ. පූර්වේනිවාසානුස්මෘති ඥානය පෙර විසූ කඳ පිළිවෙළ දන්නා නුවණයි. (*පුබ්බෙනිවාසානුස්සති*) ආත්ම ගාතක් පෙර විසූ ආකාරය දැනීමේ නුවණ මෙයින් අදහස් කරයි. ආශ්‍රවක්ෂය ඥානය, ආශ්‍රව යනු කෙලෙස්ය. කෙලෙස් ක්ෂය කිරීම, නැති කිරීම, දැනීම, මෙහිලා අදහස් වෙයි. මේ සිත කෙලෙස් වලින් යුක්තය. කෙලෙස් වලින් වියුක්තය, යනාදී ක්‍රමයට විභාගවශයෙන් දැනගැනීමය[1].

---

[1] සිව්. ඉද්ධිවිධ නිර්දේශය පි.75, අභිඥා නිර්දේශය පි . 120

( සෙලවෙන ශ්‍රද්ධාව - චලා සද්ධා

පුහුදුන්ගේ ශ්‍රද්ධාව අනිත්‍යය, අස්ථිරය. *අනිච්චා හි චලා සද්ධා* මෙය විස්තර කරන අටුවාව මෙසේ කියයි.

... *අනිච්චා හි චලා සද්ධා යස්මා පොථුජ්ජනික සද්ධා අනිච්චා එකන්තිකා න හොති, තතො එව චලා. අස්සපිට්ඨෙ ඨපිත කුම්භණ්ඩං විය ථුසරාසිම්හි නිඛාත ඛාණුකං විය ච අනවට්ඨිතා, එවං දිට්ඨා හි සා මයා එවම්භූතා සා සද්ධා මයා තයි දිට්ඨා පච්චවෙක්ඛතො විදිතා* ...[1]

පුහුදුන්ගේ [2] ශ්‍රද්ධාව [3] අස්ථිරය. ඒකාන්තික නො වෙයි. අශ්වයකුගේ පිටමත තැබූ ලබ්බක් (ලබුගෙඩියක්) මෙනි, දහයියා ගොඩෙහි හිට වූ කණුවක් වැනි ය. මා කෙරෙහි වූ ඔබගේ ශ්‍රද්ධාව ද එසේ ය ප්‍රත්‍යවේක්ෂා කරීමෙන් දැන ගතිමි.

( මුනිවරයාට - *මුනිනො*

ගිහි, ගෘහස්ථයෝ- *අගාර මුනයො*

භික්ෂූහු- *අනගාර මුනි*

හදාරන්නෝ,-*අසෙඛ*

රහත්හු- *සෙඛ*

පසේ බුදුවරු- *පච්චෙක බුද්ධ*

මුනිවරුන්ගේ මුනි බුදුහු - *මුනිමුනයො*

මෙහි මුනි වශයෙන් අදහස් වන්නේ කුසල් දහම් කරණ තැනැත්තාය. ඥානවන්ත පුද්ගලයාය. 'මුනි'

---

[1] ථෙරඅ. පි . 360

[2] පෘථග්ජන බ. පි 108

[3] මමසැදැහැයෙන් බ. පි . 86

මුනිවරු ගිහිව සිට කුසල් කරන්නා සිට බුදුවරුන් දක්වා මුනිවරු හයදෙනෙකි. මේ පුද්ගලයෝ කායික, වාචික, මානසික, කුසල කර්ම රැස් කරන්නාහ. )

## කෙසේ දිවි රකිම් ද?

තේකිච්ඡකානි ථේර

අරණ්‍ය ගතව මහණදම් පිරූ තේකිච්ඡකානි තෙරහු අබ්භෝකාසික (එළිමහනේ) ධූතාංගධාරීව විසූහ. එළිමහනේ ඉඳගෙන (නෙසජ්ජිකව) භාවනා කළහ. සීත, උෂ්ණ ඉවසූහ. සතර බ්‍රහ්මවිහාර භාවනා අරමුණු වූයේ ය.

පවිටු මාරයා තෙරුන් වික්ෂිප්ත කරන්නට සිතා කෙත රකින්නෙකු ලෙස තේකිච්ඡකානි වෙත එළඹ මෙසේ පැවසී ය.

(මාරයා) 381 *අතිහිතා වීහි ඛලගතා සාලි*
*න ච ලභෙ පිණ්ඩං කථමහං කස්සං*

වීවලින් අටුකොටු පිරුණි. සහලින් කලවිටි පිරී ඇත. එහෙත් මට ආහාර නැත. කෙසේ නම් දිවි රකිම් ද?

තේකිච්ඡකානි තෙරහු පිළිතුරු වශයෙන් මෙසේ කීහ.

(තෙරණුවෝ) 382 *බුද්ධමප්පමෙය්‍යං අනුස්සර පසන්නො*
*පීතියා ඵුටසරීරො හොහිසි සතතමුදග්ගො*

පහන්සිත් ඇතිව අප්‍රමාණ ගුණ ඇති බුදුන් සිහි කරව, ප්‍රීතියෙන් පතළ ගතැතිව නිතර වීර්යයෙන් යුතු වව.

383 *ධම්මමප්පමෙය්‍යං අනුස්සර පසන්නො*
*පීතියා ඵුටසරීරො හොහිසි සතතමුදග්ගො*

පහන්සිත් ඇතිව අප්‍රමාණ ගුණ ඇති දහම් සිහි කරව, ප්‍රීතියෙන් පතළ ගතැතිව නිතර වීර්යයෙන් යුතු වව.

384 *සංඝප්පමෙය්‍යං අනුස්සර පසන්නො*
*පීතියා ඵුටසරීරො හොහිසි සතතමුදග්ගො*

පහන්සිත් ඇතිව අප්‍රමාණ ගුණ ඇති සඟුන් සිහි කරව, ප්‍රීතියෙන් පතළ ගතැතිව නිතර වීර්යයෙන් යුතු වව.

ඉන්පසු මාරයා මෙසේ කී ය.

(මාරයා) 385 *අබ්භොකාසෙ විහරසි සීතා*
*හෙමන්තිකා ඉමා රත්තියො*
*මා සීතෙන පරෙතොවිහඤ්ඤිත්තො*
*පවිස ත්වං විහාරං ඵුසිතග්ගලං*

(තෙපි) අබවස්හි (එළිමහනේ) වාස කරන්නාහු ය. මේ හේමන්තික රාත්‍රීහු සීතයහ. සීතයෙන් මඩනාලදු ව නහමක් නැසෙව (නො මැරෙන්න) තෙපි වසන ලද කවුළු ඇති (ජනෙල් වැසූ) වෙහෙරට පිවිසෙව.

තෙරණුවෝ එයට පිළිතුරුවශයෙන් මෙසේ පැවසූහ.

(තෙරණුවෝ) 386 *ඵුසිස්සං චතස්සො අප්පමඤ්ඤායො*
*තාහි ච සුඛිතො විහරිස්සං*
*නාහං සීතෙන විහඤ්ඤිස්සං*
*අනිඤ්ජිතො විහරන්තො ති*[1]

සතර අප්‍රමාණ්‍යයන් (අප්පමඤ්ඤා-බ්‍රහ්මවිහරයන්) පහස්නෙමි. (කලින්කල සමවදනෙමි). එයින් (උපන්) සුව ඇතිව වාසය

[1] ථෙර. පි . 118

කරන්නෙමි. මම ආනෙඤ්ජ සමාපත්ති ඇති ව වාසය කරන්නෙමි. සිතෙන් නො නස්නෙමි' යි.

( සතර අප්‍රමාණ්‍යයන් - *චතස්සො අප්පමඤ්ඤායො*
මෛත්‍රිය - *මෙත්තා*
කරුණාව - *කරුණා,*
මුදිතාව- *මුදිතා*
උපේක්ෂාව - *උපෙක්ඛා*

බ්‍රහ්ම විහාර නමින් ද හඳුන්වන සතර අප්‍රමාණ්‍ය නම්; මෙත්තා, කරුණා, මුදිතා සහ උපෙක්ඛා ය. පෙළ පොත් වල මෙන්ම අටුවාවල මේ සතර අප්‍රමාණ්‍ය *(අප්පමඤ්ඤා)* වඩන ආකාරය දක්වා තිබේ. ලොව සතර දිශාවෙන් ම මෙත් සිතින් පුරවා වෛරයෙන් ද්වේෂයෙන් තොර විවෘත, සංවර්ධිත, මනසින් සමස්ත සත්ත්වයාම මා වැනි යැයි සිතමින් මෙත් වැඩිය යුතුය. මෙසේ කරුණා සිත, මුදිතා සිත හා උපේක්ෂා සිත ද වැඩියයුතුයි.

මෙත්තා : මෛත්‍රී සහගත සිත, මිතුරු ලෙස සිතීම, මිත්‍රබව, සෙනේහය.
ප්‍රිය මනාප පුද්ගලයකු දැකීමෙන් මිත්‍රසිත ඇතිවේද, එසේ සෑම කෙනෙකු ගැනම සිතීම මෙත්තා නම්.
'*මෙජ්ජතීති මෙත්තා, සිනියහතීති අත්ථො. මිත්තෙ වා භවා, මිත්තස්ස වා එසා පවත්තතීපි මෙත්තා.* '

කරුණා : කාරුණිකබවයි. ඉතා දුකටපත්වූ අත් පා කපාදැමූ , කබලක් ඉදිරියේ තබාගෙන අම්බලමක වැතිර සිටින ඇගේ පණුවන් ද සිටින එහෙයින්ම බැගෑපත් හඬින් හඬන පව්කාර බැගෑපත් මිනිසකු දැක අනේ මේ මිනිසා දුකටපත්වූයේය, මොහු මේ දුකින් මුදාගන්නේනම් යෙහෙකි' මෙසේ ඇතිවන සිත කරුණාවයි.

'*පර දුක්ඛෙ සති සාධූනං හදය කම්පනං කරොතීති කරුණා.*'

*'යා සත්තෙසු කරුණායනා කරුණායිතත්තං කරුණා චෙතො විමුත්ති'*

මුදිතා : සුඛිත මුදිත වූ ප්‍රියමනාප වූ පුද්ගලයකු දැක හෝ අසා හෝ මේ පුද්ගලයා යහතින් වෙසෙයි, කියා ඇතිවන සතුටු සිත මුදිතාව නම්.

*'මොදන්ති තාය සමංගිනො , සයං වා මොදති මොදන මත්තමෙව වා තන්ති මුදිතා '*

උපෙක්ඛා : එනම් මධ්‍යස්ථබවයි. යමෙක් දැක මනාප හෝ අමනාප හෝ නොවීමයි.
'අවෙරා හොන්තූති ආදිබ්‍යාපාදප්පහානෙන මජ්ඣත්තභාවූගමනෙන ච උපෙක්ඛතීති උපෙක්ඛා'[1] )

## බියසුලුරූප මවයි

හල්ලිය ථේර

පෙර අත්බව යන්හි ද කුසල් කළ හල්ලිය තෙර ගෞතමබුද්ධ කාලයේ ගැල්කාර නායකයෙකුගේ පුත්‍රව උපන්නේ ය. මේ තෙරගේ වැඩිමහල් සහෝදරයා තපස්සු නම්. වෙළෙඳ දෙ බෑයන් වූ මේ දෙදෙනා තථාගතයන් වහන්සේ බුදුවීමෙන් පසු රාජායතනයේ වැඩසිටිද්දී විලඳ හා මීපිඩු පිදූහ. බුදුහු ද්වේ වාචික උපාසක වූ ඔවුන්ට කේශධාතු දුන්හ.

තථාගතයන් වහන්සේ රජගහ නුවර වැඩවසද්දී එහි ගිය තපස්සු හල්ලිය (හල්ලුක) දෙදෙනා දහම් අසා තපස්සු සෝවාන්ඵලයෙහි පිහිටා උවසුවෙක් වූයේ ය. හල්ලිය පැවිදිව ඡළභිඥා ලැබ විසුවේ ය.

---

[1] සිවි. බ්‍රහ්මවිහාර නිර්දේශය. 433

*අථෙකදිවසං මාරො භල්ලියත්ථෙරස්ස භිංසාපනත්ථං භයානකං රූපං දස්සෙසි. සො අත්තනො සබ්බ භයාතික්කමං පකාසෙන්තො 'යොපානුදීති' ගාථා අභාසි* [1].

ඉක්බිති මාරයා එක් දිනක් තෙරුන් බියකරණු පිණිස භයානක රූප මැවී ය. තෙරණුවෝ සියලු බිය ආදිය දුරු කළ බව පැහදිලි කිරීමට මේ ගාථාව කීහ.

(භල්ලිය තෙර) 7 *යොපානුදී මච්චුරාජස්ස සෙනං*
*නළසෙතුංව සුදුබ්බලං මහොඝො*
*විජිතාවී අපෙත භෙරවො හි*
*දන්තො සො පරිනිබ්බුතො ඨිතත්ථො'ති* [2]

මහත් වූ ඕඝය (ජලස්කන්ධය) ඉතා දුබුල් (දිරූ) වූ නළහෙයක් මෙන් යමෙක් (කාමාදි) මරසෙන් (අග්‍රමාර්ගයෙන්) දුරු කෙළේ ද, කෙලෙසුන් දිනූ පහ වූ බිය ඇති දැමුණා වූ (ක්ලේශපරිනිර්වාණයෙන් ) පිරිනිවි හෙතෙම අකම්ප්‍ය වූ සිත් ඇතතේ ය.
ඉන්පසු මාරයා නො පෙණී ගියේ ය.

## අභිභූ තෙරුන්ගේ ධර්ම දේශනය

අභිභූථේර

(අභිභූතෙර) 255 *සුණාථ ඤාතයො සබ්බෙ*
*යාවන්තෙත්ථ සමාගතා*
*ධම්මං වො දෙසයිස්සාමි*
*දුක්ඛා ජාති පුනප්පුනං*

---

[1] ථෙරඅ. පි . 49
[2] ථෙර. පි . 4

මෙහි රැස් වූ තාක් නෑ වූ තෙපි සියල්ලෝ (මාගේ වචනය) අසවු, තොපට මම දහම් දෙසන්නෙමි, පුනපුනා ඉපදීම දුකෙකි.

*256 ආරභථ නික්ඛමථ*
*යුඤ්ජථ බුද්ධසාසනෙ*
*ධුනාථ මච්චුනො සෙනං*
*නළාගාරං ව කුඤ්ජරො* [1]

වීර්යකරවු , කුසීත බැවින් නික්මෙවු , බුදුසසුන්හි යුක්ත ප්‍රයුක්ත වවු , නළාගාරයක් (බටගසින් කළ ගෙයක් ) වනසන ඇත්රජකු සෙයින් මාරයාගේ සෙනඟ (කෙලෙස්) විධ්වංසනය (විනාශ) කරවු.

[1] ථෙර ගි . 90

# පස්මරුන් - පඤ්ච මාරා

මෘත්‍යු මාරයා -*මච්චුමාරො*
කෙලෙස්මාරයා- *කිලෙසමාරො,*
අභිසංස්කාර/.කර්මමාරයා -*අභිසංඛාරමාරො.*
ස්කන්ධමාරයා -*ඛන්ධමාරො,*
දෙවපුත්‍රමාරයා - *දේවපුත්ත මාරො.*

*මාරොති ; පඤ්ච මාරා- ඛන්ධමාරො, අභිසංඛාරමාරො, මච්චු මාරො, දෙවපුත්තමාරො, කිලෙසමාරො*[1]
යනුවෙන් පස් මරුන් ගැන උදාන අට්ඨකථාවේ හා නෙත්තිප්පකරණ අට්ඨකථාවේ සඳහන් වෙයි.

## මෘත්‍යුමාරයා - *මච්චුමාරො*

මච්චුමාර නම් මරණයයි[2].

## කෙලෙස්මාරයා -*කිලෙසමාරො*

කෙලෙස්, මාරයා වශයෙන් ගෙන කිලෙසමාර නම් වෙයි. සිතට කයට වද දෙන ක්ලේශයන් ය.

*තත්ථ, කිලෙසාතිඃ යස්මිං සන්තානෙ උප්පන්නා, තං කිලෙසෙන්ති විභාධෙන්ති උපතාපෙන්ති වාති කිලෙසා, රාගාදයො*[3].
යම් සිතක ජනිතව ඒ සිත කිළිටු කරන තාපනය කරන හෙයින් කෙලෙස් නම්

*යතො තෙ චිත්තං කායඤ්ච කිලෙස්සන්තීති කිලෙසාති වුච්චති*[4]
සිතත් කයත් කෙලසන හෙයින් එනම් වෙයි.

---

[1] උදාඅ. පි . 215, DPPN. II. 611
[2] මච්චුමාරො ඛ. පි. 12
[3] ථෙරඅ. පි . 152
[4] උදාඅ. පි . 202

*මාරස්සාති එත්ථ පඤ්චමාරා. තෙසු කිලෙසමාරස්ස චතුන්නං ආසවානං චතුන්නං ඔඝානං චතුන්නං යොගානං චතුන්නං ගන්ථානං චතුන්නං උපාදානානං අට්ඨන්නං නීවරණානං දසන්නං කිලෙසවත්ථූනං වසෙන*[1]

මාරස්සාති මෙහි පඤ්චමාරයෝ ය. එහි කිලේසමාර යන්නට ආස්‍රව හතර, ඕඝ හතර, යෝග හතර, ග්‍රන්ථ-ගැට හතර, උපාදාන හතර, නීවරණ අට කෙලෙස්වස්තු දහය ඇතුළත් වෙයි.

නීවරණ අට- *අට්ඨ නීවරණානි*

පඤ්චනීවරණ හැර තවත් නීවරණ අටක් මෙහි සඳහන් වෙයි.
... එතදෙව ඛො පන සංයොජනං එතං නීවරණං යදිදං පාණාතිපාතො...අදින්නාදානං...මුසාවාදො...පිසුණාවාචා...ගිද්ධි ලොභො...නින්දාරොසො...කොධුපායාසො...අතිමානො...[2]

ක්ලේශ වස්තු- කිලෙසවත්ථු

පෙළ අටුවා දෙකෙහිම කෙලෙස් පිළිබඳව විස්තර වෙයි.
විභංගයේ ක්ලේශ වස්තු දහයක් පෙන්නා තිබේ. එනම් ;

ලොභො, දොසො, මොහො, මානො, මිච්ඡාදිට්ඨි, විචිකිච්ඡා, ථීනං, උද්ධච්චං, අහිරිකං, අනොතප්පං දස කිලෙසවත්ථූනි[3]

ලෝභය, ද්වේෂය, මෝහය, මානය, මිථ්‍යාදෘෂ්ටිය, සැකය, ථීනය, උද්ධච්චය, පවට ලැජ්ජා නො මැති බව, පවට බිය නො වීම යනු ක්ලේශ වස්තු දහයයි. මෙහි මුල් කෙලෙස් අට වෙනත් මාතෘකා යටතේ විස්තරකර ඇත.

---

[1] නෙත් තිප්පකරණ අට්ඨකථා.
[2] මනි. II පොතාලිය සූත්‍රය පි. 40
[3] විභ. පි . 391

( මානය- *මානෝ*[1]

මානය දසකෙලෙස් වස්තු වලින් එකකි. දෙයාකාර මානය මෙ පිළිබඳ ව විස්තර පෙළ අටුවා දෙකෙහි ම බොහෝ සේ සඳහන්ව ඇත.

තමා උසස් ලෙස සිතීම -*සෙය්‍යො හමස්මි*
සමාන ලෙස සිතීම - *සදිසො හමස්මි*
හීන/ පහත් ලෙස සිතීම -*හීනො හමස්මි*

මාන යන පදය සෑදී ඇත්තේ මන් - සිතීමේ හෝ මන් - මිනීමේ හෝ අරුත් ඇති ධාතු මූලයෙනි.
කෙනෙකුට තමා අන් අයට වඩා උසස් (*සෙය්‍ය*) වශයෙන් සමාන (*සදිස*) වශයෙන් හෝ පහත් (*හීන*) වශයෙන් සිතා ගත හැකිය. මෙසේ අනුන් සමඟ තමන් මැන ගැනීම වශයෙන් මානය හඳුන්වා ඇත .

ශ්‍රේෂ්ඨයාට මම ශ්‍රේෂ්ඨ වෙමි - *සෙය්‍යස්ස සෙය්‍යො හමස්මීති*
ශ්‍රේෂ්ඨයාට මම සමානවෙමි- *සෙය්‍යස්ස සදිසො හමස්මීති*
ශ්‍රේෂ්ඨයාට මම පහත් වෙමි- *සෙය්‍යස්ස හීනො හමස්මීති*
සමානයාට මම ශ්‍රේෂ්ඨ වෙමි- *සදිසස්ස සෙය්‍යො හමස්මීති*
සමානයාට මම සමාන වෙමි- *සදිසස්ස සදිසො හමස්මීති*
සමානයාට මම පහත් වෙමි- *සදිසස්ස හීනො හමස්මීති*
හීනයාට මම ශ්‍රේෂ්ඨ වෙමි - *හීනස්ස සෙය්‍යො හමස්මීති*
හීනයාට මම සමාන වෙමි - *හීනස්ස සදිසො හමස්මීති*
හීනයාට මම හීන වෙමි - *හීනස්ස හීනො හමස්මීති*

මෙසේ නව ආකාරයකින් සිතා ඇති කරගන්නා මානයයි. මේ ත්‍රිවිධ මානය රජවරුන්ට ද පැවිද්දන්ට ද දාසයන්ට ද චණ්ඩාල පුක්කුසයන්ට ද ඇත. ඔවුහු තමා සිටින තත්ත්වය මැන බලමින් මානය ඇතිකර ගණියි. රජා තමා අනෙක් රජවරුන්ට

---

[1] මහානිඅ. පි.147

උසස් ලෙස සිතයි. සමාන ලෙස හීන ලෙස සිතයි. පැවිද්දා තම ධූතාංගාදිය වෙනත් පැවිද්දන් හා සසඳා සෙයා, සදිස, හීන වශයෙන් මානය ඇතිකර ගණී, දාසයා ද මෙසේම සිතා මානය උපදවා ගන්නේය.

මානයඇති කරගන්නා හේතු

උපතින්- *ජාතියා*
පරපුරෙන්-*ගොත්තෙන*
උසස් පවුලකට අයත්වීමෙන්- *කොලපුත්තියෙන*
සොඳුරු පැහැපත් බවින්- *වණ්ණපොක්ඛරතාය*
ධනයෙන්-*ධනෙන*
උගැන්මෙන්- *අජ්ඣෙනෙන*
කර්මාන්තයෙන්-*කම්මායතනෙන*
ශිල්පායතනයෙන්- *සිප්පායතනෙන*
ශිල්පීය දැනුමෙන්- *විජ්ජානට්ඨෙන*
බහුශ්‍රැත භාවයෙන්- *බාහුස්සුතෙන*
ප්‍රතිභානයෙන්- *පටිභාණෙන*[1]

පුද්ගලයෙකු තමා තුළ මානය ඇතිකර ගන්නා හේතු මෙයින් දැක් වෙයි.
මානය දස සංයොජනයන්ට අයත් වන අතර එය සිතේ ගැඹුරුට කිඳා බැස ඇති ක්ලේශ ධර්මයකි. සංයෝජනයක් ලෙස ගත්විට එය මුලිනුදුරා දැමිය හැක්කේ අර්හත්වයට පත්වීමේදිය.

පව්කිරීමට විළි ලැජ්ජා නැතිකම -*අහිරිකං*

පව්කිරීමට බිය සැක නො මැතිකම-*අනොතප්පං)*

[1] විභඅ. පි. 140

## ස්කන්ධමාරයා - *ඛන්ධමාරො*

ඛන්ධමාර යනුවෙන් අදහස් වන්නේ පඤ්චස්කන්ධයයි[1].
ස්කන්ධ පහ; රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

## අභිසංස්කාරමාරයා- *අභිසංඛාරමාරො.*

අභිසංස්කාර යනුවෙන් කියවෙන්නේ කර්මයයි.

පුණ්‍යාභි සංස්කාර - *පුඤ්ඤාභිසංඛාර,*
අපුණ්‍යාභි සංස්කාර - *අපුඤ්ඤාභි සංඛාර,*
අනෙඤ්ජාභි සංස්කාර - *ආනෙඤ්ජාභි සංඛාර,*

අභිසංස්කාරමාරයා යනු මේ කියන සංස්කාර හා බැඳෙන කර්මයෝය.

පටිච්ච සමුප්පාදය දක්වන විට 'සංඛාර'යන වචනයෙන් අදහස් කර ඇත්තේ සිතින්, කයින්, වචනයෙන් කෙරෙන සචේතනික ක්‍රියාවන් මගින් ජනිත වන කර්මයන් ය. මෙම සචේතනික ක්‍රියා කුසල හෝ අකුසල විය හැක. මෙම කර්ම සමහර විට පුණ්‍ය, පාප, ආනෙඤ්ජ (නොබිඳෙන) වශයෙන් ද වර්ග කරනු ලැබේ.
පුණ්‍යාභිසංස්කාර කාම හා රූප ලෝක වලට අදාල වෙයි.
පුණ්‍යාභිසංස්කාර යන්නෙන් කාමාවචර කුසලසිත් අට සහ රූපාවචර සිත් පහ ගැනෙයි.

( කාමාවචර කුසලසිත් අට - *අට්ඨ කාමාවචර කුසලචිත්තානි*

සොම්නස හා නුවණ යෙදුණු බලපෑම් රහිත සිත
*සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකං*

---

[1] ස්කන්ධ ඔ. පි. 111

සොම්නස හා නුවණ යෙදුණු බලපෑම් සහිත සිත
*සොමනස්ස සහගතං ඤාණ සම්පයුත්තං සසංඛාරිකං*

සොම්නස යෙදී නුවණ නො යෙදුණු බලපෑම් රහිත සිත
*සොමනස්ස සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකං*

සොම්නස යෙදී නුවණ නො යෙදුණු බලපෑම් සහිත සිත
*සොමනස්ස සහගතං ඤාණ විප්පයුත්තං සසංඛාරිකං*

මැදහත් බව හා නුවණ යෙදුණ බලපෑම් රහිත සිත
*උපෙක්ඛා සහගතං ඤාණ සම්පයුත්තං අසංඛාරිකං*

මැදහත් බව හා නුවණ යෙදුණ බලපෑම් සහිත සිත
*උපෙක්ඛා සහගතං ඤාණ සංපයුත්තං සසංඛාරිකං*

මැදහත් බව යෙදී සහ නුවණ නො යෙදුණු බලපෑම් රහිත සිත
*උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං අසංඛාරිකං*

මැදහත්බව යෙදී සහ නුවණ නො දෙුණු බලපෑම් සහිත සිත
*උපෙක්ඛා සහගතං ඤාණ විප්පයුත්තං සසංඛාරිකං*[1]

රූපාවචර කුසල සිත් - රූපාවචර කුසල චිත්තානි

ප්‍රථමධ්‍යානය සිට පස්වැනි ධ්‍යානයෙන් නිමවන, විතර්ක ආදිය නැති කිරී මෙන් ඇතිවන කුසල් සිත් පහය. එනම්;

විතර්කය විචාරය ප්‍රීතිය සැපය එකග්‍රතාව සහිත ප්‍රමධ්‍යාන කුශල සිත
*විතක්ක විචාර පීති සුඛ එකග්ගතා සහිතං පඨමජ්ඣාන කුසලචිත්තං*

[1] A Manual of Abhidhamma 35, සිව් පඤ්ඤාභූමි නිර්දේශය පි .350

විචාරය ප්‍රීතිය සැපය එකග්‍රතාව සහිත ද්වතීයධ්‍යාන කුශල සිත
*විචාර පීති සුඛ එකග්ගතා සහිතං දුතියජ්ඣාන කුසලචිත්තං*

ප්‍රීතිය සැපය එකග්‍රතාව සහිත තෘතීයධ්‍යාන කුශල සිත
*පීති සුඛ එකග්ගතා සහිතං තතියජ්ඣාන කුසලචිත්තං*

සැපය එකග්‍රතාව සහිත චතුර්ථධ්‍යාන කුශල සිත
*සුඛ එකග්ගතා සහිතං චතුත්ථජ්ඣාන කුසලචිත්තං*

උපෙක්ෂාව එකග්‍රතාව සහිත පඤ්චමජ්ඣාන කුශල සිත
*උපෙක්ඛා එකග්ගතා සහිතං පඤ්චමජ්ඣාන කුසලචිත්තං*

අපුණ්‍යාභි සංස්කාර - *අපුඤ්ඤාභි සංඛාරා*

අපුණ්‍යාභිසංස්කාර කාම ලෝකයට පමණක් අදාල වෙයි. දොළොස් අකුසල සිත් ය. එනම්;

සොම්නස් සහගතව මිථ්‍යා දෘෂ්ටිය යෙදී පෙළඹීම් රහිත සිත
*සොමනස්ස සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකං,*

සොම්නස් සහගතව මිථ්‍යා දෘෂ්ටිය යෙදී පෙළඹීම් සහිත සිත
*දිට්ඨිගත සම්පයුත්තං සොමනස්ස සහගතං සසංඛාරිකං,*

සොම්නස්සහගතව මිථ්‍යාදෘෂ්ටියනොයෙදුණුපෙළඹීම් රහිත සිත
*සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකං,*

සොම්නස්සහගතව මිථ්‍යාදෘෂ්ටිය නොයෙදුණු පෙළඹීම් සහිත සිත
*සොමනස්ස සහගතං දිට්ඨිගත විප්පයුත්තං සසංඛාරිකං,*

උපෙක්ෂා සහගතව දෘෂ්ටිය යෙදුණු පෙළඹීම් රහිත සිත
*උපෙක්ඛා සහගතංදිට්ඨිගත සම්පයුත්තං අසංඛාරිකං,*

උපෙක්ෂා සහගතව දෘෂ්ටිය යෙදුණු පෙළඹීම් සහිත සිත
*උපෙක්ඛා සහගතං දිට්ඨිගත සම්පයුත්තං සසංඛාරිකං,*

උපෙක්ෂා සහගතව දෘෂ්ටිය නො යෙදුණු පෙළඹීම් රහිත සිත
*උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං අසංඛාරිකං,*

උපෙක්ෂා සහගතව දෘෂ්ටිය නොයෙදුණු පෙළඹීම් සහිත සිත
*උපෙක්ඛා සහගතං දිට්ඨිගත විප්පයුත්තං සසංඛාරිකං,*

දොම්නස් සහගතව ප්‍රතිඝයෙන් යුත් පෙළඹීම් රහිත සිත,
*දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං අසංඛාරිකං,*

දොම්නස් සහගතව ප්‍රතිඝයෙන් යුත් පෙළඹීම් සහිත සිත
*දොමනස්ස සහගතං පටිඝ සම්පයුත්තං සසංඛාරිකං,*

උපෙක්ෂාව සහිත විචිකිච්ඡාවෙන් යුත් සිත
*උපෙක්ඛා සහගතං විචිකිච්ඡා සම්පයුත්තං,*

උපෙක්ෂාව සහිත උද්ධච්ඡයෙන් යුත් සිත.
*උපෙක්ඛා සහගතං උද්ධච්ඡ සම්පයුත්තං*[1] .

අනෙඤ්ජාභි සංස්කාර = *ආනෙඤ්ජාභි සංඛාර,*

ආනෙඤ්ජාභිසංඛාර අදාල වන්නේ අරූප ලෝකයන්ට පමණි. භාවනාකිරීම් වශයෙන් ලබාගන්නා සිත් සතර අරූපාවචර සිත් ය. එනම්;

ආකාශනඤ්චායතන කුසල් සිත
*ආකාසනඤ්චායතන කුසල චිත්තං*

---

[1] ib 12, එතනම

විඤ්ඤාණඤ්චායතන කුසල් සිත
*විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තං*

ආකිඤ්චඤ්ඤායතන කුසල් සිත
*ආකිඤ්චඤ්ඤායතන කුසල චිත්තං*

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල් සිත
*නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලචිත්තං)*

## මාරදේවපුත්‍රයා- *දෙවපුත්ත මාරො*

බලශක්ති ඇති මාර දේව පුත්‍රයා දෙවපුත්ත මාර නම් වන අතර පරනිම්මිතවසවර්ති දිව්‍යලෝකයේ වෙසෙන හෙයින් දෙවපුත්ත, වසවත්තිදෙවපුත්ත යනුවෙන් හැඳින්වෙයි.
කාමලෝක අතර ඉහළින්ම තිබෙන දිව්‍යලෝකය පරනිම්මිතවසවර්ති දිව්‍යලෝකයයි. එහි එක් කොටසක ආධිපත්‍යය මාරයා සතුවෙයි.

## ප්‍රජාපති - *පජාපති*

පජාපති යනු මාරයාට ව්‍යවහාරවන තවත් නාමෙකි. මේපිළිබඳව මනි. අට්ටකථාව මෙසේ කියයි.

... *සො කුහිං වසති? පරනිම්මිතවසවත්ති ලොකෙ, තත්‍ර හි වසවත්තිරාජා රජ්ජං කාරෙති මාරො එකස්මිං පදෙසෙ අත්තනො පරිසාය ඉස්සරියං පවත්තෙන්තො රජ්ජපච්චන්තෙ දාමරික රාජපුත්තො විය වසතීති වදන්ති...*[1]

... ඔහු කොතැනක වසන්නෙහි ද? පරනිම්මිතවසවර්ති ලෝකයෙහි ය. එහි වනාහි වසවත්තිරජ රජකරයි. එක් පෙදෙසක හෙතෙම ස්වකීය පිරිස ප්‍රධානත්ත්වයේ තබා දාමරික රාජපුත්‍රයෙකු මෙන් වසන්නේ යයි කියති ...

---

[1] මනිඅ. I පි. 31, බ. පි. 11

*මාරො මහානුභාවො ඡ කාමාවචරිස්සරො වසවත්ති*

මාරයා මහානුභාව සම්පන්නය. කාමවචර දිව්‍යලෝක හයට අධිපතිය.

## මාරසංඛ්‍යාව

5 පස්මරුන්- පඤ්චමාරා[2]

*... භගවා බොධිමණ්ඩෙ අපරාජිතපල්ලංකෙ නිසින්නො තිණ්ණං මාරානං මත්ථකං මද්දිත්වා අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො...*[3]

... භාග්‍යවතුන් වහන්සේ අපරාජිත පළඟෙහි වැඩසිට මාරයන් තුන්දෙනාගේ මස්තකය මැඩ සම්මා සම්බෝධිය අවබෝධ කළහ. ...

මෙහිදී මාරයන් තුන්දෙනා නම් වශයෙන් සඳහන් නො වේ. එහෙත් දීනි. අට්ඨකථාවේ චක්කවත්ති සූත්‍රය වර්ණනාවේ 'මාරබලං' යන්නට කළ විස්තරයේ දේවපුත්‍රමාරයා, මෘත්‍යුමාරයා, ක්ලේශමාරයා යි තුන් මරුන් සඳහන් වෙයි.

[1] දීනිඅ I පි. 122
[2] පස්මරුන් බ. පි. 172
[3] දීනිඅ I පි. 50

3 *යථයිදං භික්ඛවෙ මාරබලන්ති යථා ඉදං දෙවපුත්තමාර මච්චුමාර කිලෙසමාරානං බලං අප්පසහං දුරභිසම්භවං ...*[1]

**මහණෙනි, මේ දේවපුත්‍රමාරයා, මෘත්‍යුමාරයා, ක්ලේශමාරයා යන මාරයන්ගේ බලය මැඩලීම දුස්කරය.**

4 ... *චතුන්නානං මාරානං මත්ථකං මද්දිත්වා අනුත්තරං...*[2]
... මාරයන් සිවුදෙනාගේ මස්තකය මැඩ...

*වසං මාරස්ස ගච්ඡතීති කිලෙසමාරස්ස ච සත්තමාරස්ස*[3] *ච වසං ගච්ඡි*[4]

මාරවශයට යයි යනු කෙලෙස් මාරයාගේ ද සත්ත මාරයාගේ ද වසඟයට යයි

9 *ඛන්ධමාරො, ධාතුමාරො, ආයතනමාරො, ගතිමාරො, උප්පත්ති මාරො, පටිසන්ධිමාරො, භවමාරො, සංසාරමාරො, වට්ටමාරො,*[5]

**ස්කන්ධමාරයා, ධාතුමාරයා, ආයතනමාරයා, ගතිමාරයා, උප්පත්තිමාරයා, ප්‍රතිසන්ධිමාරයා, භව මාරයා, සංස්කාර මාරයා, වට්ටමාරයා,**

## මාරබලය - *මාරබලං*

*නාහං, භික්ඛවෙ, අඤ්ඤං එක බලම්පි සමනුපස්සාමි යං එවං දුප්පසහං යථයිදං භික්ඛවෙ, මාරබලං, කුසලානං භික්ඛවෙ*

---

[1] දිනිඅ II පි. 622
[2] මහානිඅ. මාරයන් සිවුදෙනා නවරහු දැයි තම වශයෙන් සඳහන් තැනක් හමුයුයේ නැත
[3] 'සත්තමාරස්ස' - මෙය අපැහැදිලිය ? DPPN. II. 618
[4] ජාත්. පි. 86
[5] චූලනි . පි . 73

*ධම්මානං සමාදානහෙතු එවමිදං පුඤ්ඤං පවඩ්ඪතී ති*[1]

මහණෙනි, මාරබලය සේ දුකසේ මැඩලිය යුතු වූ අන් එකද බලයක් මම (නුවණැසින් ) නො දකිමි. එය ද (රහත්බලහේතුවෙන්) මැඩලයි. මහණෙනි, මෙසේ කුශලධර්ම යන්ගේ සමාදාන හේතුවෙන් බින්ද රහත්ඵලය තෙක් ම වැඩෙයි.

## මාරධෙය්‍ය - *මාරධෙය්‍යං*

මාරධෙය්‍ය, මච්චුධෙය්‍ය යනු මාරයාට විෂය වන තැන, මාරයා බලපවත් වන ස්ථාන, ක්ලේශ වර්ග යයි.
මේ ශබ්දය මාරධෙය්‍ය- මච්චුධෙය්‍ය යන දෙ වීධි යට ම යෙදී තිබේ. අර්ථය එක ම ය.

*අනිච්චා භික්ඛවෙ, කාමා තුච්ඡා මොසධම්මා මායාකතමෙතං භික්ඛවෙ, බාලලාපනං යෙ ච දිට්ඨධම්මිකා කාමා යෙ ච සම්පරායිකා කාමා යා ච දිට්ඨධම්මිකා කාමසඤ්ඤා යා ච සම්පරායිකා කාමසඤ්ඤා උභයමෙතං මාරධෙය්‍යං*[2]

මහණෙනි, වත්කම් කෙලෙස්කම්හු (වස්තුකාම ක්ලේශකාම) ඇතිවැ නැතිවන අටින් අනිත්‍යහ. (නිත්‍යසාර ධ්‍රැවසාර ආත්මසාර විරහිතයෙන්) සිස්හ, නැසෙනුවහ, නැසෙනසැහැවි ඇතියවහ. මහණෙනි, මායාවෙන් කරනලද බාලාලාපනයෙක.(බාලයන් ලවා මාගේ යයි කියවනුයෙක) යම් දිට්ඨධම්මික වූ යම් මානුෂක පඤ්ච කාමගුණ කෙනෙක් ඇද් ද සම්පරායික වූ යම් තදවශේෂ කාම කෙනෙකුත් ඇද් ද දිට්ඨධම්මික වූ යම් කාමසඥාවක් වෙයි ද සාම්පරායික වූ යම් කාමසඥාවකුත් වෙයි ද මේ දෙක ම (මාරධෙය්‍ය) මාරායත්ත යෙක. (මාරයාගේ වශයෙහි වැටෙයි).

[1] දිනි. III පි. 135
[2] මනි III පි . 82

*වාරිජොව ථලෙ ඛිත්තො*
*ඔකමොකත උබ්භතො*
*පරිප්ඵන්දතිදං චිත්තං*
*මාරධෙය්‍යං පහාතවෙ* [1]

මේ සිත දියෙන් ගොඩගෙන බිම තැබූ මාලුවෙකු මෙන් හැමඅතින් ම සැලෙයි. ඒ නිසා මාරධෙය්‍ය නැසිය යුතුයි.

*මාරධෙය්‍යං පහාතවෙ යෙන කිලෙසවට්ට සංඛාතෙන මාරධෙය්‍යතෙව පරිප්ඵන්දති. තං පහාතබ්බං* [2]

ක්ලේශ වර්ත සංඛ්‍යාත විෂයෙන් (සිත) සෙල වෙයි. එය නැතිකළ යුතුයි.

*සීලං සමාධි පඤ්ඤා ච*
*යස්ස එතෙ සුභාවිතා*
*අතික්කම්ම මාරධෙය්‍යං*
*ආදිච්චොව විරොචතීති* [3]

යමෙක් ශීලය සමාධිය ප්‍රඥාව සුභාවිත නම් ඔහු මාරවිෂය ඉක්මවා හිරු මෙන් බබලයි.

## මච්චුධෙය්‍ය

*යෙ ච ඛො සම්මදක්ඛාතෙ*
*ධම්මෙ ධම්මානුවත්තිනො*
*තෙ ජනා පාරමෙස්සන්ති*
*මච්චුධෙය්‍යං සුදුත්තරං* [4]

---

[1] ධප 34
[2] ධපඅ. පි . 179
[3] ඉති. මාරධෙය්‍ය සුත්තං
[4] ධප . 86

යම්කෙනෙක් බුදුන් විසින් මනාලෙස දේශනාකළ ධර්මය දැන ඒ අනුව පවතිද් ද, ඔවුහු ඉතා අමාරුවෙන් තරණය කළ යුතු මච්චුධෙය්‍ය තරණය කොට නිවනට යන්නාහ.

*මච්චුධෙය්‍යන්ති' මච්චු එත්ථ ධීයතීති මච්චුධෙය්‍යං තෙභූමකවට්ටස්සෙතං අධිවචනං*[1]

මච්චුධෙය්‍ය යනු මරණය-මාරයා වෙසෙන හෙයින්, යුක්ත බැවින් මච්චුධෙය්‍ය වෙයි. ත්‍රි භූමක වර්තයට අධිවචනයෙකි.

( වර්ත-වට්ට

ක්ලේශ වර්තය- *කිලෙසවට්ට*
කර්ම වර්තය- *කම්මවට්ට*
විපාක වර්තය -*විපාකවට්ට*

'වට' යන අරුත දෙන වට්ට යන වචනය බෞද්ධ ධර්ම ග්‍රන්ථ වල යොදා ඇත්තේ පුනර්භව චක්‍රය (සංසාරය) හැඟවීම පිණිසය. පටිච්ච සමුප්පාදයෙහි දොළොස් අංග විස්තර කරන අටුවාචාරීහු එහි එන ක්ලේශ. කර්ම සහ විපාක යන ත්‍රිවිධ අංගයන් දැක්වීම සඳහා මෙය යොදා ගත්හ. 'කම්ම වට්ට' (කර්ම වටය) තුළ සංඛාර සහ භව යන අංග දෙක ඇතුළත් වෙයි. කිලෙස වට්ට (කෙලෙස් වටය) තුළ අවිජ්ජා, තණ්හා, උපාදාන යන තුන ඇතුළත් වෙයි. විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා යන අංග ඇතුළත් වන්නේ විපාක වට්ට (විපාක වටය) තුළය.)

---

[1] සුනිඅ. I පි .351

## මාරරජා - මච්චුරාජ

මාරයා, මෘත්‍යුරාජ, මච්චුරාජ යනුවෙන් ද සඳහන් වී තිබේ.

*මච්චුරාජස්සාති, මච්චු නාම මරණං, ඛන්ධානං භෙදො, සො එව ච සත්තානං අත්තනො වසෙ අනුවත්තාපනතො ඉස්සරට්ඨෙන රාජාති, මච්චුරාජා*[1]

මාරරජුගේ යනු, මච්චු නම් මරණය යි, ස්කන්ධ භේදයි එය ම සත්ත්වයන් තමාගේ විෂයේ පවත්වන හෙයින් ප්‍රධානය යන අර්ථයෙන් රාජ වේනුයි මෘත්‍යුරාජ නම්.

*ඵෙණූපමං කායමිමං විදිත්වා*
*මරීචිධම්මං අභිසම්බුධානො*
*ඡෙත්වාන මාරස්ස පපුප්ඵකානි*
*අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ* [2]

මේ කය පෙණපිඩක් බඳු බව දැන, මිරිඟුවක් බව අවබෝධ කර මාරයාගේ මල් (කෙලෙස්) සිඳ දමා මාරරජාට නො පෙනෙන තැනට(නිවනට) යන්න.

1124 *සුඤ්ඤතො ලොකංඅවෙක්ඛස්සු*
*මොඝරාජ සදා සතො*
*අත්තානු දිට්ඨිං ඌහච්ච*
*එවං මච්චු තරො සියා*
*එවං ලොකං අවෙක්ඛන්තං*
*මච්චුරාජා න පස්සති* [3]

මෝඝරාජය, හැමකල්හි ස්මෘතිමත් (සිහි ඇති ) ව සත්කාය

---

[1] ථෙරඅ පි . 49
[2] ධප 46
[3] සුනි පි. .344

දෘෂ්ටිය දුරු කොට ලෝකය ශූන්‍ය හෙයින් බලව, මෙ සෙයින් මෘත්‍යුහු (මාරයා) ඉක්මවත්තෙහි මෙ සේයින් ලොව දක්නහු මාත්‍යුරාජ (මාරරජ) නො දක්නේ ය.

*සිරස්මිං හි පලිතෙසු පාතුභූතෙසු මච්චුරාජස්ස සන්තිකෙ ඨිතො විය හොති*[1]
හිසෙහි කෙස් පැසුණු නම් මාරරජා ලඟ සිටීම වැනි වෙයි.

*...අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පති වත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං*[2]

... ශ්‍රමණයකු විසින් හෝ බ්‍රාහ්මණයකුවිසින් හෝ දෙවියකු විසින් හෝ මාරයකු විසින් හෝ බ්‍රහ්මයකු විසින් හෝ ...

මෙහි මාරයකු[3] යන්න විස්තර කළ තැනක් හමු වූයේ නැත.

---

[1] මනිඅ III පි ..310
[2] මහාව I පි. 24
[3] සනි. සච්චසංයුත්තයේ ධම්මචක්කප්පවත්තන සූත්‍ර වණ්ණනා වේ ද නැත.

# විවරණ කළ පද


| | |
|---|---|
| අභිසංඛාරමාර | 176 |
| අර්හත්ය-අරහං | 91 |
| අපුණ්‍යාභි සංස්කාර- අපුඤ්ඤාභි සංඛාරා | 178 |
| අනෙඤ්ජාභි සංස්කාර - ආනෙඤ්ජාභි සංඛාර | 178 |
| ආර්යපුද්ගලයෝ - අට්ඨ අරියපුග්ගලා | 106 |
| ආස්‍රව රහිත- අනාසවො | 96 |
| උපාදානස්කන්ධ පහ - පඤ්ච උපාදානක්ඛන්ධා. | 71 |
| එකළොස් ගිනි - එකාදස අග්ගී | 160 |
| කය පිළිබඳ සිහි කිරීම - කායගතා සති | 47 |
| කල්පයක් - කප්පං | 30 |
| කාමාවචරකුසල්සිත් අට - අට්ඨ කාමාවචරකුසලචිත්තානි | 117 |
| කාමයෝ - කාමා | 145 |
| ක්ලේශ වස්තු - කිලෙසවත්ථු | 173 |
| අත්තානං සමුක්කංසෙ පරෙ ච අවජානති | 146 |
| දිව්‍යලෝක | 7 |
| දුක් - දුක්ඛං | 117 |
| ත්‍රිවිධ භවයන් - තයො භවා | 97 |
| ථීනමිද්ධය ථීනමිද්ධං | 145 |
| ධාතුහු - ධාතුයො | 112 |
| නිර්වාණය - නිබ්බානං | 79 |
| නීවරණ අට - අට්ඨ නීවරණානි | 173 |
| නො ඇලීම - අරති | 145 |
| පටිච්චසමුප්පාදය. | 118 |
| පව්කිරීමට විළිනැති කම - අහිරිකං | 175 |
| පව්කිරීමට බිය නැති කම - අනොත්තප්පී | 175 |
| පසැස් - පඤ්ච චක්ඛූ | 35 |
| පෘථග්ජන නොවන - අපුථුජ්ජන | 108 |
| ප්‍රඥාව - පඤ්ඤා. | 53 |
| බලයට පැමිණි- බලප්පත්තා | 66 |
| බෝධ්‍යංග සත - සත්ත බොජ්ඣංගා | 131 |
| මනාව සංවෘත - සුසංවුතා | 56 |

| | |
|---|---|
| මඬනාලද - පරියුට්ඨීතචිත්තෙ | 31 |
| මානය - මානො | 174 |
| මානයට හේතු | 175 |
| මාරකොක්ක - මාරබළිසං | 94 |
| මාරපාශය - මාරපාසං | 94 |
| මුල්සහිත තෘෂ්ණාව - සමූලං තණ්හං | 91 |
| මුනිවරයාට - මුනිනො | 65 |
| රාගය - රාගො | 126 |
| රූපාවචර කුසලසිත් - රූපාවචර කුසලචිත්තානි | 177 |
| ලාභසත්කාර කීර්ති ප්‍රශංසා - ලාභසක්කාරසිලොකො | 122 |
| ලෞකික සමවතක් - සාමයිකං චෙතොවිමුත්තිං | 91 |
| වර්ත - වට්ට | 185 |
| විපර්යාස - විපල්ලාසා | 31 |
| වීර්ය - චතුරංගවීරියං | 143 |
| ශීලය - සීලං | 52 |
| ශ්‍රද්ධාව - සද්ධා | 86 |
| ශාශ්වතදෘෂ්ටි - සස්සතදිට්ඨී | 41 |
| සතර අප්‍රමාණ්‍යයන් - චත්තාරො අප්පමඤ්ඤා | 168 |
| සතරඍද්ධිපාද - චත්තාරො ඉද්ධිපාදා | 30 |
| සමාධිය -සමාධි | 52 |
| සතර සතිපටට්ඨාන - චත්තාරො සතිපට්ඨානා | 138 |
| සතරඍද්ධිපාදයෝ - චත්තාරො ඉද්ධිපාදා | 30 |
| සියලු බවබැඳුම් ඉක්මවා - සබ්බසංයොජනාතිගං | 71 |
| සිවු පිළිසිඹියා - නිරුත්තිපදා | 158 |
| සිහිය - සති | 88 |
| සුගතය - සුගතො | 98 |
| සෙලවෙන ශ්‍රද්ධාව - චලා සද්ධා | 165 |
| ස්කන්ධයෝ - ඛන්ධා | 111 |
| ස්පර්ශායතන - ඵස්සායතනා | 75 |
| ෂඩායතනයෝ - ඡආයතනා | 113 |
| ෂට්අභිඥා - ඡළභිඤ්ඤා | 164 |

ගැලී සිටින දන පස්කම් සුවෙහි ලොවේ
වෙලී තිබෙන දුක් දොම්නස්වලින් තැවේ
ඇලී නො ඉඳ මතුමත්තේ සසර බවේ
මෙලී පිනෙන් සැනසෙම්වා! නිවන් සුවේ



**කර්තෘ හිමි පිළිබඳව.**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් (විද්‍යෝදය)1967 ශාස්ත්‍රවේදී උපාධියලත් කන්දරපංගුවේ ධම්මසිරි හිමියෝ ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයෙන් ද සමත්වූහ. මේ කතු හිමියෝ රජයේ ගුරු සේවයට බැඳී ධර්මදූතාශ්‍රම මහ පිරිවෙණ, මහරගම මධ්‍ය මහා විද්‍යාලය, හැටන් ශ්‍රී පාද මහා විද්‍යාලය ආදී විද්‍යාලයන්හි ආචාර්යව සේවා කළහ.

සිංගප්පූරුවේ ධම්ම දූත බුඩිස්ට් සෙන්ටර් හි අධිපති උන්වහන්සේ ධර්මදූත සේවය සඳහා ඇමෙරිකාව, මැලේසියාව, ස්විට්සර්ලන්තය, හොංකොං, සිංගප්පූරුව යන රටවල සංචාරය කළහ. ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, තායිලන්තය, කාම්බෝජය, මියන්මාරය, චීනය ආදී රටවල සංචාරය කළ ධම්මසිරි හිමයෝ ඒ රටවල බුද්ධ ප්‍රතිමා හා ස්තූප පිළිබඳව අධ්‍යයනයේ නිරත වූහ.

තායිලන්තයේ බුද්ධ ප්‍රතිමා හා ස්තූප පිළිබඳව කළ පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් ද *බුද්ධ ඉමේජස් ඇන්ඩ් පැගෝඩාස් ඉන් තායිලන්ඩ්* ග්‍රන්ථය ලියා පළ කළහ.

තවද *ටීචින්ග්ස් ඔෆ් ද බුද්ධ, ද සිඟාලෝවාද ඉන් පික්චර්ස්, ද ඩික්ෂනරි ඔෆ් නියුමරිකල් ටර්මස් ඉන් බුඩිසම්, ඩිස්ක්‍රිප්ටිව් ඇනලිසිස් ඔෆ් නියුමරිකල් ටර්මස් ඉන් බුඩිසම්, පැසිනේටින් සිංගපෝර්* යන ග්‍රන්ථ ඉංග්‍රිසි බසින් ද *සිතුවම් සහිත සිඟාලෝවාද සූත්‍රය, සංඛ්‍යා ධර්මපද වර්ණනා සිංහල බසින්* ද ලියා පළ කළහ.

තායිලන්තයේ වැඩ විසූ කාලය තුළ භූමිබලෝ භික්ඛු පදනමේ සේවයේ නිරතව සිටිය දී, *සද්ධම්මප්පකාසිනියා නාම පටිසම්භිදා මග්ගට්ඨ කථාය ගණ්ඨිපදත්ථනිච්ඡය,* ග්‍රන්ථය සංස්කරණය කිරීමට සහාය වූහ.

කවියකු ද වන මේ කතු හිමියන් විසින් ජෝන් ස්ටීන් බෙක් ගේ ද *පර්ල්* කෘතිය සිංහලයට නගා *මුතු ඇටය* නමින් පළ කරන ලදී. *බුදුසමයේ පැනෙන මාරයා,* ධම්මසිරි හිමියන්ගේ නවතම කෘතියයි.

බෞද්ධ විශ්ව කෝෂයේ හිටපු නියෝජ්‍ය කර්තෘ
සනත් නානායක්කාර

ISBN 978-955-633-113-5

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

*THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL*

# DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.

May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

**NAMO AMITABHA**

南無阿彌陀佛

《斯里蘭卡文：佛經裏提到的魔王》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website: http://www.budaedu.org
Mobile Web: m.budaedu.org

**This book is strictly for free distribution, it is not to be sold.**

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan
2,000 copies; November 2017
SR069 - 15503